38 වන කාණ්ඩය
12 වන කලාපය

බ්‍රහස්පතින්ද
1985 දෙසැම්බර් 12

EVELYN RUTNAM LIBRARY
13
4/1/86
JAFFNA

# පාර්ලිමේන්තු විවාද

## (හැන්සාඩ්)

## නිල වාර්තාව

(අශෝධිත පිටපත)

## අන්තර්ගත ප්‍රධාන කරුණු

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු**

**දේශීය ආදායම් (සංශෝධන) පනත් කෙටුම්පත :**

පළමුවන වර කියවන ලදී

**පිරිවැටුම් බදු (සංශෝධන) පනත් කෙටුම්පත :**

පළමුවන වර කියවන ලදී

**මුදල් බදු (ඉවත් කිරීමේ) පනත් කෙටුම්පත :**

පළමුවන වර කියවන ලදී

**විසර්ජන පනත් කෙටුම්පත, 1986 [දහනව වන වෙන් කළ දිනය] :**

[ශීර්ෂ 170–173 (ආහාර හා සමුපකාර) ; ශීර්ෂ 162–166 සංස්කෘතික කටයුතු]
කාරක සභාවේදී සලකා බලන ලදී

**පරිපූරක මුදල් :**

ආහාර මුද්දර යෝජනා ක්‍රමය—පාඩු අත්හැරීම
ආහාර මුද්දර යෝජනා ක්‍රමය—භාණ්ඩාගාරයට අයවිය යුතු පොළී
සීනි සංයුක්ත මණ්ඩලයට ලැබෙන මූල්‍ය ආධාර

**කල් තැබීමේ යෝජනාව**

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

தொகுதி 38
இல. 12

வியாழக்கிழமை
12 டிசெம்பர் 1985

# பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

அதிகார அறிக்கை

(பிழை திருத்தப்படாதது)

## பிரதான உள்ளடக்கம்

வினாக்களுக்கு வாய்மூல விடைகள்

உண்ணாட்டரசிறை (திருத்தம்) சட்டமூலம் :
முதன்முறை மதிப்பிடப்பட்டது

மொத்த விற்பனை வரவுவரி (திருத்தம்) சட்டமூலம் :
முதன்முறை மதிப்பிடப்பட்டது

மரணச் சொத்துவரி (நீக்கம்) சட்டமூலம் :
முதன்முறை மதிப்பிடப்பட்டது

ஒதுக்கீட்டுச் சட்டமூலம், 1986 [ஒதுக்கப்பட்ட பத்தொன்பதாம் நாள்] :
குழுவில் ஆராயப்பட்டது [தலைப்புக்கள் 170—173 (உணவு, கூட்டுறவு) ; தலைப்புக்கள் 162—166 (கலாசார அலுவல்கள்)]

குறைநிரப்புத் தொகை :
உணவு முத்திரைத் திட்டம் : நட்டத்தைத் தள்ளிவிடல்
உணவு முத்திரைத் திட்டம் : திறைசேரிக்குரிய வட்டி
சீனிக் கூட்டுத்தாபனத்திற்கு நிதியுதவி

ஒத்திவைப்புப் பிரேரணை

---

Volume 38
No. 12

Thursday
12th December 1985

# PARLIAMENTARY DEBATES

(HANSARD)

OFFICIAL REPORT

(Uncorrected)

## PRINCIPAL CONTENTS

ORAL ANSWERS TO QUESTIONS

INLAND REVENUE (AMENDMENT) BILL :
Read the First time

TURNOVER TAX (AMENDMENT) BILL :
Read the First time

ESTATE DUTY (ABOLITION) BILL :
Read the First time

APPROPRIATION BILL, 1986 [Nineteenth Allotted Day] :
Considered in Committee [Heads 170 - 173 (Food & Co-operatives) ; Heads 162 - 166 (Cultural Affairs)]

SUPPLEMENTARY SUPPLY :
Food Stamps Scheme – Write-off of Losses
Food Stamps Scheme – Interest due to Treasury
Financial Assistance to Sugar Corporation

ADJOURNMENT MOTION

2 – A 087737 – 3,125 (85/12)

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

**1985 දෙසැම්බර් 12 වන බ්‍රහස්පතින්ද**

**வியாழக்கிழமை, 12 டிசெம்பர் 1985**

*Thursday, 12th December 1985*

*පූ. භා. 9 ට පාර්ලිමේන්තුව රැස්විය. නියෝජ්‍ය කථානායකතුමා [නෝමන් වෛද්‍යරත්න මහතා] මූලාසනාරූඪ විය.*

*பாராளுமன்றம் மு. ப. 9 மணிக்குக் கூடியது. பிரதிச் சபாநாயகர் அவர்கள் [திரு. நோமன் வைத்யரத்ன] தலைமை வகித்தார்கள்.*

*The Parliament met at 9 a.m.* MR. DEPUTY SPEAKER (MR. NORMAN WAIDYARATNA) *in the Chair.*

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

Supplementary Estimate No. 33 of 1985.– (*Mr. M. Vincent Perera, on behalf of the Prime Minister, Minister of Local Government, Housing & Construction, Minister of Highways and Minister of Emergency Civil Administration.*)

Supplementary Estimate No. 31 of 1985.– (*Mr. Gamini Jayasuriya, Minister of Agricultural Development & Research and Minister of Food & Co-operatives.*)

Supplementary Estimate No. 32 of 1985.– (*Mr. M. Vincent Perera, on behalf of the Minister of Posts and Telecommunications.*)

*සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.*

*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*

*Ordered to lie upon the Table.*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

### ආර්. බී. හේමාවතී මෙනෙවිය : රැකියාවක්
### செல்வி ஆர். பி. ஹேமாவதி : தொழில்
### MISS R. B. HEMAWATHIE : EMPLOYMENT

659/85

7. **ආචාර්ය ඩබ්ලිව්. දහනායක මහතා (ගාල්ල)**
**(கலாநிதி டபிள்யு. தஹநாயக்க — காலி)**
**(Dr. W. Dahanayake – Galle)**

යෞවන කටයුතු හා රැකිරක්ෂා ඇමතිතුමා සහ අධ්‍යාපන ඇමතිතුමාගෙන් ඇසූ ප්‍රශ්නය :

(අ) ලියාපදිංචි අංක 10/යූ/එෆ්/80/එෆ්.ඒ යටතේ 1981 වර්ෂයේදී ලියාපදිංචි වූ ගෝනාපිනූවල මාජුවාන පාරේ පදිංචි ආර්. බී. හේමාවතී මෙනෙවියට තවම රැකියාවක් ලැබී නොමැති බැව් එතුමා දන්නේද ?

(ආ) ඇයට පසුව ලියාපදිංචි වූ අයට රැකියා ලැබී ඇති බැව් එතුමා දන්නේද ?

(ඇ) ඇයට වහාම රැකියාවක් ලබා දෙන්නේද ?

(ඈ) එසේ නම්, කවදාද ?

(ඉ) ලබා නොදෙන්නේ නම්, ඒ මන්ද ?

இளைஞர் அலுவல்கள், தொழில் வாய்ப்பு அமைச்சரும் கல்வி அமைச்சரும் ஆனவரைக் கேட்ட வினா :

(அ) மஜீவன ரோட்டு, கோணப்பினுவலை என்ற முகவரியினரும் 10/U/F/80/FA என்ற பதிவெண்ணைக் கொண்டவரும் 1981 இல் பதிவு செய்யப்பட்டவருமாகிய செல்வி ஆர். பி. ஹேமாவதிக்கு இன்னும் தொழில் கிடைக்கவில்லை என்பதையும் அறிவாரா ?

(ஆ) இதன் பின்னர் பதிவு செய்யப்பட்டவர்களுக்குத் தொழில் கிடைத்துள்ளது என்பதையும் அறிவாரா ?

(இ) இவருக்கு உடனடியாகத் தொழில் வழங்குவாரா ?

(ஈ) அவ்வாறயின் எப்பொழுது ?

(உ) இல்லையேல் ஏன் ?

asked the Minister of Youth Affairs and Employment and Minister of Education :

(*a*) Is he aware that Reg. No. 10/U/F/80/F.A., Miss R. B. Hemawathie, of Majuwana Road, Gonapinuwala, who was registered in 1981, has not yet received employment ?

(*b*) Is he aware that those who registered later have received employment ?

(*c*) Will he give her employment at once ?

(*d*) If so, when ?

(*e*) If not, why ?

**එම්. වින්සන්ට් පෙරේරා මහතා (පාර්ලිමේන්තු කටයුතු හා ක්‍රීඩා ඇමතිතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
**(திரு. எம். வின்சன்ற் பெரேரா — பாராளுமன்ற அலுவல்கள், விளையாட்டுத்துறை அமைச்சரும் பிரதம அரசாங்கக் கொறடாவும்)**
**(Mr. M. Vincent Perera – Minister of Parliamentary Affairs & Sports and Chief Government Whip)**

I answer on behalf of the Minister of Youth Affairs and Employment and Minister of Education.

(*a*) Miss R. B. Hemawathie of Majuwana Road, Gonapinuwala, has been recommended for a post of graduate assistant teacher to the Educational Services Committee by the Director, Youth Employment Planning.

(*b*), (*c*), (*d*) and (*e*) Do not arise.

**ආචාර්ය ඩබ්ලිව්. දහනායක මහතා**
**(கலாநிதி டபிள்யு. தஹநாயக்க)**
**(Dr. W. Dahanayake)**

Sir, I am quite satisfied with the Answer given. Thank you.

**නියෝජ්‍ය කථානායකතුමා**
**(பிரதிச் சபாநாயகர் அவர்கள்)**
**(Mr. Deputy Speaker)**

Question No. 8.

**එම්. වින්සන්ට් පෙරේරා මහතා**
**(திரு. எம். வின்சன்ற் பெரேரா)**
**(Mr. M. Vincent Perera)**

On behalf of the Minister of Labour, I ask for four weeks' time.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது*
***Question ordered to stand down.***

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**නියෝජ්‍ය කථානායකතුමා**
**(பிரதிச் சபாநாயகர் அவர்கள்)**
**(Mr. Deputy Speaker)**

Question No. 1.

**එම්. වින්සන්ට් පෙරේරා මහතා**
**(திரு. எம். வின்சன்ற் பெரேரா)**
**(Mr. M. Vincent Perera)**

On behalf of the Minister of Textile Industries, I ask for six weeks' time.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது*
***Question ordered to stand down.***

## රජයේ ආයතනවල ආරක්ෂක කටයුතු
## அரசாங்க நிறுவனப் பாதுகாப்பொழுங்கு
## SECURITY ARRANGEMENTS IN GOVERNMENT INSTITUTIONS

528/85

2. **ලක්ෂ්මන් ජයකොඩි මහතා** (මෛත්‍රීපාල සේනානායක මහතා – මැදවච්චිය – වෙනුවට)

**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி — திரு. மைத்ரிபால சேனநாயக்க — மதவாச்சி சார்பாக)**

(Mr. Lakshman Jayakody – on behalf of Mr. Maithripala Senanayake – Medawachchiya)

ස්වදේශ කටයුතු ඇමතිතුමාගෙන් ඇසූ ප්‍රශ්නය :

(අ) එතුමා යටතේ ඇති දෙපාර්තමේන්තුවල, සංස්ථාවල, සංයුක්ත මණ්ඩලවල, මණ්ඩලවල, රජයට පවරාගත් ආයතනවල සහ අමාත්‍යාංශ කාර්යාලයේ ආරක්ෂක අංශය පෞද්ගලික සමාගමකට හෝ සමාගම්වලට භාර දී තිබේද ?

(ආ) ඉහත (අ) කොටසට පිළිතුර "ඔව්" නම්—

(i) එම සමාගම්වල හෝ සමාගමේ නම සහ ලිපිනයත්, අධ්‍යක්ෂක වරුන්ගේ හෝ අයිතිකරුවන්ගේ නම් සහ ලිපිනයත් ද,

(ii) භාරදුන් දිනයද,

(iii) සමාගමට හෝ සමාගම්වලට මාසිකව ගෙවනු ලබන මුදලද,

(iv) ඒ සඳහා අයදුම්පත් කැඳෙව්වේ නම් අයදුම් කරන ලද අයගේ නම් සහ ලිපිනයත්ද ඒ සමාගම්වල අයිතිකරුවන්ගේ නම් සහ ලිපිනයත්ද,

(v) ඔවුන් විසින් ඉදිරිපත් කරන ලද මිල ගණන් ද,

(vi) ආරක්ෂක අංශය පෞද්ගලික සමාගමකට හෝ සමාගම්වලට භාර දීමට හේතුවද,

(vii) පෞද්ගලික අංශයට භාරදීමේ හේතුවෙන් එම ක්ෂේත්‍රයේ රැකියා අහිමිවූවන්ගේ සංඛ්‍යාවද,

එතුමා සඳහන් කරනවාද ?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද ?

உள்நாட்டலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா :

(அ) அவரின் நிருவாகத்தின் கீழுள்ள திணைக்களங்கள், கூட்டுத் தாபனங்கள், இணைக்கப்பட்ட சபைகள், சபைகள், அரசாங்கம் பொறுப்பேற்றுள்ள நிறுவனங்கள், அமைச்சின் அலுவலகம் ஆகியவற்றின் பாதுகாப்புப் பிரிவு தனியார் கம்பனி அல்லது கம்பனிகளிடம் கையளிக்கப்பட்டுள்ளதா ?

(ஆ) மேற்படி (அ) பிரிவுக்குரிய விடை ஆம் எனில்—

(i) இக்கம்பனிகளின் அல்லது கம்பனியின் பெயர், முகவரி, பணிப்பாளர்களின் அல்லது உரிமையாளர்களின் பெயர், முகவரி ;

(ii) கையளித்த தேதி ;

(iii) கம்பனிக்கு அல்லது கம்பனிகளுக்கு மாதந்தோறும் செலுத்தும் தொகை ;

(iv) இதற்கு விண்ணப்பம் கோரப்பட்டிருப்பின் விண்ணப்பித்தவர்களின் பெயர், முகவரி, இந்தக் கம்பனிகளின் உரிமையாளர்களின் பெயர், முகவரி ;

(v) இவர்கள் சமர்ப்பித்த கோரிக்கைத் தொகை ;

(vi) பாதுகாப்புப் பிரிவைத் தனியார் கம்பனியிடம் அல்லது கம்பனிகளிடம் கையளித்தற்குரிய காரணம் ;

(vii) தனியார் துறையிடம் கையளிப்பதன் காரணமாக இப்பிரிவில் தொழில் இழந்தவர்களின் எண்ணிக்கை,

ஆகிய விபரங்களை அவர் கூறுவாரா ?

(இ) இன்றேல், ஏன் ?

asked the Minister of Home Affairs :

(*a*) Has the Security Section of the Departments, Corporations, Corporate Bodies, Government Acquired Institutions and Ministry Office under him been handed over to a private company or companies ?

(*b*) If the answer to (*a*) above is "yes", will he state –

(i) the name and address of the company or companies and the names and addresses of the directors or owners ;

(ii) date of handing over ;

(iii) the amont paid monthly to the company or companies ;

(iv) the names and addresses of those who applied if applications were called for and the names and addresses of the owners of those companies ;

(v) the quotations submitted by them ;

(vi) the reasons for handing over the Security Section to a private company or companies ;

(vii) the number who were deprived of employment in this field due to this handing over to the private sector.

(*c*) If not, why ?

**කේ. ඩබ්ලිව්. දේවනායගම් මහතා (ස්වදේශ කටයුතු ඇමතිතුමා)**
**(திரு. கே. டபிள்யு. தேவநாயகம் — உள்நாட்டலுவல்கள் அமைச்சர்)**
**(Mr. K. W. Devanayagam – Minister of Home Affairs)**

(*a*) Yes – Kandy Kachcheri only.

(*b*) (i) Meco Security Services Ltd., No. 20, Mulgampala Road, Kandy. Managing Director – Mr. M. J. H. Sherifdeen.

(ii) 1.11.1984.

(iii) Rs. 7,625.

(iv) Applications were not called for.

(v) Rs. 1,200 per person per month for a duty shift of eight hours a day.

(iv) For the protection of the establishment and the personnel due to the state of Emergency prevailing in the Island.

(vii) No one has lost employment.

(*c*) Does not arise.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**නියෝජ්‍ය කථානායකතුමා**
**(பிரதிச் சபாநாயகர் அவர்கள்)**
**(Mr. Deputy Speaker)**

Question No. 3.

**එම්. වින්සන්ට් පෙරේරා මහතා**
**(திரு. எம். வின்சன்ற் பெரேரா)**
**(Mr. M. Vincent Perera)**

On behalf of the Minister of National Security and Deputy Minister of Defence, I ask for two weeks' time.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது*
***Question ordered to stand down.***

**නියෝජ්‍ය කථානායකතුමා**
**(பிரதிச் சபாநாயகர் அவர்கள்)**
**(Mr. Deputy Speaker)**

Question No. 4.

**එම්. වින්සන්ට් පෙරේරා මහතා**
**(திரு. எம். வின்சன்ற் பெரேரா)**
**(Mr. M. Vincent Perera)**

On behalf of the Deputy Minister of Power and Energy, I ask for three weeks' time.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது*
***Question ordered to stand down.***

**නියෝජ්‍ය කථානායකතුමා**
**(பிரதிச் சபாநாயகர் அவர்கள்)**
**(Mr. Deputy Speaker)**

Question No. 5.

**එම්. වින්සන්ට් පෙරේරා මහතා**
**(திரு. எம். வின்சன்ற் பெரேரா)**
**(Mr. M. Vincent Perera)**

On behalf of the Deputy Minister of Plan Implementation, I ask for two weeks' time.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது*
***Question ordered to stand down.***

**නියෝජ්‍ය කථානායකතුමා**
**(பிரதிச் சபாநாயகர் அவர்கள்)**
**(Mr. Deputy Speaker)**

Question No. 6.

**එම්. වින්සන්ට් පෙරේරා මහතා**
**(திரு. எம். வின்சன்ற் பெரேரா)**
**(Mr. M. Vincent Perera)**

On behalf of the Minister of Lands and Land Development and Minister of Mahaweli Development, I ask for two weeks' time.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது*
***Question ordered to stand down.***

## පනත් කෙටුම්පත් පිළිගැන්වීම
### சமர்ப்பிக்கப்பட்ட சட்டமூலங்கள்
## BILLS PRESENTED

### දේශීය ආදායම් (සංශෝධන) පනත් කෙටුම්පත
### உண்ணாட்டு அரசிறை (திருத்தம்) சட்டமூலம்
### INLAND REVENUE (AMENDMENT) BILL

**"To amend the Inland Revenue Act, No. 28 of 1979".**

*පිළිගන්වන ලද්දේ මුදල් හා ක්‍රම සම්පාදන ඇමතිතුමා වෙනුවට එම්. වින්සන්ට් පෙරේරා මහතා විසිනි.*

*1985 දෙසැම්බර් 20 වන සිකුරාද දෙවන වර කියවිය යුතුයයිද, එය මුද්‍රණය කළ යුතුයයිද නියෝග කරන ලදී.*

*நிதி, அமைப்புத்திட்ட அமைச்சர் சார்பாக திரு. எம். வின்சன்ற் பெரேரா அவர்களால் சமர்ப்பிக்கப்பட்டது. 1985 டிசெம்பர் 20, வெள்ளிக்கிழமை இரண்டாம் முறையாக மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் கட்டளையிடப்பட்டது.*

*Presented by Mr. M. Vincent Perera, on behalf of the Minister of Finance and Planning; to be read a Second time upon Friday, 20th December 1985, and to be printed.*

### පිරිවැටුම් බදු (සංශෝධන) පනත් කෙටුම්පත
### மொத்த விற்பனவு வரி (திருத்தம்) சட்டமூலம்
### TURNOVER TAX (AMENDMENT) BILL

**"to amend the Turnover Tax Act, No. 69 of 1981".**

*පිළිගන්වන ලද්දේ මුදල් හා ක්‍රම සම්පාදන ඇමතිතුමා වෙනුවට එම්. වින්සන්ට් පෙරේරා මහතා විසිනි.*

*1985 දෙසැම්බර් 20 වන සිකුරාද දෙවන වර කියවිය යුතුයයිද, එය මුද්‍රණය කළ යුතුයයිද නියෝග කරන ලදී.*

*நிதி, அமைப்புத்திட்ட அமைச்சர் சார்பாக திரு. எம். வின்சன்ற் பெரேரா அவர்களால் சமர்ப்பிக்கப்பட்டது. 1985 டிசெம்பர் 20, வெள்ளிக்கிழமை இரண்டாம் முறையாக மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் கட்டளையிடப்பட்டது.*

*Presented by Mr. M. Vincent Perera, on behalf of the Minister of Finance and Planning; to be read a Second time upon Friday, 20th December 1985, and to be printed.*

### බූදල් බදු (ඉවත් කිරීමේ) පනත් කෙටුම්පත
### மரணச் சொத்துவரி (நீக்கம்) சட்டமூலம்
### ESTATE DUTY (ABOLITION) BILL

**"to abolish the levy and payment of estate duty under the Estate Duty Act, No. 13 of 1980, on the estates of persons dying on or after November 13, 1985."**

*පිළිගන්වන ලද්දේ මුදල් හා ක්‍රම සම්පාදන ඇමතිතුමා වෙනුවට එම්. වින්සන්ට් පෙරේරා මහතා විසිනි.*

*1985 දෙසැම්බර් 20 වන සිකුරාද දෙවන වර කියවිය යුතුයයිද, එය මුද්‍රණය කළ යුතුයයිද නියෝග කරන ලදී.*

*நிதி, அமைப்புத்திட்ட அமைச்சர் சார்பாக திரு. எம். வின்சன்ற் பெரேரா அவர்களால் சமர்ப்பிக்கப்பட்டது. 1985 டிசெம்பர் 20, வெள்ளிக்கிழமை இரண்டாம் முறையாக மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் கட்டளையிடப்பட்டது.*

*Presented by Mr. M. Vincent Perera, on behalf of the Minister of Finance and Planning; to be read a Second time upon Friday, 20th December 1985, and to be printed.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

# පාර්ලිමේන්තුවේ කටයුතු

## பாராளுமன்ற அலுவல்

## BUSINESS OF THE PARLIAMENT

**එම්. වින්සන්ට් පෙරේරා මහතා**
**(திரு. எம். வின்சன்ற் பெரேரா)**
**(Mr. M. Vincent Perera)**

I move,

That the proceedings on Items 4, 5 and 6 of Public Business appearing on the Paper be exempted at this day's sitting from the provisions of Standing Order No. 23."

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பெற்று ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

# විසර්ජන පනත් කෙටුම්පත, 1986

## ஒதுக்கீட்டுச் சட்டமூலம், 1986

## APPROPRIATION BILL, 1986

*කාරක සභාවෙහිදී තවදුරටත් සලකා බලන ලදී. – [ප්‍රගතිය දෙසැම්බර් 11.]*
*[නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.]*

*குழுவில் மேலும் ஆராயப்பெற்றது. — [தேர்ச்சி : 11 டிசெம்பர்]*
*[பிரதிச் சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.]*

*Considered further in Committee [Progress : 11th December.]*
[MR. DEPUTY SPEAKER *in the Chair.]*

**170 වන ශීර්ෂය. – ආහාර හා සමුපකාර අමාත්‍යවරයා**

1 වන වැඩ සටහන.– සාමාන්‍ය පරිපාලනය හා කාර්ය මණ්ඩල සේවා – පුනරාවර්තන වියදම, රු. 50,14,000

**தலைப்பு 170.— உணவு, கூட்டுறவுகள் அமைச்சர்**

நிகழ்ச்சித் திட்டம் 1.— பொது நிருவாகமும் பதவியினர் சேவைகளும் — மீண்டுவருஞ் செலவு, ரூபா 50,14,000

Head 170 :– Minister of Food and Co-operatives
Programme 1. – General Administration and Staff Services – Recurrent Expenditure, Rs. 5,014,000

**සභාපතිතුමා**
**(தலைவர்)**
**(The Chairman)**

Heads 170 – 173, Ministry of Food and Co-operatives. The Vote will be taken at 3 p.m.

**ගාමිනී ජයසූරිය මහතා (කෘෂිකාර්මික සංවර්ධන හා පර්යේෂණ ඇමතිතුමා සහ ආහාර හා සමුපකාර ඇමතිතුමා)**
**(திரு. காமினி ஜயசூரிய — விவசாய அபிவிருத்தி, ஆராய்ச்சி அமைச்சரும் உணவு, கூட்டுறவு அமைச்சரும்)**
**(Mr. Gamani Jayasuriya – Minister of Agricultural Development & Research and Minister of Food and Co-operatives)**

Sir, may I have your permission to take up Items 2, 3 and 4, the Supplementary Estimates, at the end of the day ?

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
**(Mr. Lakshman Jayakody)**

No. Those items were not on the Order Paper earlier. So he must explain them. One is for Rs. 1,727 million. The other is for Rs. 190 million. You cannot just pass them like that.

**සභාපතිතුමා**
**(தலைவர்)**
**(The Chairman)**

Order, please ! The Hon. Minister will explain them.

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
**(Mr. Lakshman Jayakody)**

Sir, this is for food stamps. We will take them up–

**සභාපතිතුමා**
**(தலைவர்)**
**(The Chairman)**

When ? The agreement is to take up Supplementary Estimates–

**ගාමිනී ජයසූරිය මහතා**
**(திரு. காமினி ஜயசூரிய)**
**(Mr. Gamani Jayasuriya)**

Do you want me to explain them ?

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
**(Mr. Lakshman Jayakody)**

Why did you not put them on the Order Paper ?

**සභාපතිතුමා**
**(தலைவர்)**
**(The Chairman)**

They are on the Order Paper.

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
**(Mr. Lakshman Jayakody)**

Sir, some items have been included after being exempted from the provisions of Standing Order 23. If the Hon. Minister wanted to take up those items he should have given them so that we would know what they were. He just comes here with a Supplementary Estimate for Rs. 1,727 million – food stamps–

**සභාපතිතුමා**
**(தலைவர்)**
**(The Chairman)**

The Supplementary Estimates are on the Order Paper and the explanations are, I believe, in the docket. Order, please ! Will somebody move the cut ?

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
**(Mr. Lakshman Jayakody)**

I move,

"That the Programme be reduced by Rs. 10."

**එම්. වින්සන්ට් පෙරේරා මහතා**
**(திரு. எம். வின்சன்ற் பெரேரா)**
**(Mr. M. Vincent Perera)**

The Hon. Minister can explain the Supplementary Estimates now.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
(Mr. Lakshman Jayakody)

Yes, a short explanation.

**ගාමිනී ජයසූරිය මහතා**
**(திரு. காமினி ஜயசூரிய)**
**(Mr. Gamani Jayasuriya)**

Sir, the Food Department operates its activities on a commercial basis under the Food Purchased and Distribution Advance Account. Up to 31.12.79 the food commodities were distributed on a subsidized basis and a çonsiderable loss was anticipated every year and monetary provision to meet such losses was made under the Vote in the annual estimates. From 1.1.80 this policy was changed and it was decided to run this account on a no-loss no-profit basis. Therefore, provision to meet any anticipated loss was not made in the annual estimates in 1980 and subsquent years. The final accounts, that is, the trading accounts and the profit and less accounts of the Food Purchase and Distribution Advance Accont for the period 1974, 1975, 1976, 1977, 1978, 1979 and 1980 revealed losses under the activity. These losses were in excess of the provisions which had been made in the annual estimates of the respective years to meet such anticipated losses. The actual losses that are not covered by such provision in the annual estimates are detailed in the Cabinet memorandum. As regards 1980, although this account was to be operated on a no-loss no-profit basis, a loss of Rs. 809,697,542 was incurred. The total losses during the period 1974 to 1980 is Rs. 1,727,745,000. Hitherto, it had been the practice for the reasons for any losses to be examined by the Public Accounts Committee of Parliament before provision was obtained for writing off such losses. The Treasury has now advised that provision of writing off losses need not wait for the Public Accounts Committee's examination but could be attended to after the Auditor-General's certification of the accounts.

The final accounts relating to all these years have been examined by the Auditor-General and the Food Department and therefore included provision to cover all these losses in the draft estimates for 1986. The Treasury has advised the department to provide for these losses by way of a Supplementary Estate in 1985 itself.

It is for this purpose that a Cabinet memorandum was submitted. It will not involve any financial approval. It is necessary, however, to obtain formal Parliamentary approval by way of a Supplementary Estimate.

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
(Mr. Lakshman Jayakody)

Sir, the Hon. Minister has now come before this House with a Supplementary Estimate for Rs. 1,727,745,000 and another Supplementary Estimate for Rs. 190,245,000. There is a Committee sitting under the Chairmanship of the hon. Member for Galle, on the Food and Kerosene Stamps Scheme. I want to say very clearly that the Hon. Minister must not bring another Supplementary Estimate again for next year. I am saying this because he is rushing through these Supplementary Estimates.

Sir, I want to read out a letter, sent by the Food Commissioner to the then hon. Acting Minister of his Ministry, which is slightly contradictory to what the Hon. Minister of Finance said about two or three days ago. He put the entire blame for the rise in food prices on the Food Commisioner and said that he should have acted not now but six months ago. With that statement the whole country went into a complete stir because we did not know what the truth was ! The Hon. Minister has come out with a little bit of the truth. It is a Cabinet Memorandum that he read out in Parliament.

I want to read out the letter the Food Commissioner had sent to the Hon. Acting Minister pertaining to the statement made by the Hon. Minister of Finance and Planning. He will have to answer for the statement he made in Parliament. This is what the letter says –

" 1985 නොවැම්බර් මස 22 වැනි දින "

**ඇත කාලයක නොවෙයි.**

" වැඩබලන ගරු ආහාර හා සමුපකාර ඇමතිතුමා,
වැඩබලන ලේකම් මගින්.

**හාල්, පිටි, සීනි මිල වැඩිකිරීම පිළිබඳව ගුවන්විදුලිය, රූපවාහිනිය හා පත්‍ර මගින් ආහාර දෙපාර්තමේන්තුව සම්බන්ධව කර ඇති ප්‍රකාශය**

1981 සිට 1985.10.22 වන දින දක්වා හාල්, පිටි සහ සීනි මිල වෙනස්වීම් සඳහා දින දක්වන සටහන මේ සමග ඔබතුමාගේ දැනගැනීම පිණිස ඉදිරිපත් කරමි.

මෙම සටහන අනුව අවසාන වශයෙන් මවිසින් 1985.10.23 දින සිට පිටරට සහල් කිලෝග්‍රෑම් 1ක් රු. 6.36 සිට රු. 6.86 දක්වා වැඩිකර තිබේ. මෙය බලපාත්තේ සමුපකාර සමිති සඳහා පමණි. එය සැපයුම් මධ්‍යස්ථානයේ මිළය. පුද්ගලික වෙළඳුන් සඳහා තොග මිල 85.10.22 දින සිට කිලෝග්‍රෑම් එකක් රු. 6.53 සිට රු. 7.03 දක්වා වැඩිකරන ලදි. මෙරට නැම්බු සහ කැකුළු සහල් සඳහා මිල වෙනස්වීමක් නැත. තවද, 1985.10.03 වන දින සිට සීනි මිල කිලෝග්‍රෑම් 1ක් රු. 11.40 සිට රු. 13.05 දක්වා වැඩිකර තිබෙන බව සත්‍යයකි. තවද, 1985.10.22 දින සිට පිටි කිලෝ එකක කලින් සැපයුම් මධ්‍යස්ථාන මිල රු. 7.12ක්ව තිබුණ නමුත් එය රු. 7.25 දක්වා වැඩිකරන ලදි. මේ අනුව පුද්ගලික වෙළඳුන් සඳහා තොග මිල කිලෝ එකක් රු. 7.31 සිට රු. 7.45 දක්වා වැඩිකරන ලදි. සිල්ලර මිල රු. 7.75 සිට රු. 7.90 දක්වා වැඩිවිය. මේ අනුව ග්‍රෑම් 450ක් වූ රු. 3.05 තිබුණ පාන් රාත්තලක මිල රු. 3.10 දක්වා වැඩිකරන ලදි.

ආයාත සහල්, තිරිඟු පිටි සහ පාන් මිල ප්‍රතිශෝධනය කිරීම සඳහා 1985 ඔක්තෝබර් 22 වෙනි දින මවිසින් සියලුම නියෝජ්‍ය ආහාර පාලකවරුන් වෙත යවන ලද චක්‍රලේඛ අංක : 2487 ලිපියේ පිටපතක්ද, සීනි මිල ප්‍රතිශෝධනය කිරීම සඳහා මවිසින් නියෝජ්‍ය ආහාර පාලකවරුන්ට ඉදිරිපත් කරන ලද චක්‍රලේඛ අංක : 2484හි පිටපතක්ද මේ සමග ඔබතුමාගේ දැනගැනීම සඳහා ඉදිරිපත් කරමි.

1985.04.09 වෙනි දින ජාතික ආහාර ප්‍රතිපත්ති කමිටුව ආ. ස./ලේ., මු/ලේ. වෙ./ලේ. සහ අමාත්‍ය මණ්ඩලයේ ලේකම්තුමා සමග කරන ලද සාකච්ඡාවේදී ගත් තීරණයක් අනුව මවිසින් හාල්, පිටි සහ සීනි මිල වැඩිකිරීම සඳහා ඉදිරිපත් කරන ලද යෝජනාව සමග ඉදිරිපත් කරන ලද ගිණුම් භාණ්ඩාගාරයේ නිලධාරීන්ද සමග යළිත් අධ්‍යයනය කර වාර්තා කළයුතු බවට තීරණය කරන ලදි. ඉන්පසුව මවිසින් ඉදිරිපත් කරනලද 2 වැනි වාර්තාව අනුව ආහාර අමාත්‍යාංශය සහ ජාතික ආහාර ප්‍රතිපත්ති කමිටුව 85.8.2 දින යළිත් සාකච්ඡාකර හාල්, පිටි සහ සීනි මිල වැඩිකිරීම සඳහා කැබිනට් පත්‍රිකාවක් සකස්කර ඉදිරිපත් කරන මෙන් කරන ලද නියෝගය අනුව කැබිනට් පත්‍රිකාවක් සකස්කර අමාත්‍යාංශය මගින් අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කරන ලදි. එයට පිළිතුරක් වශයෙන් අමාත්‍ය මණ්ඩල කාර්යාලයෙන් 85.10.02 වැනි දින යෝජිත හාල්, පිටි සහ සීනි මිල වැඩිකිරීම අමාත්‍ය මණ්ඩලය විසින් අනුමතකර ඇති බව ආ. ස./ලේ. වෙත දන්වා ඇත.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ලක්ෂ්මන් ජයකොඩි මහතා]

පූ. භා. 9. 15

හය මාසයකට ඉස්සෙල්ලා නොවෙයි, ඒක ඔක්තෝබර් මාසයේදීයි, කරලා තිබෙන්නේ.

"එමනිසා එම තීරණය ලැබෙනතුරු අප්‍රේල් මාසයේ සිට ඔක්තෝබර් මාසය දක්වා මට මිල වැඩි කිරීම සඳහා කටයුතු කිරීමට නොහැකිවුන බව මෙයින් දන්වමි. මේ අනුව ආහාර දෙපාර්තමේන්තුවේ ආ. මි. හා බෙ. ගිණුම ලාභ පාඩු රහිතව පවත්වාගෙන යෑම සඳහා මිල මට්ටම් සංශෝධනය කිරීමට මවිසින් දිගටම කටයුතු කරගෙන ගොස් ඇත. තවද, 1984 නොවැම්බර් මස සිට ආනයනය කරන හාල් සඳහා රේගු ගාස්තු 5% සිට 25% දක්වා භාණ්ඩාගාරයෙන් වැඩිකරන ලදි."

එහෙම නම් ගරු මුදල් ඇමතිතුමාට කියන්න බැහැ, මේ හැම එකක්ම එතුමා දන්නේ නැතිව කලාය කියා. ආනයන ගාස්තුත් වැඩි කර තිබෙනවා. රේගු ගාස්තුත් වැඩි කර තිබෙනවා. චක්‍රලේඛය ඉදිරිපත් කර තිබෙන්නේ ඔක්තෝබර් මාසයේදීයි. හය මාසයකට ඉස්සෙල්ලා නොවෙයි. ඒ නිසා ගරු මුදල් ඇමතිතුමා මේ ගරු සභාවට ඇවිත් කළ ඒ ප්‍රකාශය ගැන සෑහීමකට පත් වන්න අපට බැහැ. ඒ නිසා එක්කෝ එතුමා ඒ ප්‍රකාශය ඉල්ලා අස් කර ගන්න ඕනෑ. එහෙම නැත්තම් සත්‍යය ප්‍රකාශ කරන්න ඕනෑ.

"තවද, විශේෂ කරුණක් මවිසින් කිව යුතුව ඇත. එනම්, අයවැය ලේඛනයෙන් පසුව හෝ අයවැය ලේඛනය අතලඟ තිබියදී මා හිතාමතා හාල්, පිටි සහ සීනි මිල වැඩිකර නොමැත. නමුත් සෑම වර්ෂයක්ම පාසා නොවැම්බර්, දෙසැම්බර්, ජනවාරි මාසවලදී විවෘත වෙළඳපොළේ සහල් මිල සිරිතක් වශයෙන් අධික වන බව ඔබතුමාද පිළිගන්නවා ඇත. මේ අනුව මෙම වර්ෂයේදී ද විවෘත වෙළඳපොළේ හාල් මිල වැඩිවී තිබෙන බව සත්‍යයකි. මීට අමතරව වී බුසලක මිල රු. 70 දක්වා වැඩිවීමත් සමගම වෙළඳපොළේ සහල් මිල ඊට සමානුපාතිකව වැඩිවීමට ඉඩ තිබේ."

"guaranteed price" එක වැඩි කලාම මිල තවත් ඉහළ නගිනවා.

"ආනයනය කරන ලද හාල් ලාභ පාඩු රහිතව විකුණන්නේ නම් සහල් කිලෝ ග්‍රෑම් 1ක් රු. 7.65කට විකිණීමට සිදුවේ."

ඔන්න ගණන :

"නමුත් දැනට මෙම සහල් විකීමෙන් පාඩුවක් ලබමින් ආනයනය කරන ලද සහල් කිලෝ ග්‍රෑම් 1 ක් රුපියල් 6.86 බැගින් දෙපාර්තමේන්තුව විසින් විකුණනු ලැබේ. මේ අනුව සහල් විකිණීමෙන් 1985 වර්ෂයේ දෙපාර්තමේන්තුව බලාපොරොත්තුවන පාඩුව රුපියල් දශ ලක්ෂ 107 ක් වේ. සීනි සහ පිටි වෙළඳාමෙන් දෙපාර්තමේන්තුවට රුපියල් දශ ලක්ෂ 54 ක ලාභයක් බලාපොරොත්තු වේ. මේ අනුව සහල්, පිටි සහ සීනි වෙළඳාමෙන් දෙපාර්තමේන්තුව 1985 වර්ෂයේදී අපේක්ෂා කරන ශුද්ධ පාඩුව රුපියල් දශ ලක්ෂ 53 කි. ඇත්තවශයෙන්ම ලාභ පාඩු රහිත පදනමක් යටතේ දෙපාර්තමේන්තුව ක්‍රියා කිරීම සඳහා නම් මෙම පාඩුවද පියවා ගැනීම සඳහා සහල් මිල තවදුරටත් ඉහළ දැමීමට දෙපාර්තමේන්තුවට සිදු වේ.

තවත් ඉහළ දැමීමට සිදු වෙනවා.

එහෙත් මෙම අවස්ථාවේදී එසේ ක්‍රියා කිරීම සුදුසු නොවන බව මගේ අදහසයි."

මේ ලිපිය අනුව, මේ කළ ප්‍රකාශනය සම්බන්ධයෙන් ගරු මුදල් ඇමතිතුමා පිළිතුරු දෙන්න ඕනෑ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම වැඩිපුර කථා කරන්න යන්නේ නැහැ. ආහාරවල තත්ත්වය පිළිබඳව කවුරු මොනවා කිව්වත්, මේ රටේ ඒ ද්‍රව්‍යවල මිල ඉහළයාම අනිවාර්යයෙන්ම සිදුවේගෙන යන බව කවුරුත් දන්නවා. ඔහු ගන්නා පියවරවල් මොනවාද කියල අපි දැන ගන්නට ඕනෑ.

ආහාර දෙපාර්තමේන්තුව තමයි මේ රටේ දුප්පත් ජනතාවට ආහාර බෙදීම සඳහා ක්‍රියා කරන්න මුලින්ම ආරම්භ කලේ. නමුත් ඒ කටයුත්ත වෙළඳ අමාත්‍යාංශයට දීලත් බැහැ, වෙනත් අමාත්‍යාංශයකට දීලත් බැහැ. ආහාර සම්බන්ධයෙන් වෙනම තිබෙන මේ දෙපාර්තමේන්තුව ආහාර අමාත්‍යාංශය යටතෙයි තිබෙන්නේ එම නිසා මොන හේතුවක් උඩද ආහාර මිල නගින්නේ කියන එක සම්බන්ධයෙන් එතුමා අපට පැහැදිලි ප්‍රකාශයක් කරන්න ඕනෑ. එවැනි ප්‍රකාශයක් ඇමතිතුමා කලේ නැතිනම්, මා හිතන්නේ ඇමතිතුමා තමන්ගේ යුතුකම් හරියාකාර ඉෂ්ට කරන්නේ නැහැ කියල කියන්න පුළුවන්.

පත්‍රවල තිබෙන ආහාර මිල සම්බන්ධයෙන් මම කියන්නේ නැහැ. "සත්" පත්‍රයේ "දවස" පත්‍රයේ තිබෙන ආහාර මිල දැක්කම බියක් ඇති වෙනවා. වැඩිවන මිල ක්‍රමය දෙස බැලූවිට කොයි විධියට පාලනයක් කරන්න පුළුවන්ද කියන එක ගැනවත් ගරු ඇමතිතුමා මේ ගරු සභාවට කියන්න ඕනෑ. දැන් ජීවත් වෙන්න බැරිව අමාරු තත්ත්වයකට වැටිලා ඉන්නවා අපේ දුඃඛිත ජනතාව. එමනිසා පැහැදිලි අවබෝධයක් අපිට දෙන්න. ඒ මොකද, බඩගින්න කියන දේ එක මිනිහෙකුට පමණක් තිබෙන දෙයක් නොවෙයි. බඩගින්න කියන දේ විශේෂයෙන්ම ධනපතින්ට නොවෙයි තිබෙන්නේ. නිර්ධන පංතියටයි බඩගින්න තිබෙන්නේ. [බාධා කිරීමක්] කෑ ගහන්න එපා.

භාණ්ඩ බෙද හැරීම සාධාරණව තිබෙන්න ඕනෑ දෙයක්. සාධාරණ බෙදීමක් කෙරෙන්නේ නැති නිසා තමයි, කොළඹ, ඒ වාගේම නගරබද ප්‍රදේශ සහ ගම්බද ප්‍රදේශවල බඩුබාහිරාදියේ මිලේ වෙනසක් තිබෙන්නේ. ඇත්තවශයෙන්ම අවංකව කියනවා නම්, අද බෙද හැරීමේ අංශය කඩා වැටිගෙන යන තත්ත්වයකට වැටිලා තිබෙනවා. ගිය සැරේ එහෙම වුණා. සමූපකාර සමිති තිබෙන තාක් කල් එවැනි තත්ත්වයක් ඇති වුණේ නැහැ. නමුත් සමූපකාර සමිති විනාශ වී ගිය සමහර තැන්වල, අපට කන්නත් නැතිව ගියා. ඒ නිසා තමයි මම කිව්වේ බෙද හැරීමේ කටයුතු පිළිබඳව මීට වඩා ක්‍රමවත් වෙන්න කියල.

I think the Hon. Minister must think seriously about the problem of hunger because it is not confined to a particular area or to a particular group. This has to be worked out and a good distribution system has to be set up. Today the distribution system is iniquitous, unjust and unequal. You must accept this position. What the poor have to get, they do not get. Of course they can get it if they can pay for it but what they want and what they really need, they do not get. I want the Hon. Minister to let us know what his policy is where the poor are concerned and where the rich are concerned.

The other day I went to the Parlour at the Race Course Avenue. There was a pound of Prima bread sold at Rs. 5.50 and another pound of Prima bread at Rs. 3.05. I bought both varieties. I did not want to bring them here and create another Dahanayake issue. I found that the bread which cost Rs. 5.50 contained the wheat bran, the wheat germ and everything else. You can buy it even today. But the poor are asked to eat the bread with the starch while the rich are given the better bread. On the next occasion I will bring both varieties here and show you the difference. I would like the distribution system to be worked out in a better way.

About two or three days ago I saw a notice in the gazette of the Democratic Socialist Republic of Sri Lanka, dated 22nd November of this year, that Credit and Thrift Societies, School Co-operatives, Producer Co-operatives, Handicraft Co-operatives, Farmers Co-operatives, Drama Artists Co-operatives and Fisheries Co-operatives are to be closed down and liquidated. It looks as if there is a calculated effort being made to liquidate these co-operatives. This is a crying shame. It is the duty of the Co-operative Department to revive them, not to close them down and liquidate them. You are smashing up in the village and in our societies the traditional teamwork that we used to have, the spirit of the new economic ventures which we were used to. All the traditions of the villages will break down if the co-operative system breaks down.

Food production has broken down because Fisheries and Vegetable and Agricultural Co-operatives have gone. Speaking about absorption and consumption, I must say that what we get in the villages from Colombo

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

is only dirt and muck. The distribution system is crumbling. I want the Hon. Minister to look into this because the berst example of how this operates is in my own electorate, Attanagalla.

අත්තනගල්ලේ සිද්ධ වෙලා තිබෙන්නෙ මොක්කද ? 1984 දක්වා ඒ සමුපකාර සමිතියේ පාඩුව දස ලක්ෂ 2යි. තවම හරි හැටි ගණන් බලා නැහැ. 46(1) වගන්තිය යටතේ සභාපතිතුමාට විරුද්ධව ක්‍රියා කරනවාය කියල ඒ කාලෙ කිව්වා. 1970 – 77 දක්වා ශ්‍රීලනිප කාලය බලන්න. ඒ වාගේම 1977 – 83 දක්වාත් බලන්න. ඊ ළඟට අලුත් සභාපතිවරයෙක් ආවා. ඊට පස්සෙත් බලන්න. ඒ තුනම බලා තීරණයක් ගන්න, කාගෙන්ද වරද සිද්ධ වී තිබෙන්නෙ කියා.

අනික් කාරණය, අත්තනගල්ලේ ප්‍රාදේශීක සමුපකාර සමිති අඩු කරන්න යනවා. කොටසක් මීරිගමට යා කරන්න යනවා. පාඩු විඳින්න ඉඩ දෙනවා. ආරක්ෂාවක් නැතුව ඒවා හොරුන්ට කඩන්න ඉඩ දී තිබෙනවා. සේවකයන් අස් කරනවා. මේ හැම එකක්ම කරන්නෙ ඒ සමිතිය විනාශ කරන්නයි. මොකද මේ සමිතිය විනාශ කළ හැටියෙ අර එක බැම්මකින් හිටපු සමුපකාර ව්‍යාපාරිකයො ටික විසුරුවා හරින්නයි මේ කල්පනා කරන්නෙ. මෙන්න මේ වාගේ වැඩ ව්‍යාපාරයක් තිබෙනවාය කියා මම ඇමතිතුමාට කියන්න කැමතියි.

ඊ ළඟට කඳඹලුවාවෙ ප්‍රාදේශිකය ගැන බලන්න. එහි සභාපති හැටියට පත් වී සිටිනවා විශේෂ සේවා නිලධාරිගේ සහෝදරයෙක්. ඔහු ගමට කිසි ආදරයක් නැති කෙනෙක්. මේ ගොඩනැගිල්ල අයිතිකාරයා, ඔහුගේ සහෝදරය, ඩබ්ලිව්. පී. තේගිස් අප්පුහාමි. එයා තමයි සභාපති. සභාපති මොකද කෙළේ ? සභාපති හාල් පොත් නැත්නම් ආහාර මුද්දර ටික හැම තැනටම බෙදලා දැම්මා. කඳඹලුවාවෙ හාල් පොත් ටික බෙම්මුල්ලට මාරු කරන්න කටයුතු කළා. මොකක්ද හේතුව ? කඩේ ලබාගන්න. තමන්ට අයිති කඩේ ගන්න. ඊ ළඟට කටුවස්කොඩ ප්‍රාදේශිකය අවුරුදු 40ක් පැරණියි. ඒකෙත් මොකද වුණේ ? සභාපතිගේ ගෙය කඩයට තිබෙන්නෙ. ඔහු හොරෙන් අත්තනගල්ලේ සභාපතිට දැන්වීමක් කළා, මේ හාල් පොත් එහෙම නැත්නම් ආහාර මුද්දර ලබන සාමාජිකත්වය දඩගමුවටයි, කලගෙඩිහේනටයි බෙද හරින්න කියල. මේ හැම දෙයක්ම කලේ කාරක සභාවේ අනුමැතියක් නැතිවයි. අවසානයේදී ප්‍රධාන සභාපති ඇවිත් බැලුවාම සම්පූර්ණ බොරුවක් හැටියටයි මේ ක්‍රියා කර තිබෙන්නෙ කියා පෙනුණා. ඔය විධියට මේ සමුපකාර සමිති විනාශ කිරීමේ වැඩ පිළිවෙළක් තිබෙනවා. ඒ නිසා සමුපකාර ව්‍යාපාරය විනාශ කරන්නට ඉඩ දෙන්නේ නැතිව කටයුතු කරන්න කියා මම කරුණාවෙන් ඉල්ලා සිටින්න කැමතියි.

මම විනාඩි දහයයි ඉල්ලා ගත්තේ ගරු කථානායකතුමනි. මම ස්තුතිවන්ත වෙනවා ගරු කොත්මලේ මන්ත්‍රීතුමාටත් (ආනන්ද දසනායක මහතා), ගරු අක්මීමන මන්ත්‍රීතුමාටත් (රිචඩ් පතිරණ මහතා) මට මේ කාල සීමාව දීම ගැන. මා ආරාධනා කරනවා තමුන්නාන්සේට කැමති කෙනෙකුට කතා කරන ලෙසට.

**ගාමිනී ජයසූරිය මහතා (කෘෂිකාර්මික සංවර්ධන හා පර්යේෂණ ඇමතිතුමා සහ ආහාර හා සමුපකාර ඇමතිතුමා)**
**(திரு. காமனி ஜயசூரிய — விவசாய அபிவிருத்தி, ஆராய்ச்சி அமைச்சரும் உணவு, கூட்டுறவு அமைச்சரும்)**
**(Mr. Gamani Jayasuriya – Minister of Agricultural Development & Research and Minister of Food and Co-operatives)**

I want to explain something. I do not agree with the hon. Member for Attanagalla. What he mentioned was completely wrong. I would like to rectify some of these things.

ගරු සභාපතිතුමනි, අත්තනගල්ලේ ගරු මන්ත්‍රීතුමා (ලක්ෂ්මන් ජයකොඩි මහතා) විරුද්ධ පැත්තේ ඉන්න කොට ජනතාව කෙරෙහි විශේෂ කණගාටුවක් දක්වනවා. මීට පෙර අපට දකින්නට නොතිබුණු කණගාටුවක්, අනුකම්පාවක්, මෛත්‍රියක් දක්වනවා මේ රටේ ජනතාව කෙරෙහි. මම කියන්න කැමතියි, මේ පරිපූරක ඇස්තමේන්තුව ඉදිරිපත් කළේ, 1974 ඉඳලා ඇති වූ පාඩු සම්බන්ධයෙන් බව. මේවා නීත්‍යානුකූලව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා සම්මත කර ගන්නටය කියා ඔඩිටර් ජනරාල්තුමා අපට දන්වා තිබුණ නිසයි මේක ඉදිරිපත් කළේ.

හාල් ගැන කතා කරන කොට, ලංකාවේ නිෂ්පාදනය කරන සහල්වල සිල්ලර මිල වැඩි වුනේ නැහැ. ලංකාවේ නිෂ්පාදනය කරන සහල්වල සිල්ලර මිල මාස හයකට ඉස්සෙල්ලත් ඒ ගණනයි, දැනුත් ඒ ගණනයි. සමුපකාරයට ගියොත් ඒවා ඒ ගනනට ලබාගන්න පුළුවන්.

පිට රටින් ගෙන්වන හාල්වල මිල වැඩි වුණා. අපි එහි මිල වැඩි කෙරුවා. මුදල් ඇමතිතුමා 5% සිට 25% දක්වා බද්දක් වැඩි කළා. ඒ වැඩි කිරීමෙන් රටට එක අතකින් ආදායමක් ලැබුණා. මිලියන 128ක තරම් විශාල මුදලක් අපේ රටට ආදයම වශයෙන් ලැබුණා. අද රටට වියදම් කරන්නට තිබෙන දේවල් දෙස බැලුවාම ඒව අවශ්‍යයි. යුද්ධ අවිආයුධ මිලදී ගැනීමට, ත්‍රස්තවාදී කටයුතු මර්ධනය සඳහා වියදම් කිරීමට තිබෙන ප්‍රමාණය දෙස බැලූ විට මම හිතනවා රජය මුලින්ම කළ යුතුව තිබෙන කටයුත්ත රජයේ වගකීම ඒවාට අවශ්‍ය මුදල් කොහෙන් හරි, කොහොම හරි සොයා ගැනීමය කියා.

ලංකාවේ නිෂ්පාදනය කරන සහල් මිල වැඩි කලේ නැහැ. පිට රටින් ගෙන්වන සහල්වල මිල වැඩි වුනා.

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
(Mr. Lakshman Jayakody)
වී මිල වැඩි කළාද ?

හාල් මිල වැඩි කලේ නැහැ කියා කිව්වා. වී මිල වැඩි කළාද ?

**ගාමිනී ජයසූරිය මහතා**
**(திரு. காமனி ஜயசூரிய)**
**(Mr. Gamini Jayasuriya)**
වී මිල ඊයෙ, පෙරේද වැඩි කළා.

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
(Mr. Lakshman Jayakody)
එතකොට සහල් මිල වැඩි වෙනවාද ? නැද්ද ?

පූ. භා. 9.30

**ගාමිනී ජයසූරිය මහතා**
**(திரு. காமனி ஜயசூரிய)**
**(Mr. Gamani Jayasuriya)**
එතකොට සහල් මිල වැඩි වෙනවා.

මම මේ කියන්නේ දැනට සිදුවී තිබෙන දේ. තවම වැඩි කරලා නැහැ. වී මිල මේ අයවැයේදී වැඩි කළා, ගොවියාට ස්ථිර මුදලක් ලබා දෙන්නට. එහෙම වැඩි වෙන කොට සහල් මිලත් වැඩි වෙන්න ඉඩ තිබෙනවා. ඒක නැහැ කියන්න බැහැ. මම හිතනවා මේ කාරණය ඕනෑම කෙනෙකුට තේරුම් ගන්නට පුළුවන්කමක් තිබෙනවා කියා. අපි ගොවියාට වැඩිපුර සල්ලි දෙන්නේ නැද්ද ? ඒ පුද්ගලයා ආරක්ෂා කරන්නේ නැද්ද ? අපි ඔහුට කියන්නේ, " අපට වැඩි වැඩියෙන් බත් කන්න දීපන්, උඹට කිසියම්ම දෙයක් අපි දෙන්නේ නැහැ " කියාද ? එහෙමද අපේ හැඟීම ? අපි කල්පනා කරන්නේ එහෙම නොවෙයි. ගොවි මහත්මයා අපට ආධාර කරන ප්‍රමාණයට අපිත් අපට පුළුවන් අන්දමින් එතුමාට කෙලෙහිගුණ සැලකීමක් හැටියට ආධාර උපකාර කරන්නටයි අපි මහන්සි දරන්නේ. ඒ අනුවයි මේ සිද්ධිය සිදු වී තිබෙන්නේ.

මුදල් ඇමතිතුමා මගේ ආහාර කොමසාරිස්ට තරමක චෝදනාවක් කර තිබෙනවා. මම ඒ දවස්වල මෙහේ සිටියේ නැහැ. පස්සේ මම මුදල් ඇමතිතුමාත් එක්ක කතා කළාම, එතුමා කිව්වා. අර ඒ වෙලාවේ කිපිලා එහෙම කිව්වාට හිත ඇතුලෙ එහෙම එකක් නැහැ කියල.

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
(Mr. Lakshman Jayakody)
මොකක්ද " ඒ වෙලාවේ කිපිල "ය කිව්වේ ? [බාධා කිරීම්]

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**සභාපතිතුමා**
**(தலைவர்)**
**(The Chairman)**

Order, please ! Please let him explain.

**ගාමනී ජයසූරිය මහතා**
**(திரு. காமனீ ஜயசூரிய)**
**(Mr. Gamani Jayasuriya)**

ආහාර කොමසාරිස්ට බැහැ මිල ගණන් වැඩි කිරීමට හෝ අඩු කිරීමට. ඒක කරනවා නම් මගේ නියෝගයක් අනුවයි කරන්නට තිබෙන්නේ. කාට හරි චෝදනා කරන්නට ඕනෑ නම් මට චෝදනා කරන්න. මාව එලවලා දමන්න. ඒ අහිංසක පුද්ගලයාට චෝදනා කරන එක වැරදියි. නමුත් ඉතින් මනුස්සයෝ ඔක්කොම මනුස්සයොනෙ. මම හිතනවා අර පත්තරෙත් තිබුණා තදේට ලියලද කොහෙද. ඕකට ටිකක් අර වචනයක් අඩුවෙන්, බැරිවෙලා ඔහොම කිව්වා.

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
(Mr. Lakshman Jayakody)

නැහැ, නැහැ.

**ගාමනී ජයසූරිය මහතා**
**(திரு. காமனீ ஜயசூரிய)**
**(Mr. Gamani Jayasuriya)**

මුදල් ඇමතිතුමා කළ ප්‍රකාශය මම බාර ගන්නවා. මොකද අවංකව කිව්වා, " ඒක වුණා තමයි. නමුත් මම ඒ විධියට ඒක ගත්තේ නැත " කියන එක.

අපේ රජය තීරණය කර තිබුණා මේ අවුරුද්දේ මුල් කාලයේ වගේ ආහාර ද්‍රව්‍ය සම්බන්ධයෙන් – සීනි, පිටි හා හාල් ගැන – පාඩුවක් නොවිඳ කටයුතු කරන්නට ඕනෑය කියන එක. නමුත් එය එසේ කිව්වාට 1980 සිට ඇති වු නොයෙක් නොයෙක් හේතු උඩ ඒක ඒ අන්දමට කරගෙන යන්නට බැරි වී තිබෙනවා. නමුත් බොහොම තදින් කියා සිටියා, මේ අවුරුද්දේ මෙය කිසිම පාඩුවක් නැතිව – ලාභ ලබා ගන්නට ඕනෑ නැහැ – කටයුතු කරගෙන යන්නය කියා. මිල අඩු කරන්නට ඕනෑද, මිල වැඩි කරන්නට ඕනෑද, කොයි කොයි ද්‍රව්‍යවල මිල වැඩි කරන්නට ඕනෑද යනාදී වශයෙන් මිල ගැන සාකච්ඡා කර රජයට උපදෙස් දෙන්නට උසස් නිලධාරීන් ගෙන් – අර්ථ ශාස්ත්‍රය ගැන හොඳ දැනීමක් ඇති අයගෙන් හා බොහෝ කාලයක් තිස්සේ රජයේ සේවය කළ අයගෙන් – සමන්විත කොමිටියක් අපේ රජයේ තිබෙනවා. ඒ නිසා මම මේ කාරණය ඒ කමිටුවට ඉදිරිපත් කලා, මෙවැනි නීතියක් තිබෙනවා ඒ නිසා මේ ගැන සොයා බලා කොයි අන්දමට මම කටයුතු කළ යුතුදැයි මට උපදෙස් දෙන්නය කියා. මේ කරුණ ගැන සාකච්ඡා කරන්නට " National Agricultural Food Policy Committeeඑක පළමු වන වරට මේ අවුරුද්දේ පෙබරවාරි මාසයේ රැස් වුණා. එහිදී මේ ප්‍රශ්නය ගැන සාකච්ඡා කර ඒ අයගෙන්ම තවත් කොමිටියක් පත් කලා තවදුරටත් මෙන්න මේ මේ කරුණු – ප්‍රමාණය කොච්චරද, ගණන කොච්චරද, වියදම කොච්චරද, පාවිච්චිය කොච්චරද, ආදී කරුණු – ඒ ප්‍රධාන කොමිටියට ඉදිරිපත් කරන්නය කියා.

ගරු සභාපතිතුමනි, මේවා පැය 24 න් කරන්නට පුළුවන් දේවල් නොවෙයි. හොඳට සොයා බලන්නට ඕනෑ. ලොකු බැරෑරුම් ප්‍රශ්නයක්. ඒ නිසා යමක් කියනවා නම් වගකීමක් ඇතිව එය කියන්නට ඕනෑ ; අදහස් ඉදිරිපත් කරන්නට ඕනෑ ; ගණන් හිලව් දෙන්නට ඕනෑ. මේවා කරන්නට යම්කිසි කාලයක් ගත වෙනවා. මේ කටයුතු කරන අයටත් තවත් නොයෙක් නොයෙක් වැඩ කටයුතු තිබෙනවා. මේකම නොවෙයි, ඒ අය කරන්නේ. මෙවැනි තවත් කමිටු තිබෙනවා, ඒ අයට යන්නට. නොයෙක් දේවල් තිබෙනවා. එවැනි වෙනත් නොයෙකුත් දේවල් නිසා කවදත් මෙය යට ගියා. ඔය අන්දමට ගොස් අන්තිමට ඔක්තෝබර් මාසය පමණ වන විට තමයි, මට යම්කිසි ස්ථිර අදහස් ටිකක් එහෙම නැත්නම් ඒ කමිටුවේ තීරණ ටිකක් ලබා ගන්නට පුළුවන් වුණේ. ඒ අනුව බැලූ විටත් ඇත්තෙන්ම මම කාගෙන්වත් අහන්නට ඕනෑ නැහැ, කල්පනා කර මටම මෙය කරන්නය කියන එකයි එහිත් තිබුණේ. නමුත් මේ තරම් භයානක තීරණයක් තනියම ගන්නට මම ටිකක් අදිමදි කලා. ඒ නිසා අපේ අනික් ඇමතිවරුන්ට මම මෙය ඉදිරිපත් කලා, මෙයයි අපට ලැබී තිබෙන උපදෙස් කියා. එවිට ඒ අයත් මට කිව්වා, " ඔව්, කරන්න තිබෙන දේවල් කරන්න " කියා. අපේ ප්‍රතිපත්තිය තේරුම් ගෙන පාඩුවක් නැතිව – ලාභයක් ඕනෑ නැහැ – මේ කටයුතු ඒ විධියට සකස් කරන්නය කියා මට කිව්වා. අන්න ඒ අනුව තමයි, වුවමනාවක් නොතිබුණත් මම ඒ කරුණු ඔක්තෝබර් මාසයේ Economic Sub Committee කියා තිබෙන ඇමතිවරුන්ගේ මණ්ඩලයට ඉදිරිපත් කලේ. එතැනින් අනුමැතියක් ලබා ගෙන මෙය ගැසට් කර ගණන් වැඩි කලා. අපි ගණන් වැඩි කලේ බොහොම සුළුවෙන් ; කරන්නට පුළුවන් තරම් අඩුවෙන්. මමත් දන්නවා හැම බඩුවකම මිල වැඩි වෙනවාට කවුරුත් ආසා නැහැ, කාටත් අමාරුවක් ඇති වෙනවා කියා. නමුත් ඒ සමගම අපි කල්පනා කරන්නට තිබෙනවා, අද රටට මුහුණ පාන්නට සිදු වී තිබෙන බැරෑරුම් තත්ත්වය ගැන. ඒක බැරෑරුම් ප්‍රශ්නයක්. කවදවත් කොයි කාලයේවත් අපි දන්න අපේ ජීවිත කාලය තුළ මෙවැනි තත්ත්වයක් අපට ඇති වී නැහැ. මේ සැම දෙයක්ම කර ඒ ප්‍රශ්නයෙන් අපි ජය ගත්තේ නැත්නම් කිසිම වැඩක් නැහැ. ඒකයි මගේ හැඟීම. ඒ නිසා මොන දුකක් විඳ හෝ අපි කවුරුත් ඒ ප්‍රශ්නයට මුහුණ දී හරියාකාරව කටයුතු කරගෙන යන්නට ඕනෑ. ඒ නිසා සතුටකින් නොවෙයි, හිතේ අමාරුවකින් හෝ මෙය කරන්න සිදු වුණා. මිල ටිකක් වැඩි කරන්නට සිදු වුණා. මම කියා සිටියා ලංකාවේ නිෂ්පාදනය කරන හාල්වල මිල වැඩි කරන්නට එපා, පිට රටින් ගෙන්වන හාල් කිලෝ එකක් සත 50 කින් වැඩි කරන්නය කියා. ඒකට හේතු තවත් තිබුණා. සියයට 5 සිට සියයට 25 දක්වා තීරු ගාස්තු වැඩි වුණා. ඒවා මම කරන්නෙ නැහැ. මීට කලින් රටේ සිදු වූ දේවල් මේවා. එයින් මිලියන 128ක බලපෑමක් ඇති වුණා.

පිටිවලට වැඩි කලේ බොහොම සුළු ප්‍රමාණයක්. පාන් රාත්තලකට වැඩිවුණේ සත 5 යි. මේ ගරු මන්ත්‍රීතුමා කියනවා ප්‍රීමා පාන් රාත්තල් දෙකක් මෙපමණ ගණන්, අනික් ඒවා ඊට අඩුයි කියා. ඒක හරි. මට මතකයි තමුන්නාන්සේලා ආණ්ඩු කරන කාලයෙත් බාස්මතී හාල් කාටවත් දකින්නට තිබුණේ නැහැ, මොන හාලක්වත් දකින්නට තිබුණේ නැහැ. නමුත් ඔය කියන පත්තරවලම තිබුණා අරලිය ගහ මන්දිරයට ගියොත් බාස්මතී හාල් ලබාගන්න පුළුවන් වෙයි කියා [බාධා කිරීමක්]

මම සාමාන්‍යයෙන් මෙහෙම කතා කරන්නෙ නැහැ. නමුත් තමුන්නාන්සේ ඔය තරම් අසාධාරණ අන්දමට කතා කරන්න පටන්ගත් නිසා අපට සිදු වෙනවා අසතුටෙන් හරි වුවමනා නැති දේවල්, හිතට වේදනා දෙන දේවල් වුනත් කියන්නට.

**ආනන්ද දසනායක මහතා**
**(திரு. ஆனந்த தஸநாயக்க)**
**(Mr. Ananda Dassanayake)**

ඒකට කමක් නැහැ.

**ගාමනී ජයසූරිය මහතා**
**(திரு. காமனீ ஜயசூரிய)**
**(Mr. Gamani Jayasuriya)**

ඒ සමගම අද රටේ ඇති වී තිබෙන රුපියලේ වටිනාකම අඩු වීමත් එයට බලපානවා. මේ අවුරුද්දේ ජනවාරි මාසයේ මුලදී ඩොලරයේ වටිනාකම රුපියල් 26.25යි. දැන් එය රු. 27.40ක් වෙලා තිබෙනවා. මෙයිනුත් පාඩුවක් ඇති වී තිබෙනවා, අපට. මෙයින් මිලියන 94ක පාඩුවක් විඳින්නට සිදු වී තිබෙනවා.

සීනිවල මිලත් වැඩි කලා. ඊයේ මම ඒ ගැන විස්තරයක් කලා. අපි මේ රටේ සීනි නිෂ්පාදනය කරන්නට යනවා නම්, ඒ ආයතනවලට වැඩ කරන්නට පුළුවන් තත්ත්වයක් ලබා දෙන්නට ඕනෑ. නිෂ්පාදනය කරන්නට යම්කිසි වියදමක් දරනවා නම් එහි සාධාරණය ගැන බලා කටයුතු කරන්න ඕනෑ. ඊට අඩුවෙන් කරන්නය කිව්වාට ඒක කරන්න බැහැ. අපේ රට අවට තිබෙන රටවල සීනි කිලෝවක් විකුණන මිල අපේ රටට වඩා වැඩියි. මට මතක හැටියට, බංග්ලාදේශයේ රුපියල් තිස් ගණනක් වෙනවා, කිලෝ එකක්. ඉන්දියාවේ රුපියල් 18ක් පමණ වෙනවා, කිලෝ එකක්. ලෝකයේ මිල රුපියල් 5යි. නමුත් රුපියල් 5කට කවදවත්, කොහේවත්, කොයි රටකවත් නිෂ්පාදනය කරන්න බැහැ. මේ නිෂ්පාදනය ආරක්ෂා කරන්න, ගොවිතැන් ආරක්ෂා කරන්න ඒ දියුණු රටවල ආණ්ඩු ගොවීන්ට මුදලක් එහෙම දීලයි ඒ නිෂ්පාදනය කරගෙන යන්නෙ. ඊට පසුව තමන්ට වැඩිපුර තිබෙන ටික ලෝකයට දෙනවා, අඩු මිලකට. අපිත් වැඩිදුර කල්පනා කරන්නේ නැතුව ඒ මොහොතට පමණක් ඒවා අඩු මිලකට ලබාගෙන, " මොනවටද අපි මීට වඩා සල්ලි ගෙවන්නේ, නිෂ්පාදනය කරන්නට " කියා හිතාගෙන වැඩ කලොත් අපි ගෙන යන මේ ව්‍යාපාර අඩපණ වෙනවා. ඒ නිසයි මේවා මෙහෙම වෙන්නෙ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ලෝක වෙළෙඳ පොළේ වෙන දේවල් මේවා. ඒ නිසා අපි මේවා තේරුම් අරගෙන ක්‍රියා කරන්න ඕනෑ. මට මතක හැටියට 1976 අවුරුද්දේ සීනි කිලෝ එකක් රුපියල් 17කුත් ගණනකට වික්කා.

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
(Mr. Lakshman Jayakody)

කවුද කියන්නෙ ?

**ගාමිනී ජයසූරිය මහතා**
(திரு. காமனீ ஜயசூரிய)
**(Mr. Gamani Jayasuriya)**

මම කියන්නෙ.

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
(Mr. Lakshman Jayakody)

සත 72ටයි. රුපියල් 5ටයි අපි වික්කේ.

**සරත්චන්ද්‍ර රාජකරුණා මහතා (නියෝජ්‍ය ආහාර හා සමුපකාර ඇමතිතුමා)**
(திரு. சரத்சந்திர ராஜகருணா — உணவு, கூட்டுறவுப் பிரதி அமைச்சர்)
**(Mr. Sarathchandra Rajakaruna – Deputy Minister of Food & Co-operatives)**

තමුන්නාන්සේලාගේ ආණ්ඩු කාලයේ සත 72කට දුන්නා සීමාසහිත ප්‍රමාණයක්.

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
(Mr. Lakshman Jayakody)

ඔව්. සත 72ටයි, රුපියල් 5ටයි දුන්නේ.

සරත්චන්ද්‍ර රාජකරුණා මහතා
(திரு. சரத்சந்திர ராஜகருணா)
**(Mr. Sarathchandra Rajakaruna)**

නැහැ, තමුන්නාන්සේලාගේ රජයෙනුත් කිලෝව රුපියල් 17කුත් ගණනකට විකුණුවා.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
**(Mr. Ananda Dassanayake)**

අපි කෙළින්ම ඒක ප්‍රතික්ෂේප කරනවා. එහෙම එකක් තිබුණෙ නැහැ. සත 72ට දුන්නා. කොන්ට්‍රෝල් ක්‍රමයට නැත්නම් සලාකයට. අනික් එක දුන්නේ රාත්තල රුපියල් 5ට ඕනෑ කෙනෙකුට ගන්න.

මන්ත්‍රීවරයෙක්
(அங்கத்தவர் ஒருவர்)
**(A Member)**

කිලෝ එක පහට ?

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
**(Mr. Ananda Dassanayake)**

නැහැ රාත්තල පහට.

සරත්චන්ද්‍ර රාජකරුණා මහතා
(திரு. சரத்சந்திர ராஜகருணா)
**(Mr. Sarathchandra Rajakaruna)**

රුපියල් 7.50ටත් රාත්තල තිබුණා, තමුන්නාන්සේලාගේ කාලයේ.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
**(Mr. Ananda Dassanayake)**

නැහැ, නැහැ, රුපියල් 5ට වැඩියෙන් ගියේ නැහැ.

**ගාමිනී ජයසූරිය මහතා**
(திரு. காமனீ ஜயசூரிய)
**(Mr. Gamani Jayasuriya)**

දැන් ඒ ගැන තර්ක කරන්න වුවමනා නැහැ. මට ලැබුණු තොරතුරු අනුව මම කිව්වෙ. මම කියන එක වැරදි වෙන්න පුළුවන්. වැරදි නම් වැරදියි, හරි නම් හරිය කියා පිළිගන්න.

**මන්ත්‍රීවරයෙක්**
(அங்கத்தவர் ஒருவர்)
**(A Member)**

දිරව්ච ලුණුවක් දීලා, කවුද.

**ගාමිනී ජයසූරිය මහතා**
(திரு. காமனீ ஜயசூரிய)
**(Mr. Gamani Jayasuriya)**

නැහැ, නැහැ, ඔයගොල්ලො තමයි දිරව්ච ලුණු දෙන්නෙ. කාරණා නොදැන නොවෙයි ඔය කතා කරන්නෙ. ඔයගොල්ලො දන්නවා කාරණාව හොඳට. පුළුවන් නම් මේකෙන් රටේ අවුලක් ඇති කරන්න ඕනෑ කියන අදහසිනුයි මේක කරන්නෙ. එහෙම නැතුව ඔයගොල්ලො මෝඩයො නොවෙයි. හොඳට කාරණා දන්න උදවිය. හොඳ පළපුරුද්දක් තිබෙන මන්ත්‍රීවරු. මෙයින් ප්‍රයෝජනයක් ගන්නට, යම්කිසි පිරිසක් මුලා කරන්නට—

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
(Mr. Lakshman Jayakody)

සීනිවලින් අය කරගන්නෙ කොමිස් කාක්කො. කොමිස් කාක්කො සිය දහස් ගණනක් මෙහෙ ඉන්නවා.

**සභාපතිතුමා**
**(தலைவர்)**
(The Chairman)

Order, please ! Shall we come back to the Votes ?

**ගාමිනී ජයසූරිය මහතා**
(திரு. காமனீ ஜயசூரிய)
**(Mr. Gamani Jayasuriya)**

අපි මේ කාරණා පිළිගන්න ඕනෑ. අපට මේවා මුහුණපාන්න වන දේවල්. මොකද කරන්නෙ ? අසතුටෙන් හරි කරන්න සිද්ධ වෙනවා. නොයෙක් හේතුන් මම කිව්ව නේ ? මේවායේ මිල ටිකක් වැඩි කරන්න සිද්ධ වුණේ මොන හේතුවක් නිසාද කියල මම කිව්ව නේ ? මීටත් වඩා වැඩි කරන්න මට අවස්ථාවක් ඇති නොවේවායි මම ප්‍රාර්ථනා කරනවා. නමුත් රටේ මොනවා වෙයිද කියල කියන්න බැහැ. ආහාර වර්ග තුනක් මට පාලනය කරන්න තිබෙනවා. සීනි, පිටි, හාල්.

**මන්ත්‍රීවරයෙක්**
(அங்கத்தவர் ஒருவர்)
**(A Member)**

පාන්.

**ගාමිනී ජයසූරිය මහතා**
(திரு. காமனீ ஜயசூரிய)
**(Mr. Gamani Jayasuriya)**

ඔව්, පිටිවලින් එන්නෙ පාන් තමයි.

**මන්ත්‍රීවරයෙක්**
(அங்கத்தவர் ஒருவர்)
**(A Member)**

කේකුත් තියෙනවා.

**ගාමිනී ජයසූරිය මහතා**
(திரு. காமனீ ஜயசூரிய)
**(Mr. Gamani Jayasuriya)**

කේක්වල ගණන් වැඩි කරන්නෙ තමුන්නාන්සේලා පාවිච්චි කරන නිසා.

මේ වර්ග තුන මට පාලනය කරන්න සිදු වී තිබෙනවා. පොදුවේ රට දෙස බලන විට මේවා පාඩුවට වෙළඳාම් කරගෙන යන්නට ඉඩ දෙන්න බැහැ. විශේෂයෙන් අද රට මුහුණපා තිබෙන තත්ත්වය අනුව එහෙම කරන්න ඉඩ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගාමනී ජයසූරිය මහතා]

දෙන්න බැහැ. අන්න ඒ නිසා රජයට පාඩු වෙන්නෙ නැතිව රජයට බරක් වෙන්නෙ නැතිව මේ කටයුත්ත කරන්න ඕනෑ. ත්‍රස්තවාදය මැඩපැවැත්වීම සඳහා රජයට දෙන්න පුළුවන් සෑම ආධාරයක්ම සෑම විධියකින්ම දෙන්න මම සූදානම්. තමුන්නාන්සේලා චෝදනා කරනවා නම් මට චෝදනා කරන්න. නමුත් මගේ හැඟීම ඒකයි. ඒ අනුව මම හිතනවා මම හරියි කියා. මේ අවස්ථාවේදී රජයට පාඩුවක් විඳින්න ඉඩ දෙන්න බැහැ. අන්න ඒ ප්‍රතිපත්තිය අනුව මම කටයුතු කරගෙන යනවා.

**සරත් මුත්තෙට්ටුවෙගම මහතා (කලවාන)**
**(திரு. சரத் முத்தெட்டுவெகம — கலவான)**
**(Mr. Sarath Muttetuwegama – Kalawana)**

ගරු සභාපතිතුමනි, අපේ ගරු ඇමතිතුමා දවසක් විවේක අරගෙන එතුමාගේ අමාත්‍යාංශවල දෙවැනි භාගය පිළිබඳ සාකච්ඡාව අද ආරම්භ කර තිබෙනවා. එතුමා අද දීර්ඝ කථාවක් කළා. ආහාර කොමසාරිස්තුමාගේ නිවැරදිභාවය ගැන එතුමා කියා සිටියා. මමත් එය පිළිගන්නවා. ආහාර කොමසාරිස්තුමාට — මම නම් ඒ මහත්මයා ගැන දන්නෙ නැහැ — දෙස් කියල කිසිම ඵලක් නැහැ. ආහාර කොමසාරිස්වරයා මේ රටෙ මිනිසුන් කෙරෙහි ද්වේශ සහගතව බඩු මිල උස්සන්නෙ නැහැ. දැන් ඇමතිතුමත් කිව්ව අන්දමට කැබිනට් මණ්ඩලයේ අනු කාරක සභාවක් තීරණය කළ මිල ගණන් තමයි, ඒ නියෝගය තමයි, ආහාර කොමසාරිස්වරයා ක්‍රියාත්මක කරන්නෙ. මුදල් ඇමතිතුමාගේ පැමිණිල්ල වුයේ ඒ නියෝගය හුඟක් කලින් දී තිබුණාය. ආහාර කොමසාරිස්තුමා අයවැය ලේඛනය එන තෙක් ඒ නියෝගය ක්‍රියාත්මක කිරීම ප්‍රමාද කළාය කියන එකයි. එහෙම නම් ආහාර කොමසාරිස්තුමාට මිනිස්සු කෘතඥ වෙන්න ඕනෑ මොකද, හුඟක් කලින් දුන්න නියෝගයක් ක්‍රියාත්මක නොකිරීම නිසා යම්කිසි කාලයක් තුළ වැඩි මිලක් නොගෙවා ඉන්නට මිනිසුන්ට පුළුවන් වුණා.

මෙතන ප්‍රශ්නය තිබෙන්නෙ ආහාර කොමසාරිස්තුමා නියෝගය දුන්නාද, ඇමතිතුමා නියෝගය දුන්නාද, කැබිනට් මණ්ඩලය නියෝගය දුන්නාද කියන එක නොවෙයි. මම පිළිගන්නෙ නැහැ — මට සමාවෙන්න — මේ කරන්නෙ ත්‍රස්තවාදය කියන එක මැඩපවත්වන්නට උදව් කරන්න සල්ලි එකතු කරන වැඩක්ය කියා එය පිළිගන්න බොහොම අමාරුයි. මෙය, අද තමුන්නාන්සේලා වෙළඳ පොළේ ක්‍රියාත්මක කර තිබෙන නීති දමය නිසා තමුන්නාන්සේලාටත් පාලනය කර ගන්න බැරි මිල වැඩිවීම්වල එක්තරා නිදර්ශනයක් පමණයි. මෙය තව දිගටම සිදුවෙනවා. තමුන්නාන්සේලා ඉන්න තාක් කල්, විවෘත වෙළඳ පොළේ මේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරන තාක් කල්, තමුන්නාන්සේලා මිල පාලනය ප්‍රතික්ෂේප කරන තාක් කල්, තමුන්නාන්සේලාගේ පාලනය මේ විධියට දිරාපත් වෙන්න යන්න දෙන තාක් කල් මේ බඩු මිල පාලනය කරන්න බැරි වෙනවා. එය එන්න එන්නම ඉහළ යනවා. කැබිනට් සබ් කොමිටි එක තිබුණත් ඉහළ යනවා. කැබිනට් සබ් කොමිටි එක නැතත් ඉහළ යනවා. තමුන්නාන්සේලාට එය වළක්වන්න බැහැ. මෙය තමුන්නාන්සේලාට අද තිබෙන්නා වූ උභතෝකෝටික ප්‍රශ්නයක්. මොකද කරන්නෙ ? එක පැත්තකින් මහජනතාව නොසන්සුන්තාවයකින් පෙළෙනවා. මේ ජීවන වියදම මහජනතාවට උසුලන්න බැහැ. අනික් පැත්තෙන් තමුන්නාන්සේලා ක්‍රියාත්මක කර තිබෙන වෙළඳ ක්‍රමයේ ඒ ව්‍යුහය නිසා අද තමුන්නාන්සේලාට පාලනය කරන්න බැරි විධියට බඩු මිල ඉහළ නගින්න පටන් ගෙන තිබෙනවා. ඒ සම්බන්ධයෙන් තිබෙන එකම සැනසිල්ල තමයි සමුපකාරය. නමුත් සමුපකාර ව්‍යාපාරය අද ඉතාම අමාරු තත්ත්වයකට පත් වී තිබෙන බව මම මුලදීම කියන්න ඕනෑ. එවැනි අවධියක සමුපකාර ව්‍යාපාරය සම්පූර්ණයෙන්ම දිය වී යෑම වළක්වන්න ගරු ඇමතිතුමා යම් කිසි උත්සාහයක් ගෙන තිබෙනවා. ගරු ඇමතිතුමා පසුගිය කාලයේදී සමුපකාරයට දී තිබෙන මුදල් පහසුකම් ටික දෙන්න එතුමාට ලොකු සටනක් කරන්න සිදු වන්න ඇති.

තමුන්නාන්සේලාගේ මුළු ක්‍රමයම සකස් වී තිබෙන ආකාරය දෙස බැලුවාම කියන්න තියෙන්නේ තමුන්නාන්සේලාට සමුපකාරය තිබුණත් එකයි නැතත් එකයි වගේ බවයි. නැත්නම් වඩා හොඳයි. තමුන්නාන්සේලා පිටුපසින් තිබෙන බලවේගවලට, ඉන්න මුදලාලිලාට හා වෙනත් ව්‍යාපාරවලට සමුපකාරය නැති තරමට හොඳයි. නමුත් ගරු ඇමතිතුමා පසුගිය කාලයේ මේ මුදල් ටික ලබා දෙන්න උත්සාහයක් දරා තිබෙනවා. එතුමාට ඒ අතින් ලොකු අමාරුවක් ඇති වෙන්න ඇති.

සමුපකාර කීපයකට අද සිදු වී තිබෙන දේ බලන්න. ඔක්කෝම සමුපකාර ගැන කියන්න වුවමනාවක් නැහැ. අද මේ තිබෙන තත්ත්වය නිසා මේ ආකල්පය නිසා සමුපකාරයට සිදු වී තිබෙන හරිය බලන්න. කොළඹ උතුර සමුපකාර සමිතිය කලක් ලාභ ලබමින් තිබුණු සමිතියක්. යම් යම් භාණ්ඩ මිලට ගැනීමේ හැකියාව ඇති ශක්තිමත් පාරිභෝගිකයන් පිරිසක් සිටි සමිතියක්. විශාල ජනගහනයක් ආශ්‍රිතව හද තිබුණු සමිතියක්. නමුත් අද එය සම්පූර්ණයෙන්ම වසා දමන්න සිදු වී තිබෙනවා. රාගල සමුපකාර සමිතියේ— ආරංචියේ හැටියට—ලක්ෂ විසි හයක මුදල් වංචාවක් සිදු වී තිබෙනවා. දැන් එය වසා දමා තිබෙනවා. බිබිලේ, කොටගම සමුපකාර වංචාවක් වෙලා තිබෙනවා. ආරංචියේ හැටියට ලක්ෂ දහතරක්. ඒකෙ තත්ත්වයත් ඉතාම අවදානම්.

මේ ඔක්කෝටම හපන් සමිතිය කොළඹ තිබෙන, විශාල මුදලක් පාලනය වුණ, අධ්‍යාපන සේවකයන්ගේ සකසුරුවම් සහ ණයදෙන සමිතියයි. මේක පුදුම සමිතියක්. ඒකේ සභාපති තමුන්නාන්සේලාගේ යාළුවෙක්. හොඳ යාළුවෙක්. ජාතික සේවක සංගමයේ ලොකු නායකයෙක්. එයා කියන හැටියට—අපි දන්නේ නැහැ—මේ ඇමතිවරුන්ට එයා කතා කරනවා කියන්නේ සුරතල් නම්වලින්. මේ, අධ්‍යාපන සේවකයන්ගේ සකසුරුවම් හා ණය දෙන—සකසුරුවම්කමක්මක් ඒකේ නැහැ—සමිතියේ ලොක්කා.

මේ සම්බන්ධයෙන් මේ මාසෙ හත් වැනිද 'දිවයින' පත්‍රයේ පළවුණු ලිපියක් මා ළඟ තිබෙනවා. එය අධ්‍යාපන සේවක ණයදෙන සමිතියේ අක්‍රමිකතා ගැනයි. එය කියවා බලන එක මේ මන්ත්‍රීතුමන්ලාට හුඟාක් ප්‍රයෝජනවත් වෙයි. ඒ සමිතියේ ළඟදී ඇති වී තිබෙන තත්ත්වය එයින් පෙනෙනවා. ගුරුවරුන් සඳහා දිනපොත්—

**ගාමනී ජයසූරිය මහතා**
**(திரு. காமனி ஜயசூரிய)**
**(Mr. Gamani Jayasuriya)**

Are you speakin on the Appropriation Bill ?

**සරත් මුත්තෙට්ටුවෙගම මහතා**
**(திரு. சரத் முத்தெட்டுவெகம)**
**(Mr. Sarath Muttetuwegama)**

No, we are at the Committee Stage.

**ගාමනී ජයසූරිය මහතා**
**(திரு. காமனி ஜயசூரிய)**
**(Mr. Gamani Jayasuriya)**

This has become a general debate now.

**සරත් මුත්තෙට්ටුවෙගම මහතා**
**(திரு. சரத் முத்தெட்டுவெகம)**
**(Mr. Sarath Muttetuwegama)**

I am not speaking on the Supplementary. I did not know what had happened ; when I came here I thought it was the Committee Stage going on and I presume it is.

පිළිගත් පරිදි මිල ගණන් නොකැඳවා ගුරුවරුන් සඳහා දිනපොත් හැට දහක් අච්චු ගැසීමට රුපියල් දහ තුන් ලක්ෂයකට අධික මුදලක් වැය කර තිබෙනවා, මේ අධ්‍යාපන සේවක සකසුරුවම් සමිතිය. ඉල්ලුම තිබෙන්නේ දිනපොත් දහ දහකට පමණයි. සමිතියට මේකෙන් ඇති වී තිබෙන පාඩුව ලක්ෂ දහසයයි. මේ, ජාතික සේවක සංගමයේ සකසුරුවම් නායකයෙක්.

ඊට පස්සේ එයාකර තිබෙන හරිය මේ බලන්න. මේ අධ්‍යාපන සේවක සකසුරුවම් සමිතියට විශාල මුදලක් තිබෙනවා. බණ්ඩාරවෙල ගුරුවරුන්ගේ නිවාඩු නිකේතනයක් සඳහා — ඉඩමක්වත් තවම අරගෙන නැතිව — ගෘහ නිර්මාණ ශිල්පියාට ලක්ෂ දෙක හමාරක් දී තිබෙනවා. ඉඩමත් නැහැ. නමුත් ආකිටෙක්ට ලක්ෂ දෙක හමාරක් දී තිබෙනවා. ඉඩමත් නැහැ. නමුත් ආකිටෙක්ට්ට ලක්ෂ දෙක හමාරක් දී තිබෙනවා. ආයෙත් අනුරාධපුරයේ ගුරු ගම්මානයක් සඳහා — ඉඩමක් අරගෙන නැහැ — ගෘහ නිර්මාණ ශිල්පියාට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ලක්ෂයක් දී තිබෙනවා. අපරාදේ කියන්න බෑ, මේ සකසුරුවම් නිලධාරියා ගෘහ නිර්මාණ කටයුතුවලට හුඟාක් උත්සාහ කරන කෙනෙක්. අම්පාරේ ගුරු ගම්මානයක් පිහිටුවන්න – තවම ඉඩමක් නැහැ – අර කියාපු ගෘහ නිර්මාණ ශිල්පියාටම එකසිය තිස් අට දහක් දී තිබෙනවා.

මන්ත්‍රීවරයෙක්
(அங்கத்தவர் ஒருவர்)
(A Member)
නම කියන්න.

සරත් මුත්තෙට්ටුවෙගම මහතා
(திரு. சரத் முத்தெட்டுவெகம)
(Mr. Sarath Muttetuwegama)
නම මොකටද මම කියන්නෙ.

කැස්බෑවෙත් තව ගම්මානයක් පිහිටුවන්න හදල තියෙනවා. සැලැස්මක් හෝ ඇස්තමේන්තුවක් නැහැ. එතැන ඉඩම තිබෙනවා. 'ආකිටෙක්ට්' කෙනෙකුට සැලැස්මක් – ප්ලෑන් එකක් – තිබෙන්න එපායැ. ඇස්තමේන්තුවක් තිබෙන්න එපායැ. සල්ලි දෙන්න ඉස්සෙල්ලා. මේ ගෘහ නිර්මාණ ශිල්පියා තමුන්නාන්සේ හොයා ගන්න. එයාගේ පින්තූරයක් තමුන්නාන්සේගේ අමාත්‍යාංශයේ එල්ලා ගන්න. ඒ ගෘහ නිර්මාණ ශිල්පියාට එක්ලක්ෂ එකොළොස් දහක් දීලා තිබෙහවා. දොම්පේ, බියගම – නියෝජ්‍ය ඇමතිතුමා මේ ගැන හොඳට දන්නවා. – ගුරු ගම්මානයක් සඳහා දීලා තිබෙනවා. රුපියල් හාර ලක්ෂ විසි දහක ඒත් 'ආකිටෙක්ට්' මහත්මයාට. [බාධා කිරීම්]

සරත්චන්ද්‍ර රාජකරුණා මහතා
(திரு. சரத்சந்திர ராஜகருணா)
(Mr. Sarathchandra Rajakaruna)
දොම්පෙ කාටද දුන්නේ ? ඉඩම ගන්න දුන්නේ ?

සරත් මුත්තෙට්ටුවෙගම මහතා
(திரு. சரத் முத்தெட்டுவெகம)
(Mr. Sarath Muttetuwegama)
නැහැ. නැහැ. දොම්පෙ මම දන්නේ නැහැ. 'ආකිටෙක්ට්' මහත්මයාට දුන්නාද කියා. දොම්පෙ කාටද දුන්නෙ ?

සරත්චන්ද්‍ර රාජකරුණා මහතා
(திரு. சரத்சந்திர ராஜகருணா)
(Mr. Sarathchandra Rajakaruna)
ඉඩම ගන්න ඒක දීලා තිබෙන්නේ ආණ්ඩුවටමයි. 'එල්ආර්සී' එකට.

සරත් මුත්තෙට්ටුවෙගම මහතා
(திரு. சரத் முத்தெட்டுவெகம)
(Mr. Sarath Muttetuwegama)
එහෙමනම් එතන පටන්ගෙන තිබෙන්නේ තිවැරදි විදියටයි. කමක් නැහැ, කාට දුන්නත් ඉඩම අරගන තිබෙනවා. අපරාදෙ කියන්න බැහැ, දොම්පෙ තමුන්නාන්සේ ඉන්න නිසා වෙන්න ඇති ඒ පැත්තේ, එතැන නියම නැතිත් පටත් ගෙන තිබෙන්නේ, ඉඩම අරගෙන. [බාධා කිරීම්] නැහැ. නැහැ. වාර්තා වැරදි නම් කියාවි නෙ. සමිතියේ සල්ලි හරියට තිබෙනවා. තව ඉවර නැහැ, මේ ව්‍යාපාරය පුංචි බොරුල්ලේ–

ගාමිනී ජයසූරිය මහතා
(திரு. காமனி ஜயசூரிய)
(Mr. Gamani Jayasuriya)
අනික් ටිකත් කියන්න. තමුන්නාන්සේ ඔය කියන්නේ අපේ විභාගයෙන් සොයාගත් කරුණුනෙ. විභාගයක් කරගෙන යනවා. ඒ ගැන ඉතුරු හරිය අපිට කියන්න පුළුවන්.

සරත් මුත්තෙට්ටුවෙගම මහතා
(திரு. சரத் முத்தெட்டுவெகம)
(Mr. Sarath Muttetuwegama)
මම අහන්න සතුටුයි, ඒ මහත්මයා ගැන මොනවාද කරලා තිබෙන්නේ කියා.

ගාමිනී ජයසූරිය මහතා
(திரு. காமனி ஜயசூரிய)
(Mr. Gamani Jayasuriya)
ඒ කියන්නේ දැන් මේ ගැන විභාගයක් කර ගෙන යනවා. ඒ විභාගය දැන් අවසාන වෙන්න ළං වෙලා තිබෙනවා. අවාසනාවකට මේවා විභාග කරන උදවියට ස්ප්‍රිතාලයට යන්න වෙලා තිබෙනවා. ඒ අය ආ හැටියේම නැවත විභාගය කරගෙන යනවා.

සරත් මුත්තෙට්ටුවෙගම මහතා
(திரு. சரத் முத்தெட்டுவெகம)
(Mr. Sarath Muttetuwegama)
මම කියන්න ගියේ වෙන දෙයක්. තමුන්නාන්සේත් හොඳටම දන්නවා, නියෝජ්‍ය ඇමතිතුමාත් හොඳටම දන්නවා, අපි සැම දෙනාමත් දන්නවා, පොඩි සමුපකාරයක, ප්‍රාදේශිකයක ඉන්න කළමනාකාරවරයෙකු රුපියල් දෙතුන්දහක "ලීකේජ්" එකක් තිබුණොත් පොලීසියට පැමිණිලි කළාම ඇප නැතිව රිමාන්ඩ් භාරයේ තබා ගන්නවා.

ගාමිනී ජයසූරිය මහතා
(திரு. காமனி ஜயசூரிய)
(Mr. Gamini Jayasuriva)
එහෙමවත් වෙනවා නම් කාරියක් නැහැ. එහෙමවත් වෙන්නේ නැති එකයි, මට තිබෙන ප්‍රශ්නය. පොලීසියට කිව්වාම ඒ අය මේ ගැන බලන්නේ බොහොම පරක්කු වෙලා. ඒකයි වෙලා තිබෙන කරදරේ.

සරත් මුත්තෙට්ටුවෙගම මහතා
(திரு. சரத் முத்தெட்டுவெகம)
(Mr. Sarath Muttetuwegama)
තමුන්නාන්සේගේ දෙපාර්තමේන්තුව ඔය තරම් අසරණ නැහැ. මම දන්නවා. මම දකලා තිබෙනවා. මම මේ කියන්නේ හරිද වැරදිද කියන එක නොවෙයි. ලක්ෂ ගණන් ගහල තියෙන මිනිහා නිදැල්ලේ ඉන්නවා. [බාධා කිරීම්] මොන රිමාන්ඩ්ද ? රිමාන්ඩ් නොවෙයි එයා මම කිව්ව විධියට සුරතල් නම්වලින් ඇමතිතුමන්ලා අමතා කථා කරනවා. සුරතල් නමින් ඇමතිතුමාට කථා කරනවා.

මන්ත්‍රීවරයෙක්
(அங்கத்தவர் ஒருவர்)
(A Member)
ඒ සුරතල් නම් කියන්න බලන්න.

සරත් මුත්තෙට්ටුවෙගම මහතා
(திரு. சரத் முத்தெட்டுவெகம)
(Mr. Sarath Muttetuwegama)
මම කියන්නෙ නැහැ. තමුන්නාන්සේලා දන්නේ නැහැ, ඒ සුරතල් නම්. ඒ ගොල්ලො තමයි, ඒව දන්නෙ.

ගාමිනී ජයසූරිය මහතා
(திரு. காமனி ஜயசூரிய)
(Mr. Gamini Jayasuriya)
මට කොහොමද කියන්නේ ? මොකක්ද මගෙ සුරතල් නාමය ?

සරත් මුත්තෙට්ටුවෙගම මහතා
(திரு. சரத் முத்தெட்டுவெகம)
(Mr. Sarath Muttetuwegama)
තමුන්නාන්සේට කියන්නේ නැහැ. තමුන්නාන්සේ සමඟ කථා කරන්නේ නැහැ. කථා කරන ඇමතිතුමන්ලාත් සමඟ සුරතල් නමින් කථා කරනවා.

එම නිසා මම මේ කියන්න ගියේ මේන්න මෙයයි. මේ වැඩේ දැන් සමිති ගණනාවක වේගෙන යන වැඩක්. අපේ පළාත්වලත් සමිති තිබෙනවා. ගරු ඇමතිතුමනි, බොහොම අමාරුවෙන් අපි ඒවා ඒ පළාත්වල නඩත්තු කරන්නේ. මගේ ඡන්ද කොට්ඨාශයේ සමිතියක් තිබෙනවා. ඉතාමත් අමාරුවෙන් නඩත්තු කරන්නේ. එක කොණක ඉඳලා අනෙක් කොණට හැතැප්ම 72 ක් දිගයි. එක ප්‍රාදේශිකයකට පාරිභෝගිකයන් දහක් හමාරක්වත් නැති සමිති තියෙනවා. ප්‍රවාහන ගාස්තු ඉතාමත් අධිකයි. ගොඩනැගිල්ලක් නැහැ. මුරකරුවෝ නැහැ. මොකුත් නැහැ. එහෙම සමිතිවල යන්නම් මැනේජර් මහත්මයෙකුගෙ රුපියල්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[සරත් මුත්තෙට්ටුවෙගම මහතා]

දෙදහක ලීකේජ් එකක් තිබුණොත් රිමාන්ඩ් කරනවා. මේ වගේ ගෘහ නිර්මාණ ශිල්පියාට ඉඩම් නැතිව සල්ලි දීපු උදවිය නිදැල්ලේ ඉන්න කොට සාමාන්‍ය මිනිසුන්ට හිතේ අමාරුවක් ඇති වෙනවා. ඒක ස්වාභාවික දෙයක්.

**ගාමිනී ජයසූරිය මහතා**
**(திரு. காமினி ஜயசூரிய)**
**(Mr. Gamani Jayasuriya)**

මේවා දැනගත්තාම විභාග කරන්නට තිබෙනවා. ඒ සඳහා යම්කිසි වැඩපිළිවෙලක් තිබෙනවා. ඒ රාමුව ඇතුළෙයි, අපිට වැඩ කරන්න තිබෙන්නේ.

**සරත් මුත්තෙට්ටුවෙගම මහතා**
**(திரு. சரத் முத்தெட்டுவெகம)**
**(Mr. Sarath Muttetuwegama)**

නැහැ. නැහැ.

**ගාමිනී ජයසූරිය මහතා**
**(திரு. காமினி ஜயசூரிய)**
**(Mr. Gamani Jayasuriya)**

මේක රුසියාවේ වගේ එක පාරටම හිතුවක්කාර අත්දමට අරක මේක කරන්න අමාරුයි. තමුන්නාන්සේලා එහෙම බලයක් දෙනවා නම් හොඳයි කියලා හිතාගෙන ක්‍රියාකරනවා නම්, අනෙක් මන්ත්‍රීවරුත් එහෙම හිතනවා නම්, අපිට පුළුවන් ක්‍රියා කරන්න. නැත්නම්, අපිට තිබෙන්නේ ප්‍රජාතන්ත්‍රවාදයය කියලා එක්තරා නීති රාමුවක් ඇතුලේ වැඩ කරන්නයි.

**සරත් මුත්තෙට්ටුවෙගම මහතා**
**(திரு. சரத் முத்தெட்டுவெகம)**
**(Mr. Sarath Muttetuwegama)**

ඔව්. රුසියාවේ, අර පිටකොටුවේ තිබෙන තොග කඩ ටික නැහැ. සමුපකාර ඔක්කොම ඔය තොග කඩවලට ගිහිල්ලා බඩු ගන්න ඕනැ. රුසියාවේත් ඒවා තිබුණා නම් මේ වගේ තමයි. තොග කඩ එහෙ නැහැ.

මේක විහිළුවක් නොවෙයි. ගරු ඇමතිතුමා පරිශ්‍රමයක් ගන්නවා, සමුපකාර සමිති සේදියාමෙන් වළක්වන්න මම එය පිළිගන්නවා. මම ඒකට සම්පූර්ණයෙන්ම සහයෝගය දක්වන අතර, තමුන්නාන්සේලා ගෙන යන මේ තත්ත්වය යටතේ ඒක කරන්නට තමුන්නාන්සේලාට පුළුවන්කමක් නැහැ. මොකද ? සමුපකාර ව්‍යාපාරය පැවැත්වීම තමුන්නාන්සේලාගේ අතීක් චුවමනාවලට වඩා පටහැනියි. එම නිසා තමයි, මේ ප්‍රශ්න සියල්ලක්ම ඇති වී තිබෙන්නේ. අද බලන්න, මහජන බැංකුව සමුපකාර සමිති සමග ඇති සම්බන්ධතාව. මහජන බැංකුවේ උපත ඇති වුණේ සමුපකාර සමිති නිසයි. ඉලංගරත්න මහත්මයායි මේක පටන් ගත්තේ. ඒ කාලයේ මේ සමුපකාර සමිතිවලට බද්ධ කළ බැංකුවක් හැටියටයි, පවත්වා ගෙන ආවේ. සමුපකාර සමිති නිසා උපත ලැබූ මෙම බැංකුව සමුපකාර සමිතිවල සේවය සඳහා නිරත වුණා. අද මොකද ඇති වී තිබෙන තත්ත්වය ? දැන් මේක වාණිජ බැංකුවක් වී තිබෙනවා පමණක් නොවෙයි, පෞද්ගලික ව්‍යාපාරිකයන්ට දෙන පහසුකම් සමුපකාර සමිති ක්ෂේත්‍රයට දෙන්නේ නැහැ. මේ සම්බන්ධයෙන් බැංකුවේ සමහර නිලධාරි මහතුන් සමග මම කථා කලා. පෞද්ගලික ව්‍යාපාරිකයන් තරම් සමුපකාර සමිති ණය ගනුදෙනුවලදී විශ්වාසයක් තබන්නට බැහැ, පෞද්ගලික ව්‍යාපාරිකයන් ණය මුදල් ආපසු ගෙවනවා, නමුත් බොහොමයක් සමුපකාර සමිති ඒ අන්දමට ගෙවන්නේ නැහැ. 'ඔන්න ඔය විධියට මට ඒ නිලධාරීන් කිව්වා. එවැනි නොයෙක් නොයෙක් තත්ත්වයන් ඇති. මම ඒක නැතැයි කියන්නේ නැහැ. වගකීමකින් තොරව ඒ විධියට මට කියන්නට පුළුවන්කමක් නැහැ. සමුපකාර සමිති අමාරුවේ වැටුණු තැන් තිබෙනවා. ණය ආපසු ගෙවීමේදී ප්‍රශ්න ඇති වෙන්නට ඇති. නමුත් මේක රජයේ බැංකුවක් බව අප මතක තබා ගන්න ඕනැ. එම නිසා කැබිනට් මණ්ඩලය සමග සාකච්ජා කර, සමුපකාර සමිතිවලට මහජන බැංකුවෙන් විශේෂ පහසුකම් සලසා දීමට කටයුතු කරන්න ඕනැ.

පු. භා. 10

ගරු සභාපතිතුමනි, මෙයට සම්බන්ධ තවත් ප්‍රශ්නයක් තිබෙනවා. සමුපකාර සමිතිවලට කිසියම් සීමාවක් පනවා තිබෙනවා. ගණුදෙනුවලදී සමුපකාර සමිති මහජන බැංකුවටම යන්න ඕනැ. වෙනත් බැංකුවක් සමග ගණුදෙනු කරන්නත් බැහැ. අදාල ඇමතිතුමා දැන් ගරු සභාවේ සිටීම ගැන මම සතුටු වෙනවා. නමුත් මහජන බැංකුව පෞද්ගලික ව්‍යාපාරිකයන්ට දෙන පහසුකම් සමුපකාර සමිතිවලට දෙන්නේ නැති බව සොයා බැලුවොත් එතුමාටම පෙනේවි. වුවමනා නම් ඒකට නිදර්ශන ගණනාවක්ම මට කියන්නට පුළුවනි. නමුත් මා හිතන හැටියට එසේ කිරීම අවශ්‍ය වන්නේ නැහැ. කොහොම වුණත් දැන් පවතින තත්ත්වය ඒකයි.

ගරු සභාපතිතුමනි, බැංකුවේ සමහර නිලධාරීන් සමග පෞද්ගලිකව මේ ගැන සාකච්ජා කලාම, මම කලින්නුත් සඳහන් කලා වාගේ, ඒ අය මට කිව්වා, සමුපකාර සමිති ගැන වාණිජ වශයෙන් විශ්වාසයක් තබන්නට බැරිය, සමහර තැන්වල පොරොන්දු කඩ කර තිබෙනවාය, හරියාකාර ගෙවීම් කර නැත ආදී වශයෙන්. ඒ වාගේ නිදර්ශන ඕනැවටත් වැඩියෙන් පෙන්වන්න පුළුවනි. නමුත් මේ රජයේ ආයතන දෙකක්, දෙපාර්තමේන්තු දෙකක්. සමුපකාරය ජන ජීවිතයට බොහොම සම්බන්ධව කටයුතු කරන ආයතනයක්. එම නිසා එම ආයතනයට විශේෂයක් කිරීමට තමුන්නාන්සේලාගේ රජයේ අදාල අමාත්‍යාංශ සියල්ලක්ම එකතු වී සැලකිල්ල යොමු කරන්නට ඕනැ.

ගරු සභාපතිතුමනි, සතොස භාර ඇමතිතුමා දැන් සභාවේ නැහැ. සතොසත් මේ වාගේ ආයතනයක්. සතොසත් බිහි වුණේ සමුපකාරය නිසයි. සමුපකාරයේ තොග වෙළඳ ආයතනය සතොසයි. නමුත් සතොසෙන් ගෙන්වන බඩු තොග වශයෙන් ලබා දෙන්නේ කාටද ? පහසුකම් සලසා දී තිබෙන්නේ කාටද ? ණයට තොග වශයෙන් භාණ්ඩ ලබා දෙන්නේ කාටද ? පෞද්ගලික ව්‍යාපාරිකයාටයි, සමුපකාරයට නොවෙයි. සමුපකාරයට ලොකු ලොකු තහංචි පනවා තිබෙනවා. එම නිසා ඇමතිතුමාට පමණක් මේක කරන්නට බැහැ. එතුමාගේ දෙපාර්තමේන්තුවේ කාමරයේ, බිත්ති හතර තුලින් මේ ප්‍රශ්නයට විසඳුමක් ලැබෙන්නේ නැහැ. සමුපකාර තොග වෙළඳ ආයතනය භාර වී ඇත්තේ වෙනත් අමාත්‍යාංශයකට. තොග වෙළඳ ආයතනයේ පාලනය ඇත්තේ වෙළඳ අමාත්‍යාංශයටයි. ඒ අය සමුපකාර සමිතිවලට කිසිම අනුකම්පාවක් දක්වන්නේ නැහැ. සමුපකාර සමිති නැසී යනවා නම්, ඒ අය වඩාත් කැමතියි. එහෙමනම් සමුපකාර සමිති නගා සිටුවන්නේ කොහොමද ? නගා සිටුවීම පැත්තක තිබියදී අඩු වශයෙන් දැන් තිබෙන ටිකවත් ආරක්ෂා කර ගන්න කටයුතු කරන්න ඕනැ. ඒක තමයි මම නැවත නැවතත් කියන්නේ, ආණ්ඩුවට වුවමනාවක් නැති නිසයි මේ තත්ත්වයට වැටී තිබෙන්නේ කියා. සමුපකාරය වුවමනා වෙන්නේ 1983 වාගේ රටේ කලබල ඇති වී කඩ කාරයන් තමන්ගේ කඩ වසා දමා, විදුරු ඉස්සරහින් යකඩ දොරවල් දමා, තමන්ගේ ගෙවල්වලට වී පාරිභෝගිකයන් එන විට තුවක්කු තබා ගන ඉන්නා විටයි. එතකොට සමුපකාර ඇරිලා. සමුපකාරය මතක් වෙන්නේ අන්න ඒ වාගේ අවස්ථාවල. එවිට තමයි, මිනිසුන් සමුපකාරවල පෝලිමේ ඉන්නේ.

**ගාමිනී ජයසූරිය මහතා**
**(திரு. காமினி ஜயசூரிய)**
**(Mr. Gamani Jayasuriya)**

සමාවන්න, මන්ත්‍රීතුමා. තමුන්නාන්සේ කියන බොහොමයක් දේවල් ඇත්ත බව මම පිළිගන්නවා. නමුත් කොයි කාලයේද, මේ තත්ත්වයේ වෙනසක් දකින්නට තිබුණේ. තමුන්නාන්සේලා ආණ්ඩු කරන කාලයේදී මීටත් වඩා අපහසුකම්වලට ජනතාවට මුහුණ දෙන්න සිදු වුණා. නමුත් ඔය තත්ත්වවලට මුහුණ දෙමින් ජනතාවට යම්කිසි සේවාවක් අප කරන්නට ඕනැ. තවමත් කිසියම් සේවාවක් ඉටු කරනවා නම්, ඔවැනි අමාරුකම්වලට මුහුණ දෙමිනුයි එසේ කරන්නේ.

**සරත් මුත්තෙට්ටුවෙගම මහතා**
**(திரு. சரத் முத்தெட்டுவெகம)**
**(Mr. Sarath Muttetuwegama)**

තමුන්නාන්සේගේ ඒ අදහසට මම එකඟ වෙන්නේ නැහැ. ඒ ගැන බොහොම කනගාටු වෙනවා. මහජන බැංකුව සහ සතොස යන ආයතන දෙක මෙවැනි ආකල්පයක් සමුපකාරයට දක්වන්නට පටන් ගත්තේ තමුන්නාන්සේලාගේ ආණ්ඩුව යටතේයි. මම කියපු කාරණා දෙක –

**ආර්. ජේ. ජී. ද මැල් මහතා**
**(திரு. ஆர். ஜே. ஜீ. த மெல்)**
**(Mr. R. J. G. de Mel)**

මන්ත්‍රීතුමාගේ ප්‍රකාශය සම්පූර්ණයෙන්ම වැරදියි. මහජන බැංකුව මේ රටේ ලොකුම ධනපතියන්ට කිසිම හේතුවක් නැතුව ඕනැවටත් වඩා විශාල වශයෙන් ණය දෙන්නට පටන් ගත්තේ පසුගිය ආණ්ඩු කාලයේදියි. ශ්‍රී ලංකා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නිදහස් පක්ෂයට සහයෝගය දුන් ධනපතියන්ට රුපියල් දස ලක්ෂ සිය ගණනින් මහජන බැංකුව ණය ලබා දී තිබෙනවා. ඕනෑ නම් විස්තර ඉදිරිපත් කරන්නම්. මහජන බැංකුවෙන් එසේ දුන් ණය ආපසු අය කර ගන්නට බැරි තත්ත්වයක් තිබෙනවා. කිසිම හේතුවක් නැතුවයි, ණය දී තිබෙන්නේ.

සරත් මුත්තෙට්ටුවෙගම මහතා
(திரு. சரத் முத்தெட்டுவெகம)
**(Mr. Sarath Muttetuwegama)**
ඒක හරි.

ආර්. ජේ. ජී. ද මැල් මහතා
(திரு. ஆர். ஜே. ஜீ. த மெல்)
**(Mr. R. J. G. de Mel)**
ඇපත් නැතිව, මොකක්වත් නැතිව දුන් ණය රුපියල් දස ලක්ෂ 800 ක් විතර දුන් මහජන බැංකුවට ලබා ගන්නට බැරිව තිබෙනවා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ඒගොල්ලන්ගේ කාලයේදී ඒ අයගේ ධනපතියන්ට දුන් ණය දූන් ලබා ගන්නට බැරිව තිබෙනවා.

සරත් මුත්තෙට්ටුවෙගම මහතා
(திரு. சரத் முத்தெட்டுவெகம)
**(Mr. Sarath Muttetuwegama)**
ඒ කාලයේ මහජන බැංකුවේ විශේෂ ලක්ෂණයක් තිබුණා. ඒ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ කාලයේ මහජන බැංකුවෙන් ඔය විදියට ඇප නැතිව ණය ලබා ගත් උදවිය ඒ සල්ලිවලින් බිස්නස් කරලා 1977 දී යූඑන්පී එකට වැඩ කළා.

ආර්. ජේ. ජී. ද මැල් මහතා
(திரு. ஆர். ஜே. ஜீ. த மெல்)
**(Mr. R. J. G. de Mel)**
ඒක ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මෝඩකම වෙන්න ඇති.

සරත් මුත්තෙට්ටුවෙගම මහතා
(திரு. சரத் முத்தெட்டுவெகம)
**(Mr. Sarath Muttetuwegama)**
ඒ නිසා මම කියන්නේ මේ – [බාධා කිරීමක්]

මන්ත්‍රීවරයෙක්
(அங்கத்தவர் ஒருவர்)
**(A Member)**
දේශපාලන හොරුන්ට උදව් කළා.

සරත් මුත්තෙට්ටුවෙගම මහතා
(திரு. சரத் முத்தெட்டுவெகம)
**(Mr. Sarath Muttetuwegama)**
දේශපාලන හොරුන්ට උදව් කළාලු ! කවුද හොරා ? අපි දන්නවා හොරු. තේරුණාද ? හොරු අන්තිමට නැවතුණේ කොහේද කියලත් අපි දන්නවා. ඒ හොරුන්ගේ ගෙවල්වලට නිතරම ගියේ කවුද කියලත් අපි දන්නවා. ඒ නිසා හොරු ගැන වැඩිය කථා කරන්නට එපා. [බාධා කිරීමක්] " වර්මින් ". ඒකට සිංහල වචනය මොකක්ද කියන එක මම හරියට දන්නේ නැහැ.

ආර්. ජේ. ජී. ද මැල් මහතා
(திரு. ஆர். ஜே. ஜீ. த மெல்)
**(Mr. R. J. G. de Mel)**
කකුල් දෙකේ මීයෝ. කකුල් දෙකේ මීයෝ.

මන්ත්‍රීවරයෙක්
(அங்கத்தவர் ஒருவர்)
**(A Member)**
කකුල් හතරේ නොවෙයි, කකුල් දෙකේ මීයෝ.

ආර්. ජේ. ජී. ද මැල් මහතා
(திரு. ஆர். ஜே. ஜீ. த மெல்)
**(Mr. R. J. G. de Mel)**
ඒ කෙසේ වෙතත් මේ ප්‍රශ්නය මතු වුණ නිසා, තමුන්නාන්සේ මේ ආණ්ඩුවට බැන්න නිසා මම ඒ ගැන කියන්නම්. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආණ්ඩුව කාලයේ ඒගොල්ලන්ගේ ආධාරකරුවන්ට දස ලක්ෂ සිය ගණනින් දුන් ණය දූන් ආපසු අය කර ගන්නට බැරිව " වෙව් " කරන්නටත් සිදු වී තිබෙනවා.

සරත් මුත්තෙට්ටුවෙගම මහතා
(திரு. சரத் முத்தெட்டுவெகம)
**(Mr. Sarath Muttetuwegama)**
ගරු ඇමතිතුමනි, ඒ ගැන නොවෙයි මම කිව්වේ. ඒ දෙන ණය නවත්වන්නය කියාවත් වෙනත් කාරණයක් ගැනවත් නොවෙයි මම කිව්වේ. මහජන බැංකුවෙන් පෞද්ගලික ව්‍යාපාරිකයන්ට දී තිබෙන පහසුකම් ටික සීමිත ක්ෂේත්‍රයක් තිබෙන සමුපකාරයට මහජන බැංකුවෙන් දී නැහැ. ඒක ඇත්ත නේද ? ඒක ඒ කාලයේ කළත් එකයි, මේ කාලයේ කලත් එකයි. එය එසේ කළ යුතු නැහැ. ඒ මොකද ? මහජන බැංකුව බිහි කලේ සමුපකාර සමිතිවලට සේවය කිරීමටයි. පස්සේ ඒක උපාලි විජේවර්ධන මහත්මයාටයි, එඩ්මන්ඩ්ලාටයි, මැකලම්ලාටයි, තව එක් එක්කෙනාටයි සල්ලි දුන්නාට අපි මොනවා කරන්නද ? සමුපකාරය බිහි වුණේ එක පරමාර්ථයක් ඇතිව. ඒ පරමාර්ථය දූන් නැහැ. දූන් වෙන වෙන උදවියට ණය දෙනවා. ඒකයි මම කියන්නේ.

තව එක කාරණයක් කියන්නට තිබෙනවා. 1978 ආහාර මුද්දර ක්‍රමය ආරම්භ වුණාට පසුව සමුපකාර දෙපාර්තමේන්තුවෙන්වත් විමසන්නේ නැතිව – එතුමාගේ අමාත්‍යාංශය යටතේම තිබෙන දෙපාර්තමේන්තු දෙකක් – එක එක සමිතියේ තිබෙන හොඳ නරක තක්සේරු නොකර, වාණිජ ශක්තිය තක්සේරු නොකර, ගෙවන්නට පුළුවන් ප්‍රමාණය තක්සේරු නොකර ආහාර කොමසාරිස් ආහාර මුද්දර සඳහා ණය දෙන්න පටන් ගත්තා. සමිතිවලට මුදල් දෙන්න පටන් ගත්තා. මොකද ? ආහාර මුද්දරවලට අවශ්‍ය නිසා. ඒ කාලයේ හිටපු අධ්‍යක්ෂ මණ්ඩලවල නොයෙකුත් දුර්වලකම් නිසා ඒ මුදල් වැරදි විධියට පාවිච්චි කලා. දූන් ඒ ණය ගෙවන්නට තිබෙනවා. මට මතක විධියට දූන් ඒවා 1983 නැත්නම් 1984 ඉඳලා ආපසු අය කරනවා. සමුපකාර සමිතිවලට දූන් විඳින්නට සිදු වී තිබෙන අමාරුකම්වලට අමතරව ඒ ණයත් එකපාරටම ගෙවන්නට සිදුවීම ලොකු අපහසුවක්. තමුන්නාන්සේගේම අමාත්‍යාංශය යටතේ තිබෙන දෙපාර්තමේන්තු දෙකක් නිසා සමුපකාර දෙපාර්තමේන්තුවයි ආහාර කොමසාරිස්වරයාගේ දෙපාර්තමේන්තුවයි මේ ගැන සාකච්ඡා කර යම් යම් සමුපකාර සමිතිවලට සහන ලබා දී තිබෙනවා. සමහර සමිතිවලින් අවුරුද්දක් අය කරන්නේ නැහැ. ඒ විධියේ සහන ලබා දී තිබෙනවා. සමුපකාර සමිති කොයි තරම් අමාරුවෙන්ද ගෙන යන්නේ කියන එක තමුන්නාන්සේ දන්නවා.

ගාමිනී ජයසූරිය මහතා
(திரு. காமனி ஜயசூரிய)
**(Mr. Gamani Jayasuriya)**
ඒ නියෝගය දුන්නේ මමයි. ඒ විධියට ණය දී තිබෙන ඒවා ආපසු ලබා ගන්නට ඕනෑය කියා මම කොමසාරිස්තුමාට කිව්වා. නමුත් එහෙම කිව්වාට ඒ මුදල් ගෙවන්නය කියා නියම කළාට පස්සේ කලවාතේ ගරු මන්ත්‍රීතුමා දූන් කිව්වා වගේ ඒ අය අපි ළඟට එනවා. ඇත්තවශයෙන්ම මෙය ප්‍රසිද්ධියේ කියන එකත් හොඳ නැහැ. එහෙම අවස්ථාවලදී අපි ඒ ගැන කල්පනා කර බලා අනුකම්පාවක් දක්වා කටයුතු කරනවා. නිකම්ම හිටියොත් මුදල් ගෙවන්නේ නැතිව ඒ තාලයටම යනවා. ඒ නිසා ඒ සම්බන්ධයෙන් ඒ විධියට තදින් ක්‍රියා කරන්නට ඕනෑය කියා මම කල්පනා කළා.

සරත් මුත්තෙට්ටුවෙගම මහතා
(திரு. சரத் முத்தெட்டுவெகம)
**(Mr. Sarath Muttetuwegama)**
නැහැ ! ගරු ඇමතිතුමනි, මම කියන්නට ගියේ මගේ අදහසක්. මම කරන්නට ගියේ යෝජනාවක් විතරයි. මම හිතන විධියට තමුන්නාන්සේ එය පිළිගනීවි. ආහාර කොමසාරිස් මේ ණය මුදල අය කිරීමට කලින් සෑම සමිතියක් සමගම දෙපාර්තමේන්තුව සාකච්ඡා කර ඒ සඳහා වෙනම වැඩපිළිවෙලක් යොදනවා නම් හොඳයි. අය කරන ආකාරය පිළිබඳව " බ්ලැන්කට් රූල් " එකක් දන්නෙ නැතිව. ඒ මොකද ? සමහර සමිති අතිශය අමාරුකම් මධ්‍යයේයි කටයුතු කරගෙන යන්නේ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[සරත් මුත්තෙට්ටුවෙගම මහතා]

කලවානේ සමූපකාර සමිතිය ගැනත් වචනයක් කියන්නට ඕනෑ. මම ගරු ඇමතිතුමාට ඒ කාරණාව ඒ දවස්වල කිව්වාම, පුළුවන් හැටියට ඒ ගැන කටයුතු කරදී තිබීම ගැන ඉතාමත්ම කෘතඥ වෙනවා. නමුත් ඒ සමිති ගෙනයන්නේ බොහොම අමාරුවෙන්. මම අර කලින් සඳහන් කළ අමාරුකම් ඒ සමූපකාර සමිතිවලට තිබෙනවා. දැන් මේ අවස්ථාවේ අයිරාව ඇරෙන්න ලක්ෂ හයක ආධාරයක් එයට ලබාදී තිබෙනවා. එය මේ අවුරුද්දේ ඔක්තෝබර් 20 වැනිදයි ලැබුණේ. මම කියන්න සතුටුයි – මම හිතන්නේ රත්නපුර සමූපකාර දෙපාර්තමේන්තුවෙන් කවුරුහරි ඉන්නවා නම් එය සනාථ කරයි – ඒ සමිතියේ සේවකයෝ තමන්ගේ වැඩක් හැටියට වේලාව නොබලා, මේ සමිතිය වැටී තිබෙන ප්‍රපාතයෙන් ගොඩ ගැනීමට කටයුතු කරනවා. මොකද මෙය ඒගොල්ලන්ගේ ජීවන වෘත්තියට ලොකු ප්‍රශ්නයක්. [බාධා කිරීමක්]

ඔක්තෝබර් මාසයේ මේ සල්ලි දෙනකොට ඒ සමිතියේ මාසයකට ලක්ෂ පහලොවක වෙළඳාමක් තිබුණා. දැන් එය ලක්ෂ 19 දක්වා නංවා තිබෙනවා. තව ආධාර දුන්නොත් වෙළඳාම තව තවත් නංවන්න පුළුවන්. මොකද නමුන්නාන්සේ දන්නවා ලක්ෂ විස්සක පමණ ණය තිබෙනවා. එක එක්කෙනාගෙන් ඒ ණය අය කරගන්න දැන් උත්සාහ කරනවා. විශේෂයෙන් ඒ සමිතිය පිහිටි ප්‍රදේශයේ භූගෝලීය තත්ත්වය, ඒ සමිති බල ප්‍රදේශයේ ජනගහනය බෙදී තිබෙන ආකාරය දෙස බලා විශේෂ සහන සලසා දී ඒ සමිතියට ආධාර කරන්න කියා මම ඉතාමත් ඕනෑකමින් ඉල්ලා සිටිනවා. කළමනාකාර අධිකාරියේ මහත්වරුත්, තවත් උදවියත් සමග මා මේ සම්බන්ධව කථා කළාම සෑහෙන මූලධනයක් ඒගොල්ලන්ට ලැබෙනවා නම්, ලක්ෂ 50 දක්වා මේ සමිතියේ වෙළඳාම ගෙන යන්න පුළුවන් කියා ඒ අය කිව්වා.

මේ සමිතියට රජයෙන් නොයෙක් නොයෙක් අවහිරකම් දමනවා. මේ සමිතියට පමණක් නොවෙයි සමූපකාර ව්‍යාපාරයටම අවහිරකම් ඇතිව තිබෙනවා. දැන් නිදර්ශනයක් වශයෙන් මම කියන්න කැමතියි, මේ මයිසූර් පරිප්පු බෙදා හැරීම සම්පූර්ණයෙන්ම සමූපකාරයට භාරව තිබුණු කටයුත්තක්. මයිසූර් පරිප්පු බෙදා හැරීම දැන් ආපසු වෙළෙන්දන්ට දී තිබෙනවා. වෙළෙන්දන්ට අමාරුවක් නැහැ. ඒගොල්ලෝ කොහොම හරි කරනවා. ඒවාගේ ඒවා විට වික තරගකාරී තත්ත්වයට පත්කළාම මේ තත්ත්වයෙන් ගොඩ එන්නට බැරි තත්ත්වයක් ඇතිවෙනවා.

සේවකයන්ගේ කාරණා සම්බන්ධයෙන් මම හිතනවා කියන්න අවශ්‍ය නැහැ. නමුන්නාන්සේ දන්නවා ජීවන වියදම වැඩිවුණු නිසා 1979 සිට පඩි වැඩිවීම් ගණනාවක් ඇතිවී තිබෙනවා. දිස්ත්‍රික්කයක්, දිස්ත්‍රික්කයක් ගෙන බැලුවොත් ඒ වැඩිවුණු පඩිය බාගවිට දිස්ත්‍රික්කයක එක සමූපකාර සමිතියක පමණක් හරියාකාරව ගෙවනවා ඇති කියා මම හිතනවා. අනික් සමිතිවලට ගෙවන්න බැහැ. එවැනි තත්ත්වයක් තිබියදී ගරු ඇමතිතුමා ඒ සේවකයින්ගෙන් බලාපොරොත්තු වෙන්නේ මොනවාද ?

සරත්චන්ද්‍ර රාජකරුණා මහතා
(திரு. சரத்சந்திர ராஜகருணை)
**(Mr. Sarathchandra Rajakaruna)**
සමූපකාර සමිතියෙන් ගෙවන්න බැරි මොකද ?

සරත් මුත්තෙට්ටුවෙගම මහතා
(திரு. சரத் முத்தெட்டுவெகம)
**(Mr. Sarath Muttetuwegama)**
එය ගෙවන්න තරම් ඒ සමිතිවලට වානිජ ශක්තියක් නැහැ ; සල්ලි නැහැ. [බාධා කිරීමක්]

නැහැ මම මේ කියන්න යන්නේ ඒ ගැන තමයි. සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව – ආණ්ඩුව – මේ ගැන හොයන්න ඕනෑ. ඒ සේවකයින්ගේ වැටුප් දීම සඳහා නමුන්නාන්සේලාට ඕනෑ නම් සබ්සිඩි එකක් දිය හැකියි. එහෙම ඕනෑ නැති නම් මක බැව් යන්න කියා නිකම් බලාගෙන සිටිය හැකියි. ඊට පසුව ඒ සේවකයින්ට ජීවත් වෙන්න බැහැ. දිනපතා සල්ලි අතපත ගාන මිනිහාට තමන්ගේ දරුවාට කිරි ටින් එකක් ගන්න තිබෙනවා නම් නමුන්නාන්සේ හිතන්නේ මොනවා කරයි කියලාද ? එක්කෝ සමූපකාරයෙන් කිරි ටින් එකක් අරගෙන යනවා. එහෙම නැතිනම් සමූපකාරයෙන් සල්ලි අරන් යනවා. එහෙම කරන එක මනුෂ්‍ය ගතියක්. වැඩි කර තිබෙන පඩි සමූපකාර සමිතියක කිසි දවසක හරියට ගෙවන්න නමුන්නාන්සේලාට බැහැ. වැටුප් ගෙවීම සඳහා ආණ්ඩුවෙන් එලවුන්ස් එකක් දෙන්න ඕනෑ කියා මම කියනවා. එහෙම නැත්නම් සේවකයන්ට පඩි නැහැ. මෙය " Price Stabilizer" එකක් හැටියට පාවිච්චි කරනවා නම්, අඩු තරමින් ඒ ආයතන මිනිසුන්ට සේවයක් කරන ආයතන බවට පරිවර්තනය කරනවා නම් එහෙම නම් ඒ කටයුත්ත හරියට කරන්න.

සරත්චන්ද්‍ර රාජකරුණා මහතා
(திரு. சரத்சந்திர ராஜகருணை)
**(Mr. Sarathchandra Rajakaruna)**
කරන්න බැහැ කියන කථාව වැරදියි. මම උදාහරණයක් වශයෙන් කියන්නම්.—

සරත් මුත්තෙට්ටුවෙගම මහතා
(திரு. சரத் முத்தெட்டுவெகம)
**(Mr. Sarath Muttetuwegama)**
කරුණාකර ලංකාවේ තිබෙන සමූපකාර සමිතිවලින් අහන්න පඩි වැඩිවීම් ඔක්කොම ගෙවනවාද කියා.

සරත්චන්ද්‍ර රාජකරුණා මහතා
(திரு. சரத்சந்திர ராஜகருணை)
**(Mr. Sarathchandra Rajakaruna)**
සමිති ඔක්කොම නොවෙයි. රජයෙන් ලැබෙන සියලුම දීමනාවත් – රුපියල් 515 – සෑහෙන සමිති ප්‍රමාණයක් ගෙවනවා. එපමණක් නොවෙයි, රුවන්වැල්ල සමූපකාර සමිතිය ලබන අවුරුද්දේ සිට බෝනසුත් ගෙවීමට යන බව මම ගරු කලවාන මන්ත්‍රීතුමාට කියන්න කැමතියි. ඒ සඳහා දැනටම අපෙන් අවසර ඉල්ලා තිබෙනවා.

සරත් මුත්තෙට්ටුවෙගම මහතා
(திரு. சரத் முத்தெட்டுவெகம)
**(Mr. Sarath Muttetuwegama)**
එහෙම තිබෙන සමිති තිබෙන්න පුළුවන්.

සරත්චන්ද්‍ර රාජකරුණා මහතා
(திரு. சரத்சந்திர ராஜகருணை)
**(Mr. Sarathchandra Rajakaruna)**
දක්ෂතාවය අනුව –

සරත් මුත්තෙට්ටුවෙගම මහතා
(திரு. சரத் முத்தெட்டுவெகம)
**(Mr. Sarath Muttetuwegama)**
දක්ෂතාවය පමණක් නොවෙයි.

සරත්චන්ද්‍ර රාජකරුණා මහතා
(திரு. சரத்சந்திர ராஜகருணை)
**(Mr. Sarathchandra Rajakaruna)**
දැන් නමුන්නාන්සේ කලවාන සමිතිය ගැන වර්ණනා කළා. කලවාන සමිතිය බොහොම හොඳ තත්ත්වයට නැගී ගෙන එන බව සත්‍යයක්.

සරත් මුත්තෙට්ටුවෙගම මහතා
(திரு. சரத் முத்தெட்டுவெகம)
**(Mr. Sarath Muttetuwegama)**
ගරු නියෝජ්‍ය ඇමතිතුමා දන්නවා මේ තත්ත්වයට හේතුව දක්ෂතාවය පමණක් නොවෙයි. වෙනත් ආවේනික හේතුත් තිබෙනවා. සමූපකාර සමිතිය තිබෙන ප්‍රදේශයේ මිනිසුන්ට බඩු ගන්න සල්ලි නැත්නම් – පාරිභෝගික ශක්තියක් නැත්නම් – කොපමණ හොඳට සමිතිය ගෙන ගියත් වැඩක් නැහැ. [බාධා කිරීමක්] ඒක බොහොම සරල දෙයක්. ඒ නිසා යම් යම් වළක්වාගත නොහැකි හේතු නිසා අඩු ආදායම් ලබන සමූපකාර ගැනවත් සොයා බලා ඒ ගොල්ලන්ට ආධාරයක් දෙන්න ඕනෑ. වේතන වශයෙන් යම් කිසි දීමනාවක් දෙන්න ඕනෑ. පඩි වැඩි කර තිබෙනවාය කියා දැන් නමුන්නාන්සේලා සන්තෝෂ වෙනවා. නමුත් සමූපකාර ක්ෂේත්‍රයේ සියයට 80කට ඒ වැඩි වුණ සියලුම දීමනා ලැබෙන්නෙ නැහැ. ගරු මුදල් ඇමතිතුමා දන්නවා, බුලත්සිංහල

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ආසනයේ තිබෙන තත්ත්වයත් ගැන. යම් යම් ආවේණික දුර්වලකම් තිබෙනවා. ඒ නිසා මේ ව්‍යාපාරය රැකගන්න ආණ්ඩුවට ඕනෑනම් යම් යම් ආධාර දෙන්න ඕනෑ. තමුන්නාන්සේලා පසු ගිය මාස කීපය තුළ ගත් උත්සාහයන් නිසා සමහර සමිතිවලට දූත් දෙනවා. නමුත් අනික් ඒවාටත් ඒ විධියට දෙන්නෙ නැත්නම් මේක පවත්වාගෙන යන්න අමාරුයි.

මම ඇමතිතුමාගේ අවධානය යොමු කරවනවා වැලිමඩ මැතිවරණ කොට්ඨාශයේ තිබෙන උඩපළාත විවිධ සේවා සමුපකාර සමිතියේ පවතින තත්ත්වය ගැන. එතන ඡන්දයෙන් තේරුණු අධ්‍යක්ෂ මණ්ඩලයක් ඉන්නවා. නමුත් ඒ තේරුණු උදවිය රජයට අහිතකර දේශපාලන අදහස් දරන අය නිසා සමුපකාර දෙපාර්තමේන්තුව ඒ සමිතිය ඒ ගොල්ලන්ට භාර දුන්නෙ නැහැ. අන්තිමට ඒ ගොල්ලන්ට සිද්ධ වුණා උසාවි යන්න. අධිකරණය තීරණය කළා ඒ ගොල්ලන්ට වැඩ කරන්න දෙන්නය කියා. මට දැනගන්න ලැබී තිබෙන හැටියට ඊට පස්සෙ ඒ අධ්‍යක්ෂ මණ්ඩලයට විශේෂ තහංචි දමා තිබෙනවා. යන්නම් එහාට මෙහාට හැරුණොත් ප්‍රශ්න ඇති වෙනවා. ණයක් ඉල්លුවාම ණය අනුමත කරන්නෙ නැහැ. ඒ නිසා ඒ තත්ත්වය නැති කරන්න ඕනෑ. මේ මහජන ආයතනයක් වන සමුපකාරයේ ජනසම්මතවාදයක් තිබෙන්න ඕනෑ. එහෙමනම් ඡන්දයෙන් තේරුණු උදවියට කරන්න දෙන්න. මේක තමුන්නාන්සේ කරනවා නොවෙයි. මම දන්නවා එතන තිබෙන තත්ත්වය. එහෙම කෙරෙන්නෙ නැත්නම් මෙහි ප්‍රතිපත්තිය වශයෙන්ම තිබෙන කොඳු නාරටිය හෙවත් ජනතා සහයෝගය නැති වෙනවා. එමනිසා මෙතැනින් පටන්ගෙන කරන්න ඕනෑ.

**සරත්චන්ද්‍ර රාජකරුණා මහතා**
**(திரு. சரத்சந்திர ராஜகருணா)**
**(Mr. Sarathchandra Rajakaruna)**

මොකක්ද මොකක්ද අර කිව්ව ජනසම්මත මොකක්ද ?

**සරත් මුත්තෙට්ටුවෙගම මහතා**
**(திரு. சரத் முத்தெட்டுவெகம)**
**(Mr. Sarath Muttetuwegama)**

ඡන්දයෙන් තේරුණ උදවියට එහි පාලනය කරන්න දෙන්න ඕනෑ.

**සරත්චන්ද්‍ර රාජකරුණා මහතා**
**(திரு. சரத்சந்திர ராஜகருணா)**
**(Mr. Sarathchandra Rajakaruna)**

නැහැ අර ඉස්සෙල්ල කිව්වෙ මොකක්ද ? ඒක නැවතත් කියන්න.

පූ. භා. 10.15

**සරත් මුත්තෙට්ටුවෙගම මහතා**
**(திரு. சரத் முத்தெட்டுவெகம)**
**(Mr. Sarath Muttetuwegama)**

ඉස්සෙල්ල කිව්ව එක ආයිත් කියන්න ඕනෑ නැහැ. අහගෙන හිටියෙ නැද්ද ? මම කියන්නෙ මේ සමිතිය ගැන බොහොම පැමිණිලි තිබෙනවා. මේ පැමිණිලිවලට සමුපකාර දෙපාර්තමේන්තුවත් සම්බන්ධයි. මොකද, දෙපාර්තමේන්තුවත් යම් යම් දේශපාලන බලවතුන්ගේ කීම නිසා ඒ සමුපකාර සමිතියේ කටයුතුවලට සහයෝගය දක්වන්නෙ නැහැ. අවහිරකම් පටවනවා. ඒ තත්ත්වය නැති කරන්න ඕනෑය කියලා මම විශේෂයෙන් මතක් කරනවා. අවුරුදු ගණනාවක් තිස්සේ තිබෙන සේවක දුක්ගැනවිලි අද තිබෙන සමුපකාර සේවා කොමිෂන් සභාවෙන් විසඳන්න බැහැ. ඒ නිසා දේශපාලන මතභේදවලින් තොරව කවුරුත් වාගේ එක්කාසු වෙලා සේවකයන් සම්බන්ධයෙන් තිබෙන අමාරුකම් මගහැරවීමටත් සමුපකාර සමිතිවල දේපොළ ආරක්ෂා වන විධියේ අලුත් ක්‍රමයක් ඇති කිරීමටත් තමුන්නාන්සේ උත්සාහ ගන්නවා ඇතැයි මම විශේෂයෙන් බලාපොරොත්තු වෙනවා.

**කේ. වින්සන්ට් පෙරේරා මහතා** (යටියන්තොට)
**(திரு. கே. வின்சன்ற் பெரேரா — யட்டியாந்தோட்டை)**
(Mr. K. Vincent Perera - Yatiyantota)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ආහාර හා සමුපකාර වැය ශීර්ෂය යටතේ වචන ස්වල්පයක් කථා කිරීමට අවස්ථාව ලබාදීම ගැන මම පළමුවෙන්ම තමුන්නාන්සේට ස්තුතිවන්ත වෙනවා. දැන් මොහොතකට පෙර කථා කළ අපේ කලවාන මන්ත්‍රීතුමා (සරත් මුත්තෙට්ටුවෙගම මහතා) ජනසම්මතවාදය ගැන කථා කළා. ඇත්තවශයෙන්ම මේ අවස්ථාවේදී අපි මතක් කර දෙන්න ඕනෑ 1970-1977 වකවානුවේදී ඔය විධියට ජනසම්මතවාදය ගැන වචනයක්වත් කථා කෙළේ නැති බව. මේ සමුපකාර සමිති පිළිබඳව හොඳ සම්බන්ධීකරණයක් ඇති කරගෙන ආ අවස්ථාවේදී තමයි 1970-77 කාලයේ තුන් හවුල් රජය බලයට පත් වෙනවාත් සමගම ඉලංගරත්න ඇමතිතුමා මේ සමුපකාර ව්‍යාපාරය ජනතාවගෙන් ඉවත් කෙළේ; ඒ සම්බන්ධීකරණය සහමුලින්ම නැති කර දැම්මෙ. එය නැති කර දැමීම නිසා සමුපකාරය සම්පූර්ණයෙන්ම අඩපණ වුණා. ජනතාවගෙන් ඈත් වුණා. දූෂණ ක්‍රියා විශාල වශයෙන් ඇති වෙන්න පටන්ගත්තා. ඒක අමතක කරල මේ අය අද මේ රජය සමුපකාර ව්‍යාපාරය ව්‍යාප්ත කරන්න වෑයම් කරන මේ අවධියේදී මේ විධියේ ප්‍රකාශ කිරීම ඇත්තවශයෙන්ම පුදුමයට කාරණයක් වෙනවා. දහ නවවන සියවසේ මුල් භාගයේදී ණය දෙන සමුපකාර සමිති මගින් ආරම්භ වූ සමුපකාර ව්‍යාපාරය, යටත්විජිත පාලන කාලය තුළ ශ්‍රී ලංකාව තුළ ඉතාමත් සාර්ථක අන්දමින් ව්‍යාප්ත වුණා. අඩසියවසකටත් අධික කාලයක් තුළ විවිධ නීතිරීති හා අණපනත්වලින් පෝෂණය වෙමින් පැවතියාවූ මෙම සමුපකාර ව්‍යාපාරය අද සැහෙන දුරට ව්‍යාප්ත වී තිබෙනවා. රට තුළ අත්‍යාවශ්‍ය ආහාර ද්‍රව්‍ය බෙද හැරීමේදී, විශේෂයෙන් රටේ කලබලකාරී තත්ත්වයන් ඇති වූ අවස්ථාවලදී, බඩු හිඟයක් ඇති වූ අවස්ථාවලදී, සමුපකාරය මහජනයාට කොයිතරම් සෙතක් සැලසුවාද කියනවා නම්, එහි අගය කියල නිම කරන්න බැරි තත්ත්වයක් ඇති වුණා.

මෙවැනි තත්ත්වයකින් යුතු සමුපකාර ව්‍යාපාරය රැක බලා ගැනීම, ආරක්ෂා කිරීම අපගේ බලවත් යුතුකමක් බව මා මේ අවස්ථාවේදී සඳහන් කරන්න කැමතියි. එය අපේ යුතුකමක් පමණක් නොව, මේ රටේ ජනතාවගේත්, රජයේත් යුතුකමක් බව මා මේ අවස්ථාවේදී මතක් කරන්න සතුටුයි.

සමුපකාර සමිති මගින් ඉටුවෙන යුතුකම් රාශිය ගැන බලන විට එයින් මහජනතාවට විශාල සේවයක් සිදුවෙන බව කිව යුතුයි. එම නිසා අපි සෑම අවස්ථාවකදීම සමුපකාර ව්‍යාපාරය හැකි තරම් දියුණු කරන්න කල්පනා කළ යුතුයි. අද සමුපකාර ව්‍යාපාරය ගැන කථා කරන විට, සමහර අය කියනවා සමුපකාර ව්‍යාපාරය ගෙන යන්නට බැරි තත්ත්වයක් ඇති වී තිබෙනවාය කියල. ඇත්තවශයෙන්ම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මට නම් එවැනි තත්ත්වයක් පෙනෙන්නේ නැහැ. සමුපකාර ව්‍යාපාරය රටපුරාම ව්‍යාප්ත තත්ත්වයකින් ගෙන යන්න පුළුවන් ව්‍යාපාරයක්.

අපි දන්නවා,' සමුපකාර ව්‍යාපාරයේ සම්බන්ධීකරණය පිණිස සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් නීතිරීති සකස් කර තිබෙන බව. එමගින් නීතිරීති සකස් කර තිබෙනවා පමණක් නොව චක්‍රලේඛ පවා නිකුත් කර තිබෙනවා. ඒ චක්‍රලේඛවලින් කියැවෙන්නේ එහි සම්බන්ධීකරණය ඇති කරන ආකාරයත්, කළමනාකරණයත් පිළිබඳවයි. සමුපකාර සංවර්ධන කොමසාරිස්තුමාගේ පාලනය යටතේ තිබෙන මේ දෙපාර්තමේන්තුවෙන් නිකුත් කරන චක්‍රලේඛ අනුව නිසියාකාරව කටයුතු කරනවා නම් මේ සමුපකාර ව්‍යාපාරය මීට වඩා වේගවත් විධියට ව්‍යාප්ත කරන්න පුළුවන්ය කියා මා මේ අවස්ථාවේදී මතක් කර දෙන්න ඕනෑ. නිදර්ශනයක් වශයෙන් ගතහොත්, සම්බන්ධීකරණය ඇති කිරීම සඳහා නිකුත් කර තිබෙන චක්‍රලේඛ අනුව, සෑම සමුපකාරයක් පිළිබඳවම වාර්තාවක් මාසයකට වරක් සංවර්ධන නිලධාරී මහත්මයාගේ නිර්දේශය සහිතව සහකාර සමුපකාර සංවර්ධන කොමසාරිස්තුමාට ඉදිරිපත් කරන්නට ඕනෑ. ඒ ඉදිරිපත් කරන වාර්තාවේ, අදාළ සමුපකාරය පිළිබඳ සැහෙන විස්තර මාලාවක්, සමුපකාර කළමනාකරණය පිළිබඳ සැහෙන විස්තරයක් අඩංගු වෙනවා. ඒ කරුණු අඩංගු වාර්තාව සහකාර සමුපකාර සංවර්ධන කොමසාරිස්තුමාගේ කාර්යාලයට යැවූ පසුව, ඒ වාර්තාව සුපරීක්ෂාකාරී ලෙස සලකා බලා ඒ අනුව කටයුතු කළොත් කිසි දිනක සමුපකාර ව්‍යාපාරය අඩපණ වෙන්නට ඉඩ නොදී හොඳින් පවත්වාගෙන යාහැකි තත්ත්වයක් ඇති කරන්න පුළුවන්ය කියා මා විශ්වාස කරනවා. සමහර තැන්වල අඩපණ වුණා නම් සමහර විට එවැනි තත්ත්වයක් උද්ගත වන්න අවස්ථාව සැලසී තිබෙන්නේ සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවට අවශ්‍ය තරම් නිලධාරී මහතුන් නොමැති වීම නිසා වෙන්න පුළුවනි. එහෙම නම් ඒ අඩුපාඩුකම් සියල්ලක්ම සපුරා ගැනීම ඒ දෙපාර්තමේන්තුවේ වගකීමක්. ඒ නිසා ඒ වගකීම් ඉටු කොට, අඩුපාඩුකම් සියල්ල සම්පූර්ණ කරගෙන අවශ්‍ය කටයුතු කරනවා ඇතැයි අපි බලාපොරොත්තු වන බව මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්න කැමැතියි.

3 – A 087737 (85/12)

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[කේ. වින්සන්ට් පෙරේරා මහතා]

1970–77 වකවානුව ගැන ගරු මන්ත්‍රීතුමන්ලා මතක් කළා. ඊට කලින් සමිති මට්ටමින් මහජනයා සම්බන්ධ කරගෙන තිබුණු සමුපකාර ව්‍යාපාරය 1970–77 කාල සීමාවේදී ඒ රජය විසින් ඒකාධිකාරයක් බවට පත් කර ගනු ලැබ ඒ සමිතිවලට මහජනයාත් සමග තිබුණු සම්බන්ධකම්, මහජනයාට ඒ සමිති පිළිබඳව තිබූ අයිතිවාසිකම් ඉවත් කර ගත්තා. ඒ නිසා ක්‍රමයෙන් ජනතාව සමුපකාර ව්‍යාපාරයෙන් ඈත් වුණා. ජනතාව කල්පනා කළා, සමුපකාරය සම්බන්ධයෙන් තමන්ට තිබුණු අයිතිවාසිකම් ඉවත් වුණාය කියා. අන්න ඒ විධියටයි, සමුපකාරය සමග ජනතාවගේ තිබුණු සම්බන්ධීකරණය ක්‍රමානුකූලව ඉවත් වුණේ.

නමුත් වාසනාවකට 1977 දී ශ්‍රීමත් ජේ. ආර්. ජයවර්ධන මැතිතුමාගේ රජය බලයට පත් වෙනවාත් සමගම, එතෙක් ජනතාවට අහිමිව තිබූ වරප්‍රසාද සියල්ලක්ම ඔවුන් සතු කොට සමුපකාර ව්‍යාපාරයත් නැවත ජනතාව අතට පත් කළ බව මේ අවස්ථාවේදී මතක් කර දෙන්න මම කැමතියි. ඒ අනුව දැනට ඒ ව්‍යාපාරයේ කටයුතු හොඳින් කෙරීගෙන යන බව මම ඉතාමත් සන්තෝෂයෙන් මතක් කරන්න ඕනෑ.

කලවානේ ගරු මන්ත්‍රීතුමා (සරත් මුත්තෙට්ටුවෙගම මහතා) 1970 - 77 වකවානුව ගැන කථා කළා. ඒ වකවානුවේදී සමුපකාර ව්‍යාපාරය රජයේ ඒකාධිකාරයක් හැටියට පවරාගෙන ඒ සමිතිවල නිලතලවලට ඒ අය පත්කර ගත්තේ තමන්ගේ දේශපාලන ගැත්තන් බව මේ අවස්ථාවේදී මතක්කර දෙන්න කැමතියි. නමුත් අද එවැනි දේශපාලන ඇඟිලිගැසීම් කිසිවක් කෙරෙන්නේ නැහැ. පසුගිය ආණ්ඩු කාලයේදී විශේෂයෙන් සභාපති වශයෙන් ඒ සමිතිවලට ඒ අය පත්කර ගත්තේ දේශපාලන වශයෙන් තමන්ට ගැති අයයි. ඒ කාලයේදී ඇති වී තිබුණු ඒ දූෂණ නිසා තමයි, අද සමුපකාර ව්‍යාපාරය ගොඩගැනීම සඳහා අපට ඉමහත් ප්‍රයත්නයක් දරන්න සිදු වී තිබෙන්නේ. [බාධා කිරීම්] ඔව්, ඒ වකවානුවේදී මහාසංගමයේ සභාපති වශයෙන් කටයුතු කළේ පලාත් මන්ත්‍රීවරයායි.

ඇතැම් මන්ත්‍රීවරුන්ගේ විමසීම්වලට පිළිතුරු වශයෙන් නියෝජ්‍ය ඇමතිතුමා ලාභ ලබන සමුපකාර සමිති කීපයක් පෙන්වා දුන්නා, රුවන්වැල්ලේ සමුපකාර සමිතියත් ඇතුළුව. රුවන්වැල්ලේ සමුපකාර සමිතිය අද විශාල වශයෙන් ලාභ ලබන බව, සේවකයන්ට බෝනස්දීමට පවා අවසර ඉල්ලා තිබෙන බව කීම සන්තෝෂයට කරුණක්. 1970 - 77 වකවානුවේ ඒ සමිතියේ සභාපති වශයෙන් කටයුතු කළේ එවකට රුවන්වැල්ලේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයාව සිටි අනාවුද සෙනෙවිරත්න මහතායි. ඒ යුගයේදී ඒ සමුපකාර සමිතියේ තිබුණු දූෂණ කොපමණදැයි අපට කියන්න පුළුවන්කමක් නැහැ. නමුත් ඒවා සම්බන්ධයෙන් පරීක්ෂණ කටයුතු කළ නිලධාරී මහතුන් දන්නවා, ඒ සමිතිය මොන තත්ත්වයකටද පත් වී තිබුණේ කියා. නමුත් වර්තමාන පාලන කාලය තුළ එවැනි තත්ත්වයක් නැති බවත්, සමිතියේ වැඩකටයුතු ඉතා හොඳින් සිදුවන බවත් මේ අවස්ථාවේදී ආඩම්බරයෙන් මතක් කරන්න ඕනෑ.

දැනට පවතින ජන්දක්‍රමය අනුව ප්‍රාදේශීය කාරකසභා මගින් පත්වන නියෝජිතයන්ගෙන් මහාසභාව සමන්විත වන අතර, මහාසභාව තුළින් අධ්‍යක්ෂ මණ්ඩලයක් පත් කෙරෙනවා. සභාපති පත්වන්නේ ඒ අධ්‍යක්ෂ මණ්ඩලයෙනුයි. මේ ක්‍රමය අනුව සභාපති වශයෙන් පත්වන පුද්ගලයාට මහාසභාවේ ඇති කැමැත්ත මැන බැලීම අපහසුයි. ඒ නිසා සභාපති තැනත් මහාසභාවෙන් පත්වීමට කටයුතු යෙදිය යුතුයයි මේ අවස්ථාවේදී මම යෝජනා කරනවා. එමෙන්ම සමුපකාර සමිතිවල අධ්‍යක්ෂ මණ්ඩලවලට සේවක මණ්ඩලයේ නියෝජිත මහත්මයකුත් ඇතුළත් විය යුතුයයි මම යෝජනා කරනවා. ඒ හැර, තවත් යෝජනාවක් කරන්න තිබෙනවා. දැනට සභාපති වශයෙන් පත්වන පුද්ගලයාගේ නිල කාලය අවුරුදු 3ක් වෙනවා. ඒ නිල කාලය අවුරුදු 2 දක්වා අඩු කරන හැටියටත් මේ අවස්ථාවේදී මම ඉල්ලා සිටින්න කැමැතියි. නිල කාලය අවුරුදු දෙකක් කර ඊට පසුව අවුරුදු තුනක කාලයක් යනතෙක් ඒ සභාපතිවරයාට නැවත සභාපතිධුරයට තරග කිරීමට ඉඩ නොදිය යුතු බව මම සඳහන් කරන්න ඕනෑ.

ගරු ඇමතිතුමනි, සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවට ප්‍රශ්න රාශියක් තිබෙනවා. විශේෂයෙන්ම සමිති පිළිබඳව, ඒවායේ නීතිරීති පිළිබඳව, සමීක්ෂණ වාර්තාවල් සම්බන්ධයෙන් කටයුතු කරන අවස්ථාවලදී ප්‍රශ්න මතු වෙනවා. එමනිසා මම මේ අවස්ථාවේදී යෝජනා කරනවා, අධ්‍යක්ෂ මණ්ඩල පත්කිරීම්, ඉවත් කිරීම් සම්බන්ධයෙන් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවට වැඩි බලතල ලබාදිය යුතුය කියා. සමුපකාර සමිතිවල අක්‍රමිකතාවන් සම්බන්ධයෙන් කටයුතු කිරීමට කොමසාරිස්වරයාට දැනට තිබෙන බලතලවලට වඩා වැඩි බලතල පවරා දිය යුතුයි. ඒ මගින් සමුපකාර සමිතිවල වැඩකටයුතු දක්ෂ ලෙස ක්‍රියාත්මක කරගැනීමට හැකිවේයයි මම විශ්වාස කරනවා. ඒ පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියා මම මේ අවස්ථාවේදී ඉල්ලා සිටිනවා.

සමුපකාර සමිතිවල බඩු අඩුවීම සම්බන්ධයෙන් දැනට අනුගමනය කරන ක්‍රමය නම්, තීරක ප්‍රදාන තීන්දු ලබාගෙන, ඒවා උසාවියට බලගන්වා, උසාවි මාර්ගයෙන් ඒවා අයකර ගැනීමයි. දැනට උසාවිවල නඩු විශාල සංඛ්‍යාවක් විභාගවෙමින් පවතින හෙයින් මේ නඩු සඳහා ප්‍රමුඛත්වයක් දීම අපහසු වෙනවා. එමනිසා මම යෝජනා කරනවා, තීරක ප්‍රදාන බල ගැන්වීම සඳහා අධිකරණ ක්‍රමයක් ඇතිකිරීම යෝග්‍ය බව.

තව එක කාරණයක් ගැන මතක් කළ යුතුයි. සමුපකාර සමිතිවල රක්ෂණ කටයුතු කරගෙන යන්නේ රක්ෂණ සංස්ථා මගින්. රක්ෂණ සංස්ථාවෙන් වන්දි ලබා ගැනීමේ දී නොයෙකුත් දුෂ්කරතාවයන්ට මුහුණ දීමට මෙම සමුපකාර සමිතිවලට සිදු වෙනවා. එබැවින් සමුපකාර සමිතිවල වත්කම් රක්ෂණය කිරීම පහසුවෙන් කර ගැනීම පිණිස සමුපකාර රක්ෂණ සංගමයක් පිහිටුවීම යෝග්‍යයයි මම මේ අවස්ථාවේදී මතක් කර දෙන්නට ඕනෑ. ඒ තුළින් ව්‍යාපාරයේ මූල්‍ය වත්කම් ව්‍යාපාරය තුළම රඳවා තැබීමට පුළුවන් වෙනවා.

1961 දී පිහිටුවනු ලැබූ මහජන බැංකුව පිළිබඳව කලවාන ගරු මන්ත්‍රීතුමා (සරත් මුත්තෙට්ටුවෙගම මහතා) මතක් කළා. ඇත්තවශයෙන්ම ඒ පිළිබඳව වචන ස්වල්පයක් මමත් ප්‍රකාශ කරන්නට ඕනෑ. එතෙක් පැවති සමුපකාර බැංකුවේ වගකීම් සහ වත්කම් පවරා 1961 වර්ෂයේදී පිහිටුවූ මහජන බැංකුව, සමුපකාර සමිතිවලට සහයෝගය දෙන ආයතනයක් ලෙස ආරම්භ කළ බව අපි කවුරුත් දන්නවා. සමුපකාර සමිතිවලට ණය දෙන ලෙස සමුපකාර කොමසාරිස්තුමාගේ අවසරය ලැබී තිබියදීත්, ඒ සම්බන්ධව එතුමාගේ යෝජනාවක් තිබියදීත්, සමුපකාර සමිතිවලට ණයක් ලබාගැනීමට ගිය අවස්ථාවලදී, ඒ ණය පහසුකම් ලබාදීම අතපසු කර, එයින් මිදෙන්නට මහජන බැංකුව කටයුතු කර තිබෙන බව මම මේ අවස්ථාවේදී මතක් කළ යුතුයි.

ගරු මුදල් ඇමතිතුමාත් මේ ස්ථානයේ සිටින නිසා මම මේ අවස්ථාවේදී විශේෂයෙන් මතක් කරනවා, මහජන ආයතන බවට පරිවර්තනය වී තිබෙන මේ සමුපකාර සමිතිවලට විශේෂ අනුග්‍රහයක් දක්වා දැනට නොයෙකුත් දුෂ්කරතාවයන්ට මුහුණ පා තිබෙන සමුපකාර සමිති නැවත වරක් ලංකාවේ ජනතාව තුළ ශීඝ්‍රයෙන් නංවාලීම සඳහා, එහි උසස් අන්දමින් පවත්වාගෙන යාම සඳහා මහජන බැංකුව තුළින් ඒ ණය පහසුකම් ලබා දීම ආදී කටයුතු කෙරෙන්නට ඕනෑ බව.

පූ. භා. 10.30

ආර්. ජේ. ජී. ද මැල් මහතා
(திரு. ஆர். ஜே. ஜீ. த மெல்)
(Mr. R. J. G. de Mel)

පුළුවන්, සමුපකාර සමිතිවලින් හොරුන් ඉවත් කළොත්.

කේ. වින්සන්ට් පෙරේරා මහතා
(திரு. கே. வின்சன்ற் பெரேரா)
(Mr. K. Vincent Perera)

මම ඒ කීම සියයට සියයක්ම අනුමත කරනවා.

ආර්. ජේ. ජී. ද මැල් මහතා
(திரு. ஆர். ஜே. ஜீ. த மெல்)
(Mr. R. J. G. de Mel)

සමුපකාර ව්‍යාපාරයට සම්පූර්ණ සහයෝගය දෙන්න මහජන බැංකුවත් කැමතියි. මුදල් අමාත්‍යාංශයත් කැමතියි. සමුපකාර සමිතිවලින් හොරුන් ඉවත් කළොත් සම්පූර්ණ සහයෝගය දෙන්නම්.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**කේ. වින්සන්ට් පෙරේරා මහතා**
**(திரு. கே. வின்சன்ற் பெரேரா)**
**(Mr. K. Vincent Perera)**

ඒ ප්‍රකාශය මම සියයට සියයක්ම අනුමත කරනවා. කළමනාකරණය ඉතා දක්ෂ ලෙසත්, අවංක ලෙසත් කරගෙන යන බවට තීර්දේශ කර ඇති. ඒ අතරම සමුපකාර කොමසාරිස්තුමා විසින් විශේෂයෙන් ඉල්ලීම් කරන සමුපකාර සමිතිවලට පමණක් මේ සහාය ලබා දෙන ලෙස මම ඉල්ලා සිටිනවා.

**ආර්. ජේ. ජී. ද මැල් මහතා**
**(திரு. ஆர். ஜே. ஜீ. த மெல்)**
**(Mr. R. J. G. de Mel)**

සමුපකාර සමිතිවල කළමනාකාර මහත්වරුත් දක්ෂ ලෙස සොරකම් කරනවා. ඒකයි වෙන්නෙ.

**කේ. වින්සන්ට් පෙරේරා මහතා**
**(திரு. கே. வின்சன்ற் பெரேரா)**
**(Mr. K. Vincent Perera)**

දක්ෂ ලෙස හම්බ කරනවා. සොරකම් කිරීමෙන් ඒ අය හම්බ කරනවා. නමුත් ගරු ඇමතිතුමනි, මා ප්‍රථමයෙන් මතක් කළ පරිදි ඒ තත්ත්වය මග හරවා ගැනීමට සමුපකාර දෙපාර්තමේන්තුවේ යම් යම් නීති රීති තිබෙනවා. මේ නීති රීති හරියාකාර පරීක්ෂණයට භාජනය කර හරියාකාර කටයුතු කරනවා නම්, සෑම මාසයකදීම ඒ අයගේ වාර්තා පිළිගෙන ඒ අනුව කටයුතු කරනවා නම්, එකම සමුපකාරයකින්වත් හොරකම් කරන්නට බැහැ කියන එක මගේ විශ්වාසයයි. මෙහි තිබෙන දුර්වල පාලනය ඉවත් වන්නට ඕනෑ. දුර්වල පාලනය ඉවත් වුණොත් මේ තත්ත්වය මීට වඩා කාර්යක්ෂම ලෙස පවත්වා ගෙන යන්නට අපට පුළුවන්. විශේෂයෙන්ම මම ගරු ඇමතිතුමාට මතක් කළේ එවැනි දූෂණ තිබෙන සමිතිවලට එතුමාගේ ආධාරය ලබා නොදීමටත්, සමුපකාර සංවර්ධන කොමසාරිස්තුමා වගකීම භාරගත් අවස්ථාවලදී — දෙපාර්තමේන්තුවේ උසස් ඥානවන්ත කාර්යශූර නිලධාරීන් ඒ තැන්වලට පත් කළ අවස්ථාලවලදී — අන්න ඒ සහනය ලබාදීමටත් කටයුතු කිරීම යෝග්‍යයි කියන එකයි. මගේ අදහස එයයි.

මේ අවස්ථාවේදී ගරු මුදල් ඇමතිතුමාටත් ආහාර හා සමුපකාර ඇමතිතුමාටත් මගේ ගෞරවනීය ස්තුතිය පිරිනමන්න කැමතියි. ඇත්තවශයෙන්ම ඒ දෙපොළ ඒ සඳහා සුදුසුකම් ලබාගෙන තිබෙනවා.

කළමනාකරණයේ අඩුපාඩු සහ අද පවතින ආර්ථික රටාව තුළ සාර්ථක ලෙස මෙය පවත්වා ගෙන යන්නට අපොහොසත් වූ සමිතිවලට ආධාර ලබා දී තිබෙනවා. එසේ ආධාර ලබා දීම ගැන මම විශේෂයෙන් මේ අවස්ථාවේ සඳහන් කරන්නට ඕනෑ. මගේ ආසනයේ බුලත්කොහුපිටිය සමුපකාර සමිතිය ගැනත් මම මේ අවස්ථාවේදී මතක් කරන්නට ඕනෑ. බුලත්කොහුපිටිය සමුපකාර සමිතිය දුර්වල අවස්ථාවකට පත් වූ අවස්ථාවේ විශේෂයෙන් ආධාර ලබා ගෙන දෙපාර්තමේන්තුවේ නිලධාරීන් පත් කර කටයුතු කිරීම නිසා — විශේෂයෙන් මගේ ඉල්ලීම මත ඒ ස්ථානයේ සේවය කිරීම සඳහා කරවිට කියා දෙපාර්තමේන්තුවේ පරීක්ෂක නිලධාරී මහත්මයෙකු සභාපති වශයෙන් පත් කළා — අද ඒ සමිතිය ඉතාමත්ම දියුණු තත්ත්වයකට පත් වී තිබෙනවා යයි මම ඉතාමත්ම ආඩම්බරයෙන් මේ අවස්ථාවේදී මතක් කරන්නට ඕනෑ. එමෙන්ම අල්ලපු ආසනය වන මගේ මිත්‍ර දැරණියගල ගරු මන්ත්‍රීතුමාගේ (ඒ. කේ. ඩී. වනිගරත්න මහතා) කොට්ඨාශයේ සමිතියත් ඒ ආකාරයෙන්ම තිබුණු සමිතියක්. ඒ සමිතියටත් අද පරීක්ෂක මහත්මයෙක් පත් කර එයත් අද ලාභ ලබමින් ඉතාමත්ම සාර්ථකව කටයුතු කරගෙන යන බව මම මතක් කරන්න ඕනෑ. ඇත්තවශයෙන්ම මම මේ අවස්ථාවේදී මෙන්න මේක මතක් කර දෙන්න ඕනෑ. අලාභ ලබන සමිති එසේ අලාභ ලබන්නට හේතු මම කලින් දැක්වූවා. එවැනි අවස්ථාවලදී පුළුවන් තරම් නිලධාරී මහත්වරුන් ඒ තැන්වලට යොදවා කටයුතු කළොත්, අවංක මහත්වරු ඒ තැන්වලට යොදවා කටයුතු කළොත්, මීට වඩා සැලකිය යුතු විධියට මෙය දියුණු කර මහජනතාවට හොඳ සේවාවක් ඉටු කර දෙන්නට අපට පුළුවන්ය කියන එකයි, මගේ විශ්වාසය.

සමුපකාර ව්‍යාපාරයේ නියැලී සිටින සේවක මණ්ඩලයට වරප්‍රසාද ලැබිය යුතුයි. සමුපකාර සේවකයාගේ අභිවෘද්ධිය සඳහා ඇතිවූ සමුපකාර සේවක කොමිෂන් සභාවෙන්ද අපේක්ෂිත සේවය ලැබී නැහැ. සමහර සමිතිවල අවුරුදු ගණන් ක්‍රියාමාර්ගයක් නොගෙන වැඩ තහනම් කළ සේවකයන්ද සිටිනවා. සමුපකාර සේවක කොමිෂන් සභාව අහෝසි කර කම්කරු නීතිය සමුපකාර සේවකයාටත් බලපැවැත්වෙන ආකාරයට නීති පැනවිය යුතුයි.

මේ අවස්ථාවේදී මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා. දෙපාර්තමේන්තුවත් සමග සාකච්ඡා කර අද මේ සමුපකාර සේවකයාට විඳින්නට සිදු වී තිබෙන දුක් කම්කටොළු හා ගැහැට ගැන කල්පනා කර කඩිනම් පියවරක් ගත්තොත් මැනවැයි කියන එකයි, මගේ විශ්වාසය. ඒ තුළින් සමුපකාර ව්‍යාපාරයට විශාල සහයක් ඇතිවෙයි කියා මම විශ්වාස කරනවා. අවසාන වශයෙන් මම මේ අවස්ථාවේදී මතක් කර සිටින්නේ විශේෂයෙන් මේ ආහාර හා සමුපකාර වැය ශීර්ෂ යටතේ මම ඉදිරිපත් කළ කාරණා පිළිබඳව ඔබතුමාගේ දැඩි අවධානය යොමුකර ඒවා හැකිනාක් දුරට ක්‍රියාත්මක කරන ලෙසයි. ආණ්ඩුවත්, ඒ වාගේම ඒ ඒ කොට්ඨාශ නියෝජනය කරන ගරු මන්ත්‍රීවරුත් අද සමුපකාර ව්‍යාපාරය ව්‍යාප්ත කරලීමේ නිරතව කටයුතු කරනවා. ඒ ගරු මන්ත්‍රීවරුන්ගේ සහයෝගය ඔබතුමාටත්, ඔබතුමාගේ දෙපාර්තමේන්තුවටත් නොඅඩුව ලැබෙනවා කියා මම මතක් කරනවා.

අපේ ගරු ඇමතිතුමා මේ ආහාර අංශයෙන් හා සමුපකාර අංශයෙන් අපට දක්වා තිබෙන අනුග්‍රහය අපි ඉතා අගේකොට සලකනවා. එතුමාගේ ලේකම් තුමාටත් මේ අවස්ථාවේදී මම ස්තුතිවන්ත වෙන්නට ඕනෑ. යම් යම් අවස්ථාවලදී සමුපකාරය පිළිබඳව ගැටළු ඇති වූ විට මම එතුමා සමග සාකච්ඡා කර තිබෙනවා. ඒ අවස්ථාවලදී මේ ලේකම්තුමා අවශ්‍ය උපදෙස් ලබා දී ඒවා කඩිනමින් නිරාකරණය කර දී තිබෙනවා. මම විශේෂයෙන් සඳහන් කරන්නට ඕනෑ නියෝජ්‍ය ඇමතිතුමා ගැන. ගරු ඇමතිතුමා රටින් බැහැරව සිටියදී වැඩ බලන ඇමති වශයෙන් එතුමා මට විශේෂ සහායක් ලබා දී ඉතා බලවත් කටයුත්තක් නිරාකරණය කර දීමට පොහොසත් වුණා. එනිසා මගේ කෘතඥතාවය එතුමාට හිමි වෙනවා. ඒ වාගේම දෙපාර්තමේන්තුවේ සියලුම නිලධාරී මහතුන්ටත් මගේ ස්තුතිය හිමි කරමින් මම නිහඬ වෙනවා.

**සභාපතිතුමා**
**(தலைவர்)**
**(The Chairman)**

Order, please ! The Deputy Chairman of Committees will now take the Chair.

*අනතුරුව නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන් නියෝජ්‍ය කාරක සභාපතිතුමා [එඩ්මන්ඩ් සමරවික්‍රම මහතා] මූලාසනාරූඪ විය.*

*அதன் பிறகு, பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுப் பிரதித் தலைவர் அவர்கள் [திரு. எட்மண் சமரவிக்ரம] தலைமை வகித்தார்கள்.*

*Whereupon* MR. DEPUTY SPEAKER *left the Chair, and* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES [MR. EDMUND SAMARAWICKREMA] *took the Chair.*

**ආනන්ද දසනායක මහතා (කොත්මලේ)**
**(திரு. ஆனந்த தஸநாயக்க — கொத்மலே)**
**(Mr. Ananda Dassanayake - Kotmale)**

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ආහාර හා සමුපකාර දෙපාර්තමේන්තු ගැන කතා කරන්නටයි තිබෙන්නෙ. ගරු ඇමතිතුමා ඒවා පිළිබඳ සෑහෙන විස්තරයක් කළා. ඒ වාගේම සප්ලිමන්ටරි එස්ටිමේට් එකක් ගැන නැත්නම් ඌනපූරණ අයක් ගැනත් විස්තර කළා. නමුත් එතුමා හරියට කිව්වෙ නැහැ ඒක ගිය අවුරුද්දේ වැය කළ ඒවා සඳහා ඇඩ්වාන්ස් එකවුන්ට් එකක් හැටියට ගන්නවාද එහෙම නැත්නම් මේ අවුරුද්දේ ඉදිරියට කරන වියදම් සඳහා ගන්නවාද කියා.ඒක පැහැදිලි නැහැ.

**ගාමිණී ජයසූරිය මහතා**
**(திரு. காமினி ஜயசூரிய)**
**(Mr. Gamani Jayasuriya)**

ඇඩ්වාන්ස් එකවුන්ට්.

**ආනන්ද දසනායක මහතා**
**(திரு. ஆனந்த தஸநாயக்க)**
**(Mr. Ananda Dassanayake)**

ඒක නමුත්නාන්සේ කිව්වෙ නැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගාමිනී ජයසූරිය මහතා**
**(திரு. காமினி ஜயசூரிய)**
**(Mr. Gamani Jayasuriya)**

ඊක යෝජනාවේ තිබෙනවා:

**ආනන්ද දසනායක මහතා**
**(திரு. ஆனந்த தஸநாயக்க)**
**(Mr. Ananda Dassanayake)**

යෝජනාවේ තිබෙනවා, සප්ලිමන්ටරි එස්ටිමේට් එකක් කියා.

**සරත්චන්ද්‍ර රාජකරුණා මහතා**
**(திரு. சரத்சந்திர ராஜகருணா)**
**(Mr. Sarathchandra Rajakaruna)**

යෝජනාවේ තිබෙනවාට තමුන්නාන්සේ ඊක කියවා බලා ආවෙ නැහැ ?

**ආනන්ද දසනායක මහතා**
**(திரு. ஆனந்த தஸநாயக்க)**
**(Mr. Ananda Dassanayake)**

මම කියෙව්වා. ඊකේ පැහැදිලි විස්තරයක් නැහැ.

**ගාමිනී ජයසූරිය මහතා**
**(திரு. காமினி ஜயசூரிய)**
**(Mr. Gamani Jayasuriya)**

ගිය අවුරුද්දේ පමණක් නොවෙයි, 1974 සිටම එන පාඩුවක්.

**ආනන්ද දසනායක මහතා**
**(திரு. ஆனந்த தஸநாயக்க)**
**(Mr. Ananda Dassanayake)**

ඊක තමයි තිබෙන ලොකුම දුර්වලකම. මම හිතනවා මේක මුදල් ඇමතිතුමාට ලොකු හිසරදයක් කියා. අපි දන්නවා ඒ ගැන.

**සරත්චන්ද්‍ර රාජකරුණා මහතා**
**(திரு. சரத்சந்திர ராஜகருணா)**
**(Mr. Sarathchandra Rajakaruna)**

තමුන්නාන්සේ කරදර වෙන්න එපා. ඒ ගැන මුදල් ඇමතිතුමා බලා ගනීවි.

**ආනන්ද දසනායක මහතා**
**(திரு. ஆனந்த தஸநாயக்க)**
**(Mr. Ananda Dassanayake)**

අපිට අයිතියක් තිබෙනවා මුදල් ඇමතිතුමා බේරාගන්න.

I am referring to the draft Estimates, Volume (ii), – Estimates of the Revenue and Expenditure of the Government – page 1618. It says: "Head 171 –Department of the Food Commissioner, Programme Employment Summary". The total positions according to that is 2849. That may be the number of employees. Under (*b*), it states "Expenditure met from Advance Account 'Food Purchases and Distribution' "

මේකේ ගණන දමල නැහැ. මෙතන සප්ලිමන්ටරි එස්ටිමේට් එකට ආවට මේ එස්ටිමේට් එකේ එය පැහැදිලි කර නැහැ. මම දන්නෙ නැහැ, මොකක්ද කියල. එතකොට එතන මේ එස්ටිමේට් එකට අනුව මේ සප්ලිමන්ටරි එස්ටිමේට් එක ඉල්ලුවාද ? නැත්නම් වෙන දෙවල්වලටත් වියදම් කරන්න බලාගෙන මේ මුදල ඉල්ලුවාද කියන එක ගැන සැකයක් පහළ වෙනවා. මම දන්නෙ නැහැ, මොන විධියට ගරු ඇමතිතුමා කියනවාද කියල. ඒ නිසා ඒ සම්බන්ධයෙන් ගරු ඇමතිතුමාගේ පිළිතුරු කතාවේදී සඳහන් කරනවා ඇතැයි මා විශ්වාස කරනවා. මේ මුදල ඉල්ලන්නෙ ගිය අවුරුද්දේ ඇඩ්වාන්ස වශයෙන් ගත්ත මුදල පියවා ගන්නද ? නැත්නම් දෙපාර්තමේන්තුවේ ඉදිරියේදී ඇති විය හැකි අඩුපාඩුකම් සම්පූර්ණ කර ගන්නද ? [බාධා කිරීමක්] මම පිළිගන්නවා. 1974 සිට නොවෙයි ඊට ඉස්සර ඉඳල එනවයි කියමුකො. සප්ලිමන්ටරි එස්ටිමේට්ස්වලට විශේෂයෙන්ම අපේ ගරු මුදල් ඇමතිතුමා විරුද්ධයි කියා මම හිතනවා.

**ආර්. ජේ. ජී. ද මැල් මහතා**
**(திரு. ஆர். ஜே. ஜீ. த மெல்)**
**(Mr. R. J. G. de Mel)**

සමහර අත්‍යවශ්‍ය කරුණුවලට පරිපූරක ඇස්තමේන්තු ඉදිරිපත් කරන්නට සිදු වෙනවා. ඒවා පුළුවන් තරම් අඩු කරන්න ඕනැ ; සීමා කරන්න ඕනැ. නැත්නම් අයවැය ලේඛනයේ ඔක්කෝම පරස්පර විරෝධී තත්ත්වයක් ඇති වෙනවා. හිඟය වැඩි වෙනවා.

**ආනන්ද දසනායක මහතා**
**(திரு. ஆனந்த தஸநாயக்க)**
**(Mr. Ananda Dassanayake)**

තමුන්නාන්සේලාගේ සප්ලිමන්ටරි එස්ටිමේට්ස් දිහා බලන්න. මම මේ කියවන්නෙ 1985 දෙසැම්බර් 12 වන බ්‍රහස්පතින්ද – අද දින – න්‍යාය පත්‍රයෙන්. මේ න්‍යාය පත්‍රයේ මෙහෙම සඳහන් වෙනවා.

"Vide Supplementary Estimate No. 33 of 1985 presented on 12th December, 1985 ; total of Supplementary Estimates Nos. 1 to 32 – Rs.7,166,595,374.14".

පූ. භා. 10.45

එතකොට අද වන විට සප්ලිමන්ටරි එස්ටිමේට්ස් 32ක් ඇවිත් තිබෙනවා. අමාත්‍යාංශ තිබෙන්නේ 32ක් ද කියල මම දන්නෙ නැහැ. ඊට අඩුද වැඩිද කියල මම දන්නෙ නැහැ. එකේ සිට තිස් දෙක දක්වා රු. 7,16,65,95,374.14ක් වී තිබෙනවා. එතකොට තමුන්නාන්සේ කියන්නේ මේවා ඔක්කොම අත්‍යවශ්‍යයි කියලද ?

**ආර්. ජේ. ජී. ද මැල් මහතා**
**(திரு. ஆர். ஜே. ஜீ. த மெல்)**
**(Mr. R. J. G. de Mel)**

පරිපූරක ඇස්තමේන්තු පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්නේ කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ඇතිවයි. කැබිනට් මණ්ඩලය තීරණයක් අරගෙන තිබෙනවා, ඒ කියන්නේ රජය තීරණයක් අරගෙන තිබෙනවා, මේවා ඔක්කොම අත්‍යවශ්‍යයි කියා.

**ආනන්ද දසනායක මහතා**
**(திரு. ஆனந்த தஸநாயக்க)**
**(Mr. Ananda Dassanayake)**

රජය අත්‍යවශ්‍යයි කියනවා. මම කියන්නෙ මෙයයි. තමුන්නාන්සේම කියනවා, " මට මේ මුදල් පරිපාලනය කර ගන්න බැහැ. මුදල්මය විනයක් නැහැ " කියල. පරිපාලනයක් නැහැයි කියනවා. එක් එක් ඇමතිවරු ඇස්තමේන්තුවලට අමතරව ඇඩ්වාන්ස් එකවුන්ට් එකෙන් වියදම් කරනවා. ඊළඟට අවුරුද්ද අන්තිමට තමුන්නාන්සේගෙන් සප්ලිමන්ටරි එස්ටිමේට්ස් ඉල්ලනවා. මුදල් ව්‍යුහය වශයෙනුත් මුදල් පරිපාලනය වශයෙනුත් මූල්‍ය විනය වශයෙනුත් මෙය වැරදියි කියන මතය තමුන්නාන්සේටත් කාටත් පිළිගන්න වී තිබෙනවා. එහෙම නම් මේ පරිපූරක ඇස්තමේන්තුවල ගෙවීම් කරන්න වෙන්නේ තමුන්නාන්සේගේ දැන් තිබෙන වැයෙන්. ඒ වැයට මේකත් එකතු වෙනවා. ඊළඟ අවුරුද්දට සත්‍යවශයෙන්ම නැවත පරිපූරක ඇස්තමේන්තු වැඩිවෙනවා. එතකොට මේක දිගින් දිගට එහාට යන එකයි තිබෙන්නේ. කවදාවත් ඉවර කරන්න බැහැ. ඊකට හේතුව මුදල් පරිපාලනය සම්බන්ධයෙන් හරියට කටයුතු කරන්න මුදල් ඇමතිතුමාට ඉඩ නොලැබීමයි. පරිපූරක ඇස්තමේන්තු නොයෙක් විධියට දනවා. බැරි වන තැනදී කරන්නේ ඇඩ්වාන්ස් එකවුන්ට් හැටියට මුදල් ලබාගෙන වියදම් කිරීමයි. එසේ වියදම් කළාම ඊක සම්පූර්ණයෙන්ම කවර්අප් කරන්න පරිපූරක ඇස්තමේන්තු දමා ඇපෘවල් එක ගන්නවා.

**ගාමිනී ජයසූරිය මහතා**
**(திரு. காமினி ஜயசூரிய)**
**(Mr. Gamani Jayasuriya)**

තමුන්නාන්සේලාගේ ආණ්ඩුව පුරුදු කළ ඒවානේ.

**ආනන්ද දසනායක මහතා**
**(திரு. ஆனந்த தஸநாயக்க)**
**(Mr. Ananda Dassanayake)**

ඔව්. තමුන්නාන්සේට ඉතින් හැම එකටම අපි තමයි. හැම එකටම පහුගිය කාලෙ, පහුගිය කාලෙ '. පහුගිය කාලෙ පුරුදු කළ ඒවා අදත් කරගෙන යනවාය කියනවා. ඇමතිතුමා පුංචි ළමයෙක් වෙන්න දඟලන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

එකටයි, මට කණගාටු. ඒවා කියලා මේවායේ තිබෙන වැරදි නැති කරන්න බැහැ. මුදල්මය පරිපාලනය හරියට නොකලොත් වෙන දේ තමුන්නාන්සෙලා දන්නවා. කෝටි එක් දහස් හය සිය ගණනක ප්‍රමාණයක් ණයවලින් පියවන බව ගරු මුදල් ඇමතිතුමා අය වැය කතාවේදී කිව්වා. කෝටි එක් දහස් හය සිය අසූ පහක්ද කොහෙද. මම දන්නෙ නැහැ.

ආර්. ජේ. ජී. ද මැල් මහතා
(திரு. ஆர். ஜே. ஜீ. த மெல்)
(Mr. R. J. G. de Mel)

එක් දහස් නවසියයක්.

**ආනන්ද දසනායක මහතා**
**(திரு. ஆனந்த தஸநாயக்க)**
(Mr. Ananda Dassanayake)

එතකොට කෝටි එක් දහස් නවසියයක් ණය ගන්නවා. එහෙම නම් ඒ ණය විදේශවලින් ගන්නවාද ? නැත්නම් මේ රටින් ගන්නවාද ? ඒත් නැත්නම් භාණ්ඩාගාරයෙන් ගන්නවාද ? සමහර විට භාණ්ඩාගාර බිල්පත් – ට්‍රෙෂරි බිල්ස් – ගහලා ඒවා විකිණීම් වශයෙන් කොමිෂන් එකක් කොම්පැනිවලට, සල්ලිකාරයන්ට, විදේශවලට දීලා ඒ මුදලුත් මේ එක් දහස් නවසියයට එකතු වෙනවා. ඒකත් අතිරේක වශයෙන්, නැති ආදායමකට වැටී මුදල් තත්ත්වය තවත් බාල්දු වෙනවා. ආදයම කෝටි පන්දහ නම් එක් දහස් නව සියයක් කියන්නේ එයින් හරියටම තුනෙන් දෙකක්. එතකොට තුනෙන් දෙකක බාල්දු වීමක් වෙනවා. ඊට එකතු වෙනවා සප්ලිමෙන්ටරි එස්ටිමේට්ස්වල මුදලුත්. ඒකත් මේකට වැටුණාම විශාල මුදලක්. නැති මුදල් කොටසක්, පාවිච්චියට යනවා. අද තිබෙන තත්ත්වයට නම් මුදලේ වටිනාකම අනුව රුපියලේ මිල ශත හතක් හෝ අටක් වෙනවා. මේවාත් එකතු වුණාම මම හිතන හැටියට රුපියලේ වටිනාකම ශත කීයකට වැටේද කියන්න බැරි තරමට බාල්දු වෙනවා. මුදල් ප්‍රසාරණය වෙනවා. මුදල් වැඩි වෙනවා. නමුත් මුදලේ වටිනාකම අඩු වෙනවා. ද්‍රව්‍ය ප්‍රමාණයක් සංවර්ධනය කළ හැකි ප්‍රමාණයක් අඩු වෙනවා. අපි කෝටි ගණන් දෙනවා ලක්ෂ ගණන් දෙනවාය කියා තමුන්නාන්සේලා කියනවා. විසි පන් ලක්ෂයක් පනස් ලක්ෂයක් දෙනවාය කියනවා. ඒ දුන්නට එයින් කරන්න පුළුවන් වැඩ ප්‍රමාණය අනුවයි, සංවර්ධනය වන්නේ. ඒ නිසා සංවර්ධනයට කොපමණ මුදලක් වෙන් කළත් ඉලක්කයක් පෙන්වන්න බැහැ. ඉවරයක් කරන්න බැහැ. කෙරෙන වැඩ ප්‍රමාණය අඩුයි. මුදල් ප්‍රමාණය වැඩි වුණාට වැඩ ප්‍රමාණය අඩුයි.

ද්‍රව්‍ය සම්බන්ධයෙනුත් ඒ වාගේම තමයි. තමුන්නාන්සේලා කෝටි ගණන් මුදල් වෙන් කර ද්‍රව්‍ය ගෙන්වනවා. මුදල් ගණනින් වැඩි වුණාට ද්‍රව්‍ය ප්‍රමාණය අඩුයි. ඇත්තවශයෙන්ම ක්‍රමානුකූල මුදල් පරිපාලනයක් අවශ්‍ය නම් අත්‍යවශ්‍යම අවස්ථාවක ස්පිල්මෙන්ටරි එස්ටිමේට්ස් දීමට කටයුතු කරනවා මිස ඉන් එහාට මෙය පුරුද්දක් හැටියට ගියොත් අය වැය ලේඛනය එන්න එන්නම නරක පැත්තට හැරෙනවා. එයින් රටේ උද්ධමනකාරී තත්ත්වය, මිනිසුන්ට තිබෙන අපහසුකම්, ජීවන බර වැඩි වීම, ද්‍රව්‍යවල මිල වැඩි වීම ආදී ප්‍රශ්න ගොඩක් මෙයින් පැනනගිනවා. ඒ සියල්ලම නැති කරන්න ඕනැ.

ද්‍රව්‍ය මිල අඩු කරන්න තමුන්නාන්සේලා පොරොන්දු වුණා. පුළුවන් තරම් අඩු කරනවාය කිව්වා. එහෙම කියමින් එද ආණ්ඩුවට බැන්නා. පටන් ගන්න කොටත් එහෙමයි කළේ. මැතිවරණ ප්‍රකාශනයෙන් කියන්න ඕනැ ඒවා ඔක්කොම කිව්වා. සිංහල, ඉංග්‍රීසි, දෙමළ භාෂා තුනෙන්ම ඒ ප්‍රකාශනය දුන්නා. ඒ අනුව නම්, තමුන්නාන්සේලාට පුළුවන් කමක් නැහැ මහජනයාට කියන්න ජීවන බර වැඩිවෙන්නේ ලෝකයේ මුදලේ උද්ධමනකාරී තත්ත්වය නිසයි, ලෝකයේ ද්‍රව්‍යවල මිල වැඩි වීම නිසයි, ලෝක බැංකුවේ හෝ ලෝක වෙළඳ පොළේ තත්ත්වය නිසයි කියා. ඒක කියන්න තමුන්නාන්සේලාට බැහැ. එහෙම කියනවා නම් ඇත්තවශයෙන්ම ඒක වැරැද්දක්. තමුන්නාන්සේලා කිව්වා, ඒක බොරුයි කියලා. ලෝක වෙළඳ පොලක් නැහැ කිව්වා. එහෙම එකක් නැහැ කිව්වා, ලෝක වෙළඳ පොළේ කොච්චර මිළ ඉහළ ගියත්, මේ රටේ තිබෙන ද්‍රව්‍යවල මිල ඇයි ඉහළ යන්නේ කියන තර්කයයි, එද ඉදිරිපත් කළේ. තමුන්නාන්සේලාට අමතක වෙලා තිබෙන දෙයක් මම මතක් කරන්න කැමතියි."Programme of Action to create a Just and Free Society" — United National Party — 1977" මේක සම්පූර්ණයෙන්ම මම කියවන්නට යන්නේ නැහැ. මේ එහි සඳහන් මාතෘකාවක් "Food for the Hungry". එහි මෙසේ සඳහන් වෙනවා :

"We have experienced an unprecedented escalation of prices in the past six years. The rupee has brought less and less of the same commodity during this period. We have been subject to pain of mind and the humiliation of being unable to provide our families with essential nourishment due to the high cost of living, corruption and monopoly of State Corporations and Co-operative Societies."

මේකට විකක් ගරු ඇමතිතුමා ඇහුම්කන් දෙනවා නම් හොඳයි. මේක බණ පොත වගේ, බයිබලය වගේ ඒ දවස්වල කිව්ව දෙයක්.

This is the United National Party Manifesto, 1977. You have printed nearly 10 lakhs or more than 10 lakhs of copies. – (*Interruption*). We are reading every article. I got "Siyarata" cuttings here. We are reading them, we want to know. We have studied them. I have got to teach you about these things.

**නියෝජ්‍ය සභාපතිතුමා**
***(பிரதித் தலைவர் அவர்கள்)***
(The Deputy Chairman)

Order, please ! Hon. Member, how long do you want ?

**ආනන්ද දසනායක මහතා**
**(திரு. ஆனந்த தஸநாயக்க)**
(Mr. Ananda Dassanayake)

I just started, Sir.

**නියෝජ්‍ය සභාපතිතුමා**
***(பிரதித் தலைவர் அவர்கள்)***
(The Deputy Chairman)

You have taken 15 minutes now. How long do you want ? Many other Members want to speak.

**ආනන්ද දසනායක මහතා**
**(திரு. ஆனந்த தஸநாயக்க)**
(Mr. Ananda Dassanayake)

There are no Opposition Members here now.

**ගාමිණී දිසානායක මහතා (ඉඩම් හා ඉඩම් සංවර්ධන ඇමතිතුමා සහ මහවැලි සංවර්ධන ඇමතිතුමා)**
**(திரு. காமினி திஸாநாயக்க — காணி, காணி அபிவிருத்தி அமைச்சரும் மகாவலி அபிவிருத்தி அமைச்சரும்)**
**(Mr. Gamini Dissanayake – Minister of Lands & Land Development and Minister of Mahaweli Development)**

I am of the view that the hon. Member for Kotmale must be given some time because he is the shadow Minister for Finance, the shadow Minister for Industries, the shadow Minister for Co-operatives, and I take it, the shadow Minister for Agriculture also.

**ආනන්ද දසනායක මහතා**
**(திரு. ஆனந்த தஸநாயக்க)**
(Mr. Ananda Dassanayake)

I am not going to criticize my Hon. Friend. If I want to criticize you I can. I do not want to attack you.

**නියෝජ්‍ය සභාපතිතුමා**
***(பிரதித் தலைவர் அவர்கள்)***
(The Deputy Chairman)

If the Government Party wants to give time, certainly I can give you time.

**ගාමිණී දිසානායක මහතා**
**(திரு. காமினி திஸாநாயக்க)**
**(Mr. Gamini Dissanayake)**

Sir, May I say something about the last point he made ?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ ගාමිණී දිසානායක මහතා ]

ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා, මිල සම්බන්ධව. එතුමන්ලාගේ පක්ෂයේ සමගි ආණ්ඩුව මේ රට පාලනය කරන යුගයේ එනම්, 1970 - 1977 දක්වා කාලයේ අවශ්‍ය පාරිභෝගික බඩු හැම දෙයක්ම ආණ්ඩුව මගින් ලංකාවට ගෙන්වුවා. ආණ්ඩුවේ ඒකාධිකාරයක් ඒ කාලයේ තිබුණේ. බෙදා හැරීමත් කළේ ආණ්ඩුව මගින්. එතකොට රුපියලේ වටිනාකම කෙසේ වෙතත්, සමූපකාර සහ වෙළඳ අමාත්‍යාංශවල වැය ශීර්ෂ පිළිබඳ විවාද කරන අවස්ථාවලදී විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරුන් හැටියට අප එදා පෙන්වා දුන්නා, එක් පැහැදිලි කාරණයක්.

ඒක තමන්නාන්සේලා අද ඔය ප්‍රකාශ කරන දෙයට වඩා හාත්පසින්ම වෙනස් දෙයක්. එනම්, ලංකාවට බඩු ගෙන්වන ආකාරය සහ ඒ බඩුවල වටිනාකම, රුපියල ඒකකය හැටියට පාවිච්චි කරමින්, එම බඩු පිටරටවල විකුණන මිලත්, අපේ රටේ විකුණන මිලත් සංසන්දනය කර පෙන්නා දුන්නා. ලංකාවට බඩු ආණ්ඩුව මගින්ම ගෙන්වා, සමහර අවස්ථාවලදී සියයට සියයක් ලාභ තබා ගත ඒවා විකුණන බව අප එදා පෙන්වා දුන්නා. මිරිස්, ලූණු, පිටි සහ වෙනත් අවශ්‍ය පාරිභෝගික භාණ්ඩ, මෙරටට ගෙන්වීමේ ඒකාධිකාරය සම්පූර්ණයෙන්ම තිබුණේ සතොසටයි. නැතිනම් සමූපකාර ව්‍යාපාරයටයි. මේ භාණ්ඩ සියයට පණහක්, සියයට හැත්තෑපහක්, සියයට සියයක් වැනි ප්‍රමාණවලින්, ලාභ තබා ගෙන මහජනතාවට විකුණන බව අපි පෙන්වා දුන්නා. විශේෂයෙන්ම මෙරටට ගෙන්වන රෙදි පිළිවලට සියයට තුන් සියයේ ලාභ තබා ගත විකුණන බව එවකට මැද කොළඹ පළමුවන මන්ත්‍රීතුමා, වර්තමානයේ අපේ රජයේ අග්‍රාමාත්‍යතුමා, එවකට ඒ රජයේ සිටි වෙළඳ ඇමතිතුමාට පෙන්වා දුන්නා. ඒ ආකාරයටයි තමුන්නාන්සේලාගේ රජය එදා විශාල වශයෙන් ලාභ ලබා ගත්තේ.

නමුත් අද බඩු මිල සංසන්දනය කර බලනවා නම් එදාට වඩා වෙනස් තත්ත්වයක් පවතින්නේ. රුපියලේ වටිනාකම කෙසේ වෙතත්, යම්කිසි මිලකට ලංකාව තුළ බඩු විකුණනවාද, ඒ මිලට සමාන මිලකටයි සිංගප්පූරුවේ, ඉන්දියාවේ, පකිස්ථානයේ, මෑත පෙරදිග රටවලත් විකුණන්නේ. එම නිසා අද අප භාණ්ඩ විකුණන්නේ ලෝක වෙළඳ පොළේ පවත්නා මිල ගණන් අනුවයි. සබ්සිඩි එකක් නැහැ. අන්න ඒ කාරණය මතක තබා ගන්න.

**රිචඩ් පතිරණ මහතා (අක්මීමන)**
**(திரு. றிச்சட் பத்திரன — அக்மீமன)**
**(Mr. Richard Pathirana – Akmeemana)**

සීනි මිල ගණන් ගැන මොනවාද කියන්නේ ?

**ආනන්ද දසනායක මහතා**
**(திரு. ஆனந்த தஸநாயக்க)**
(Mr. Ananda Dassanayake)

මම එක කාරණයක් මතක් කර දෙන්නට කැමතියි. සීනිවලින් රජය ලබන විශාල ලාභය අනික් කිසිම භාණ්ඩයකින් ලබන්නේ නැහැ. ඒ ලාභය ගැන සිතන විට අනික් භාණ්ඩවලින් ලාභ ලබන්න ඕනෑ නැහැ, සීනිවලින් ලබන ලාභයම ප්‍රමාණවත්.

**ගාමිණී දිසානායක මහතා**
**(திரு. காமினி திஸாநாயக்க)**
**(Mr. Gamini Dissanayake)**

සීනි වෙනත් පාරිභෝගික භාණ්ඩ වාගේ නොවෙයි, කල් තබා ගන්න පුළුවන් ද්‍රව්‍යයක්. එම නිසා කල් වේලා ඇතුව සීනි ගබඩා කර තබා ගන්නවා, ඒ ඒ අවස්ථාවේ පවතින මිල ගණන් අනුව. එසේ ලබාගත් මිල ගණන්වලට අලෙවි කරන විට විරුද්ධ පක්ෂයේ තමුන්නාන්සේලා වර්තනමානයේ වෙළෙඳපොළේ ඇති මිල ගණන් හා සංසන්දනය කරනවා. එහෙම සංසන්දනය කර ලාභය පිළිබඳව තීරණය කරන්න බැහැ.

**ආනන්ද දසනායක මහතා**
**(திரு. ஆனந்த தஸநாயக்க)**
(Mr. Ananda Dassanayake)

මොනවා හරි නිදහසට කාරණයක් තිබෙනවා, කියන්නට. ඒකත් අර කිතුල් ගහට ගිය මනුෂ්‍යයා, තණ කොළ නැති නිසා බහිනවාය කී කථාවට සමානයි. ඔය විධියට පිළිතුරු දී අපේ ඇමතිතුමාට ගැලවෙන්න බැහැ.

සරත්චන්ද්‍ර රාජකරුණා මහතා
(திரு. சரத்சந்திர ராஜகருணா)
**(Mr. Sarathchandra Rajakaruna)**

මන්ත්‍රීතුමා තමන්ට තේරෙන දෙයක් ගැන කථා කරන්න.[බාධා කිරීමක්]

**ආනන්ද දසනායක මහතා**
**(திரு. ஆனந்த தஸநாயக்க)**
(Mr. Ananda Dassanayake)

Are you going to teach me ? I am very sorry. Do not try to teach me.

සරත්චන්ද්‍ර රාජකරුණා මහතා
(திரு. சரத்சந்திர ராஜகருணா)
**(Mr. Sarathchandra Rajakaruna)**

තමුන්නාන්සේට උගන්වන්නට හදනවා නොවෙයි. තමුන්නාන්සේට තේරෙන දෙයක් ගැන කථා කර කථාව අවසන් කරන්න. මුදල් ඇමතිතුමාට අයිති දේවල් ගැනයි, වෙනත් අමාත්‍යාංශයකට අයිති දේවල් ගැනයි කථා කරන්නට ඕනෑකමක් නැහැ.

**ආනන්ද දසනායක මහතා**
**(திரு. ஆனந்த தஸநாயக்க)**
(Mr. Ananda Dassanayake)

මට තේරෙනවාද නැද්ද කියන එක ගැන ප්‍රශ්න කිරීම නියෝජ්‍ය ඇමතිතුමාට අයිති වැඩක් නොවෙයි. [බාධා කිරීමක්]

නියෝජ්‍ය ඇමතිතුමාට මම එක කාරණයක් කියන්නම්. තමුන්නාන්සේට පුළුවනි, මම කියන දේවල්වලට තමුන්නාන්සේගේ කථාවේදී පිළිතුරු දෙන්නට. ඊට වඩා නියෝජ්‍ය ඇමතිවරයෙකු වශයෙන් දඟලන්නට යන්න එපාය කියා මම කියනවා.

සරත්චන්ද්‍ර රාජකරුණා මහතා
(திரு. சரத்சந்திர ராஜகருணா)
**(Mr. Sarathchandra Rajakaruna)**

දඟලන්නට ඕනෑ තැනදී දඟලනවා. තමුන්නාන්සේට ඒක නවත්තන්න බැහැ.

**ආනන්ද දසනායක මහතා**
**(திரு. ஆனந்த தஸநாயக்க)**
(Mr. Ananda Dassanayake)

ඊළඟට, මේකේ 10 වන කොටසේ මෙසේ තිබෙනවා ;

"The UNP will give the utmost priority to reducing the cost of living which reached Himalayan heights under Sirima's rule and made daily life unendurable."

පූ. භා. 11.

මොනවාද කියන්නේ ? ජීවන මිල හිමාලය කන්ද තරම් උසට නැග තිබෙන බව කියා මහජනතාවට අදහස් කා වද්දන්න උත්සාහ කළා. මේ අන්දමට අසත්‍ය ප්‍රචාර ගෙනයමින්, ඒවා මහජනතාවට කා වද්ද, මහජනතාවගෙන් ඡන්දය ලබාගන්නට උත්සාහ කළා. නමුත් එදා තමුන්නාන්සේලා කී කිසිම දෙයක් අද ඉෂ්ට කරන්නට බැරි වී තිබෙන බව පෙනෙනවා. ඉහළ යන ජීවන වියදම පහත දැම්මාද ? රුපියලේ නියම වටිනාකමට සරිලන බඩු ප්‍රමාණයක් දෙන්නට පුළුවන්ද ? අද බුලත්විටක්වත් රුපියලකට ගන්නට පුළුවන්ද ?

**ගාමනී ජයසූරිය මහතා**
(திரு. காமனி ஜயசூரிய)
(Mr. Gamani Jayasuriya)

බුලත්විටක් රුපියලකට ගන්න බැරි වුණත්, බුලත්විටි කීපයක් ගන්නට පුළුවන් තත්ත්වයක ආදායමක් ලැබෙනවා එදාට වඩා. පඩි ප්‍රමාණය සියයට සියයකටත් වැඩි වී තිබෙනවා.

**ආනන්ද දසනායක මහතා**
**(திரு. ஆனந்த தஸநாயக்க)**
(Mr. Ananda Dassanayake)

කොහේද ?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගාමිනී ජයසූරිය මහතා**
**(திரு. காமனி ஜயசூரிய)**
**(Mr. Gamani Jayasuriya)**

හැම කෙනෙකුගේම. කම්කරුවාගේ, සුළු සේවකයාගේ සිට වැඩි වී තිබෙනවා.

**ආනන්ද දසනායක මහතා**
**(திரு. ஆனந்த தஸநாயக்க)**
**(Mr. Ananda Dassanayake)**

නමුත් රුපියලේ වටිනාකම පහත බැසීම නිසා ඇති වී තිබෙන තත්ත්වය ගැන සිතන්න. අපේ ගරු මුදල් ඇමතිතුමා ඔය විධියෙ අසත්‍ය ප්‍රකාශ කර නැහැ. මේ රටේ මුදල් ඇමතිවරයා වශයෙන් රටේ නියම තත්ත්වය ගැන, රටේ මුදල් තත්ත්වය ගැන, පැහැදිලි කරදීම එතුමාගේ වගකීමක්. එතුමා නියම තත්ත්වය පෙන්වා දෙන්න ඕනෑ. එහෙම පෙන්වා නොදුන්නොත් ඇතිවන තත්ත්වය මොකක්ද ? මුදල් ව්‍යුහය පිළිබඳව, මුදල් පරිපාලනය පිළිබඳ, වටිනාකම් පිළිබඳව දන්නා විශේෂඥයන් තවත් අපේ රටේ ඉන්නවා. එමනිසා වැරදි දෙයක් කියා එතුමාට බේරෙන්නට පුළුවන්කමක් නැහැ.

**ගාමිනී ජයසූරිය මහතා**
**(திரு. காமனி ஜயசூரிய)**
**(Mr. Gamani Jayasuriya)**

මන්ත්‍රීතුමනි, මම කිව්වේ එදාට වඩා සිය ගුණයකින් පඩි වැඩිකර තිබෙනවායි කියලයි.

**ආනන්ද දසනායක මහතා**
**(திரு. ஆனந்த தஸநாயக்க)**
**(Mr. Ananda Dassanayake)**

පඩි වැඩිවීම අනුව නමුන්නාන්සේලා මේකයි කියන්නේ—[බාධා කිරීමක්]

**ගාමිනී ජයසූරිය මහතා**
**(திரு. காமனி ஜயசூரிய)**
**(Mr. Gamani Jayasuriya)**

උද්ධමනය ගැන අරවා මේවා ගැන මම කථා කලේ නැහැ.

**ආනන්ද දසනායක මහතා**
**(திரு. ஆனந்த தஸநாயக்க)**
**(Mr. Ananda Dassanayake)**

නමුන්නාන්සේලා නියම විධියට පඩි වැඩි කරනවා නම් හරියටම එද රුපියල් 400ක පඩියක් ලැබුණු පුද්ගලයෙකුට " ඩිවැල්‍යුවේෂන් " එක අනුව ඒ වන්දියට සම කරන්න නම් රුපියල් හාරදහසකට වඩා පඩි වැඩි කරන්නට ඕනෑ. එහෙම කර තිබෙනවාද ? නැහැ. එහෙම නම් පඩි වැඩිවීම සම්පූර්ණයෙන් වැරදි ක්‍රමයටයි කර තිබෙන්නේ.

**සරත්චන්ද්‍ර රාජකරුණා මහතා**
**(திரு. சரத்சந்திர ராஜகருணா)**
**(Mr. Sarathchandra Rajakaruna)**

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, සාමාන්‍ය දැනීමක්වත් නැති කෙනෙකුයි මේ කථා කරන්නේ. බුලත්විටක මිල එතුමා දන්නේ නැහැ. බුලත්විටක මිල රුපියලයි. එහෙම නැත්නම් ශත හැත්තෑ පහයි. ගරු මන්ත්‍රීතුමා ගිහින් බුලත්විටක මිල කීයද කියන එක පළමුවෙන් දැනගෙන එන්න.

**ආනන්ද දසනායක මහතා**
**(திரு. ஆனந்த தஸநாயக்க)**
**(Mr. Ananda Dassanayake)**

රුපියලට නොවෙයි, එකයි පණහටත් ගිහින් තිබෙනවා. බුලත්විටක මිල රුපියල් එකයි පණහටත් ගිහින් තිබෙනවා. එයින් පෙනෙන්නේ අද ජීවන වියදමේ බරපතලකමයි. දැන් ශත දහයක් බිම වැටිලා තිබුණත් මිනිහෙත් අහුලන්නේ නැහැ. ශත දහයකින් කරන්නට පුළුවන් කිසිම වැඩක් නැහැ. ටොෆි එකක් ගන්නත් බැහැ, බුලත්විටක් ගන්නත් බැහැ, ගිනි පෙට්ටියක් ගන්නත් බැහැ, සීනි ටිකක් ගන්නත් බැහැ.

**සරත්චන්ද්‍ර රාජකරුණා මහතා**
**(திரு. சரத்சந்திர ராஜகருணா)**
**(Mr. Sarathchandra Rajakaruna)**

ඒක හරි !

**ගාමිණී දිසානායක මහතා**
**(திரு. காமினி திஸாநாயக்க)**
**(Mr. Gamini Dissanayake)**

ගරු මන්ත්‍රීතුමා මේ ගැනත් පොඩ්ඩක් හිතන්න. අද පුවක් ගෙඩියක් විකුණන්නේ කීයටද ? පුවක් වවන තැනැත්තා පුවක් විකුණන්නේ කීයටද ? බුලත් වවන පුද්ගලයා බුලත් විකුණන්නේ කීයටද ? අද ඒවා වවන උදවියත් මුදල් උපයනවා.

**ආනන්ද දසනායක මහතා**
**(திரு. ஆனந்த தஸநாயக்க)**
**(Mr. Ananda Dassanayake)**

විකුණන තැනැත්තා නැත්නම් වවන තැනැත්තා මුදල් උපයන එක දෙවැනි කාරණය. නමුන්නාන්සේලා පොරොන්දු වූ පරිදි කටයුතු කර නැති එකයි මම කියන්නේ. ආහාර සම්බන්ධයෙන් දුන් පොරොන්දු තිබෙනවා. එද මිනිසුන් මන්දපෝෂණයෙන් පෙළෙනවාය කිව්වා. මන්දපෝෂණය නිසා ඇටසැකිලි විතරයි තිබෙන්නේ කිව්වා. ඇවිදින ඇටසැකිලි කීවා. ඒ නිසා ජනතාවට හොඳට කන්න දෙන්න ඕනෑය කිව්වා. මේ ප්‍රකාශවල තිබෙන්නේ. හොඳම හොඳ ජීවධාතු වැඩිකරන ආහාර දෙන්න ජීවිත සරුසාර කරන්න, ඒවාගේම හොඳට මස් දමන්න කටයුතු කරනවාය කියලයි මේවායේ තිබෙන්නේ. නමුත් නමුන්නාන්සේලා අද මස් දමනවා නොවෙයි, මස් දමනවා වෙනුවට දෙන දිළිඳු සහනාධාර ටිකත් අර දිළිඳු සහන කොමසාරිස් මගින් කපන්නට කටයුතු කර තිබෙනවා. එය දැන් සීයයට පණහක් —[බාධා කිරීමක්]

**ගාමිනී ජයසූරිය මහතා**
**(திரு. காமனி ஜயசூரிய)**
**(Mr. Gamani Jayasuriya)**

ගරු මන්ත්‍රීතුමා, නමුන්නාන්සේගේ ප්‍රදේශයේ හොඳට එන්සාල් වැවෙනවා. ඒ එන්සාල්වලින් නමුන්නාන්සේ කොයිතරම් දියුණු වී තිබෙනවාද ? ඒවායින් අද නමුන්නාන්සේගේ ජන්දදායකයන් කොයි තරම් දියුණු වී තිබෙනවාද ?

**ආනන්ද දසනායක මහතා**
**(திரு. ஆனந்த தஸநாயக்க)**
**(Mr. Ananda Dassanayake)**

එන්සාල් ඒ කාලයේත් තිබුණා. නමුන්නාන්සේලා ඔය මිල සම්බන්ධයෙන් ඔය විධියට කථා කලාට එද තිබුණු තත්ත්වයට වඩා ආදයම අඩු වී තිබෙන බව කියන්න ඕනෑ. නියම ආදයම එද තිබුණු තත්ත්වයට වඩා අඩු වී තිබෙනවා. ඇයි අද ලැබෙන්නේ "ඩිවැලිව් රුපීස්" වලින්. එද තිබුණේ හරියට නියම වටිනාකම තිබුණු රුපියල්. එතකොට එද ලැබුණු ආදයම අද වැඩි වී තිබෙනවාය කියා නමුන්නාන්සේලා කියනවා. සමහරවිට එද ශතයකට විතර විකුණු බඩුවක් අද රුපියලකට විතර විකුණනවා. ඒ විධියේ වටිනාකමේ වෙනසක් සිදු වී තිබෙනවා. ඒ නිසා විශාල මුදලක් ලැබෙනවාය කිව්වාට ඒක ලාභයක් නොවෙයි.

**සරත්චන්ද්‍ර රාජකරුණා මහතා**
**(திரு. சரத்சந்திர ராஜகருணா)**
**(Mr. Sarathchandra Rajakaruna)**

මම නමුන්නාන්සේගෙන් එකක් අහන්නට කැමතියි. නමුන්නාන්සේලාගේ ආණ්ඩුව පැවති කාලයේ තිබුණාට වඩා දැන් හාල් මිල වැඩිද ?

**ආනන්ද දසනායක මහතා**
**(திரு. ஆனந்த தஸநாயக்க)**
**(Mr. Ananda Dassanayake)**

ඔය කොහේ ඉදලාද කථා කරන්නේ ?

**සරත්චන්ද්‍ර රාජකරුණා මහතා**
**(திரு. சரத்சந்திர ராஜகருணா)**
**(Mr. Sarathchandra Rajakaruna)**

මේ ගරු සභාවේ ඉදලයි කථා කරන්නේ. එද හාල් සේරුවක් රුපියල් 25කට වත් ගන්නට පුළුවන් වුණාද ?

**ආනන්ද දසනායක මහතා**
**(திரு. ஆனந்த தஸநாயக்க)**
**(Mr. Ananda Dassanayake)**

හාල් සේරුවක් ? හොර හාල් අදත් ඒ ගණනට යනවා. ඒ විධියට යන තැන් තිබෙනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සරත්චන්ද්‍ර රාජකරුණා මහතා
(திரு. சரத்சந்திர ராஜகருணா)
(Mr. Sarathchandra Rajakaruna)

හොර හාල් අද කීයද ?

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

අද තමුන්නාන්සේලා 'බ්ලැක් මාර්කට්' වෙළෙන්දුව 'කන්ට්‍රෝල්' කරලා තිබෙනවාද ?

සරත්චන්ද්‍ර රාජකරුණා මහතා
(திரு. சரத்சந்திர ராஜகருணா)
(Mr. Sarathchandra Rajakaruna)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, එදා අපි මිරිස් රාත්තල ගත්තේ රුපියල් 45ට.

නියෝජ්‍ය සභාපතිතුමා
(பிரதித் தலைவர் அவர்கள்)
(The Deputy Chairman)

How long do you want to speak ?

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

20 minutes, Sir.

නියෝජ්‍ය සභාපතිතුමා
(பிரதித் தலைவர் அவர்கள்)
(The Deputy Chairman)

I can give you 10 minutes. The Hon. Deputy Minister and the Hon. Minister when they are replying can say all these things, otherwise it is a question of cross-talks going on. I have to give an opportunity to the other hon. Members who want to speak. There are a number of them waiting to speak.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

The Hon. Minister has taken nearly half-an-hour –

නියෝජ්‍ය සභාපතිතුමා
(பிரதித் தலைவர் அவர்கள்)
(The Deputy Chairman)

තවත් මන්ත්‍රීවරුන් කථා කරන්න ඉන්නවා. ගරු මන්ත්‍රීතුමා දැන් කථා කරන්න. උත්තර දෙන්න ඕනෑ ඒවාට ගරු ඇමතිතුමාත් නියෝජ්‍ය ඇමතිතුමාත් කථා කරනකොට උත්තර දෙයි. මන්ත්‍රීතුමාගේ කථාව දැන් පුළුවන් තරම් ඉක්මනින් ඉවර කරන්න.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

මම තමුන්නාන්සේගේ කීමට විරුද්ධ වෙන්නේ නැහැ. ඒක නොවෙයි තිබෙන ප්‍රශ්නය. පැය භාගයකටත් වැඩිය කාලය අරගෙන එතුමා ඉස්සෙල්ලා උත්තර දුන්නා. දැන් තිබෙන්නේ ගරු නියෝජ්‍ය ඇමතිතුමාට අවස්ථාව දෙන්න. ඒ මොකද මම එතුමාගේ කථාව අහන්න බොහොම සන්තෝෂයි.

නියෝජ්‍ය සභාපතිතුමා
(பிரதித் தலைவர் அவர்கள்)
(The Deputy Chairman)

ඒ කථාව දෙන්නේ මමයි. දැන් තමුන්නාන්සේ කථා කරන්න.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

බාධා නොකරනවා නම් මම කථා කරනවා.

"... We shall bring down the cost of living by reducing the artificially increased prices of imported and local goods in a day to day use by increasing local production and shall ensure that the consumer shall not be exploited"

Not be exploited.

රජය මගින් හූරා කන්න ඉඩ දෙන්න බැහැ. ගසාකන්න ඉඩ දෙන්න බැහැ. අද මොකක්ද වෙන්නේ ? අද සී.ඩබ්ලිව්.ඊ. එකට ගෙනෙන ද්‍රව්‍ය ප්‍රයිස් කරන හැටි දන්නවාද ?

සරත්චන්ද්‍ර රාජකරුණා මහතා
(திரு. சரத்சந்திர ராஜகருணா)
(Mr. Sarathchandra Rajakaruna)

නැහැ. කියන්න බලන්න.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

ඒවායේ ප්‍රයිස් කරන හැටි දන්නේ නැති නම් අදවත් තමුන්නාන්සේට පෙන්වන්නම්.

සරත්චන්ද්‍ර රාජකරුණා මහතා
(திரு. சரத்சந்திர ராஜகருணா)
(Mr. Sarathchandra Rajakaruna)

එහෙනම් පොඩ්ඩක් කියන්න.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

ඒවායේ ප්‍රයිස් කරන්නේ – මිල කරන්නේ – ඒගොල්ලන්ගේ පුළුවන් තරම් පාඩු වෙන ඒවා වහගෙන වාසිදායක විධියටයි. ඒ මිල ඇවිත් වැටෙන්නේ – ඒ මිල ගෙවන්නේ –

නියෝජ්‍ය සභාපතිතුමා
(பிரதித் தலைவர் அவர்கள்)
(The Deputy Chairman)

Order, please ! Hon. Deputy Minister let the hon. Member finish his speech because there are other Members who want to take part in the Debate. You can continue. You address the Chair then there will be no problem.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

I am addressing the Chair.

නියෝජ්‍ය සභාපතිතුමා
(பிரதித் தலைவர் அவர்கள்)
(The Deputy Chairman)

You are addressing the Hon. Deputy Minister. Please address the Chair.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

When he keeps on disturbing me I cannot keep quiet.

ඒ මිල නියම කිරීම අද හරියට සිදු වෙනවාද ? අද ඒ මිල නියම කිරීම ඉතාම නරක විධියට කරනවා. සල්සලේ මිල නියම කිරීමේදී ඒගොල්ලන්ගේ සියලුම දුර්වලකම් වහගෙන, දූෂණ වහගෙන වැඩි මිලක් ඒ රෙදිවලට දමනවා. ඒ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වාගේම ආහාර ද්‍රව්‍යවලට මිල නියම කිරීම ගැන තමුන්නාන්සේලා පරීක්ෂා කරන්නේ නැහැ. ඇයි පරීක්ෂා නොකරන්නේ කියා මම අහනවා. එය ගරු ඇමතිතුමා නොවෙයි කරන්නේ. එය වෙනින් තැනකින් කෙරෙන්නේ. නමුත් ගරු ඇමතිතුමා තමයි එයට වග කියන්න ඕනෑ. තමුන්නාන්සේ තමයි මිනිසුන්ට පෝෂ්‍යදායී ආහාර දෙන්න පොරොන්දු වී තිබෙන්නේ. ඒ කියන්නේ හොඳට ඒ-විටමින් තිබෙන්න ඕනෑ. බී-විටමින් තිබෙන්න ඕනෑ. සී-විටමින් තිබෙන්න ඕනෑ. ඔය හැම විටමින් එකක්ම තිබෙන පෝෂ්‍යදායී ආහාර බෙදදීමට තමුන්නාන්සේලා පොරොන්දු වුණා. එහෙම පොරොන්දු වුණු අය මිල නියම කිරීමේදී කටයුතු කරන ආකාරය බලන්න ඕනෑ.

දැන් අපේ ගරු ඉඩම් ඇමතිතුමා කිව්වා මෙරටට ගෙන්වන ද්‍රව්‍යවලට එද මිල නියම කළේ වැරදි විධියට කියා. තමුන්නාන්සේලාගෙන් අද ඒක හරියාකාරව කෙරෙනවාද ? අද එහෙම හරියාකාරව කෙරෙනවා නම් තමුන්නාන්සේලාගේ පිළිතුරු කථාවලින් කියන්න. අද ඒගොල්ලන්ගේ අඩුපාඩු වහ ගන්න, දූෂණ වහ ගන්න, මුදල් නාස්ති වහගන්න මිල නියම කිරීමේදී කොයිතරම් දුරට කටයුතු කරනවාද ? අන්න ඒවා ගැන හොයන්න. අන්න ඒවා ගැන හොයා බලා ඒ "ප්‍රයිසින්" එක කළොත් සමහර විට සෑහෙන ගණනක් මිල අඩු කරන්න පුළුවන්. ඒගොල්ලෝ සමහර ඒවාට කරන්නේ තඩුවක් දලා සේවකයා අස් කරනවා. සේවකයා අස්ථානයේ අස් කෙරුවාම කම්කරු උසාවියෙන් තීන්දුවක් දෙනා ඒ සේවකයා ගන්න කියා. ඒ සේවකයා ගන්නේ නැහැ. ඊළඟට ඒ තීන්දුවට ඇපැල් කළාම සුප්‍රීම් උසාවියෙන් හෝ දිස්ත්‍රික් උසාවියෙන් එම සේවකයා ගන්න කියා එම තීන්දුවම දෙනවා. ඇපැල් කළාම තඩුවේ වියදම පමණක් ලක්ෂ 15 ක් 20 ක් පමණ යනවා. අර සේවකයා සේවයට ගත්තා නම් සමහර වෙලාවට මුළු ගෙවීමම — රුපියල් 20,000කට, 30,000කට වැඩි වෙන්නෙ නැහැ. ඒ විධියෙන් ක්‍රියා නොකරන ඒවා තිබෙනවා. ඒ නිසා ඒවා වහගන්න තමයි "ප්‍රයිසින්" වැඩ පිළිවෙළ ගෙන යන්නේ. ඒවා ඇතුළත්ව තමයි මිල නියම කිරීම කරන්නේ. එහෙම නම් මේ මිල නියම කිරීම් ගැන සැලකිල්ලක් දක්වන්නේ නැත්තේ ඇයි කියා ගරු ඇමතිතුමාගෙන් අහන්න සිදු වී තිබෙනවා. ඊළඟට — [බාධා කිරීමක්]

No, I would not give in.

**සරත්චන්ද්‍ර රාජකරුණා මහතා**
**(திரு. சரத்சந்திர ராஜகருணை)**
**(Mr. Sarathchandra Rajakaruna)**

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, වැඩියෙන් අපි මිල නියම කරනවා කියන එක භාණ්ඩයක් ගැන පුළුවන් නම් කියන්න කියා මම එතුමාට කියනවා.

**ආනන්ද දසනායක මහතා**
**(திரு. ஆனந்த தஸநாயக்க)**
**(Mr. Ananda Dassanayake)**

එක නොවෙයි ගොඩක් කියන්නම්. නියෝජ්‍ය සභාපතිතුමනි, මෙහි කියන විධියට

"…. We shall make available an adequate supply of nutritious food including a minimum cereal content of 8 lbs. per week".

මිනිස්සු කියනවා රාත්තල් 8 නොහොත් "ඇට අට" කියා. මහජනයා කියන්නේ "ඇට අට" කියායි. ඕක අහන්නෙත් කොයි අරයගේ "ඇට අට" කියලයි. දැන් අවුරුදු 8ක් ගිහිල්ලා තමුන්නාන්සේලාට මේවා අමතක වෙලා.

**සරත්චන්ද්‍ර රාජකරුණා මහතා**
**(திரு. சரத்சந்திர ராஜகருணை)**
**(Mr. Sarathchandra Rajakaruna)**

අපට මොකුත් අමතක වෙලා නැහැ.

**ආනන්ද දසනායක මහතා**
**(திரு. ஆனந்த தஸநாயக்க)**
**(Mr. Ananda Dassanayake)**

මිනිසුන්ට දේශීය පෝෂ්‍යදායක ආහාර දීමේ ක්‍රමය සම්පූර්ණයෙන්ම විනාශ කර දැම්මා. රජයෙන් එද සබ්සිඩි එකක් දුන්නා. හාල් සේරුවක් රුපියල් 5ක් වෙනවානම් එයින් සීටටට 80ක්ම අඩු කර සබ්සිඩයිස් කරලයි දුන්නෙ. ඒ මොකද ? මිනිසුන්ට හොඳට කාලා බීලා ශක්තිමත්ව ජීවත් වෙන්න ආහාර සපයා දිය යුතු නිසයි. අද ඒ සියල්ලම තමුන්නාන්සේ ඉවත් කර දමලා. තමුන්නාන්සේ නොවෙයි. මේ ආණ්ඩුවේ තීරණයයි. ආණ්ඩුවේ තීරණය මේවා අස් කරන්නයි. ඇයි ? ලෝක බැංකුවේ ඉල්ලීම උඩයි. ලෝක බැංකුව කියනවා මේවා කරනවානම් අපි ණය දෙනවාය කියා.

**ගාමිනී ජයසූරිය මහතා**
**(திரு. காமனீ ஜயசூரிய)**
**(Mr. Gamani Jayasuriya)**

අපි මේ සාකච්ඡා කරන්නේ ආහාර හා සමුපකාර අමාත්‍යාංශය පිළිබඳවයි. මේ කථා කරන්නෙ සම්පූර්ණයෙන් පිට පැනලයි.

**ආනන්ද දසනායක මහතා**
**(திரு. ஆனந்த தஸநாயக்க)**
**(Mr. Ananda Dassanayake)**

නැහැ. නැහැ. පිට පැනලා නැහැ. තමුන්නාන්සේලාට ටිකක් වේදනාව එනවා මේවා කියන කොට. ආහාර සම්බන්ධවම නව හුගක් තිබෙනවා මේ පොතේ. ඒ එක පොරොන්දුවක්වත් ඉටු කර නැහැ. හැම පොරොන්දුවක්ම කඩලා තිබෙනවා. තමුන්නාන්සේලාගේ මැතිවරණ ප්‍රකාශනයෙන් එද පොරොන්දු දුන්නා. ඒ පොරොන්දු ඉටු කරන්නයි තමුන්නාන්සේලා රජය පිහිටෙව්වෙ. තමුන්නාන්සේලා බැඳිලා ඉන්නවා ඒ පොරොන්දු ඉටු කරන්න. තමුන්නාන්සේලා වේදිකාවල් ගානෙ ගිහින් දිවුරුම් දුන්නා. මේ මැතිවරණ ප්‍රකාශන පොත් ලක්ෂ ගණනක් මුද්‍රණය කර හැමතැනම බෙද හැරියා. එද තමුන්නාන්සේලා දුන් පොරොන්දු ඉටු නොකළ නිසයි අද ජනතාව පිට ලොකු ජීවන බරක් පැටවී තිබෙන්නෙ.

තමුන්නාන්සේලා එක පැත්තකින් මිනිසුන් ජීවත් කරවීමේ අදහස අතහැර ලෝකයට ගියා ණය ගන්න. ඉස්සෙල්ලා තමුන්නාන්සේලා කිව්වෙ මිනිසුන් සංවර්ධනය කරනවාය කියලයි. අපට තිබෙන එකම වස්තුව, ජනතාව සංවර්ධනය කරනවාය කියලයි. ඒ සඳහා මිනිසුන්ට කන්න දෙන්න, අඳින්න දෙන්න ඕනෑය ජීවත් වීමට අවශ්‍ය අනික් පහසුකම් දෙන්න ඕනෑය. ඒ හැර මිනිස්සු විනාශ කරලා මිනිස්සු ඇට සැකිලි බවට පත් කරලා, මිනිසුන් කන්න නැතිව බඩගින්නේ තබා අපි සංවර්ධනය කරන්න යන්නෙ නැහැ, කියා කිව්වා. නමුත් අද තිබෙන තත්ත්වය මොකක්ද ? අද තමුන්නාන්සේලා ඊට වඩා සම්පූර්ණයෙන් වෙනස් පැත්තකයි ඉන්නෙ. ඒ ප්‍රතිපත්තියට විරුද්ධ පැත්තෙයි. ඒ නිසා තමයි තමුන්නාන්සේලාගේ වැඩ කටයුතු මේ ආකාරයට දෝෂ දර්ශනයට ලක් වෙන්නෙ.

පූ. භා. 11.15

අර දිළිඳු සහන ක්‍රමය පිළිබඳව මට එද කථා කරන්න දුන්නෙ නැහැ. මම එද තමුන්නාන්සේලාගේම පත්‍රයකින් කියවාගෙන ගියා. අදත් මම කියවන්න යන්නෙ නැහැ. මුදල් ඇමතිතුමා එද කී දේ පිළිබඳව ප්‍රශ්න කළ අවස්ථාවයි මේ. 1985 දෙසැම්බර් මාසෙ 3 වෙනිද තමුන්නාන්සේලාගේම "සියරට " පත්‍රයේ මෙසේ කියනවා :

" ඔවුනුත් රජයේ සේවකයෝ "

කාටද මේ කියන්නෙ ? මේ ආහාර කොමසාරිස්තුමා විශාල වැරදි වැඩක් කළාය කියා ආහාර කොමසාරිස්තුමාටයි කියන්නෙ. නිලධාරිවාදය ගැන කියාගෙන ගිහින් මෙසේ කියනවා :

" නිලධාරිවාදය රජ කරන අවිය ගැන පාලකයන්ට නැති දැනීමක් අවබෝධයක් සාමාන්‍ය ජනතාවට ඇති බව කවුරුත් දන්නා කරුණකි. "

මේ තැනින් තැන තිබෙන කොටස් :

" මේ තත්ත්වය යටතේ මුදල් ඇමතිවරයා කළ ප්‍රකාශය කොතරම් අගනා එකක්දැයි විස්තර කිරීම උගහටය. ඇතැම් නිලදරුවෝ තමන් දැරූ දේශපාලන දර්ශනය ප්‍රමාණයට වඩා පානය කොට මත් වී සිටිති. "

කවුද මේ මත් වී ඉන්නෙ ? කා ගැනද මේ කියන්නෙ ? ආහාර කොමසාරිස්තුමා ගැනයි. මේක කියන්න හේතු වුණේ මුදල් ඇමතිතුමා එතුමාගේ අය වැය කථාවේදී සීනිවලට මිල වැඩි කෙළේ අය වැයට මාසයකට කලින්ය කියා පෙන්වා දුන් නිසයි. පිටිවල මිල වැඩි කළා. හාල්වල මිල වැඩි කළා. කිරිපිටි මිල වැඩි කළා. ඔය විධියට වැඩි කරන විට අපි කිව්වා, අයවැය ලේඛනයෙන් වැඩි කරන්න අවශ්‍ය නැහැ. වැඩි කරන්න ඕනෑ අත්‍යාවශ්‍ය දේවල්වල මිල වැඩි කරලයි තිබෙන්නෙ කියල. ඒ නිසා මේ අයවැය ලේඛනය පුස්සක් කියල අපි කිව්වා. ඒ සම්බන්ධයෙන් මුදල් ඇමතිතුමා කියූ කථාවක් අයවැය කථාවෙන් තිබෙනවා, පත්‍රයෙත් තිබෙනවා. 1985 නොවැම්බර් 22 වැනිද " සන් " පත්‍රයේ මේ විධියට තිබෙනවා.

"Food Department and traders and guilty of hikes."

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආනන්ද දසනායක මහතා]

ඒ අනුව පෙනී යන්නේ, තමුන්නාන්සේගේ අමාත්‍යාංශය යටතේ තිබෙන ආහාර කොමසාරිස්තුමා තමයි මේ වරද කර තිබෙන්නේ කියලයි. මෙම වරද කර තිබෙන්නේ ආණ්ඩුවත් නොවෙයි, මුදල් ඇමතිතුමාත් නොවෙයි කියල තිබෙනවා. මුදල් ඇමතිතුමා එහෙම අනුමතියක් දුන්නේ නැහැ කියල තිබෙනවා. නමුත් දැන් තමුන්නාන්සේ කිව්වා ආහාර කොමසාරිස්ගේ තත්ත්වය. මේ කටයුතු සම්බන්ධයෙන් කැබිනට් අනුකාරක සභාවක් පත් කර එම අනුකාරක සභාව මගින් මේ පිළිබඳව පරීක්ෂණයක් කළ බවත් ඒ පරීක්ෂණය අනුව " ලෝක වෙළඳපොලේ භාණ්ඩවල මිළ වැඩි වී තිබෙනවා, ඒ අනුව මෙහෙත් ඒ ද්‍රව්‍යවල මිළ වැඩිවෙනවා, අපට කරන්න දෙයක් නැහැ. අපට තිබෙන මුදල් ප්‍රමාණය ආරක්ෂා කර ගන්න ඕනෑ, ඊට වැඩිය දෙයක් කරන්න ගියොත් පාඩු සිදු වුණොත් මේ දෙන සහනාධාරවත් දෙන්න ලැබෙන්නේ නැහැ, ඒ නිසා අපි මෙය කරන්න තීන්දු කළා"ය යනුවෙන් තීරණය කළ බවත් එම තීරණය කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කළ බවත් කිව්වා. කැබිනට් එකෙන් ඒ තීරණය අනුමත වුණා. කැබිනට් එකෙන් මේ තීරණය අනුමත වී තිබෙන්නේ ඔක්තෝබර් 2 වැනිදයි. ඒ තීන්දුව අනුව ආහාර කොමසාරිස්තුමා ඔක්තෝබර් මස 22 වැනිද සිට සීනි, පිටි මිළ වැඩි කළා. කැබිනට් තීරණය අනුව ඒවායේ මිළ වැඩි කළා නම් කොහොමද ඔහුට දෙස් කියන්නේ ? මේ කළ වැරදි ප්‍රකාශන නිසා තමුන්නාන්සේලාගේ " සියරට " පත්‍රය ඒ නිලධාරීන්ට අන්තිම කැත විධියට බනිනවා, " ඒ අය තමයි මේ ආණ්ඩුව කන්නේ, ආණ්ඩුව පෙරළන්නේ, ආණ්ඩුව විනාශ කරන්නේ " කියල.

**නියෝජ්‍ය සභාපතිතුමා**
**(பிரதித் தவிசாளர் அவர்கள்)**
(The Deputy Chairman)

Order, please ! ගරු මන්ත්‍රීතුමා කථාව ආරම්භ කළේ 10.40 ටයි. දැන් මිනිත්තු 40 ක් කථා කරල තිබෙනවා. මේ විධියට කථා කරන්න ගියොත් ඇමතිතුමාට කථා කරන්න වේලාවක් ලැබෙන්නේ නැහැ.

**ආනන්ද දසනායක මහතා**
**(திரு. ஆனந்த தஸநாயக்க)**
(Mr. Ananda Dassanayake)

I am prepared to finish my speech within five minutes.

**මන්ත්‍රීවරයෙක්**
**(அங்கத்தவர் ஒருவர்)**
(A Member)

එයත් ඇමතිවරයෙක්.

**ආනන්ද දසනායක මහතා**
**(திரு. ஆனந்த தஸநாயக்க)**
(Mr. Ananda Dassanayake)

ඔව්, තමුන්නාන්සේලා කවුරුත් එහෙම තමයි හිතන්නේ. මෙතන ඉන්න " බැක් බෙන්චර්ස්ලා " සියළු දෙනාම හිතන්නේ " අනේ මට හෙට හරි ඇමතිකමක් ලැබෙනවා නම් " කියලයි.

**නියෝජ්‍ය සභාපතිතුමා**
**(பிரதித் தவிசாளர் அவர்கள்)**
(The Deputy Chairman)

" බැක් බෙන්චර්ස්ලා " ගැන කථා කරල වැඩක් නැහැ. මූලාසනයට කථා කරල ඉක්මණින් කථාව අවසන් කරන්න.

**ආනන්ද දසනායක මහතා**
**(திரு. ஆனந்த தஸநாயக்க)**
(Mr. Ananda Dassanayake)

තමුන්නාන්සේ මට කිසි දෙයක් කථා කරන්න දෙන්නේ නැහැනේ.

එද අපේ අක්මීමණ ගරු මන්ත්‍රීතුමා (රිචඩ් පතිරණ මහතා) කිව්වා දිළිඳු සහන කොමසාරිස්තුමාගේ චක්‍රලේඛණය ඉවත් කරන්නය, ඒක වෙනස් කරන්නය කියල. එයින් දිළිඳු සහනයක් වෙන්නේ නැහැ, තිබෙන සහනත් කපනවා. එක් එක් අංශයෙන් කොයිතරම් දුරට සහන අඩු වී තිබෙනවාදැයි පෙන්නුම් කරන්නට අපි දැන් සංඛ්‍යාලේඛණ ගොඩක් සූදානම් කර ගෙන සිටිනවා. අද ලංකාවේ දරුවන්ගේ මන්දපෝෂණ ප්‍රමාණය සියයට 35 දක්වා ඉහළ ගොස් තිබෙනවා. එහෙම නම් ඒ ළමයින්ට මාන්දම. එහෙම නම් අර තමුන්නාන්සේලා කියූ විධියට, එනම් ඇටසැකිලි තිබුණු කාලය නැති කරල, හොඳට මස් දල එන පුෂ්ටිමත් ළමයින් හදන්න පුළුවන් වෙයිද මේ යන විධියට ?

**විමලා කන්නන්ගර මහත්මිය (ග්‍රාම සංවර්ධන ඇමතිතුමිය)**
**(திருமதி விமலா கன்னங்கர — கிராம அபிவிருத்தி அமைச்சர்)**
(Mrs. Wimala Kannangara – Minister of Rural Development)

අපි ගම්වලට කිරි එළදෙනුන් බෙදන්නෙ ඒ නිසයි.

**ආනන්ද දසනායක මහතා**
**(திரு. ஆனந்த தஸநாயக்க)**
(Mr. Ananda Dassanayake)

ආ.... කිරි එළදෙනුන් බෙදනවා ! ඒක හරි, පෝෂ්‍යදයි ආහාර දෙන්න. ඒවා ගැන මම කියන්න යන්නේ නැහැ.

තමුන්නාන්සේලා ලෝක බැංකුව කියන විධියට නටන්න යන්න එපා. ලෝක බැංකුව කියන විධියට නටලා මැක්ෂිකෝව අද නට්ටං වෙලා තිබෙනවා. චිලී රට නට්ටං වෙලා ගියා. චිලී ආණ්ඩුවම විනාශ වෙලා ගියා.

**ගාමිණී ජයසූරිය මහතා**
**(திரு. காமினி ஜயசூரிய)**
(Mr. Gamani Jayasuriya)

අපි ලෝක බැංකුව කියන විධියට නටන්න යන්නේ නැහැ. කිරි එළදෙනුන් ගැන කියවුණ නිසා මම එක නිදර්ශනයක් කියන්නම්. ලෝක බැංකුව කියා සිටියා, කිරි ලබා ගැනීමේ කිරි බෙද දීමේ වැඩපිළිවෙල කොම්පැණි මාර්ගයෙන් කරන්නය කියල. ඒ අය කිව්වා සමුපකාරය මගින් කරන්න එපාය කියා. අපි ඒ ගැන සටන් කර සමුපකාරයෙන් කරගෙන යන තත්ත්වය ආරක්ෂා කර ගත්තා. කවුරු හරි කී පළියටම අපි හැම විටම කටයුතු කරන්නේ නැහැ.

**ආනන්ද දසනායක මහතා**
**(திரு. ஆனந்த தஸநாயக்க)**
(Mr. Ananda Dassanayake)

එහෙම නම් කිරි මණ්ඩලය විසුරුවා හැරියේ ? දැන් තිබෙන්නේ 'මිල්කෝ ' කියා කොම්පැණියක්.

**ගාමිණී ජයසූරිය මහතා**
**(திரு. காமினி ஜயசூரிய)**
(Mr. Gamani Jayasuriya)

අපේ සමුපකාරවලින් අදත් කිරිදෙනවා. [බාධා කිරීම්] කියන දේ අහන්නේ නැත්නම් කාට කියන්නද ? යම්කිසි කාරණයක් කීවාම ඒක තේරුම් ගන්න.

**ආනන්ද දසනායක මහතා**
**(திரு. ஆனந்த தஸநாயக்க)**
(Mr. Ananda Dassanayake)

දැන් අපට කියනවා, තේරුම් ගන්න කියා. එතෙක් ලාබෙට දිව්ව, නිෂ්පාදනය වැඩි කරගෙන තිබුණු කිරි මණ්ඩලය විසුරුවා හැරියා. ඒ වෙනුවට 'මිල්කෝ ' කියා කොම්පැණියක් පිහිටෙව්වා. ඒක පිහිටුවන කොටම අපි විරුද්ධ වුණා. ඇයි, ඒ කොම්පැණිය පිහිටෙව්වේ ?

**ගාමිණී ජයසූරිය මහතා**
**(திரு. காமினி ஜயசூரிய)**
(Mr. Gamani Jayasuriya)

කොහෙද, යන්නෙ ; මල්ලෙ පොල් ? මම කියන එක තේරුම් ගන්නකෝ.

**ආනන්ද දසනායක මහතා**
**(திரு. ஆனந்த தஸநாயக்க)**
(Mr. Ananda Dassanayake)

ඒ විධියට කටයුතු කිරීම ගැන අපේ සම්පූර්ණ විරුද්ධත්වය හා අප්‍රසාදය පළ කරනවා. මේ රජය පිහිටුවන්න ඉස්සර ජනතාවට දුන් පොරොන්දු එකක්වත් ඉෂ්ට කර නොතිබීම ගැන අපේ කනගාටුවත්, බලවත් අප්‍රසාදයත් පළකරමින් මගේ කථාව නවත්වනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**රිචඩ් පතිරණ මහතා (අක්මීමන)**
**(திரு. றிச்சட் பத்திரன — அக்மீமன)**
**(Mr. Richard Pathirana – Akmeemana)**

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ආහාර හා සමූපකාර අමාත්‍යාංශයේ වැය ශීර්ෂ සාකච්ඡාවට භාජන වන මේ අවස්ථාවේදී විශේෂයෙන්ම ලංකාවේ සමූපකාර ව්‍යාපාරය සම්බන්ධයෙන් කරුණු කීපයක් ගරු ඇමතිතුමාගේත්, නියෝජ්‍ය ඇමතිතුමාගේත් අවධානයට ලක් කරවන්න මම අදහස් කරනවා. මේ සමූපකාර සමිති ව්‍යාපාරය දීර්ඝ කාලයක් තිස්සේ මේ රටේ ජනතාවට විවිධ අංශවලින් විශාල, වැදගත් සේවයක් ඉෂ්ට කළ ව්‍යාපාරයක්. සමූපකාර සමිති ව්‍යාපාරයේ අගය අපට විශේෂයෙන් දැනෙන්නේ රටේ යම්කිසි කලබලකාරී තත්ත්වයක් ඇති වුණ අවස්ථාවකදීයි. උදාහරණයක් හැටියට, 1983 ජූලි මාසයේදී මේ රටේ ඇති වුණ කලබලකාරී අවස්ථාවේදී සමූපකාර සමිති සිය ප්‍රාදේශීක මගින් ඉතා වැදගත් සේවයක් මේ රටේ ජනතාවට ඉෂ්ට කළ බව පෙන්වා දෙන්න පුළුවනි. මේ සමූපකාර සමිති තිබුණේ නැත්නම් ඒ අවස්ථාවේදී මේ රටේ ජනතාවට පුළුවන්කමක් නැති වෙන්න තිබුණා, තමන්ට අවශ්‍ය පාරිභෝගික භාණ්ඩ ලබා ගන්න. ඒ නිසා මොන හේතුවක් නිසාවත් කවර ප්‍රතිපත්තියක් නිසාවත් මේ ව්‍යාපාරය විනාශ වන්න ඉඩ දෙන්න හොඳ නැහැ. ඒ නිසා තමයි, මේ සමූපකාර ව්‍යාපාරය ගැන අපි දැඩි අවධානයක් යොමු කළ යුතුව තිබෙන්නේ.

විශාල ප්‍රශ්න රාශියකට මුහුණ පාන්න අද සමූපකාර සමිතිවලට සිදු වී තිබෙනවා. කලින් කලවානේ ගරු මන්ත්‍රීතුමා (සරත් මුත්තෙට්ටුවෙගම මහතා) අදහස් දැක්වූ පරිදි, ඊට එක හේතුවක් වී තිබෙන්නේ මේ රජයේ ආර්ථික ප්‍රතිපත්තියයි මාත් විශ්වාස කරනවා. කලින් සමූපකාර සමිති තමයි ; හාල්, පිටි, සීනි වෙළෙඳාම ප්‍රධාන වශයෙන් කළේ. නමුත් අද තත්ත්වය ඊට වඩා වෙනස්. ඒ නිසා සමූපකාර සමිති පවත්වාගෙන යැමේදී විශාල ප්‍රශ්න රාශියකට මුහුණ පාන්න සිදු වී තිබෙනවා [බාධා කිරීම්]

**ගාමිණී දිසානායක මහතා**
**(திரு. காமினி திஸாநாயக்க)**
**(Mr. Gamini Dissanayake)**

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ අවස්ථාවේදී පොඩි අදහසක් ප්‍රකාශ කරන්න ඕනෑ. 1970 - 1977 වකවානුවේදී මේ රටේ තිබුණේ සමූපකාර සමිති නොවෙයි. ඒ ආණ්ඩුවේ හිටපු වෙළෙඳ ඇමතිතුමා ඒ සමිති සම්පූර්ණයෙන්ම අහෝසි කර දැම්මා. ඒ කාලයේ සමූපකාර ව්‍යාපාරය කියන එක නමින් පමණක් තිබුණු ව්‍යාපාරයක්. හිටපු වෙළෙඳ ඇමතිතුමා ඒ ව්‍යාපාරය සම්පූර්ණයෙන්ම ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක් බවට පත් කළා. ඒ නිසා ජාත්‍යන්තර සමූපකාර මධ්‍යස්ථානය ලංකාවට ලියුමක් එව්වා, ලංකාව සමූපකාර ව්‍යාපාරයෙන් නෙරපන්න.

**රිචඩ් පතිරණ මහතා**
**(திரு. றிச்சட். பத்திரன)**
**(Mr. Richard Pathirana)**

මම ගරු ඉඩම් හා ඉඩම් සංවර්ධන ඇමතිතුමාගේ ප්‍රශ්නයට නැත්නම් ප්‍රකාශයට පිළිතුරු දෙන්න යන්නේ නැහැ. ඒක මට අවශ්‍ය කාරණයක් නොවෙයි. එතුමා කී දේ ගැන කරුණු හොයන්නේ නැතිව යමක් කියන්නත් මට බැහැ.

නමුත් මම එකක් කියනවා. කවර රජයක් තිබුණත් මේ රටේ සමූපකාර සමිති ව්‍යාපාරය ආරක්ෂා වන්න ඕනෑ.

**මන්ත්‍රීවරු**
**(அங்கத்தினர்)**
**(Members)**

ඒක හරි.

**රිචඩ් පතිරණ මහතා**
**(திரு. றிச்சட் பத்திரன)**
**(Mr. Richard Pathirana)**

—ඒකයි, මගේ ප්‍රකාශය. ඒ ගැන කිසිම තර්කයක් නැහැ. කලින් ආණ්ඩුව කාලයේදී සමූපකාර සමිතිවල යම් - යම් වැරදි තිබුණා නම් මම ඒක අනුමත කරන්නේ නැහැ. දැන් ඒවායේ වැරදි තිබෙනවා නම් මම ඒක අනුමත කරන්නේත් නැහැ. මම කියන්නේ නැහැ, කලින් අය වැරදි කර නැහැයි කියා. දැනට සමූපකාර අනු - කාරක සභාවක් තිබෙනවා. මමත් ඒකෙ සාමාජිකයෙක් ඒ නිසා මම දන්නවා, එහෙමත් වැරදි ඕනෑ තරම් කර තිබෙන බව. නමුත් ඒ වැරදි දැනුත් කෙරෙන අවස්ථා රාශියක් තිබෙනවා. දේශපාලනයෙන් තොරව ගෙන යනවා නම් තමයි, සමූපකාර ව්‍යාපාරය ආරක්ෂා කර ගන්න පුළුවන් වන්නේ. [බාධා කිරීම්]

**ගාමිණී දිසානායක මහතා**
**(திரு. காமினி திஸாநாயக்க)**
**(Mr. Gamini Dissanayake)**

සමහර රටවල — උතුරු යුරෝපයේ — ආර්ථිකයෙන් සියයට 90 ක් පාලනය වන්නේ සමූපකාර සමිතිවලින්.

**රිචඩ් පතිරණ මහතා**
**(திரு. றிச்சட் பத்திரன)**
**(Mr. Richard Pathirana)**

මම කියන්නේ සමූපකාර සමිති ව්‍යාපාරය ආරක්ෂා කර ගන්න ඕනෑය කියායි. කවර දේශපාලනඥයෙක් ඒකට ගියත් රක්ෂාව දෙන්න, එහෙම නැත්නම් තමාට පක්ෂපාත අය දමා ගන්න, එහෙමත් නැත්නම් තමාගේ දේශපාලන ව්‍යාපාරය සාර්ථක කර ගන්න ඒක උපයෝගී කර ගන්න කටයුතු කරනවා වෙන්න පුළුවන්. ඒ නිසා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ හෝ වේවා එක්සත් ජාතික පක්ෂයේ හෝ වේවා වෙනත් පක්ෂයක හෝ වේවා සමූපකාරයට දේශපාලන ඇඟිලි ගැසීම් තිබෙනවාට මම කැමති නැහැ. ඒක තමයි, මගේ ප්‍රතිපත්තිය. 1985 ජූලි මාසයේ 16 වැනි ද " දවස " පත්‍රයේ ලිපියක් පළ වී තිබෙනවා. මම එය කියවන්නම්.

"රු. කෝටි 100ක ණය බරින් සමූප අසූ පහක් පණ අදී.

විවිධ සේවා සමූපකාර සංගම් අසූ පහකට පාරිභෝගික සේවා පවත්වා ගෙන යැමට නොහැකි තත්ත්වයකට පත්වීම පිළිබඳව ආහාර හා සමූපකාර ඇමැති ගාමනී ජයසූරිය මහතා අවධානය යොමු කර තිබේ.

ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුවට හා සමූපකාර තොග වෙළඳ සංස්ථාවට විවිධ සේවා සමූපකාර සංගම්වලින් රුපියල් කෝටි සියයකට අධික මුදලක් අය වෙන්නට ඇත.

මින් කෝටි 55ක්ම අයවිය යුත්තේ සමූපකාර තොග වෙළඳ සංස්ථාවට බව වාර්තා වෙයි."

ඒ අනුව සමූපකාර සමිති සැහෙන ප්‍රමාණයක් පාඩුදායක තත්ත්වයකින් පවත්වා ගෙන යන තත්ත්වයක්, ඇති වී තිබෙනවා. මෙයට විවිධ හේතු තිබෙනවා. ඒවා ගැන ඇමතිතුමාගේ අවධානය යොමු කරවන්නට කැමතියි. මේ සමහර සමූපකාර සමිතිවල නොයෙක් දූෂණ තිබෙනවා. විවිධ දූෂණ තිබෙනවා. ආහාර හා සමූපකාර කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු උපදේශක කාරක සභාවේ මමත් සිටිනවා. මම ගරු ඇමතිතුමාගෙන් පැහැදිලිව ඉල්ලුවා, යම්කිසි සමූපකාර සමිතියක දූෂණ තිබෙනවා නම්, අධ්‍යක්ෂ මණ්ඩලය දූෂණවල යෙදෙනවා යයි පැහැදිලි සාක්ෂි තිබෙනවා නම්, ඇමතිතුමාගේ බලය යොදා වහාම ඒවා විසුරුවා හරින්නය කියා. එය මේ ව්‍යාපාරය ආරක්ෂා කර ගැනීමට කළ යුතු දෙයක්. ඒ නිසා යම්කිසි සමිතියක අධ්‍යක්ෂවරු වැරදි කරනවා නම්, වැරදි විධියට දේපොළ පරිහරණය කරනවා නම්, ඒ සමිතියේ අධ්‍යක්ෂ මණ්ඩලය සාධාරණ විධියට කටයුතු කරන්නේ නැහැයි හැඟීමක් තිබෙනවා නම්, ඇත්ත වශයෙන්ම ඒ සමිතිය විසුරුවා හරින එක තමයි කළ යුතු කාර්යය.

මේ සමිතිවලට බඩු සපයන්නේ විශේෂයෙන්ම සමූපකාර තොග වෙළඳ සංස්ථාව මගිනුයි.

**ගාමනී ජයසූරිය මහතා**
**(திரு. காமனி ஜயசூரிய)**
**(Mr. Gamani Jayasuriya)**

ගරු මන්ත්‍රීතුමා ඒ කාරණය එහෙම කියා එතැනින් නැවැත්වූ විට පෙනෙන්නේ හරියට මම ඒ අනුව කටයුතු කරන්නේ නැහැ කියනවා වගෙයි. මන්ත්‍රීතුමා අපේ පාර්ලිමේන්තු උපදේශක කාරක සභාවේත් සිටින නිසා කියන්න තමුන්නාන්සේගේ හැඟීම කොහොමද ? මගේ එවැනි අඩුවක් තිබෙනවාද ?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**රිචඩ් පතිරණ මහතා**
**(திரு. றிச்சட். பத்திரன)**
**(Mr. Richard Pathirana)**

මම තමුන්නාන්සේට ස්තුතිවන්ත වෙනවා. තමුන්නාන්සේ අක්මීමන විවිධ සේවා සමුපකාර සමිති සංගමයේ අධ්‍යක්ෂ මණ්ඩලයත් විසුරුවා හැරියා. මම පසුව ඒ ගැන කථා කරනවා. මගේ ඉල්ලීම පිටයි, එය විසුරුවා හැරියේ. මම ඉල්ලා සිටියේ එය විසුරුවා හැර ගරු ඇමතිතුමාට කැමති අධ්‍යක්ෂ මණ්ඩලයක් පත් කරන්නය කියලයි. එසේ පත් කළාම ඇතිවූ තත්ත්වය මොකක්ද ? 1985 ඔක්තෝබර් මාසයේ වාර්තාගත වෙළදාමක්, රුපියල් ලක්ෂ 40ක වෙළදාමක් ඇති වුණා. මේ මෑත අවුරුදු පහ තුළ කවදාවත් ඒ සමිතියේ එවැනි වෙළදාමක් සිදුවී නැහැ. දැන් ඒ සමිතිය බොහොම හොඳට පාලනය වෙනවා. මම කිව්වේ නැහැ, අහවල් අය අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කරන්නය කියා. පත්වී සිටින සභාපතිතුමාටත් අනික් අධ්‍යක්ෂවරුන් දෙදෙනාටත් මම ස්තුතිවන්ත වෙනවා. එමෙන්ම සමුපකාර කොමසාරිස්වරයාටත් මම ස්තුතිවන්ත වෙනවා, ඔහු ගත් ඒ ක්‍රියාමාර්ගය ගැන. හැමදාම ප්‍රාදේශික වහනවා, සේවකයින් අස් කරනවා. සේවකයින්ගේ රැකියා නැති වන තත්ත්වයකුත් තිබුණා. ඒ නිසා අද ඒ මණ්ඩලය විසුරුවා හැර වෙනත් මණ්ඩලයක් පත් කර තිබෙනවා. මා ළඟ ඒ පිළිබඳ වාර්තාව තිබෙනවා. එහි පැහැදිලි විස්තරයක් සඳහන් වෙනවා. මම කිව්වේ මෙහි තිබෙන දූෂණ නිසා මේ සමිතිය ගෙන යන්නට බැහැ, ඒ නිසා කරුණාකර එය විසුරුවා හරින්නය කියලයි. එසේ විසුරුවා හැර දෙපාර්තමේන්තුව කැමති කෙනෙකු පත් කර මාස 6ක් බලන්න කියලයි, මම කිව්වේ. ඇමතිතුමා කැමති කෙනෙක් පත් කරන්න කියලයි මම ඉල්ලීම කළේ. මම කිව්වේ නැහැ, මම කැමති අය පත් කරන්නය කියා.

පූ. භා. 11.30

දැන් එයට අළුතින් අධ්‍යක්ෂ මණ්ඩයක් පත් කර තිබෙනවා. එහි වැඩ කටයුතු දැන් බොහොම හොඳට දියුණු වී තිබෙනවා. ඒ ප්‍රශ්නය මතක් කළ නිසා මම ගරු ඇමතිතුමාගෙන් මේ අවස්ථාවේ ඉල්ලීමක් කරන්න කැමතියි. අද තිබෙන තත්ත්වය අනුව මේ සමිතියේ 1985 ඔක්තෝබර් මාසයේ වෙළඳ පිරිවැටුම් රු. 40,86,055යි. මෑත අවුරුදු 5 තුළ කවදාවත් මේ සමිතිය මේ තරම් වෙළදාමක් කරලා නැහැ. මේ සමිතියෙන් අලාභයි කිව්වා. ඇයි අලාභ වුණේ ? බඩු තිබුණේ නැහැ. පාරිභෝගිකයින්ට අවශ්‍ය බඩු තිබුණේ නැහැ. ප්‍රාදේශික ගණනාවක් වහන්නට ගියා. එම නිසා මම තමුන්නාන්සේගෙන් ඉල්ලීමක් කරන්නට කැමතියි. තමුන්නාන්සේලා ගාල්ල දිස්ත්‍රික්කයේ බලපිටිය, යටලමත්ත, නාගොඩ, තියාගම, පිටිගල, බෙන්තොට කියන සමිතිවලට ආධාර ලබාදී තිබෙනවා. ඒ අනුව දැන් ඒ සමිති දියුණු වෙමින් පවතිනවා.

ඊළඟට ණයදෙන සමිති ගැන, තමුන්නාන්සේට කරුණු කිහිපයක් ඉදිරිපත් කරන්න කැමතියි. 1984 තමුන්නාන්සේලා නිකුත් කළ වාර්තාව අනුව ණය දෙන සමුපකාර සමිති 1,758ක් තිබෙනවා. මුළු ලංකාවේම තිබෙන්නේ සමුපකාර සමිති 3,728යි. එයින් 1,758ක් සකසුරුවම් හා ණය දෙන සමිති. මේ සමිතිවලින් ඉතාමත්ම වැදගත් කාර්ය භාරයක් මේ රටේ ගම්බද ප්‍රදේශවල ඉෂ්ට කරනවා. දැන් ග්‍රාමෝදය මණ්ඩල ක්‍රමය යටතේ නිවාස ණය දීම ණය දෙන සමුපකාර සමිති මගින් කරන්න අළුත් වැඩපිළිවෙළක් තිබෙනවා. කරුණාකර මේ ණය දෙන සමිති අද තිබෙන තත්ත්වයෙන් පරිහානියට පත්වෙන්නට ඉඩ දෙන්න එපා, ඒ හේතුව නිසා. දැන් හැම ගම්වලම නොයෙක් ප්‍රශ්න ඇති වී තිබෙනවා. මම දන්නවා සමහර සමුපකාර සමිති තිබෙන බල ප්‍රදේශ තුළම තවත් ණය දෙන සමිති ඇති කරන්න උත්සාස කරනවා. ඒ නිසා දැන් මේ ගැන අවුලක් ඇති වෙලා තිබෙනවා.

ගරු ඇමතිතුමනි, තමුන්නාන්සේ සංඛ්‍යාලේඛන බලන්න. සියලුම වර්ගවල සමුපකාර සමිති තිබෙන්නේ 3,728යි. එයින් 1,758ක්ම ණය දෙන සමිති. මේ ණය දෙන සමිති ඇති කළේ නිවාස ණය දීමේ පරමාර්ථය ඇතුව නොවෙයි. මේවා ගම්වල මිනිසුන්ගේ වුවමනාවට ඔවුන්ගේ යහපත සඳහා ඇති කළ සමිති. දැන් මේ අළුත් ක්‍රමය ආවාට පසුව සමහර පුද්ගලයෝ මේ සමිති බල ප්‍රදේශ තුළම අළුතෙන් සමිති ඇති කරන්න යනවා. ඒ නිසා මේ නිවාස ණය දීමේ ක්‍රමය ණය දෙන සමිති මගින් ක්‍රියාත්මක කිරීමේදී ප්‍රශ්න ඇති වෙනවා. මම ඔබතුමාට මතක් කරන්න කැමතියි, මේ සමුපකාරය කියන එක වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම ක්‍රියාත්මක වන්නේ ණය දෙන සමිතිවල බව. එමනිසා කරුණාකර මේ ණය දෙන සමිති ටික මේ කාරණය නිසා පරිහානියට පත්වෙන්න ඉඩ දෙන්න එපා. මේ ගැන ඉතාම දැඩි අවධානයක් යොමු කරන්න ඕනෑ. නිවාස ණය දීමේ ක්‍රමය මේ සමිති මගින් ඇති කරන්න ගිහින් අළුත් සමිති නිසා නොයෙක් භේද ගම්වල ඇති වෙන තත්ත්වයට වැඩ කරන්න ඉඩ දෙන්න එපා. සහකාර කොමසාරිස්වරුන්ට උපදෙස් දෙන්න අළුතෙන් සමිති පිහිටු වීමේදී දැනට පවතින සමිතිවලට කිසිම හානියක් නොවෙන ආකාරයෙන් කටයුතු කරන්න කියා. දැන් නොයෙක් අවුල් ඇතිවෙලා තිබෙනවා.

අද සමහර ගම්වල ටික දෙනකු එකතු කරගෙන සමිති පිහිටුවන්න හුඟ දෙනෙක් උත්සාහයක් කරනවා. මොකටද ? මේ නිවාස ණය සමිතියෙන් ලබා දෙන නිසා ඒ වැඩපිළිවෙළ ක්‍රියාත්මක කරන්න. මෙපමණ දවස් මේ අයට මේ සමිතිවල ඕනෑකමක් තිබුණේ නැහැ. සමුපකාර සමිතියට ආදරයක් තිබෙනවා නම් සමුපකාර සමිති ව්‍යාපාරය පවත්වාගෙන යන්නට ඕනෑ නම් ගම්වල ණය දෙන සමිති කලින් පිහිටුවා ගන්නට තිබුණා. අළුත් සමිති ආරම්භ කරනවා නම් කරුණාකර බොහොම ප්‍රවේශමෙන් එය කරන හැටියට මම ඉල්ලා සිටිනවා.

මගේ ආසනයේ තිබෙනවා ඉතාමත්ම දියුණුවට පත්වුණු සමිති රාශියක්. ග්‍රාමීය බැංකු පිහිටුවා, ඒ කියන්නෙ, ණය දෙන බැංකු පිහිටුවා ඒ බැංකු මගින් විශාල සේවාවක්, රුපියල් 10,000 සිට 20,000 දක්වා තරම් ප්‍රමාණයක් ණය දෙන සමිති තිබෙනවා. ඒ සමිති ක්‍රමානුකූලව ක්‍රියාත්මක කරන්න ඕනෑ. 1980 දී සමිති 1,315යි. 1981 දී සමිති 1,447යි. 1982 දී සමිති 1,570යි. 1983 දී 1,685යි. 1984 දී 1,758යි. එයින් පෙනෙනවා දිගටම මේ සමිති සංඛ්‍යාව වැඩිවෙලා තිබෙනවා මිසක් අඩුවෙලා නැහැ. වර්ෂයෙන් වර්ෂයට වැඩි වෙලා. ඒ නිසා සමුපකාර ව්‍යාපාරයට ලැදි පුද්ගලයෙක් හැටියට මම ඉතා කැමැත්තෙන් මේ සමිතිවල දියුණුව අපේක්ෂා කරනවා. එමනිසා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලන්න කැමතියි මේ තත්ත්වය ගැන ඉතා ප්‍රවේශමෙන් ඒ නිලධාරීන්ට උපදෙස් දී මේකෙන් අවුලක් ඇති නොවෙන්න කටයුතු කරන හැටියට.

ඊළඟට පොල්ගොල්ලේ සමුපකාර විද්‍යාලය ගැනත් කිව යුතුයි. එහි විභාග පවත්වනවා ; සමුපකාරිකයින් පුහුණු කරනවා ; නිලධාරීන් පුහුණු කරනවා. සමුපකාර සේවක සාමාන්‍ය පෙළ විභාගය හා උසස් පෙළ විභාගය කියා විභාග දෙකක් පවත්වනවා. මම තමුන්නාන්සේගෙන් ඉල්ලන්න කැමතියි කරුණාකර සමුපකාර සමිති පරීක්ෂකවරුන් වැනි අය ගන්නා විට මෙහි පුහුණුව ලැබූ අයට ප්‍රමුඛත්වය දෙන ලෙස. දැනට තමුන්නාන්සේලා ඒ අයට ලකුණු ටිකක් දෙන බව මම දන්නවා. නමුත් ඒ පුහුණුව ලැබූ අයට විශේෂ ප්‍රමුඛත්වයක් දෙන්න කියා මම ඉල්ලා සිටිනවා. ඒ කාර්යය සාර්ථකව කරන්න ඒ අයට පුළුවන්කම තිබෙන නිසා ඒ ප්‍රමුඛත්වය දෙන්නටය කියා මම ඉල්ලන්න කැමතියි.

ගරු කළවානේ මන්ත්‍රීතුමා (සරත් මුත්තෙට්ටුවෙගම මහතා) සඳහන් කළ කාරණයක් ගැනත් මමත් ඉතාමත්ම කෙටියෙන් සඳහන් කරන්නට ඕනෑ. අධ්‍යාපන සේවක සමුපකාර සමිතිය ගැන කථා කිරීම මගේ යුතුකමක්. මෙය ගුරුවරුන්ගේ සමුපකාර සමිතියක්. දීර්ඝ කාලයක් තිස්සේ මේ රටේ ගුරුවරුන්ට සහනයක් සැලසූ ආයතනයක්. නමුත් කණගාටුවට පත්විය යුතු තත්ත්වයකට අද එම ආයතනය පත්ව තිබෙනවා. මගේ හැඟීමේ හැටියට මේ කාරණයට මූලික හේතුව නම් මේ සමිතියටත් දේශපාලනය වැද්ද ගැනීමයි. මූලික හේතුව එයයි. දේශපාලන අදහස් දරන අය මේවායේ මූලිකත්වය ගන්න ගියාම මේ සමිතිවල විශාල අක්‍රමිකතා ඇති වෙනවා. තමුන්නාන්සේලාගේම පරීක්ෂණයකින් සොයා ගන්නා ලද දූෂණ වගයක් සම්බන්ධයෙන් කළවාන ගරු මන්ත්‍රීතුමා (සරත් මුත්තෙට්ටුවෙගම මහතා) කිව්වා. ඒවා ගැන තමුන්නාන්සේලා දන්නවා. පත්‍රවල පළවී තිබුණා. සමුපකාර සංවර්ධන කොමසාරිස්තුමාගේ පූර්ණ අනුමැතියක් නැතිව විශාල මුදලක් වැය කොට ඇති බව දැනගන්නට ලැබී තිබෙනවා. එම පරීක්ෂණය කර තිබෙන්නෙ තමුන්නාන්සේලා විසින්මයි.

"රුපියල් හැටහත් ලක්ෂයක පමණ මුදලක් සමුපකාර සංවර්ධන කොමසාරිස්වරයාගේ අනුමැතියෙන් තොරව වැය කොට ඇතැයි දැනට හෙළි වී තිබේ."

එතකොට ලක්ෂ 67ක් අනුමැතියෙන් තොරව වැය කර තිබෙනවා. ණය ඉල්ලුම් පත්‍ර 5,446කට ණය දී නැතිලු. කතරගම විශ්‍රාම ශාලාවකට මුදල් යොදවා තිබෙනවා. රෝහලක් සඳහා ඉඩමක් අරගෙන තිබෙනවා. ඔය ආදී වශයෙන් නොයෙක් ඒවා කර තිබෙනවා. මෙන්න මේ තත්ත්වය නැති කරන හැටියට ගරු ඇමතිතුමාගෙන් මා කරුණාවෙන් ඉල්ලා සිටිනවා. දැනට සමුපකාර කොමසාරිස්වරයා විසින් කමිටුවක් පත් කර තිබෙනවා. ඒත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පාලක මණ්ඩලයක් මගින් තමයි මෙය පාලනය වෙන්නෙ. එහෙම වුණත් මෙහි ක්‍රියාකාරිත්වය දිගටම ගෙනයන්න ඕනෑ. අපේ පළාත්වල ඉන්නවා දුප්පත් ගුරු මහත්වරු. මේ ඒ අය ණය ගන්නෙ මේ ආයතනයෙනුයි. නිවාස හදන්නට ආදී නොයෙකුත් දේවල්වලට ණය ගන්නේ මේ ආයතනයෙන්. ඒ නිසා මේ ආයතනයේ කටයුතු දිගටම ගෙන යන්න ඕනෑ. තමුන්නාන්සේට මම තව ලිපියකින් කොටසක් කියවන්නම්.

"කළකිරී පැත්ත වැටී තමන්ගේ පාඩුවේ සේවය කරන මෙරට ගුරු පිරිසේ සුභ සාධනයට තිබුණේ ගුරු සමුපකාරය පමණි. දේශපාලන පිළිකාවෙන් එය ද දැන් රෝගීය. දේශපාලන පිළිකාවෙන් එය මුදවා යළිත් එය සාමාජික ගුරු ජන නියෝජිතයන්ගේ පාලන අධිකාරිට පැවරීමට රජයේ පාලන කොමිටිය ඉක්මණින් ක්‍රියා මාර්ග ගත යුතුයි."

පත්‍රයට තිබුණු ලිපියකින් කොටසක් මා ඒ කියෙව්වෙ. සිරිල් එඩේරමුල්ල නමැති "දිවයින" පත්‍රයට ලිපි ලියන මහත්මයෙක් විසින් ලියන ලද ලිපියකින් කොටසක් මා ඒ කියෙව්වෙ.

නොයෙක් සාමාජිකයන් තුළ දැන් මේ සමිතිය ගැන විවිධ මත තිබෙනවා. ඒ නිසා සාමාජිකයන්ට මෙහි තත්ත්වය පැහැදිලි කර දීම අලුත් පාලක මණ්ඩලයේ යුතුකමක්ය කියා මා සිතනවා. දැන් මේ අස් කළ අධ්‍යක්ෂ මණ්ඩලය ඉන්නවා. ඒ අය හැම තැනම කියා ගෙන යනවා, "අපි තමයි නියම සේවයක් කෙළේ" කියල. දැන් මේ පත්තරේම තිබෙනවා, හිටපු අධ්‍යක්ෂ මණ්ඩලයේ මහත්මයෙකු වන විමලසාර මැද්දෙගෙදර විසින් ලියන ලද ලිපියක්. මම ඒ ලිපියත් කියෙව්වා. එයා කියා තිබෙනවා ඒ කාලය බොහොම හොඳ දීප්තිමත් යුගයක්ය කියල. දීප්තිමත් යුගයක්. නමුත් මේ විධියට තමයි මුදල් වියදම් කර තිබෙන්නෙ. කිසිම අනුමැතියක් නැතිව මුදල් වියදම් කර තිබෙනවා. එම නිසා මෙහි නියම තත්ත්වය කරුණාකර සාමාජිකයන්ට පැහැදිලි කර දෙන්න. මෙන්න මේ වගේ වැඩ හිටපු අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කර තිබෙනවාය කියා සාමාජිකයන්ට පැහැදිලි කර දෙන්න. මේ අධ්‍යක්ෂ මණ්ඩලය විසුරුවා හැරියේ මෙන්න මේ නිසයි කියා පැහැදිලි කර දෙන හැටියටත්, මේ සමිතියේ තිබෙන දූෂණ තත්ත්වය නැති කර එම සාමාජිකයන්ට සාධාරණයක් ඉටු කර දෙන හැටියටත් මම තමුන්නාන්සේගෙන් ඉල්ලා සිටිනවා.

ඊළඟට සමුපකාර සේවක කොමිෂන් සභාව ගැන කියන්න ඕනෑ. මේ ගැන අපි හැමදාමත් කියනවා. මේ කොමිෂන් සභාවේ කාර්යයන් ගැන ඇත්තවශයෙන්ම අපට සතුටට පත්වෙන්න පුළුවන්කමක් නැහැ. මොකද ? කොමිෂන් සභාවේ ඉන්න මහත්වරුන්ට කරන චෝදනාවක් හැටියට මම මෙහෙම කියනවා නොවෙයි. මම දන්නවා, දැන් මගේ ආසනයේ සමුපකාර සමිති සේවකයන් කීපදෙනෙකුටම නැවත රැකියාව දෙන්න කියා සමුපකාර සේවක කොමිෂන් සභාවෙන් නියම කර තිබෙනවා. නමුත් එය එතැනින් ඉවරයි. ඊට එහාට යන්න කොමිෂන් සභාවට කිසිම බලයක් ඇත්තේ නැහැ. අවුරුදු හයක් හතක් බලාගෙන සිටියත් ඒ නියෝගය ක්‍රියාත්මක වෙන්නෙ නැහැ. ඒ වගේම සේවයට ගන්න අයට හිඟ වැටුප් ගෙවන්නය කියා කොමිෂන් සභාවෙන් නියම කරනවා. එයත් ක්‍රියාත්මක වෙන්නෙ නැහැ. එහෙම නම් මේ සමුපකාර කොමිෂන් සභාවට තිබෙන බලතල මොනවාද කියල අපට හිතෙනවා. සේවකයන් ඇවිත් අපට පැමිණිලි කරනවා. කොමිෂන් සභාවෙන් නියම කර තිබෙනවා හිඟ වැටුප් ගෙවන්නය කියා. නමුත් ගෙවන්නේ නැහැ කියලා අපට ඇවිත් පැමිණිලි කරනවා. කොමිෂන් සභාවෙන් එහෙම නියම කළත් අධ්‍යක්ෂ මණ්ඩලයට නොගෙවා ඉන්න පුළුවන්. කොමිෂන් සභාවෙන් නියම කරනවා "සේවයට ගන්න" කියලා. අධ්‍යක්ෂ මණ්ඩලය කියනවා, "අපි ගන්නෙ නැහැ" කියල. ඊළඟට ඒකට විරුද්ධව උසාවියට යනවා. සමහරවිට අවුරුදු ගණනක් ගතවෙනවා. ගරු ඇමතිතුමනි, මේ තත්ත්වය දිගටම තිබෙනවා නම් මේ සමුපකාර සේවක කොමිෂන් සභාවේ කටයුතු ගැන ඇත්තවශයෙන්ම සතුටට පත්වෙන්න පුළුවන්ද ? ඒ නිසා මේ ගැන නැවත කල්පනා කර බලා මේ කොමිෂන් සභාවෙන් දෙන තීරණ ගැන නිසි අවධානය යොමු කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

රාජ්‍ය සේවා කොමිෂන් සභාව තිබෙන බව තමුන්නාන්සේ දන්නවා. රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් තීරණයක් දුන්නාම කාටවත් ඉන් එහාට යන්න බැහැ. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය තමයි අවසාන තීරණය. ඉන් එහාට යන්න බැහැ. [බාධා කිරීමක්] දැන් මේකේ එහෙමත් බැහැ නේ ? මම අහන ප්‍රශ්නය මේකයි. සමුපකාර සේවක කොමිෂන් සභාව දෙන තීරණය ලේකම්තුමා අනුමත කළත් අධ්‍යක්ෂ මණ්ඩලය ඊට කැමති නැත්නම් මොකක්ද කරන්න පුළුවන් ? රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ දෙන තීරණයකට විරුද්ධව උසාවියට යන්නත් බැහැ. එසේ උසාවියකට යන්න බැරි බව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ පැහැදිලිව සඳහන්කර තිබෙනවා. ඒ තීරණ පිළිබඳ තත්ත්වය ඒකයි. නමුත් මෙතැන මේ අයට කිසිම ආරක්ෂාවක් නැහැ. ඒ නිසා මේ ගැන තීරණයක් ගන්න ඕනෑ.

සමුපකාර සේවක කොමිෂන් සභාව තීරණයක් දුන්නාම ඊට විරුද්ධව අභියාචනයක් ඉදිරිපත් කරන්න පුළුවන්. එය සමහරවිට ඇමතිතුමාට නැත්නම් ලේකම්තුමාට වෙන්න පුළුවන්. එය එතැනින් ක්‍රියාත්මක වෙන්න ඕනෑ. එසේ නැත්නම් දුප්පත් අහිංසක මිනිසුන්ට අවුරුදු දහයක් පහළොවක් තිස්සේ කොළඹ අභියාචනාධිකරණයට ඇවිත් නඩු කියන්න පුළුවන්ද ? සමුපකාර වෙළඳ සේවකයෙක් අභියාචනාධිකරණයට ඇවිත් නීතිඥ මහත්මයෙකු අල්ලා නඩු කියන්න ගියොත් ඔහුට ඇතිවන්නේ මොන තත්ත්වයක්ද යන වග ගරු ඇමතිතුමාම කල්පනා කර බලන්න. ගාල්ලේ සිට කොළඹට එන්නවත් පුළුවන්ද සමහර මිනිසුන්ට. ඒ නිසා මේ තත්ත්වය නැති කරන්න ඕනෑ.

රජයේ සේවකයන්ට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් යම් - යම් වරප්‍රසාද ලබාදී තිබෙනවා. ඒ විධියට මේ සේවකයන්ටත් සාධාරණය ඉෂ්ට වෙන්න ක්‍රමයක් යොදන්න ඕනෑ. ඒ නිසා මේ ගැන නොපමාව සොයා බලා පනත් සම්බන්ධයෙන් යම්කිසි වරදක් තිබෙනවා නම් ඒවා පාර්ලිමේන්තුව මගින් සංශෝධනය කරලා මේ සමුපකාර සේවකයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කරදෙන්න ක්‍රියාකරන ලෙස මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

හොරුන් ආරක්ෂා කරන්න ඕනෑයයි මම කියන්නේ නැහැ. සමහර අය හොරකම් නොකළත් වැරදිවලට අහුවෙනවා. සමහරවිට පෞද්ගලික මතභේද උඩ වැරදිවලට අහුවෙනවා. ඒ අයට සාධාරණය ඉෂ්ට වෙන්න ඕනෑ. සමුපකාරවල හොරුන් තියාගන්නය කියන්න කාටවත් පුළුවන්කමක් නැහැ. හුඟක් කළමනාකාරවරුන් හොරකම් කරනවාය කියා මුදල් ඇමතිතුමා කිව්වා. මේවාටත් නොයෙක් හේතු තිබෙනවා. සමුපකාර සේවකයන්ගේ වැටුප් තත්ත්වය තමුන්නාන්සේ දන්නවා. ඇත්තවශයෙන්ම අපට ඒ ගැන සෑහීමකට පත්වෙන්න පුළුවන්කමක් නැහැ. වෙළඳ සේවකයකුට මාසයකට ලැබෙන්නේ රුපියල් පන්සියයි. මාසයකට රුපියල් පන්සියක මුදලක් අරගෙන කෙනකුට ජීවත්වෙන්න පුළුවන්කමක් නැහැ. පවුලක් නඩත්තු කරන්න පුළුවන්කමක් නැහැ. ඒ නිසා මේවා ගැන අපි සාධාරණ මට්ටමෙන් සලකා බැලිය යුතුව තිබෙනවා. සමුපකාර සේවක කොමිෂන් සභාවේ කටයුතු ගැන නැවත වතාවක් අවධානය යොමුකර වැඩි බලතල ඊට ලබාදීමට කටයුතු කරන හැටියට මම ඉල්ලා සිටින්න කැමතියි.

පූ. භා. 11.45

ඊළඟට මා ඉතාම කෙටියෙන් ආහාර කොමසාරිස්තුමා ගැන කරුණක් සඳහන් කරන්න කැමතියි. මම ඇත්තවශයෙන්ම එතුමා ගැන අවංකවම කණගාටු වෙනවා. ගරු මුදල් ඇමතිතුමා අයවැය විවාදයේදී පාර්ලිමේන්තුවේ එකපාරටම නැඟිට ආහාර කොමසාරිස්තුමා දැඩි විවේචනයට ලක් කළා. එතුමාගේ කතාවේ වෙනම ප්‍රකාශනයක් අපට බෙදා හැරියා. ඊට පස්සේ ආහාර කොමසාරිස්තුමා පත්‍ර මාර්ගයෙන් කරුණු හෙළි කළා. මම කනගාටු වෙනවාය කිව්වේ මේ නිසායි. ආහාර කොමසාරිස්තුමා රජයේ නිලධාරියෙක්. සහල්, පිටි, සීනි මිල වැඩි කිරීමේ නියෝගය එතුමාට දී තිබෙන්නේ ඔක්තෝබර් මාසයේදියි. එතුමා ඒ ඉක්මනින්ම නියෝගය ක්‍රියාත්මක කළා. නමුත් මේ රටේ ජනතාවට හැඟීමක් ඇති කරනු ලැබුවා, ආහාර කොමසාරිස්තුමා එක පාරටම බිග් බෙන් ඔර්ලෝසුව වාගේ හරියටම වෙලාව බලා ඉඳලා අයවැය එන විටම බඩු මිල වැඩි කළාය කියා. ඇත්තවශයෙන්ම මම මුදල් ඇමතිතුමාට චෝදනා කරන්නෙ නැහැ. මුදල් ඇමතිතුමාටත් සමහර විට වැරදි අවබෝධයක් ඇති වෙලා වෙන්න ඇති. නමුත් මේ ප්‍රශ්නය පැහැදිලිව ගත්තාම රජය නේද මේකට වග කියන්න ඕනෑ ? රජයේ නිලධාරියෙක් කළ දේ වැරදි නම් ඇත්තවශයෙන්ම එහි වගකීම රජය භාරගන්න ඕනෑ. නමුත් මුදල් ඇමතිතුමා මේ සභාවට ඇවිත් කිව්වේ මොකක්ද ? "ආහාර කොමසාරිස්තුමා බිග් බෙන් ඔර්ලෝසුව වාගේ හරියටම වෙලාව බලා ඉඳලා මෙතැන මගේ අයවැය ලේඛනය ඉදිරිපත් කරන්න දවසකට කලින් බඩු මිල වැඩි කළා" කියලයි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ රටේ සාමාන්‍ය රජයේ නිලධාරීන්ට වැඩ කරගෙන යාමේදී ඇති වන ප්‍රශ්නයක්, මේක. එම නිසයි මම කිව්වේ, ආහාර කොමසාරිස්වරයා ඒ විධියේ විවේචනයට ලක් කිරීම ගැන මම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[රිචඩ් පතිරණ මහතා]

ඇත්තවශයෙන්ම කනගාටු වෙනවාය කියා. කලවාන ගරු මන්ත්‍රීතුමා (සරත් මුත්තෙට්ටුවෙගම මහතා) කීවාක් මෙන්, මම ආහාර කොමසාරිතුමාට ස්තුතිවන්ත වෙන්න කැමතියි, මේක ටිකක් කල් හරි පසු කළ එක ගැන. ඇයි ? කලින් වැඩි කලා නම් — මාස 6 කට ප්‍රථම වැඩි කලා නම් — ඒ බරත් වැටෙන්නේ මහජනයාටයි. එම නිසා ඒක ටිකක් හෝ ප්‍රමාද කිරීම ගැන ආහාර කොමසාරිස්තුමාට මම ස්තුතිවන්ත වන්නට කැමතියි.

මම දීර්ඝ වශයෙන් කථා කරන්නට බලාපොරොත්තු වන්නේ නැහැ. තව කාරණාවක් සඳහන් කර මගේ කථාව අවසන් කරනවා. පිටි, සීනි සහ හාල් මිල වැඩි කිරීම ගැන අපි හැමදාම කථා කර තිබෙනවා. මේ සම්බන්ධව ගරු ඇමතිතුමාගේ අවධානය අපි හැමවිටම මේවා ගැන යොමු කර තිබෙනවා. ආහාර හා සමුපකාර ඇමතිවරයා වශයෙන් තමුන්නාන්සේට මේවාට දෙස් කියන්න මම කැමති නැහැ. එහෙම කරනවා නම් අපි තමුන්නාන්සේට කරන්නේ අසාධාරණයක්ය කියන එකයි, මගේ හැඟීම. මේක මේ රජයේ ප්‍රතිපත්තිය හැටියටයි, මම දකින්නේ. මෙය පාඩු නැතිව ලාභ ගෙන භාණ්ඩ විකිණීමේ ප්‍රතිපත්තියක් බවයි, පෙනෙන්නේ. පුළුවන් තරම් පාඩු ලබන ක්‍රම නැති කරන්නටයි, යන්නේ. එයින් වෙන්නේ මොකක්ද ? ගරු සභාපතිතුමනි, මහජනයාගේ කර පිටට මේවා එකින් එක වැටුණාම ඒ අයට විශාල කරදරයක් වෙනවා.

අත්තනගල්ලේ ගරු මන්ත්‍රීතුමාට කිව්වා, එතුමා විපක්ෂයට ගියාට පස්සේ ජනතාව ගැන බොහොම අනුකම්පාව ඇතිවෙනවාය කියා. මම මේ රටේ සාමාන්‍ය දුප්පත් පවුලකින් ආපු කෙනෙක්. එම නිසා මම දන්නවා, සාමාන්‍ය මිනිසා විඳින දුක. එම නිසා තමයි මම ඔබතුමාට කියන්නේ, මේ භාණ්ඩවල මිල දවසින් දවස වැඩි වුණාම මහජනයාට විශාල කරදරයක්ය කියා. තමුන්නාන්සේලාට පසුගිය ආණ්ඩුව කාලයේයි මේ ආණ්ඩුව කාලයේයි, තත්ත්වය සන්සන්දනය කරන්න පුළුවන්. ඒවා ගැන මම කථා කරන්න යන්නේ නැහැ. 1977 දී ශ්‍රී ලංකා නිදහස් පක්ෂය අන්ත පරාජයකට පත් වුණා. ඒකට හේතු තිබෙනවා. හේතු නැතිව පැරදුණාය කියා මම කියන්නේ නැහැ. නොයෙක් හේතු තිබෙනවා, ඒකට. ඒ ආණ්ඩුව පරාජයට පත් කරලා එක්සත් ජාතික පක්ෂය බලයට පත් කරන කොට ජනතාව බලාපොරොත්තු වුණා, ඊට වැඩි සහනයක්. අඩු මිලට බඩු ලැබෙයි බලාපොරොත්තු වුණා. එම නිසා මේ භාණ්ඩවල මිල වැඩි කිරීම ගැන ඇත්තවශයෙන්ම අපේ අප්‍රසාදය පළ කරන්නට ඕනෑ. ඒක මම තමුන්නාන්සේට පෞද්ගලිකව කියනවා.

**පර්සි සමරවීර මහතා**
(திரு. பேர்ஸி சமரவீர)
**(Mr. Percy Samaraweera)**

ඒ කාලයේ ගන්න බඩු තිබුණේ නැහැ.

**රිචඩ් පතිරණ මහතා**
(திரு. றிச்சட். பத்திரன)
**(Mr. Richard Pathirana)**

ඒ ගැන තර්කයක් නැහැ. මම ඒවා ගැන තර්ක කරලා මේ සභාවේ වටිනා කාලය කා දමන්න යන්නේ නැහැ. මන්ද, අපට තර්ක ගේන්න පුළුවන්. නමුත් මෙහි ඇත්ත තත්ත්වය පැහැදිලිව අපි දකින්නට ඕනෑ. ඒකට තමයි අපි උත්සාහ කරන්න ඕනෑ. මොකද, නිවැරදි තත්ත්වය මේකයි කියා දැන ගන්නයි. ඒ තත්ත්වය ගැන දැන ගැනීමේදී මට සාමාන්‍ය පන්තියෙන් ආපු මන්ත්‍රීවරයෙක් හැටියට කියන්න පුළුවන් වන්නේ, මේ හැම දෙයකින්ම මේ ජනතාව දවසින් දවස පීඩනයට පත්වන බවයි.

මම තමුන්නාන්සේට කියන්න ඕනෑ, මගේ ඉල්ලීම පිට තමුන්නාන්සේ ආහාර හා සමුපකාර ඇමතිවරයා හැටියට අක්මීමන විවිධ සේවා සමුපකාර සමිතිය විසුරුවා හැරියා. ඒ ගැන මම තමුන්නාන්සේට ප්‍රශංසා කරනවා. මන්ද, ඒ සමිතිය බොහොම දීර්ඝ කාලයක් තිස්සේ බොහොම අකාර්යක්ෂමව ගෙන ගිය සමිතියක්. ඒ ගැන තමුන්නාන්සේට පැහැදිලි වෙනවා ඇති තමුන්නාන්සේ ගාල්ලේ සහකාර සමුපකාර කොමසාරිස්වරයාගේ වාර්තාව ගෙන්වා ගෙන බැලුවොත්. දැන් මේ සමිතිය මාස හයකින් ලබා තිබෙන දියුණුව විශාලයි. ඒ අය ඉදිරියේදී පාරිභෝගික ජනතාවට තවත් පහසුකම් සපයන්නට කටයුතු කර ගෙන යනවා. මේ සමිතිය විසුරුවා හැරියත් නැතත් මම නම් කවදාවත් සමිති ගොඩනැගිලිලටවත් ගිහිල්ලා නැහැ. මට ඕනෑකම තිබුණේ මෙයයි. ගම්බද ජනතාව මට සෑහෙන තරම් පැමිණිලි කර තිබුණා, ඒ ප්‍රාදේශිකවල බඩු නැහැ, ඒ ප්‍රාදේශික වහනවා, ඒවා වහන නිසා ඒ ප්‍රදේශවල ගම්බදව ඉන්න පුද්ගලික වෙළඳුන් රජ කරන්නට පටන් ගෙන තිබෙනවාය කියා. එම නිසා, ඒ තත්ත්වය නැති වන්නට කටයුතු කරන්නට ඕනෑය කියලයි, මේ වැඩපිළිවෙළ ඇති කළේ. අලුතින් පත් කරපු මණ්ඩලය ඒ. කොමසාරිස්වරයාගේ කැමැත්ත පරිදි පත් කළ මණ්ඩලයක්. ඒ අයට මම ස්තුතිවන්ත වෙනවා. සමුපකාර දෙපාර්තමේන්තුවේ නිලධාරින් තුන් දෙනෙක් මේ කාර්යය දැන් හුඟක් සාර්ථකව ඉෂ්ට කර ගෙන යනවා. එම නිසා අනෙක් සමිතිවලටත් ලබා දුන් රුපියල් දස ලක්ෂයේ ආධාර මුදල මෙම සමිතියටත් ලබා දෙන ලෙස මම ඉල්ලා සිටිනවා. මන්ද, ඒ මුදල් නැති වන එකක් නැහැ. ඒ මුදල් ගැන දැන් වගකීමක් ඇතිව කටයුතු කරන්නට පුළුවන්කම තිබෙනවා. මේ සමිතිය ඉදිරියට ගෙන යන්නට පුළුවන් බව මට පැහැදිලිව ඔප්පුවී තිබෙනවා.

විශේෂයෙන්ම කොමසාරිස්තුමා ගැනත් මෙහිදී යමක් කියන්නට ඕනෑ. සමුපකාර සංවර්ධන කොමසාරිස්තුමා නොයෙක් කාරණා සම්බන්ධයෙන් විවේචනවලට ලක් වෙනවා. නමුත් එතුමා මේ වර්ෂය තුළදී පුළුවන් තරම් උත්සාහ ගෙන තිබෙනවා, තමන්ගේ වැඩ කටයුතු සාර්ථක ලෙස කර ගෙන යන්නට. එහෙත් මුද්‍රණය කළ මේ පොතේ එතුමා " ත්‍රිමූර්තිය " හැටියට හඳුන්වා තිබෙනවා. ත්‍රිමූර්තිය වශයෙන් හඳුන්වා තිබෙන්නේ, උපයන දෙන්නේත්, හද වඩන්නේත්, අවසානයේදී විනාශ කරන්නේත් එතුමා නිසයි. මේ පොත කියවන විට ඒ බව හැඟෙනවා. විනාශ කරනවාය කියන්නේ සමිති විසුරුවා හරින්නේ එතුමා නිසයි. විසුරුවා හැරීම විනාශ කිරීමක් හැටියට සමහරු හඳුන්වනවා.

කිසියම් සමුපකාර සමිතියක අධ්‍යක්ෂ මණ්ඩලයක් යම්කිසි වැරදි වැඩක් කරන බව පැහැදිලිවම දැනගන්නට ලැබුණොත්, එම අධ්‍යක්ෂ මණ්ඩලය විසුරුවා හැරීම හැර කරන්නට ඇති වෙනත් පිළියමක් නැති බව ඇමතිතුමාට පෙන්වා දෙන්නට කැමතියි. ඒ මගේ මතයයි. යම්කිසි දූෂණ කටයුතුවල යෙදී සිටින කෙනෙක් තවදුරටත් එතැන රඳවා ගන්නට කටයුතු කළොත්, එයින් වන්නේ සාමාන්‍ය ජනතාවට අයිති දේපළ විනාශ කිරීමක් බව මා සඳහන් කරන්න ඕනෑ. නමුත් අසාධාරණ අන්දමට එය කරන්නයැයි මා කියන්නේ නැහැ. එම නිසා සාධාරණ පිළිවෙළට ඇමතිතුමා කටයුතු කළ යුතු බව ප්‍රකාශ කරමින්, මගේ වචන ස්වල්පය මෙයින් අවසන් කරනවා.

**කළුබණ්ඩා රත්නායක මහතා (පඩුවස්නුවර)**
(திரு. கலுபண்டா ரத்நாயக்க — பண்டுவஸ்நுவர)
**(Mr. Kalubanda Ratnayake – Panduvasnuwara)**

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මගේ කථාව කරන්නට කාලය ඇත්තේ විනාඩි පහක් පමණයි. අනවශ්‍ය දේවල් කථා කරමින් කොත්මලේ මන්ත්‍රීතුමා (ආනන්ද දසනායක මහතා) මගේ කාලය කා දැමීම ගැන මම කනගාටු වෙනවා. [බාධා කිරීමක්] එතුමා සමුපකාරය ගැන නොවෙයි, කථා කළේ. ඒකයි මා එසේ සඳහන් කළේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ සමුපකාර උපදේශ සභාවේ සහ 46 වන වගන්තිය යටතේ පත් කර ඇති පරීක්ෂණ කමිටුවේ සාමාජිකයකු හැටියට මා සිටින නිසා, මා දන්නවා, අපේ ගරු ඇමතිතුමාත්, නියෝජ්‍ය ඇමතිතුමාත් අපේ ස්ථිර ලේකම්තුමා ඇතුළු නිලධාරි පිරිසගේත්, සමුපකාර කටයුතුවල, ආහාර බෙදීමේ කටයුතු සම්බන්ධයෙන් දක්වන විශාල උනන්දුව ගැන. අපේ ඇමතිතුමා, නිතර නිතර ඒ උපදේශක මණ්ඩලයේ හා පරීක්ෂණ කමිටුවේ රැස්වීම්, මාසයකට වරක්වත් කැඳවනවා. ඒ අවස්ථාවලදී අපට පෙනී යනවා. විශේෂයෙන්ම ඇමතිතුමාත්, නියෝජ්‍ය ඇමතිතුමාත් සමුපකාර කටයුතු පිළිබඳව දක්වන උනන්දුව, උත්සාහය ගැන. නමුත් එතුමන්ලා ගන්නා උත්සාහයේ ප්‍රතිඵල අද පවතින තත්ත්වය අනුව තෙලා ගන්නට බැහැ. එයට එක් හේතුවක් තමයි සමුපකාරයේ ඇති බඩුවල මිල වැඩිවීම.

අද විවෘත වෙළඳපොලේ සමුපකාරයට වඩා අඩු මිලට පාරිභෝගික ද්‍රව්‍ය ලබා ගන්නට තිබෙනවා. සමහර විට සමුපකාරයේ සාරියක මිල රු. 100 නම් එම වර්ගයේ සාරියක් රු. 75 කට, රු. 90කට, රු. 95කට විවෘත වෙළඳපොලෙන් ලබා ගන්නට පුළුවන්කමක් තිබෙනවා. මේ තත්ත්වය යටතේ සමුපකාරයට එතරම් ලාභයක් උපයා ගන්නට බැහැ. මා කලින් සඳහන් කළ අන්දමට බඩු මිලේ ඇති මේ වෙනස්කම් නිසා සමුපකාරය ලාභදායක අන්දමින් පවත්වා ගෙන යන්නට අමාරුයි. ඊළඟට මේ අමාරුකම් මධ්‍යයේ සමුපකාරය පවත්වා ගෙන යන විට, පිරිවැටුම් බදු හැටියටත් සෑහෙන මුදලක් ගෙවන්නට සිදු වී තිබෙනවා. ඒකත් සමුපකාරයට දරන්නට අමාරුයි. මේ අතර සමුපකාරයට ලැබෙන ලාභ මුදලින් කොටසක් සමුපකාර ආරක්ෂක මුදලට දීමට කොමසාරිස්තුමාට සිදු වෙනවා. මම ඒක වැරදි දෙයක් යයි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කියනවා නොවෙයි. මෙසේ මුදලක් එකතු කරන්නේ වැටිගෙන යන සමුපකාර සමිතිවලට ආධාර කරන්නටයි. පඩුවස් නුවර සංගමය දන් කාලයක සිට ආධාර ඉල්ලා සිටියත් මෙතෙක් මෙම ආරක්ෂක මුදලින් ආධාර ලැබුණේ නැති බව මා දන්නවා. ඒ වාගේ තවත් සංගම් ඇති. මෙසේ සමුපකාර සංගම් පවත්වා ගෙන යාමට වෙන් කර, දනට ගොඩගැසී ඇති මුදල් ප්‍රමාණය, වෙනත් තැනක තැන්පත් කිරීමෙන් සමුපකාර සංගම් දියුණු කර ගන්නට අපහසු බව මේ අවස්ථාවේදී මතක් කරන්න ඕනෑ.

සමුපකාර පරිපාලනය සම්බන්ධව සලකනවිට මුද්දර ගාස්තු සඳහා විශාල මුදලක් සමුපකාර සමිතිවලට වියදම් වන බව සඳහන් කළ යුතුව තිබෙනවා. මේ මුද්දර ගාස්තුවෙන් සමුපකාරය නිදහස් කරන හැටියට මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. එහෙම කළොත් මේ අමාරුවෙන් ගෙන යන සමුපකාර සමිතිවලට ඒ වැඩ කටයුතු කරගෙන යාමට එය සෑහෙන උදව්වක් වෙන්න පුළුවන්.

ඒ වාගේම මේ පිරිවැටුම් බද්ද සම්පූර්ණයෙන්ම අහෝසි කරනවා නම් එය තවදුරටත් සමුපකාරය දියුණු කිරීමට සෑහෙන රුකුලක් වෙනවාය කියන එක මම ගරු මුදල් ඇමතිතුමාට මතක් කරන්නට කැමතියි. ඊළඟට ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, සමුපකාරය සාර්ථකව ගෙන යාමට බැරි තවත් හේතුවක් හැටියට මේ සමුපකාරයට හාම්පුතුන් දෙදෙනෙක් සිටීම පෙන්නුම් කරන්නට පුළුවනි. ඒ පිළිදව ගරු ඇමතිතුමා දන්නවා ඇති. එයින් එක් කෙනෙක් තමයි, අධ්‍යක්ෂ මණ්ඩලය.

**නියෝජ්‍ය සභාපතිතුමා**
**(பிரதித் தலைவர் அவர்கள்)**
**(The Deputy Chairman)**

Order, please!

ගරු මන්ත්‍රීතුමා මිනිත්තු පහයි කථා කර තිබෙන්නේ. වුවමනා නම් දිවා ආහාරයෙන් පසුව කථා කරන්නට පුළුවන්.

The Sitting is suspended till 1.00 p.m.

*රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්සිටුවන ලදින්, අ. භා. 1.00ට නියෝජ්‍ය කථානායකතුමාගේ සභාපතිත්වයෙන් නැවත පවත්වන ලදී.*

*அதன்படி அமர்வு பி. ப. 1 மணி வரை இடை நிறுத்தப்பட்டு, மீண்டும் ஆரம்பமாயிற்று. பிரதிச் சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Sitting accordingly suspended till 1.00 p.m. and then resumed, Mr. Deputy Speaker in the Chair.*

**කළුබණ්ඩා රත්නායක මහතා**
**(திரு. கலுபண்டா ரத்நாயக்க)**
**(Mr. Kalubanda Ratnayake)**

ගරු සභාපතිතුමනි, අද සමුපකාර සේවකයන්ට හාම්පුතුන් දෙදෙනෙක් සිටිනවාය කියන එක ගැනයි දිවා ආහාරය සඳහා මේ ගරු සභාවේ කටයුතු නවත්වන විට මම ප්‍රකාශ කරමින් සිටියේ. ගරු ඇමතිතුමනි, හාම්පුතුන් දෙදෙනෙක් කියන්නේ අධ්‍යක්ෂ මණ්ඩලය සහ දෙපාර්තමේන්තුව එහෙම නැත්නම් කොමසාරිවරයායි. සමුපකාර සංවර්ධන කොමසාරිස්තුමා නැත්නම් දෙපාර්තමේන්තුව මේ මහජන ආයතනය ඒ ගොල්ලන්ගේය කියා කල්පනා කරනවා. අධ්‍යක්ෂ මණ්ඩලය මේ සමුපකාරය ඒ උදවියගේය කියා කල්පනා කරනවා. නමුත් ඒක මහජනයාට අයිති දෙයක්. අද අධ්‍යක්ෂ මණ්ඩලය පත් වෙන්නේ මහජන ඡන්දයෙන්. මම හිතන විධියට ඒගොල්ලන්ගේ බලය වැඩියි. ඒගොල්ලන්ට අයිතිවාසිකම් වැඩියි.

ගරු ඇමතිතුමනි, මම කලින් සඳහන් කළ පරිදි හාම්පුතුන් දෙදෙනෙක් සිටීමේ හේතුව නිසා අනවශ්‍ය සේවකයන්, වංචා කරන සේවකයන් — හැම සේවකයෙක්ම වංචා කරනවාය කියා මම කියන්නේ නැහැ — අස් කරන්නට අධ්‍යක්ෂ මණ්ඩලයට පුළුවන්කමක් නැහැ. එහෙම කරන්නට ලෑස්ති වෙනකොට අනික් හාම්පුතා එහෙම නැත්නම් කොමසාරිස්තුමා ඒකට හරස් කපනවා. සමහරවිට කොමසාරිස්තුමා යම් වැරැද්දක් පෙන්නුම් කර දෙනවිට අධ්‍යක්ෂ මණ්ඩලය ඊට උඩින් ඒකට හරස් කපනවා. මේ අතරේදී සේවකයන් මේ දෙගොල්ලන්ගේම කණින් රිංගා රුපියල් ලක්ෂ ගණන් හොරකම් කරගෙන පනිනවා. මෙන්න මේකයි තිබෙන තත්ත්වය. හොරුන් අස් කරන්නට ඕනෑය කියා ගරු මුදල් ඇමතිතුමා කිව්වා. ඒ නිසා කාටද මේක අයිති, කවුද මේ ගැන වැඩ කරන්නේ කියන කාරණය ගැන ඇමතිතුමා මූලිකව කල්පනා කරන්නට ඕනෑ.

අද හුඟක් දුරට සමුපකාර මේ තත්ත්වයට පත්වී තිබෙන්නේ මේ හාම්පුතුන් දෙදෙනාගේ ප්‍රශ්නය නිසායි. තමුන්නාන්සේ කල්පනා කර මේ ගැටළුව බේරා දෙන්න. කොමසාරිස්තුමාටද, අධ්‍යක්ෂ මණ්ඩලයටද මේ සමිති බාර දෙන්නේ කියා.

මම මේ කතා කරන්නේ මගේ ආසනයේ පඩුවස්නුවර තිබෙන සමිතිය ගැනයි. තමුන්නාන්සේට, අපේ නියෝජ්‍ය ඇමතිතුමාට, ලේකම්තුමාට, කොමසාරිස්තුමාට, අතිරේක ලේකම්තුමාට මේ සමිති යථා තත්ත්වයට පත්කර ගන්නා ක්‍රම ගැන මම කිව්වා. සමුපකාර සමිති ක්‍රමයට මම බොහොම ආදරෙයි. සමුපකාර ක්‍රමය දියුණු කරන්න මම කටයුතු කරනවා. අන්න ඒ අදහස උඩම මම කිව්වා, මෙන්න මේ මේ දේවල් තිබෙනවා. මේ ක්‍රම අනුගමනය කරන්න කියා.

අධ්‍යක්ෂ මණ්ඩලය විසුරුවන්න හදනවා. නමුත් ඒක කරන්නේ නැහැ. අළුතෙන් අධ්‍යක්ෂ මණ්ඩලයක් පත් කරන්න මහ සභාවක් පැවැත්වුවා. ඒත් කළේ නැහැ. ඉන්න අධ්‍යක්ෂ මණ්ඩලය දුර්වලයි. "අපි කොයි වෙලාවේ එළියට දවිද කියා දන්නේ නැහැ" කියා ඒ අය කියනවා. තව පිරිසක් ඉන්නවා. ඒ අය කියනවා "අපි පත් වෙන්න ඉන්නවා" කියා. මේ නිසා අපේ සමිතිය පමණක් නොවෙයි, අද අපේ ආසනයේ තිබෙන බොහෝ සමිතිවල මේ විධියේ පැටලිලි තත්ත්වයක් තිබෙනවා. මම කලින් සඳහන් කළ විදියට තමුන්නාන්සේට මතක් කරනවා, තමුන්නාන්සේ ගත් උත්සාහයේ එල නෙලන්න බැරි තත්ත්වයක් උදවී තිබෙන්නේ මෙන්න මේ කාරණා නිසාය කියා. එමනිසා මේ තත්ත්වය නැති කිරීම සඳහා ඉක්මන් පිළියමක් කරන්න වෙනවා. මේ සඳහා වගකිවයුත්තා කවුද කියා තේරුම් කර ගන්නට වෙනවා. මම නැවත වරක් මතක් කරනවා, අද බොහෝදුරට වංචා සිදුවන්නේ වගකිවයුත්තන් නැති නිසාය කියා.

මේ අවස්ථාවේදී මම කැමතියි පරිපාලනය ගැන මතක් කරන්න. දෙපාර්තමේන්තුවෙන් සමුපකාර සංගම්වලට නිලධාරීන් දෙතුන් දෙනෙක් පත්කර ඉන්නවා. සේවකයින් කරන වැරදි ගැන අධ්‍යක්ෂ මණ්ඩලය මීට වඩා සූක්ෂමව කටයුතු කරනවා නම්, මේ වගේ දුර්වලකම්, වංචා ඇතිවේවියයි කියන්න බැහැ. ගරු ඇමතිතුමනි, ඒ අයත් ඉතාම උදාසීන තත්ත්වයෙන් වැඩ කරන බව මම මතක් කරන්න ඕනෑ. ඒ නිසා එම නිලධාරීන්ගෙන් වැඩ ගන්නා ක්‍රම ගැන කල්පනාකර බලන ලෙස තමුන්නාන්සේට දන්වා සිටිනවා.

අද බලන්න කොළඹ උතුර සංගමය. මේ කලබල නිසා, දෙපාර්ශ්වයේ කඹ ඇදිල්ල නිසා, විශාල ලෙස දියුණුවට පත්වී තිබුණු සමිතියක් අද විසුරුවා හැරලා. පොල්ගහවෙල සමිතියක් විසුරුවා හැරලා. පඩුවස්නුවර සංගමය විසුරුවන තත්ත්වයට කටයුතු සලස්වා තිබෙනවා. නමුත් ඒ සංගමයේ මුදල් තිබෙනවා. පාලන තන්ත්‍රය බාර දෙන්න කෙනෙක් නැති එකයි ඒකට වෙලා තිබෙන්නේ. එහි සේවක පිරිස් පඩුවස්නුවර සංගමයෙන් රුපියල් දශ ලක්ෂයක් සොරකම් කළා. නමුත් දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට බැරි වුණා, රුපියල් දශ ලක්ෂයෙන් එක රුපියලක්වත් අය කරගන්න විභාගයක් පවත්වන්න.

පසුගිය සිංහල අවුරුද්දට බඩු ගන්න සමිතියේ මුදල් තිබුණේ නැහැ. තමුන්නාන්සේගේ අවධානය ඒ සමිතියට ලැබී, ඒ සංගමයට රුපියල් දශ ලක්ෂයක් ණය වශයෙන් ලැබුණා. ඒ රුපියල් දශ ලක්ෂයෙන් අපි පාරිභෝගික භාණ්ඩ ගෙනාවා. ඒකටත් සමහර තැන්වලින් පොලු දැම්මා. මම මේ අවස්ථාවේදී ඒවා ගැන කියන්න යන්නේ නැහැ. ඒ රුපියල් දශ ලක්ෂයේ ණය මුදල සමිතිය විසින් ආපසු ගෙව්වා. ඒ සමිතියේ සල්ලි තිබෙනවා. වැඩ කරන්න පුළුවන්. පාලන තන්ත්‍රය ගෙන යන්න ශක්තිමත් වැඩ පිළිවෙළක් නැහැ. එම නිසා මම තමුන්නාන්සේගෙන් කරුණාවෙන් ඉල්ලා සිටිනවා, මේ සංගමය ආරක්ෂා කර දෙන්න කියා. සමුපකාරය ආරක්ෂා කරන්න කියා මම ඉල්ලා සිටිනවා. මේ විධියට කටයුතු කෙරීගෙන ගියොත් මේ ව්‍යාපාරය විනාශ වී යන්න පුළුවන්.

තවත් කාරණයක් තිබෙනවා. අපි එක පැත්තකින් සේවකයින්ට දෙස් කියනවා. මුදල් ඇමතිතුමා කිව්වා සමුපකාරවල ඉන්න හොරු පන්නන්නය කියා. හොඳට වැඩ කරන මිනිහා සංගමයේ දියුණුවට වැඩ කරනවා. ඔය අතරේ වංචාකාරයින් නැත කියා අපි කියන්නේ නැහැ. පාලන තන්ත්‍රයේ වැදගත් පිරිසක් හැටියට තමුන්නාන්සේලා, අපි, කල්පනා කළ යුතුයි. කලින් කථා කළ මන්ත්‍රීතුමා කියපු විධියට මේ සේවකයින්ට ලැබෙන පඩිය රුපියල් 500 යි. නැත්නම් 600 යි. එම මුදල ඒ අයට ජීවත් වෙන්න මදි. ඒ අයට දූවා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ කළුබණ්ඩා රත්නායක මහතා ]

දරුවො ඉන්නවා. දුප්පත් පවුල්වල අය. එම නිසා මේ අයට පඩි වැඩි කරන්න ඕන. පඩි වැඩියෙන් ගෙවන්න සමුපකාරවලට හම්බ කරන්න බැහැ. පෞද්ගලික වෙළඳ සැල්වලට වඩා සමුපකාරයේ බඩු මිළ වැඩියි. මේ නිසා වෙළඳාම කරගෙන යන්න අමාරුයි. රජයෙන් ආධාරයක් ලබාගන්න, එහෙම නැත්නම් මේ වෙළඳ භාණ්ඩවලින් පිරිවැටුම් බද්ද අස් කරගන්න. අන්න ඒ විධියේ පියවරවල් අරගෙන සමුපකාරය ආරක්ෂා කරගන්න. වැඩ කරන සේවක පිරිසගේ පඩි වැඩි කරන්න කටයුතු කරන්න. එහෙම නැතිනම් එදිනෙදා වියදම් පිරිමසාගෙන ජීවිතය ගෙන යන්න බැරි නිසා සමහර අහිංසක දුප්පත් සේවකයෝ හොරකම් කරනවා ඇති කියලාත් සමහර විට මට හිතෙනවා. මේ සම්බන්ධයෙන් තමුන්නාන්සේ නැවත වරක් සලකා බලන්න.

විරුද්ධ පාර්ශ්වයේ ගරු මන්ත්‍රීතුමන්ලා අද මොනවාද මේ වැය ශීර්ෂය යටතේ කථා කළේ කියා අවසාන වශයෙන් මම මතක් කරන්න සතුටුයි. සීනි මිළ වැඩි කළා. පිටි මිළ වැඩි කළා ඔය ආදි වශයෙන් නොයෙක් නොයෙක් දේවල් ප්‍රකාශ කළා. ගරු සභාපතිතුමනි, ඒ ගොල්ලෝ හැත්තෑවේ සිට හැත්තෑ හත දක්වා පාලනය ගෙන ගිය කාලයේ අප ජීවතුන් අතර සිටියා. එදා සමුපකාර අපි දැක්කා. අපි ඒවාට උදව් කළා. එදා සමුපකාරවල බඩු තිබුණේ නැහැ. සීනි තිබුණේ නැහැ ; මිරිස් තිබුණේ නැහැ ; කරවල කෑල්ල ගන්න තිබුණේ නැහැ ; කිරිටින් එක ගන්න තිබුණේ නැහැ. ජනතාවට අවශ්‍ය දේවල් කිසිවක් තිබුණේ නැහැ. යම් සමුපකාරයක තිබුණා නම් සුළු ප්‍රමාණයක් ගෙනවිත් ටික ටික මහජනයා අතර බෙදා දුන්නා. සාරි දහයක්, දොළහක් ගෙනැවිත් ඒකට නොම්මර ඇද්දා. රාත්‍රී හතේ සිට හුළු අතු පත්තු කරගෙන ගොස් නොම්මර ගන්න එළිවෙන තුරු පෝලිමේ සිටියා. නොම්මර ගන්න ගියාම සාරි දහයයි තිබෙන්නේ. නමුත් දෙතුන් සියයක් එකතු වී සිටියා. ඒ තිබුණු සාරි දහයෙනුත් දෙක තුනක් පිටවෙලා. නොම්මර ඇද්දයින් පසුව ගුටිගහ ගෙන කල කෝලාහල වුණා. පොලීසිවලට ගියා. ඔන්න ඔහොම තත්ත්වයක් ඒ කාලයේ තිබුණේ. අද ඒ තත්ත්වය විරුද්ධ පාර්ශ්වයට අමතක වී තිබෙන නිසයි ඒ විධියට කථා කළේ.

අද එහෙම තත්ත්වයක් නැහැ. පාරිභෝගිකයාට අද ඕනෑම දෙයක් ගන්න සමුපකාරවල තිබෙනවා. එසේ නැතිනම් නැතිව තිබෙන්නේ මුදල් අමාරු තත්ත්වයට වැටී තිබෙන සමුපකාරවල පමණයි. මේ දුර්වල සමුපකාර සමිති ගැන සොයා බලා ඒවා දියුණු කරන්න උත්සාහ ගන්න කියා මම තමුන්නාන්සේට ප්‍රකාශ කළේ ඒ නිසයි. එක කාලයකදී මේ රටේ මහජනයා සමුපකාරය ඉතාම අගය කළා. තමුන්නාන්සේලාට මතක ඇති, යුද්ධ කාලයේදී මේ සමුපකාර ව්‍යාපාරය ඇති කළේ ඩී. එස්. සේනානායක අග්‍රමාත්‍යතුමායි. ඒ යුද්ධ කාලය නිසා බඩු හිඟයක් තිබුණා. ජනතාවට අවශ්‍ය කරන දේ නැතිව තිබුණා. සීනි ටික, උම්බලකඩ ටික, මිරිස් ටික ලැබුණේ සුළු ප්‍රමාණයක්. ඒ කාලයේ බඩු හිඟය නිසා සමුපකාරයේ අවශ්‍යතාවය ඉතාම වැදගත් වුණා.

හැත්තෑවේ සිට හැත්තෑ හත දක්වා කාලය තුළ තවත් අග හිඟ කාලයක් තිබුණා. හැත්තෑවේ සිට හැත්තෑහත දක්වා ශ්‍රී ලංකා නිදහස් පක්ෂ රජය කාලය තුළ මේ රටේ බඩු හිඟයක් තිබුණා. ඒ කාලයේත් මහජනයාට සමුපකාරයේ අගයක් තිබුණා. නමුත් ගරු සභාපතිතුමනි, අද ඕනෑම දෙයක් ගන්න තිබෙන නිසා අද සමුපකාරය බොහෝ දුරට මහජනයාට අමතක වී තිබෙනවා. 1983 පැවති කලබල සමයේදී මහජනයාට උවමනා කරන බඩු ලබාදීමේ කාර්‍යයට උරදී, කරදී, මහන්සි වී කටයුතු කළේ මේ සමුපකාරයයි. පුද්ගලික වෙළෙන්ද දෙර යතුරු දාගෙන තුවක්කුව අරන් පරිස්සමින් සිටියා. ඒ නිසා කොපමණ අමාරුකම් තිබුණත්, විරුද්ධ පාර්ශ්වය අද මොනවා කථා කළත් සමුපකාරය දියුණු කරන්න ඉතා දක්ෂව කටයුතු කරන තමුන්නාන්සේත්, ගරු නියෝජ්‍ය ඇමතිතුමාත් ගන්නා උත්සාහය ඉතාමත් සන්තෝෂජනක බව මම ආදරයෙන්, ගෞරවයෙන් මතක් කරනවා.

කොපමණ බලවේග තිබුණත්, මොන වාගේ කථා කළත් සීනිවලින් ශත පහක් වැඩි කළා කියා, පිටිවලින් ශත පහක් වැඩි කළා කියා එතරම් ප්‍රශ්නයක් රටේ ජනතාව තුළ නැහැ. අද මිරිස් පොලු නැහැ; සීනි පොලු නැහැ; හාල් පොලු නැහැ. අද මේ රටේ ඉතාම අවදානම් තත්ත්වයක් තිබෙන බව මහජනයා දන්නා නිසා ශත පහක් වැඩි කළා කියා දෙස් කියන්නේ නැහැ. ඒවාගේම අපෙන් ගන්න ශතය හෝ රුපියල හෝ ඒ මුදල මේ රටේ සංවර්ධනයට යොදන බවත් මහජනයා දන්නවා. අපේ රජය හොරකම් කරන්නේ නැහැ. ඒ හැම ශතයකින්ම රටේ සංවර්ධනයක් කරනවා. වැව් හදනවා, පාරවල් හදනවා, ගම් පළාත්වලට විදුලිය දෙනවා. ඒ නිසා අද ශත පහක්, රුපියලක් ගත්තා කියා ජනතාව අපට දෙස් නගනවා ඇහෙන්නේ නැහැ. විරුද්ධ පාර්ශ්වයේ අය අද දුක්බර තත්ත්වයක් අපේ ජනතාවට උදා වී තිබෙනවා කියා මවා පෙන්වීමක් කරනවා. එසේ කරන්නේ එදා තිබුණු තත්ත්වය සමහර විට ඔවුන්ට අමතක වී තිබීම නිසා වෙන්න ඇති. ගරු සභාපතිතුමනි, ඇත්තවශයෙන්ම මේ සමුපකාරය, බැරි අවස්ථාවලට මහජනයාට ප්‍රයෝජනවත් වෙන දෙයක්. එය විශාල ආයතනයක්. සැම දෙනාගෙම, විරුද්ධ පාර්ශ්වයෙන් උදව් අරගෙන මෙය දියුණුකරන හැටියට මා තමුන්නාන්සේට මතක් කරනවා. තමුන්නාන්සේගේ උපදේශක සභාව හැමවිටම අපට උදව් කරනවා. ඒවාගේම 46 පරීක්ෂණ කොමිටියේ හොඳ සභාපති කෙනෙක් ඉන්නවා. එනම් අපේ හබරාදුව ගරු මන්ත්‍රීතුමා (ජී. වී. එස්. ද සිල්වා මහතා) එහි සභාපති වශයෙන් වැඩ කරනවා. අපි මාසයකට දෙතුන් වතාවක් එකතු වෙලා 1970 සිට 77 දක්වා කාලය තුළ තිබුණු දූෂණ, දුර්වලකම් පරීක්ෂා කරනවා. අපි දෙන්න තුන් දෙනා තමයි ඒ කාලයේ තිබුණු විනාශකාරී දේවල් මොනවද කියල දන්නේ.

ගරු ඇමතිතුමනි, තමුන්නාන්සේට දක්ෂ ලේකම් මහත්මයෙකුත්, නිලධාරී පිරිසකුත් සිටිනවා. ඒ සැම දෙනාගේම සහයෝගය ලබාගෙන සමුපකාර ව්‍යාපාරය දියුණු කරන්න අවස්ථාව ලැබේවා කියා ප්‍රාර්ථනා කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**පර්සි සමරවීර මහතා**
**(திரு. பேஸி சமரவீர)**
**(Mr. Percy Samaraweera)**

ගරු සභාපතිතුමනි, ඉතාම වැදගත් අමාත්‍යාංශයක වැය ශීර්ෂ යටතේ වචන ස්වල්පයක් ප්‍රකාශ කිරීමට මට අවස්ථාව සලසා දීම ගැන මා තමුන්නාන්සේට ස්තුතිවන්ත වෙනවා.

සමුපකාර ව්‍යාපාරය පිළිබඳව අද උදේ වරුවේදී විරුද්ධ පාර්ශ්වයේ ගරු මන්ත්‍රීවරු කිහිප පොලක්ම කථා කරන්නට යෙදුණා. සමුපකාර ව්‍යාපාරය ගැන සාමාන්‍ය පොදු අදහස් කිහිපයක් ඉදිරිපත් කරල බඩු මිළ ආදිය ගැන කීමෙන් පමණක් මා හිතන්නේ නැහැ, සමුපකාර දෙපාර්තමේන්තුවෙ හෝ සමුපකාර අමාත්‍යාංශයෙ, මේ වැඩපිළිවෙළේ යම්කිසි අඩුලුහුඩුවක් තිබෙනවා නම් එය නිරාකරණය කරන්නට පුළුවන් වෙයි කියලා. සමුපකාර ව්‍යාපාරය ගැන කථා කරනවිට, සමුපකාර ව්‍යාපාරයේ අද තිබෙන වැඩපිළිවෙළ හොඳ නැත්නම් එය මෙසේ වෙනස් කළ යුතුයි කියල යෝජනා ඉදිරිපත් කිරීමයි කළ යුත්තේ. නමුත් ඇමතිතුමාත්, නියෝජ්‍ය ඇමතිතුමාත්, දෙපාර්තමේන්තුවත් මේ ගෙන යන වැඩපිළිවෙළ සම්බන්ධයෙන් විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරුන් හුඟ දෙනෙකුගෙන් ඉදිරිපත් වුණේ පරස්පරවිරෝධී අදහස්.

අ. භා. 1.15

විශේෂයෙන් අක්මීමන ගරු මන්ත්‍රීතුමා (රිචඩ් පතිරණ මහතා) එතුමාගේ හෘද සාක්ෂියට එකඟව, සත්‍ය කරුණු මේ සම්බන්ධයෙන් ඉදිරිපත් කිරීම ගැන මා එතුමාට ස්තුතිවන්ත වෙනවා. කලවාන ගරු මන්ත්‍රීතුමා (සරත් මුත්තෙට්ටුවෙගම මහතා)' බොහොම ලොකු ඉල්ලීමක් කර තිබෙනවා, සමුපකාර ව්‍යාපාරයට තිබෙන දේශපාලන ඇඟිලි ගැසීම් නවත්වන්නය කියල. අක්මීමණ ගරු මන්ත්‍රීතුමා, එතුමාගේ ආසනයේ විවිධ සේවා සමුපකාරයක තිබුණු දූෂණ වැඩ නිසා, ඒ සමුපකාර සමිතියෙ අධ්‍යක්ෂ මණ්ඩලය වෙනස් කරන්නය කියල ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරල, සමුපකාර කොමසාරිස්තුමා ලවා එය වෙනස් කරනවාගෙන, දැන් එහි කටයුතු ඉතාමත් සාර්ථක අන්දමට කෙරීගෙන යන බව කියල, ඇමතිතුමාටත්, දෙපාර්තමේන්තුවටත්, කොමසාරිස්තුමාටත් ලොකු ප්‍රසංසාවක් කළා. ඒ සමුපකාර සමිතියේ අඩුලුහුඩුකම් එතුමාට පෙනුනේ දේශපාලනඥයෙක් වශයෙනුයි.

අපි මන්ත්‍රීවරු හැටියට මහජන ආයතනයක කරන වැඩ කටයුතු පිළිබඳ සොයා බලන්නේ නැත්නම් එය සොයා බැලීමට කෙනෙක් ඇත්තේ නැහැ. ඒවා සොයා බලා අපක්ෂපාතව කටයුතු කිරීම මා හිතන්නේ මන්ත්‍රීවරු හැටියට අපේ යුතුමක්. ඒ යුතුකම අක්මීමන ගරු මන්ත්‍රීතුමා ඉෂ්ට කර තිබෙනවා. අපේ ගරු ඇමතිතුමා ඒ මන්ත්‍රීතුමාගේ ඉල්ලීම පරිදි ගත් තීරණය නිසා ඒ මන්ත්‍රීතුමාම එතුමාගේ යුතුකම ඉෂ්ට කිරීමෙන් සැහෙන තෘප්තියකට, සංතෝෂයකට පත්වෙන්න පුළුවන්කම ලැබී තිබෙනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කලවාන ගරු මන්ත්‍රීතුමා එතුමාගේ කථාවේදී මගේ ආසනයේ තිබෙන සමුපකාරයක් ගැන සඳහන් කර තිබෙනවා. මා කණගාටු වෙනවා, එතුමා මේ අවස්ථාවේදී මෙම සභාවේ නොමැතිවීම ගැන. ඒ මොකද, එතුමා සමුපකාරය ගැන කථා කරලා, අධ්‍යක්ෂ මණ්ඩලය ගැන කථා කරන විට, එතුමා ඇත්ත වශයෙන්ම දැනගෙන සිටින්නට ඕනෑ මොකක්ද මේ සමුපකාරයේ තත්ත්වය, මොකක්ද මේ අධ්‍යක්ෂ මණ්ඩයල කරල තිබුණේ කියල. ඒක නොදැන, දේශපාලන බලධරයන් ඇඟිලි ගසා මේ විධියේ අධ්‍යක්ෂ මණ්ඩලයක් විසුරුවා හැර තිබෙනවායි මේ ගරු සභාවේ ප්‍රකාශ කිරීම කලවානේ ගරු මන්ත්‍රීතුමාට (සරත් මුත්තෙට්ටුවෙගම මහතා) ගැලපෙන්නේ නැහැ.

ගරු සභාපතිතුමනි, කැප්පෙටිපොල විවිධ සේවා සමුපකාර සමිතිය කියන්නේ සමුපකාර ආයතනයක් හැටියට ඒ කාලයේදී ලෝක ප්‍රසිද්ධියක් ඉසිලූ, මගේ ආසනයේ තිබෙන සමිතියකටයි. ඒ කාලයේ විදේශිකයන් පවා ඒ සමුපකාර සමිතියට පැමිණ සමුපකාර ව්‍යාපාරය ගැන, ඒ ව්‍යාපාරයේ කටයුතු ගැන ඉගෙන ගොස් තිබෙනවා. එහෙම තත්ත්වයක තිබුණු කැප්පටිපොල විවිධ සේවා සමුපකාර සමිතියට 1970න් පස්සේ මොකද වුණේ ?

ගරු ඉඩම් හා ඉඩම් සංවර්ධන ඇමතිතුමා පෙන්වා දුන් පරිදි 1970-77 වකවානුවේදී මුළු සමුපකාර ව්‍යාපාරයම දෙපාර්තමේන්තුවක් බවට පරිවර්තනය කොට එහි බලධරයා හැටියට පළාතේ මන්ත්‍රීවරයා පත් කිරීම නිසා, මේ රටේ සමුපකාර ව්‍යාපාරය 1977 වන විට සම්පූර්ණයෙන්ම විනාශ වී ගියා. අපි පිළිගන්නා විධියට සමුපකාර ව්‍යාපාරය මහජනතාවගේ ව්‍යාපාරයක්. මහජනතාව මේ ව්‍යාපාරයේ තියැලී කටයුතු කරන විට, ජනතාවගේ ඡන්දයෙන් ඒ අධ්‍යක්ෂ මණ්ඩල තේරී පත් වන විට අපි වගබලා ගන්න ඕනෑ, සමුපකාරයේ වැඩ කටයුතු අවංකව කිරීමට දක්ෂකමක් තිබෙන අධ්‍යක්ෂ මණ්ඩලයක් තෝරා පත් කර ගන්න.

අද මොකක්ද, කැප්පටිපොල සමුපකාර සමිතියට වෙලා තිබෙන්නේ ? සමුපකාරය ජනතා ව්‍යාපාරයක් නිසාම අපට 1977න් පස්සේ අවකාශය ලැබුණා, ඒ ව්‍යාපාරය නැවත යථා තත්ත්වයට පරිවර්තනය කරන්න. හිටපු ආහාර හා සමුපකාර ඇමති හා හිරියාලේ හිටපු මන්ත්‍රී දිවංගත එස්. බී. හේරත් මැතිතුමා ඒ සඳහා ක්‍රමවත් වැඩ පිළිවෙළක් ඉදිරිපත් කොට නැවත මෙය ජනතා ව්‍යාපාරයක් බවට පත් කිරීමට පටන් ගත්තා. ඒ වැඩ පිළිවෙළ අනුව ප්‍රාථමික මට්ටමින් මහා සභාවට එන නියෝජිතයෝ අධ්‍යක්ෂ මණ්ඩලයක් හා ඒ මගින් සභාපතිවරයෙක් තෝරා පත් කර ගන්නවා.

කැප්පටිපොල සමුපකාර සමිතිය සඳහාත් එවැනි අධ්‍යක්ෂ මණ්ඩලයක් පත් වුණා. කලවානේ ගරු මන්ත්‍රීතුමා නොදැන හිටියත්, ඒ අධ්‍යක්ෂ මණ්ඩලයට පත් වුණ බණ්ඩාර නමැති මහත්මයා මේ වැඩ කටයුතු පටන් ගත්තේම වංචාවකිනුයි. වංචාව මේකයි : මම ඒ ගැන සඳහන් කරන විට තමුන්නාන්සේලා පුදුම වෙයි. බණ්ඩාර නමැති ඒ සභාපතිතුමා පත් වුණේ වැරදි දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කරලයි. එය වැරදි දිවුරුම් ප්‍රකාශයක්ය කියන්නේ මේ නිසයි : සාමාන්‍ය සමුපකාර රෙගුලාසි, නීති–රීති අනුව අධ්‍යක්ෂ මණ්ඩලයට පත් වන කෙනකු සමුපකාරයට ණය නොවී තිබිය යුතුයි. නමුත් සමුපකාරයට රු. 5,000ක ණය තිබෙද්දී දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කොට මේ පුද්ගලයා සමුපකාර අධ්‍යක්ෂ මණ්ඩලයට පත් වුණා පමණක් නොව සභාපතිත් වුණා. එතුමා මෑත කාලයේදී එය ගෙවා තිබෙනවා. සමුපකාරයෙන් රු. 5,000ක් අරගෙන තමයි, ඒකත් ගෙවා තිබෙන්නේ. ඒ නිසා අදත් එතුමා සමුපකාරයට රු. 5,000ක් ණයයි. එතුමා ඒ නිසාම සමුපකාර අධ්‍යක්ෂ මණ්ඩලයෙනුත්, සභාපතිකමෙනුත් ඉල්ලා අස් වුණා.

මේ කාල සීමාව තුළ ඒ හිටපු අධ්‍යක්ෂ මණ්ඩලය කොයි තරම් අයථා විධියට කටයුතු කර තිබෙනවාද කීවොත් තමුන්නාන්සේලා පුදුම වෙයි. ඒ අයට විරුද්ධව පැමිණිලි ඉදිරිපත් කරන්න පුළුවන්, චෝදනා එල්ල කරන්න පුළුවන් කරුණු–ඒ අය කරපුවා–පිළිබඳ විශාල ලැයිස්තුවක් මා ළඟ තිබෙනවා. ඒ නිසාම කොමසාරිස්තුමාට සිදු වුණා, ඒවා ගැන පරීක්ෂණයක් කරන්න. මට ආරංචි හැටියට ඒ පරීක්ෂණයෙන් පස්සේ සම්පූර්ණ අධ්‍යක්ෂ මණ්ඩලයම අහෝසි කිරීමට එතුමාට සිදු වී තිබෙනවා. ඒ නිසා මම මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්න ඕනෑ, කොමසාරිස්තුමා ඒ ගත් තීරණය සියයට 100ක්ම නිවැරදිය කියා. එය සියයට 100ක්ම නිවැරදි වන්නේ මේ නිසයි :

ගිය අවුරුද්දේ ඒ අධ්‍යක්ෂ මණ්ඩලය පත් වන විට රු. 12,00,000ක වටිනාකමක්, වත්කමක් ඒ සමිතියට තිබුණා. රුපියල් දස ලක්ෂයක අයිරාවක් තුළ කටයුතු කළේ, මේ සමිතිය. කලවානේ ගරු මන්ත්‍රීතුමා සඳහන් කළ ඒ අධ්‍යක්ෂ මණ්ඩලයත්, සභාපතිතුමාත් අවුරුද්දක් ඇතුළත ඒ සමිතිය කොයි තරම් ප්‍රපාතයකට දමා තිබෙනවාද ? රුපියල් ලක්ෂ 12කින් පටන්ගත් සමිතියට අද සේවකයින්ට පඩි ගෙවා ගන්නටවත් පුළුවන් තත්ත්වයක් නැහැ. එවැනි අය තමයි ඇවිත් ජනතාව වෙනුවෙන් කථා කරන්නේ.

ගරු සභාපතිතුමනි, මේ ක්‍රියා මාර්ග මෙසේ තිබියදී අද තිබෙන අඩු ලුහුඬුකම් කීපයක් ගැන ගරු ඇමතිතුමාටත් කොමසාරිස්තුමාටත් අමාත්‍යාංශයේ ලේකම්තුමාටත් මම මතක් කරන්නට ඕනෑ. මේ තරම් සිද්ධියක් කර, සමුපාකර සමිතියක් මේ තරම් ප්‍රපාතයට වට්ටලා, සේවකයින්ට පඩි ගෙවා ගන්නට බැරි තත්ත්වයකට පත් කර, ප්‍රාදේශිකයකින් ගොවියෙකුට පොර මිටියක් ගන්නට බැරි තත්ත්වයකට දමා තිබීම නිසා අස් කළ අධ්‍යක්ෂ මණ්ඩලය තහනම් නියෝගයක් ගන්නට උසාවියට පෙත්සමක් ඉදිරිපත් කරන්නට යනවා යයි මට අද දැනගන්නට ලැබුණා. මෙන්න මේකයි දුර්වලකම. මේ ගැන අපි බොහෝ විට කථා කර තිබෙනවා. මෙතන අදහස් ප්‍රකාශවූ අන්දමට සමහරවිට කොමසාරිස්තුමා හරි තීරණයක් ගන්නත් පුළුවන් වැරදි තීරණයක් ගන්නත් පුළුවන්. එහෙත් සිදුවී තිබෙන්නේ මොකක්ද ? හරි තීරණය ගත්තත් වැරදි තීරණය ගත්තත්–මේ කැප්පෙටිපොල සිද්ධියේදී ගත්තා වගේ හරි තීරණයක් අරගෙන තිබුණත් සමහරවිට හෙට උසාවියෙන් නියෝගයක් එන්නට පුළුවන් ඒ ගත් තීරණය අත්හිටුවන්නය කියා. ඒක විශාල දුර්වලකමක්. එය දුර්වලකමක් යයි කියන්නේ මෙන්න මේ නිසයි. හරි තීරණයක් අරගෙන මෙවැනි දූෂිත අධ්‍යක්ෂ මණ්ඩලයක් කොමසාරිස්තුමාගේ බලතල පාවිච්චි කර ඉවත් කරන විට වැඩ නැති පෙරකදෝරු මහත්මයෙක් අල්ලා ගෙන යම්කිසි දෙයක් උසාවියට ඉදිරිපත් කළ තරමින්–නඩුකාරයා වහාම මෙහි ඇත්ත නැත්ත විමසන්නේ නැහැ. වහාම මේ අරගෙන තිබෙන තීරණය හරිද වැරදිද කියා බලන්නේ නැහැ–තහනම් නියෝගයක් නිකුත් කරන්නට ඒ අයට බලය තිබෙනවා ex parte judgment

**මන්ත්‍රීවරයෙක්**
**(அங்கத்தவர் ஒருவர்)**
**(A Member)**

Ex parte decision.

**පර්සි සමරවීර මහතා**
**(திரு. பேஸி சமரவீர)**
**(Mr. Percy Samaraweera)**

ඒක වැරදියි. ඒ නිසා මේ ක්‍රියා මාර්ගය අපි හරිගස්සා ගන්නට ඕනෑ. කොමසාරිස් කියන ඒ වගකිවයුතු තනතුර දරන පුද්ගලයා කවුරු හෝ මෙවැනි තීරණයක් ගන්නට කලින් නීතිපතිතුමාගෙන් උපදෙස් අරගෙන හරි දෙය හරියට කරනවා මිස වැරදියට කරයි කියා මම හිතන්නේ නැහැ. අද සමුපකාර කොමසාරිස්තුමා අරගෙන තිබෙන පියවරවල් කීපයක් ගැන කල්පනා කර බලන විට මේ අය තහනම් නියෝග දමා එසේ කටයුතු කළත් අන්තිමේදී විභාග කර බලන විට දෙපාර්තමේන්තුවේ කොමසාරිස්තුමා අරගෙන තිබෙන තීරණය සියයට 98ක්ම හරිබව පෙනෙනවා. ඒ තත්ත්වයයි තිබෙන්නේ. ඒ නිසා මූලික වශයෙන් අන්න ඒ බලතල අපි තහවුරු කර ගන්නට ඕනෑ, ඒ කටයුතු කිරීමේදී.

මම කියන්නේ නැහැ දේශපාලන වශයෙන් යම් මන්ත්‍රීවරයෙක් ඇවිත් කරන ඉල්ලීමක් ඉටු කරන්නය කියා. නමුත් සාධාරණය ඉටු වෙනවා නම් අර විධියේ බලතල අරගෙන ඒවා පාවිච්චි කරන විට, ඒ අනුව ක්‍රියා කරන විට, ඒ අන්දමට උසාවියට ගියාම නීති මාර්ගයේ ආරක්ෂාවත් සැලසෙන්නට ඕනෑ. එහෙම නැත්නම් මෙහි ඇති ප්‍රයෝජනයක් නැහැ. ඒ නිසා මේ අවස්ථාවේදී මම මතක් කරන්න කැමතියි. මේ සමුපකාර රෙගුලාසි හා නීති රීති නැවත ප්‍රතිශෝධනය වන්නට ඕනෑ කියා නීතියක් සමඟ ගැලපෙන විධියට. එහෙම නැත්නම් සමුපකාර ව්‍යාපාරය මේ තත්ත්වය මත කවදාවත් කරන්නට ලැබෙන්නේ නැහැ. මේ අධ්‍යක්ෂ මණ්ඩලය ඒ විධියට මුදල් වංචා කර තිබෙනවා පමණක් නොවෙයි, සම්පූර්ණ සමුපකාර සේවක රෙගුලාසි උල්ලංඝනය කර කටයුතු කරලත් තිබෙනවා. අන්න ඒ නිසා මේ ගැන විශාල ප්‍රතිශෝධනයක් අවශ්‍යයි. ඒ සම්බන්ධයෙන් කමිටුවක් පත් කර හෝ මෙසේ ඇතුළත් විය යුතු නීති රීති නැත්නම් සංශෝධනය විය යුතු දේවල් සංශෝධනය කර ඉදිරියේදී මේ දෙපාර්තමේන්තුව හරියාකාර පාලනය කිරීම පිණිස මේ නිලධාරීන්ට බලතල ලැබෙන්නට ඕනෑ. ඇමතිතුමාට බලතල ලැබෙන්නට ඕනෑ. එය මම අවධාරණයෙන්ම මතක් කරන්නට කැමතියි.


Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[පර්සි සමරවීර මහතා]

ගරු සභාපතිතුමනි, ඔය කැප්පෙටිපොළ සමුපකාර ව්‍යාපාරය ඒ ප්‍රදේශයේ ගොවි ජනතාවට විශාල සේවයක් සැලසූ විවිධ සේවා සමුපකාර සමිතියක්. අද කොළඹට එවන එළවලුවලින් බාගයක්ම කොළඹ ප්‍රදේශයේ පාරිභෝගිකයින්ට සපයන්නේ ඒ සමුපකාර සමිතියයි. ඒ විධියේ වැඩ කටයුතුවල නියැලී සිටින අපේ එවැනි සමුපකාර සමිතිවලට තවත් බාහිර වශයෙන් ආදයම් ලබන මාර්ගත් ඇති කර දිය යුතුව තිබෙනවා. ආදයම් මාර්ග කියන්නේ මේවායි. වී අලෙවි මණ්ඩලය තිබෙනවා. ඒ වී ලබා ගන්නට පුළුවන් සමුපකාරවලට. කැප්පෙටිපොළ මා සඳහන් කළ මධ්‍යස්ථානයේ වී ගබඩාවක් තිබුණා. එමෙන්ම වී කොටන මෝලකුත් සවි කර තිබුණා. දැන් ඒවා ක්‍රියා විරහිත වී පාවිච්චි කරන්නේ නැහැ. බොහොම උනන්දුවෙන් කටයුතු කරගෙන යන සමහර තැනුත් තිබෙනවා. එවැනි තැන්වලට අවකාශ තිබෙන්න්ට ඕනෑ. වී අරගෙන සහල් කරනවා පමණක් නොවෙයි, එහිදී විසිකරන දේවල් සත්වාහාර සඳහා ප්‍රයෝජනයට ගන්න පුළුවන් එවැනි ආදයම් මාර්ග සලසා ගන්නට බලතල සහ අවකාශ තිබෙන්නට ඕනෑ.

ඒ නිසා මම මතක් කරන්න කැමතියි, සමුපකාර ව්‍යාපාරය අද ටිකක් සෙලවිලි තත්ත්වයට තිබුණත් මේ ඇමතිතුමා මේ අමාත්‍යාංශය බාර ගත්තා විට සමුපකාර සමිති නැත්නම් විවිධ සේවා සමුපකාර සමිති වලින් සියයට 40 ක් හොඳට ක්‍රියාත්මක වුණේ කියා. සියට 60 ක්ම අබලන් තත්ත්වයකට වැටිලා ප්‍රකෘතිමත් කරන්න බැරි තත්ත්වයකයි තිබුණේ. නමුත් දැන් ඒවා හුඟක් දුරට සකස් කර ඒ කටයුතු සම්පූර්ණ කර සියයට 80 ක් සමඟ හරියට වැඩ කරගෙන යනවා. ඒකට අපි උදව් දෙනවා මිසක් කලවානේ ගරු මන්ත්‍රීතුමා කියන විදියට දේශපාලන ඇඟිලි ගැසීම් තිබෙනවා කියා ඒ හොරු ටික ආයෙත් දගන්න සැරසුණොත්, මේක කවදවත් හරියට කරන්න බැහැ. ඒනිසා සත්‍යය හරියට පිළිගෙන හරි විදියට ක්‍රියා කළ යුතුයි කියන එක මම මතක් කරන්න ඕනෑ.

ගරු සභාපතිතුමනි, මට විනාඩියක් දෙන්න මම වැදගත් යෝජනාවක් ඉදිරිපත් කරන්නට බලාපොරොත්තු වුණා. කෘෂිකර්ම අමාත්‍යාංශය සම්බන්ධව සාකච්ඡා කළ අවස්ථාවේදී නමුත් මම ඒකට අවස්ථාවක් ලැබුණෙත් නෑ. ඒ අමාත්‍යාංශයත් අයිති අපේ ගරු ඇමතිතුමාට නිසා මම ඒ යෝජනාව ගැන මතක් කර මගේ කථාව අවසන් කර්නයි බලාපොරොත්තුව.

ගොවීන් සඳහා සකස් කර දී තිබෙන විශ්‍රාම වැටුප් ක්‍රමය සහ රක්ෂණ ක්‍රමය ගැනයි මම මතක් කරන්නේ. පෞද්ගලික වෙළෙන්දන් සමඟ වී අලෙවි මණ්ඩලය තරඟ කරන විට, පෞද්ගලික වෙළෙන්ද වී මිල වැඩි කරන නිසා බාගවිට වී අලෙවි මණ්ඩලයට සීමිත ප්‍රමාණයකට, සීමිත මිලකට වී මිලදී ගන්ට තිබෙන නිසා වී අලෙවි මණ්ඩලයට වී ලබාගන්න බැරිවෙයි. ඒනිසා අළුත් රක්ෂණ ක්‍රමය උඩ මා යෝජනාවක් කරන්න කැමතියි ගරු ඇමතිතුමා ඒ රක්ෂණ රෙගුලාසි පිළිබඳ නීති රීති සම්පිණ්ඩනය කරන විට, එය සකස් කරන විට තමුන්නාන්සේ පිළිගන්නවා නම් මා යෝජනා කරන මෙන්න මේ ක්‍රමය එයට ඇතුළත් කරන්නට පුළුවනි. එනම්, ගොවි මහත්මයෙක් වී අලෙවි මණ්ඩලයට දෙන සෑම වී බුසලකටම රුපියල් 5 ක් හෝ 10 ක් වැඩිකර ඒ මුදල ඒ ගොවි මහත්මයාගේ රක්ෂණ මුදලට එකතු කරන්න යම්කිසි වැඩපිළිවෙළක්, දිරිගැන්වීමක් ඇති කිරීමයි. එසේ කරනවා නම් අපට පුළුවන් පෞද්ගලික වෙළෙන්දට මුහුණ දී මේ කටයුත්ත හරියට කරන්න, වී අලෙවි මණ්ඩලය මගින්. ඒ යෝජනාව ඉදිරිපත් කරමින් තමුන්නාන්සේට මම නැවතත් ස්තුතිවන්ත වෙනවා. මට මේ කාල සීමාව දීම ගැන. මොකද, වැරදි අවබෝධයක් දී තිබෙනවා, කලවානේ ගරු මන්ත්‍රීතුමා (සරත් මුත්තෙට්ටුවේගම මහතා) මගේ සමුපකාරයක් ගැන. ඒ නිසා තමුන්න්නාන්සේට ස්තුතිවන්ත වන අතර හොඳ සමුපකාර වැඩපිළිවෙළක් තිබෙන කොට්ඨාශයක මන්ත්‍රීවරයෙක් හැටියට මේ අවස්ථාවේදී මගේ ගෞරවයත්, ස්තුතියත් මේ ගරු ඇමතිතුමාටත්, නියෝජ්‍ය ඇමතිතුමාටත්, ලේකම්තුමාටත්, නිලධාරී මණ්ඩලයටත්, පිරිනමන්නට ඕනෑ එතුමන්ලාගේ රාජකාරිය සියයට සියයක්ම හරියට කරන නිසා.

**ජේ. එල්. සිරිසේන මහතා (නියෝජ්‍ය සමාජ සේවා ඇමතිතුමා)**
**(திரு. ஜே. எல். சிறிசேன — சமூக சேவைகள் பிரதி அமைச்சர்)**
**(Mr. J. L. Sirisena – Deputy Minister of Social Services)**

ගරු සභාපතිතුමනි, ආහාර හා සමුපකාර අමාත්‍යාංශයේ වැය ශීර්ෂ ගැන වචන ස්වල්පයක් කථා කිරීමට අවස්ථාව ලබාදීම ගැන මම තමුන්නාන්සේට ස්තුතිවන්ත වෙනව. ආහාර ගැන කතා කිරීමේ දී අපි බලයට පත්වී අවුරුදු 8 කට පසු 1970-77 කාලයේ තිබුණු තත්ත්වය ගැන කතා කරන එක නම් එපමණ වැදගත් නැහැ. නමුත් විරුද්ධ පක්ෂය, විශේෂයෙන්ම ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලා, කළ ප්‍රකාශ ගැන වචනයක් දෙකක් කිව යුතුවම තිබෙනවා. අත්තනගල්ලේ ගරු මන්ත්‍රීතුමා (ලක්ෂ්මන් ජයකොඩි මහතා) කිව්වා දැන් ඇට සැකිලි දකින්නට තිබෙනවා කියා. එතුමා එහෙම කිව්වත් කොහෙවත් ගමකට ගිහින් ඇටසැකිලි බලාගන්න ඕනෑ නම් 1970-77 කලයේ ආහාර නැතිකම නිසා, ආහාර සපයාගන්න බැරිකම නිසා වස බී මැරුණු අය, ආහාර නැතුව කුසගින්නේ මැරුණු අයගේ ඇටසැකිලි හාරා ගත්තොත් මිස නැත්නම් වෙන ඇටසැකිලි නම් සොයන්නට පුළුවන් කමක් නැහැ. අද ආහාර ද්‍රව්‍යවල මිල වැඩිවීම ගැන ඒ අය කතා කරනවා. ඇත්ත, රුපියල් ගණන් වලින් බැලුවොත් මිල වැඩිවෙලා තිබෙනවා. නමුත් අපි කල්පනා කර බලන්නට ඕනෑ 1970-77 කාලයේ කෙනෙකුගේ පඩිය කොතෙක්ද කියා. එද වත්තක වැඩ කරන කම්කරුවකුට ලැබුණේ රුපියල් තුනහමාරයි. එද රුපියල් පහකටවත් හාල් සේරුවක් ගන්නට පුළුවන් කමක් තිබුණෙ නැහැ.

අ. භා. 1.30

අපි පිළිගන්නවා රුපියලේ අගය අඩුවෙලා තිබෙනවා කියා. ඒක සියයට 40කින් සියයට 50කින් අඩුවෙලා තිබුණත්, අද කම්කරු ස්ත්‍රියකට පවා රුපියල් විසිපහමාරක් දිනකට ලැබෙනවා වත්තක වැඩ කලාම. අද හාල් සේරුවක් රුපියල් හයක් හතක් වෙනවා. ගම්ගොඩවල එතරම් ගණනක් වෙන්නෙත් නැහැ. එද මිලත් අද මිලත් සමග සංසන්දනය කලොත් පෙනෙයි මිලේ කොපමණ පහසුවක් තිබෙනවාද කියා අද. එද රුපියල් තුනහමාරක් දුන්නා දිනකට. නමුත් රුපියල් 5කට, 7කට වත් හාල් සේරුවක් ගන්න පුළුවන් වුණේ නැහැ. එහෙම තත්ත්වයක් එද තිබුණේ. අද ඒ ගැන සංසන්දනයක් කලොත් රුපියලේ අගය අඩුවීමටත් වාසියක් දී බැලුවත් අද සාමාන්‍යයෙන් ගමේ ජීවත්වන කම්කරුවකුගේ ආදයම් තත්ත්වය වැඩිවෙලා තිබෙනවා.

එද රජය 'දවස' පත්‍රය තහනම් කළේ වස බී නැතිනම් ආහාර නැතුව මිනිසුන් මැරෙනවාය කියා පත්‍රයේ පළ කළ නිසයි. ස්වාධීන පත්‍ර සමාගමේ පත්‍ර සියල්ලක්ම තහනම් කළේ ඒ නිසයි. අද ඒවා මතක නැතිව කතා කරන එක ගැන කනගාටු වෙනවා. ලාභයට ආහාර ද්‍රව්‍ය දෙන්න පුළුවන් නම් අපිත් කැමතියි. හැම ආණ්ඩුවක්ම කැමතියි. නමුත් ලෝකය පුරාම හැම භාණ්ඩයකම මිල ඉහළ යනවා. ඉන්ධන මිල වැඩි වෙන විට ට්‍රැක්ටර් ගාස්තු වැඩි වෙනවා. ටයර් මිල වැඩි වෙන විට ට්‍රැක්ටර් ගාස්තු වැඩි වෙනවා. වෙනත් සෑම දෙයකම මිල වැඩි වෙනවා නම් නිෂ්පාදකයාට වැඩි මිලක් දෙන්න ඕනෑ. ඒ නිසා රු. 62.50ට තිබුණ වී බුසලේ මිල රු. 70ක් දක්වා වැඩි කළා. වී බුසලක මිල රු. 70ක් වන විට කෙලින්ම හාල් සේරුවක මිල රු. 5ක් වෙනවා. වී බුසලකින් හාල් සේරු 14ක් ලැබුණොත් එක හාල් සේරුවක මිල රු. 5ක් වෙනවා. ඒ අතික් වියදම් නැතිවයි. ඒ නිසා රු. 6කට 7කට පාරිභෝගිකයාට හාල් සේරුවක් ගැනීමට සිදුවීම ගැන කනගාටු වෙන්න දෙයක් නැහැ. නිෂ්පාදකයාට සෑහෙන මිලක් ලැබෙනවා. ඒ නිසාම 1984 වර්ෂයේදී පිටරටින් ආහාර ගෙන්වන්නේ නැතිව ආහාරවලින් ස්වයංපෝෂිත තත්ත්වයක් ලබා ගන්නට අපට පුළුවන් වුණා. ඒ ගැන අපි කවුරුත් සතුටු වෙන්න ඕනෑ. මොන දේශපාලන මත දැරුවත් මේ රටේ පුරවැසියන් හැටියට අපි ඒ ගැන සතුටු විය යුතුයි. ඒ ගැන රජයට ප්‍රශංසා කළ යුතුයි.

ඊළඟට ආහාර ගැන කථා කරද්දී තවත් කිව යුතු කාරණයක් තිබෙනවා. මේ අවුරුද්ද අවසන් වෙන්න මත්තෙන් දිළිඳු සහන යටතේ ආහාර මුද්දර ලබා දෙන්නට අපි ලෑස්ති වුණා. නමුත් එය තව කල් ගියා. යම් යම් ප්‍රශ්න නිසා ලබන ජූනි මාසයෙන් මෙහා එය ක්‍රියාත්මක කරන්න බැරි තත්ත්වයක් උද වී තිබෙනවා. ආහාර ගැන කථා කරන මේ වෙලාවේදී විරුද්ධ පාර්ශ්වයේ ගරු මන්ත්‍රීවරුන්ට පමණක් නොව ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීවරුන්ටත් මේ සභාව තුළින් මුළු මහත් ලංකාවේ වාසය කරන සියලුම ජන කොටස්වලටත් ආයාචනයක් කරන්න මම කැමතියි. ඒ ආයාචනය නම් දිළිඳු සහන ලබා ගන්නට ඉදිරිපත් විය යුත්තේ දිළිඳු සහන ලැබිය යුතු අහිංසක අය පමණක්ම විය යුතු බවයි. ආහාර මුද්දර ලබා නොගත යුතු විශාල ප්‍රමාණයක් ජනයා අද ආහාර මුද්දර ලබා ගන්නවා. මෙයින් කරන්නෙ බලවත් අසාධාරණයක්. අපි මන්ත්‍රීවරුන් හැටියට මෙය ඡන්දය සොයන, ඡන්ද කොටා ගන්නා ව්‍යාපාරයක් කර ගත යුතු නැහැ. අපේ රටේ අනාගතය ගැන අපේ රටේ අනාගත ආර්ථික සංවර්ධනය ගැන හිතනවා නම් අපි හැම කෙනෙක්ම මන්ත්‍රීවරුන් හැටියට පමණක් නොව, හැම වගකිවයුතු පුරවැසියෙක්ම ඉතාම සාධාරණව

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කල්පනා කර ආහාර මුද්දර—දිළිඳු සහන—ලබා ගන්නට සුදුසුකම් තිබෙන අය පමණක් ඉදිරිපත් කරන්න ඕනෑ. ඊට සුදුසුකම් තිබෙන, අත්‍යවශ්‍යයෙන්ම ඒ සහන ලැබිය යුතු අය පමණක් ඊට ඉදිරිපත් වෙන්න ඕනෑ. එහෙම නැත්නම් අපේ රට සංවර්ධනය කරන්න බැරි වෙනවා පමණක් නොව, රැකියා නැති උදවියට රැකියා සපයා දී රටේ සංවර්ධනය තුළින් ඒ අයත් ආදායමක් ලබන පුද්ගලයන් හැටියට පත් කරන්නටත් අවස්ථාවක් ලැබෙන්නේ නැහැ. ආහාර මුද්දර ආදී රජයෙන් දෙන ආධාර නොගන්නා තැනට ජාතියේ හැම කෙනෙක්ම ළං කරන්නට අපට බැරි වෙනවා. අන්න ඒ නිසයි කල් ඇතුවම මා මේ ප්‍රකාශය කරන්නෙ. සෑම කෙනෙක්ම මේ රටේ හැම පුරවැසියෙක්ම කල්පනා කරන්න ඕනෑ, මේ රටේ දිළිඳු සහන තුළින් ආධාර ලබා ගත යුත්තේ ඉතාම බැරි තත්ත්වයේ උදවිය පමණක් බව.

ඊළඟට සමුපකාර කටයුතු සම්බන්ධයෙන් විශේෂයෙන්ම මම ගරු ඇමතිතුමාට ස්තුති කරන්න කැමතියි. මම මේ සභාවේදී කීප විටක්ම ආයාචනා කළා, සමුපකාරය නංවාලීමට රජයෙන් උපකාර කරන්නය කියා. මේ ව්‍යාපාරයට රජයෙන් උපකාර කරන්නෙ නැහැ කියල මම කිව්වා. එහෙම නැත්නම් උපකාර කරනවා මදිය කියල මම කිව්වා. මම හිතනවා මේ අවුරුද්දේ අවසානයට හෝ භාණ්ඩාගාරයෙන් රුපියල් දස ලක්ෂ 100 බැගින් අවුරුදු තුනක් තිස්සේ ලබා දීමට දැන් කටයුතු සකස් කර තිබෙනවාය කියා. එවැනි තත්ත්වයක් ඇති කර දීම සම්බන්ධයෙන් අපි ගරු මුදල් ඇමතිතුමාටත්, ආහාර හා සමුපකාර ඇමතිතුමාටත් ස්තුතිවන්ත වෙන්න ඕනෑ. සමුපකාරය නංවාලීම සඳහා අවුරුදු තුනක් රුපියල් දස ලක්ෂ 100 බැගින් දෙන්න තීරණය කර තිබෙනවා. ප්‍රමාද වී හෝ මේ ආධාරය ලැබීම ගැන අපි සන්තෝෂ වෙනවා. ඒ සම්බන්ධයෙන් ක්‍රියා කිරීම ගැන ගරු ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා.

පසුගිය අවුරුදු කීපය තුළ සංස්ථාවලට කෝටි 4,000ක් දී තිබෙනවා. ඒ කෝටි 4,000ම ආපසු භාණ්ඩාගාරයට ලැබෙන්නෙ නැහැ. මේ වගේ මහජන ව්‍යාපාරයක් වන සමුපකාර ව්‍යාපාරයට, විශේෂයෙන්ම රජය අවදානම් තත්ත්වයකට මුහුණ දෙන අවස්ථාවලදී සහායට එන්න ඉන්න මේ මහජන ව්‍යාපාරයට ඒ මුදලින් සියයට 1ක් යථා කාලයේදී දී තිබුණා නම් මේ සමුපකාර සංගම් එකක්වත් අද තිබෙන මේ දුර්වල තත්ත්වයට වැටෙන්නෙ නැහැ.

ප්‍රමාද වී හෝ අවුරුදු තුනක් තුළදී අපට ලැබෙනවා දස ලක්ෂ තුන් සියයක්. මෙයින් නියම ප්‍රයෝජන ගන්න අපි ඉදිරිපත් වෙන්න ඕනෑ. මේ පිළිබඳව කතා කරන විට සමිති එකොළහක් සම්බන්ධයෙන් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ පාලන වාර්තාවේ 23 වැනි පිටුවේ දක්වෙන කරුණක් සඳහන් කරන්න ඕනෑ. එහි මෙසේ කියා තිබෙනවා.

විවිධ සේවා සමුපකාර සමිතිවල කාර්ය සාධනය සඳහා භාණ්ඩාගාරය විසින් ලබා දෙන ලද අරමුදල් බෙද හැරීමේ ගිණුම් කටයුතුද මුදල් අංශය මගින් ඉටු කරන ලද නවත් කාර්යයක් විය. මේ යටතේ භාණ්ඩාගාරයේ අයවැය අධ්‍යක්ෂ විසින් වෙන් කරනු ලැබ ඇති රුපියල් කෝටි දහයෙන් 1984 වර්ෂය අවසාන වන විට සමිති 11ක් සඳහා රුපියල් ලක්ෂ හතළිස් අටක් ණය මුදල් වශයෙන් ලබා දී තිබුණි.

මේ සමිති එකොළහ තෝරා ගත්තේ මොන පදනම මතද යන වග දැනගන්න මම කැමතියි. මේ සමිති එකොළහ විතරක් තෝරා ගන්න හේතුව මොකක්ද ? සමිති විශාල ප්‍රමාණයක් සංසරණය කිරීමට අවශ්‍ය මුදල් හිඟකම නිසා පාරිභෝගිකයන්ට අවශ්‍ය බඩුමුට්ටු ගෙනැවිත් දෙන්න විධියක් නැතිව සිටිනවා. ඒ නිසා පාරිභෝගිකයන් සමුපකාරය ගැන සෑහෙන කලකිරීමට පත් වී සිටිනවා. සමුපකාරයේ ආදායම් තත්ත්වය අඩු වන විට සේවක පඩි ගෙවන්න විධියක් නැහැ. ඒ වාගේ තත්ත්වයක් තිබියදීත් මේ ලක්ෂ හතළිස් අට සමිති එකොළහකට විතරක් දෙන්න යොදා ගත් පදනම මොකක්ද කියා මේ වාර්තාවේ සඳහන් වී නැහැ. එය අපි දැනගත යුතු දෙයක්.

සමුපකාර අරමුදල විශාල ප්‍රමාණයක් තිබෙනවා. කෝටි දහයක මුදලක් ලැබී තිබෙනවා. කෝටි දහයක් කියන්නේ ලක්ෂ දාහක්. ලක්ෂ දාහෙන් දී තිබෙන්නේ හතළිස් අට ලක්ෂයයි. ඒ කියන්නේ සියයට දෙකකටත් අඩු ප්‍රමාණයක්. මේ මුදල් බැංකුවේ තබාගෙන අපේ දෙපාර්තමේන්තුවේ පාලනය යටතේ මෙතරම් මුදල් සම්භාරයක් තිබෙනවාය කීම නොවෙයි වැදගත්. ඒ මුදල්වලින් නිසි ප්‍රයෝජන ගැනීමයි අවශ්‍ය. මුදල් නිකම් එක - එක තැන ගොඩගසා තැබීම වැඩක් නැහැ. මහජන යහපත සඳහා මුදල්වලින් ප්‍රයෝජන ගන්න ඕනෑ. එය හරියට ඉෂ්ට වන බවක් මට පේන්නේ නැහැ. මීට වඩා කාර්යක්ෂම අන්දමින් මේ කටයුතු කෙරෙන්න ඕනෑ. නැත්නම් භාණ්ඩාගාරය දෙන මුදල්වලින් අපි ප්‍රයෝජන නොගෙන නිකම් තිබෙනවා. එවිට භාණ්ඩාගාරය ලබන අවුරුද්දේ කෝටි දහයක් දෙන්න අදහස් කරන විට කලින් මුදල්වලින් මොකද කළේ කියා භාණ්ඩාගාරය ඇහුවොත් කියන්න දෙයක් නැහැ. අපි සියයට දෙකයි වියදම් කර තිබෙන්නේ. එනිසා භාණ්ඩාගාරය හිතන්න පුළුවන් තවත් මුදල් දීම අනවශ්‍යය කියා. සමුපකාර ව්‍යාපාරය නංවාලීමට බලවත් ආධාරයක් වන මේ මුදල් දූෂණ තිබෙන සමුපකාර සංගම්වලට නොවෙයි අවංකව ක්‍රියා කරන සමුපකාර සංගම් සොයා බලා ඒවාට දිය යුතුව තිබෙනවා.

සමුපකාර පාලන වාර්තාවේ 14 වැනි පිටුවේ අන්තිම ඡේදයේ මෙසේ සඳහනක් තිබෙනවා.

" අතිරික්ත අරමුදල්වලට විකල්ප ආයෝජනයක් වශයෙන් මෙම දෙපාර්තමේන්තුව විසින් සමුපකාර ග්‍රාමීය බැංකු මගින් වී ගොවිතැන් කරන අයට ස්වර්ණාභරණ ඇප මත සියයට විසි දෙකේ අඩු පොළියට ණය දීමේ ක්‍රමයක් යෝජනා කර ඇත. එයද මහජන බැංකුවේ නියෝජිත කටයුත්තක් වශයෙන් ක්‍රියාත්මක කළ යුතු හෙයින් එය ක්‍රියාත්මක කිරීමට මහජන බැංකුවේ එකඟත්වය බලාපොරොත්තුවෙන් තවම සිටියි. "

මම මේකට එකඟ වෙන්නේ නැහැ. එකඟ වෙන්න බැරි කරුණු දෙකක් මෙහි තිබෙනවා. වී ගොවිතැන් කරන අයට සියයට විසි දෙකේ පොළියට ණය දෙන්නේ ඇයි ? දැන් වාණිජ බැංකුවල පවා පොළිය සියයට දහ අටයි. සමුපකාරය සියයට විසි දෙකේ පොළියට ණය දෙන්න යෑම බලවත් අසාධාරණයක්. මෙය මීට වඩා අඩු පොළියක් විය යුතුයි. සියයට දහයක දොළහක පමණ පොළියක් විය යුතුයි.

අනෙක් කරුණ මේකයි. ග්‍රාමීය බැංකුවට එන්නේ ඒ ගම් ප්‍රදේශයේ තිබෙන මහජන මුදල්. ග්‍රාමීය බැංකුව මහජනයා ඉතුරු කළ මුදල් ජනතාවගේම ප්‍රයෝජනය සඳහා පොළියට දෙන අවස්ථාවේදී ඊට මහජන බැංකුව සම්බන්ධ කරගන්නේ ඇයි ? මහජන බැංකුව සම්බන්ධ කර ගන්න කිසිම හේතුවක් නැහැ. මහජන බැංකුවෙන් සමුපකාරයට කිසිම ප්‍රයෝජනයක් වෙලා නැහැ.

මහජන බැංකුව පටන් ගත්තේ. සමුපකාරයේ මුදල් වලින්. සමුපකාර බැංකුවල තිබුණු මුදල්වලින්. ඒක වාණිජ බැංකුවක විලාශයෙන් ක්‍රියා කරනවා. සමුපකාරයට කිසිම ප්‍රයෝජනයක් නැති අයුරින් ක්‍රියාකරන නිසා මහජන බැංකුව මේ කටයුත්තට යා කරගෙන මහජන බැංකුවේ උපදෙස් පරිදි ක්‍රියාකරනවාට නම් මම කිසිසේත් එකඟ වන්නේ නැහැ. ඒ කටයුත්ත කරන්න මේ උදවියට බලතල දෙන්න ඕනෑ. සීමාසහිතව ඒ බලතල දීලා බලන්න ඒක කරනවාද නැද්ද කියා. ගමේ ජනතාව මේ කටයුතුවලට පළපුරුදු කර ගන්න ඕනෑ. ඒ අයගේ ආකල්පය මේවාට යොමු කරලා, අවංකව මේ කටයුතු කරන්න පුරුදු කරන්න ඕනෑ. මේ රටේ සමුපකාරය දියුණු කරන්නට ඕනෑ නම්, සමුපකාරය මේ කටයුත්තට යාකර ගන්නට ඕනෑ නම්, ඒ උදවියට විශාල වශයෙන් බලතල දෙන්නට ඕනෑ. මේ කටයුතු සාර්ථක කර ගන්නට ඕනෑ නම් එහෙමයි කරන්න ඕනෑ.

**සභාපතිතුමා**
**(தவிசாளர்)**
**(The Chairman)**

Order, please ! It is time for the hon. Member to stop. The hon. Member has already taken fifteen minutes.

**ජේ. එල්. සිරිසේන මහතා**
**(திரு. ஜே. எல். சிறிசேன)**
**(Mr. J. L. Sirisena)**

May I have another five minutes more.

**සභාපතිතුමා**
**(தவிசாளர்)**
**(The Chairman)**

The hon. Member may continue for another five minutes.

**ජේ. එල්. සිරිසේන මහතා**
**(திரு. ஜே. எல். சிறிசேன)**
**(Mr. J. L. Sirisena)**

සමුපකාරය ගැන මට බොහොම දේවල් කියන්න තිබෙනවා. නමුත් කාලවේලා මදි නිසා මේ මිනිත්තු පහේදී සමුපකාරය පිළිබඳ වූ වඩා වැදගත් කාරණයක් ගැන සඳහන් කරනවා. ගරු ඇමතිතුමාගේ අවධානය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජේ. එල්. සිරිසේන මහතා]

විශේෂයෙන් මේ ගැන යොමුකරන්නට ඕනෑ. මම සඳහන් කරන්න යන්නේ සීමාසහිත ශ්‍රී ලංකා සමුපකාර අලෙවි සංගමය ගැනයි. මේ සංගමයේ කටයුතු ගැන කිසිසේත් සතුටු වන්නට බැහැ. මේ සංගමයේ 1979 වර්ෂයේ ගිණුම් වාර්තාව ඉදිරිපත් කර තිබෙන්නේ 1985 ඔක්තෝබර් මාසයේදීයි. 1979 වර්ෂයෙන් පස්සේ ගිණුම් වාර්තා ඉදිරිපත් කර නැහැ. මේ සංගමයේ තිබෙන දූෂණ මේ සංගමයේ තිබෙන අඩුපාඩු ගැන පැය ගණනක් කථා කරන්නට පුළුවන්. ඒ සියල්ල මේ අවස්ථාවේදී සඳහන් කිරීමට අපහසු නිසා මේ සංගමයේ 1979 වර්ෂයේ ගණන් පරීක්ෂක වාර්තාවේ සමහර කාරණ ගැන ඔබතුමාගේ අවධානය යොමු කරවන්නට කැමතියි. මේ කාරණා කියවා බලන ලෙස ගරු ඇමතිතුමාගෙන් මම ඉල්ලා සිටිනවා. එහි 2 වන පිටුවේ තිබෙනවා, ආදායම් බදු ගැන. ඊළඟට 4 වන පිටුවේ තිබෙනවා, කලින් ගෙවීම් ගැන. ඒ ගැන තවත් විස්තර තිබෙනවා 6 වන පිටුවේත්. භාණ්ඩ වැඩි මිලට ගෙන අඩුවට විකිණීම සම්බන්ධයෙන් 8 වන පිටුවේ සඳහන් වෙනවා. නත්තල් සැරසිලි සඳහා රුපියල් ලක්ෂ ගණනක ගෙනැවිත්, රුපියල් දහදහක් පමණ වටිනා භාණ්ඩ පමණයි, විකුණා තිබෙන්නේ.

ඉතාම වැදගත් කාරණය තමයි, බුලත් අපනයනය සම්බන්ධ කාරණය. බුලත් අපනයනය වාසිදායක දෙයක් වුණත් එයින් විශාල විධියේ — ලක්ෂ ගණනින් — වංචා සිදු වී තිබෙනවා. පැය ගණනක්වත් එය කියවා අවසාන කරන්නට බැහැ. එම නිසා මේ වාර්තාවේ එම පිටුවල සඳහන් කරුණු සම්බන්ධයෙන් නිලධාරී මහත්වරුන් ලවා සොයා බලා අවශ්‍ය පරිදි ක්‍රියා කරන ලෙස ඉල්ලා සිටිනවා. බුලත් අපනයනය සම්බන්ධයෙන් වූ ලක්ෂ දහයක පමණ වංචා ගැන සඳහන් වෙන්නේ මෙම වාර්තාවේ 9 වන පිටුවේයි. තොග අඩුවීමේ ගිණුමේත් විශාල වශයෙන් දොස් තිබෙනවා. ඒ ගැන සඳහන් වෙනවා, මෙම වාර්තාවේ 11 වන පිටුවේ. සුභසාධක වියදම් වශයෙන් පත්ලක්ෂ පණස් දහසක් පමණ මෙම ගිණුමට ඇතුළත් කර තිබෙනවා. එයින් වියදම් කර තිබෙන්නේ රුපියල් පණස් දහස් ගණනයි. රුපියල් පත් ලක්ෂයක්ම වැඩියෙන් ගණන් වැටුණේ කොහොමද ? පහේ ඉලක්කමක් ඉබේම වැඩියෙන් වැටිලා තිබෙනවා. මේවා විශේෂයෙන් සොයා බැලිය යුතු කාරණායි. සුභසාධක වියදම් ගැන 11 පිටුවේ සඳහන් වෙනවා.

අ. භා. 1.45

නිලධාරීන් සේවය අතහැර යාම මෙහිදී වැදගත් ශීර්ෂයක් වෙනවා. සේවය අතහැර ගොස් සිටින ඒ නිලධාරී මහත්වරු මොන හේතුවක් නිසා සේවය අතහැර ගොස් තිබෙවාදැයි තමුන්නාන්සේ කියවා බැලුවොත් හොඳයි. "වාටඩ් එකවුන්ටන්ට්ස් ලා" මේ ගිණුම් පරීක්ෂා කරන අතරතුරේදීයි මේ සියලුම ගිණුම් ලිපිකරුවන් සේවය අතහැර ගොස් තිබෙන්නේ. ඒක ඉතාම වැදගත්. නිලධාරීන්ගේ අක්‍රමිකතා 13 වන පිටුවේයි, සඳහන් වෙන්නේ. පොදු වෙළඳ ගිණුම ගැන විශාල වෙනස් කම් තිබෙනවා. ඒ ගැන 15 සහ 16 පිටුවල තිබෙනවා. ගොඩනැගිලි පිළිබඳවත් සේවකයන්ගේ විශාල දූෂණ තිබෙනවා. ඒ සම්බන්ධයෙන් 17 සහ 18 යන පිටුවල සඳහන් වෙනවා. මෝටර් වාහන පිළිබඳවත් ඒ වගේමයි. ඒ ගැන සඳහන් වෙනවා, 18 වන පිටුවේ. රුපියල් දහස් ගණනක ට්‍රැක්ටර් අමතර කොටස් අපතේ යනවා. ගණකාධිකාරීවරු කියනවා අවුරුදු 35 කටවත් ඒ තිබෙන ස්ටොක් එක විකුණන්න බැහැ කියා. ඒ ගැන සඳහන් වෙන්නේ 19 වන පිටුවේයි. වෙළඳ ණය ගැතියන් ගැන 21 වන පිටුවේ සඳහන් වෙනවා. රුපියල් දශ ලක්ෂ ගණනින් ඒවා තිබෙන්නේ. තමුන්නාන්සේ විශේෂ නිලධාරී කමිටුවක් පත් කරලා මේ ගැන සොයා බලා මෙහි අධ්‍යක්ෂ මණ්ඩලයට විරුද්ධව ගතයුතු ක්‍රියා මාර්ගයක් ගන්නා ලෙස කරුණාවෙන් ඉල්ලා සිටිනවා.

**ගාමිනී ජයසූරිය මහතා**
**(திரு. காமனீ ஜயசூரிய)**
**(Mr. Gamani Jayasuriya)**

කරුණාකර මට මොහොතකට ඉඩ දෙන්න. එතුමා සඳහන් කළ අන්දමට සමිති 11 ක් නොවෙයි, මෙම 1984 වාර්තාවේ දක්වෙන අන්දමට සමිති 12යි. අද වන විට සමිති 65කට ආධාර කර තිබෙනවා. තවත් සමිති 92කට ආධාර දීමට අප කටයුතු කර ගෙන යනවා.

**අමරසිරි දොඩන්ගොඩ මහතා**
**(திரு. அமரசிறி தொடங்கொட)**
**(Mr. Amarasiri Dodangoda)**

ගරු සභාපතිතුමනි, දැනටමත් සෑහෙන තරම් දුරට අදහස් ප්‍රකාශ කර ඇති නිසා බොහෝ කෙටියෙන් අදහස් කීපයක් දක්වීමටයි, මා අදහස් කරන්නේ. ගරු ඇමතිතුමාත්, නියෝජ්‍ය ඇමතිතුමාත්, මොන තරම් වෙහෙස ගත්තත්, විවෘත ආර්ථික ක්‍රමය තුළ සමුපකාර ව්‍යාපාරයට අදාළ කටයුතු බොහොම අපහසුකම් මධ්‍යයේ ගෙන යන්නට එතුමන්ලාට සිදු වී ඇති බව සඳහන් කරන්නට වෙනවා. විශේෂයෙන්ම රජයේ අනිකුත් ප්‍රතිපත්ති සමග සසඳා බලන විට, සමුපකාරය අද වැටී ඇති තත්ත්වය ගැන වැඩි දුර කථා කිරීමේ තේරුමක් නැහැ. මම එක් අංශයක් ගැන පමණක්, ඒ කියන්නේ සමුපකාර සමිතිවල සේවකයන් පිළිබඳව පමණක් අදහස් ස්වල්පයක් ඉදිරිපත් කරන්නට කැමතියි.

ලංකාවේ අද පවතින වැටුප් ක්‍රමය අනුව අඩුම වැටුප් මට්ටමක ඉන්නේ සමුපකාර සේවක පිරිසයි. ඒ අයගේ වැටුප් මට්ටම බැලුවාම ඒ අයගේ සේවා ස්ථානවල අඩුපාඩුකම් බොහොමයක් සිද්ධ වන බව පෙනෙනවා. අනිකුත් සේවා ස්ථානවල ගෙවන වැටුප් ප්‍රමාණ ගැන බලන විට, සමුපකාර සේවකයන්ට ගෙවන වැටුප් ප්‍රමාණය ගැන හිතා ගන්නත් අමාරුයි. මෙයට එක් උදහරණයක් හැටියට සමුපකාර සමිතිවල ප්‍රවාහන අංශයේ සේවකයන් සඳහා ගෙවන වැටුප් පරිමාව දක්වන්නට පුළුවනි. සමුපකාර සමිතිවල ප්‍රවාහන අංශයේ රැකියාවේ යෙදී ඇති අයට, වර්ෂය සහ රැකියාවේ වර්ගය අනුව වැටුප් ගෙවීම කරන ලෙස 1983.08.29 වන දින අංක 260/40 දරණ අති විශේෂ ගැසට් පත්‍රයෙන් පැහැදිලි කර තිබෙනවා. එහෙත් එසේ කිරීමේදී විශාල අසාධාරණයක් සිදු වී තිබෙනවා. මෙම පඩි පාලක සභා නිවේදනය, සමුපකාර සේවක කොමිසම මගින් ක්‍රියාත්මක නොකර, සියලුම සේවකයන්ගේ සේවා වර්ෂය, පළමුවැනි වර්ෂය ලෙස සලකා වැටුප් ගෙවීමට ක්‍රියා කිරීම නිසා ඒ අන්දමට සලකා වැටුප් ගෙවීමේදී අවුරුදු විස්සක් සේවය කළ ඒ අයගේ පවා පළමුවැනි වර්ෂයේ වැටුප් ක්‍රම පිළිබඳව පමණයි, සලකා බලන්නේ. උදහරණයක් වශයෙන් කියනවා නම්, අපේ බද්දේගම සමුපකාර සමිතියේ විසි අවුරුද්දක් සේවය කර ඇති එක් සේවක මහතකුගේ සේවා වර්ෂය දෙවන වර්ෂය හැටියටයි සලකා තිබෙන්නේ, ඔහුගේ සේවා කාලසීමාව අනුව. එම නිසා අවුරුදු විස්සක් ඔහු සේවය කළත් ඔහු ලබන මූළ වැටුප රු. 840 යි. මෙන්න මේ නිසා, සමුපකාර සේවකයන් සම්බන්ධයෙන් පඩි පාලක සභාවේ යෝජනා ක්‍රියාත්මක කිරීමේදී, ගැසට් පත්‍රයේ පවා දක්වා තිබෙන්නේ, අසාධාරණ අන්දමටයි. එම නිසා, සමුපකාර සේවකයන්ගේ වැටුප් පිළිබඳව විශේෂ අවධානය යොමු කරන ලෙස ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. මන්ද ? සමුපකාර සේවකයන්ගේ වැටුප් ගැන සිතන විට, සේවකයන් අතින් යම් යම් අඩුපාඩුකම් සිදු වන්නේත්, විනය පිළිබඳ ප්‍රශ්නවලට බොහෝ දුරට හේතු වී තිබෙන්නේත් ඒ අයගේ වැටුප් තත්ත්වයන බව පැහැදිළියි.

බොහෝ අවස්ථාවලදී බඩු අඩුවීම් වාගේ තත්ත්ව ඇති වන්නේත් මේ නිසා වෙන්නට පුළුවනි. එසේ වුණාම එම රැකියාවෙන් ඉවත්ව යන්නට සිදු වුණොත් ඒ අය කොමිසමේ සහාය සොයා ගෙන යනව. මෙහිදී ඒ කොමිසම ගැනත් වචනයක් කියන්නට ඕනෑ. ඇතැම් ප්‍රදේශවල උදවිය කොමිසම පිළිබඳ ප්‍රශ්න අපට ඉදිරිපත් කරනවා. කෙසේ වුණත් සමුපකාර සේවක කොමිසම පසුගිය කාලය තුළදී, ක්‍රියාත්මකභාවය අතින්, සුළු කාර්යක්ෂමතාවක් පෙන්නුවා. එහෙත් මෙම කොමිසම ක්‍රියාත්මකවීමෙන් ලබන ප්‍රතිඵල, සේවකයන්ට වඩා සමිතිවලට වාසිදායක තත්ත්වයක් පෙන්නුම් කලා. සේවක කොමිෂන් සභා, කම්කරු උසාවි, බොහෝ විට ක්‍රියාත්මක කලේත් තෝරා ගත්තේත් ව්‍යවස්ථාපිත කලේත් සේවකයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කර දීම උදෙසායි. නමුත් එය ඉටු වී තිබෙනවාද ? එක් සේවකයකු සම්බන්ධයෙන් සමිතියකට එවූ ලිපියක "නවක සේවකයකු ලෙස බඳවා ගන්න. හිඟ වැටුප් ගෙවීමේ ප්‍රශ්නයත් පැන නොනගී." යනුවෙන් උපදෙස් දී තිබෙනවා. එය හිඟ වැටුප් ගෙවීම සම්බන්ධයෙන් පැන නැඟුණු ප්‍රශ්නයක්. එහි තඩු අංකය මා ළඟ තිබෙනවා. එම සේවකයාට ප්‍රශ්නයක් මතු වේයයි සිතන නිසා, මම ඒ ගැන කියන්නේ නැහැ. නමුත් සේවක අයිතිය පිළිබඳ පත් වූ කොමිසම, සමිතියේ නිලධාරීන් ගෙන්වා, සමහර විට සමිතියේ ලාභ තිබෙනවාද, ගෙවන්නට පුළුවන්ද, මේ ආදිය සමිතියෙන් අසා, සමිතිය ලාභදායක තත්ත්වයක තිබුණත්, සේවයන්ගේ හිඟ වැටුප් පිළිබඳ ප්‍රශ්නයේදී, එයින් කොටසක් හෝ ගෙවීමට සමිතිය එකඟ වෙන්නේ නැහැ.

බොහෝවිට සමිතිය විසින්ම යම් හේතුන් මත ඉවත් කළ සේවකයන් නැවත සේවයට පත් වුණායින් පස්සේ ඒ සේවකයන්ගේ අයිතිය පිළිබඳව නැවතත් කොමිසම මගින් සමිති ගෙන්වා ඇහීමක් අවශ්‍ය වන්නේ නැහැ. ඒ මොකද ? කොමිසම කියන්නේ ස්වාධීන ආයතනයක්. සේවකයන්ගේ අයිතිය පිළිබඳව කොමිසමට තීරණයක් ගන්න පුළුවන් විය යුතුයි. නැවතත් පැමිණිලි පක්ෂය ගෙන්වා විත්ති පක්ෂයට කොයි විධියට සලකනවාද කියා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අහනවා නම් එය සේවකයන්ගේ ස්වාධීන අයිතිකම් ලැබෙන ක්‍රමයක් නොවෙයි. පුළුවන් තරම් අඩු වැටුපක් ලබන, රජයේ අයවැය ලේඛනයෙන් සහ කම්කරු දෙපාර්තමේන්තුවේ වෘත්තීය ක්ෂේත්‍ර සඳහා වැඩි කළ වැටුප් පවා නොලබන සමුපකාර සේවකයන් සම්බන්ධ සානුකම්පිතව කටයුතු කිරීමට කාර්යක්ෂමතාව පෙන්නුම් කළ ඒ කොමිසමට උපදෙස් දිය යුතුය කියන එක මේ අවස්ථාවේ මතක් කරමින් මගේ අදහස් මෙයින් සමාප්ත කරනවා.

**ජී. එම්. ප්‍රේමචන්ද්‍ර මහතා (නියෝජ්‍ය ධීවර ඇමතිතුමා)**
**(திரு. ஜீ. எம். பிரேமசந்திர — கடற்றொழில் பிரதி அமைச்சர்)**
**(Mr. G. M. Premachandra – Deputy Minister of Fisheries)**

ගරු සභාපතිතුමනි, අද අපි ආහාර හා සමුපකාර අමාත්‍යාංශයේ වැය ශීර්ෂය පිළිබඳව සාකච්ඡා කරනවා. මේ වාගේ වැය ශීර්ෂ ගණනාවක් අපි මේ ගරු සභාවේ සාකච්ඡා කර තිබෙනවා. මේ ආහාර හා සමුපකාර අමාත්‍යාංශය යටතේ කථා කරන විට සමුපකාරය ගැන විතරක් විශේෂ සඳහනක් අපි කරන්නට ඕනෑ. මේ සමුපකාරය ගැන වාද විවාද වෙනකොට, ඇත්ත වශයෙන්ම ලංකාවේ සමුපකාරයක් තිබෙනවාද කියන එක මම අහන්නට කැමතියි. සමුපකාරය කියන්නේ දර්ශනයක් පදනම් කර ගත් ආර්ථික වැඩ පිළිවෙළක්. මිනිසුන් විසින් තමන්ගේ යහපත සඳහා ගොඩනගන ලද ව්‍යාපාරික හෝ සමාජ හෝ දේශපාලන හෝ වැඩ පිළිවෙළක්. ඒ දර්ශනය මත ලංකාවේ සමුපකාරය තිබෙනවා නම් අද මේ ගරු සභාවේ ඒ පිළිබඳව අපට සාකච්ඡා කරන්ට වෙන්නේ නැහැ. එය පාර්ලිමේන්තුවට අයිති මාතෘකාවක් නොවෙන්න පුළුවන්. අද පාර්ලිමේන්තුවේ මේ සමුපකාරය ගැන කථා කරන්නේ නිදහස් සමුපකාරය මේ රටේ නැති නිසයි.

අපේ රජය බලයට පත් වුණාට පසුව හුඟක් අමාත්‍යාංශ සංශෝධනය වුණා. අලුත් සංකල්ප ඇතුළු කළා. අළුත් වැඩපිළිවෙළවල් ඇතුළු කළා. අලුත් දේවල් ගැන හුඟක් දුරට සොයා බැලීම් කර තිබෙනවා. නමුත් සමුපකාරය තමයි මෙම 19 වන සිය වසේ අග භාගයේ ජීවත් වන්නේ. සමුපකාරයේ දර්ශනය ක්‍රියාත්මක කරනවාට වැඩියෙන් රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරන්න ඉවහල් කර ගත් ව්‍යාපාරික අවස්ථාවක් විතරයි, අද සමුපකාරය. සමුපකාර දෙපාර්තමේන්තුවය කියා එකක් තිබෙනවා. සමුපකාරය සංවර්ධනය කරනවාට වඩා සමුපකාරය පාලනය කරනවාය කියා රජයේ බලතල ජනතාව උඩට පවරන්න හදගත් අතක් විතරයි, සමුපකාර දෙපාර්තමේන්තුව.

ඇත්තම කථා කරනවා නම් ලංකාවේ සමුපකාරයක් නැහැ. මේවාගේ සමුපකාරය තිබෙන රටක් ලෝකයේ තවත් නැහැ. රජය විසින් සමුපකාර ආඥා පනත් ඇති කර ජනතාවට ඒ අයිතිය නොදී ජනතාවගෙන් අයිතිය අතට අරගත්තා වැඩ පිළිවෙළක් ලෝකයේ කොහේවත් අපි අහලා නැහැ. ලෝකයේ හුඟක් රටවල සමුපකාරය තිබෙනවා. ඒ රටවල ප්‍රජාතන්ත්‍රවාදය ජීවත් කරන්න, ජනතාවගේ අවශ්‍යතාවය සඳහා ජනතාව සකස් වෙන වැඩපිළිවෙළවල් ක්‍රියාත්මක කරන්න රාජ්‍ය අනුග්‍රහය තමය23, ලෝකයේ ඒ රටවල දී තිබෙන්නේ. අපි අද සමුපකාරය ගැන කථා කරන්නේ රජයට අයිති ව්‍යාපාර පිළිබඳව ඇති කොටසක් වශයෙන් පමණයි. ඒ නිසා මම ගරු ඇමතිතුමාට කියන්නට කැමතියි. අද මේ රටේ සමුපකාරයක් නැහැ. තිබෙන්නේ රාජ්‍ය වැඩ පිළිවෙළක් පමණයි. ඒ නිසා විවෘත ආර්ථිකය තුළ ප්‍රජාතන්ත්‍රීය සමාජය තුළ මිනිසුන්ට තිබෙන අයිතිය සම්පූර්ණයෙන්ම නිදහස් කර දී සමුපකාරය සම්පූර්ණ මිනිස් අයිතියට යටත් කරන ලෙස මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටින්න කැමතියි. මොකද, සමුපකාරයට රෙජිස්ට්‍රාර්වරයන් සිටියාම ඇති. සමුපකාරය පාලනය කරන්නට දෙපාර්තමේන්තුවක් අවශ්‍ය නැහැ.

සමුපකාරය සම්පූර්ණයෙන්ම මහජන ව්‍යාපාරයක්. මිනිසුන් විසින් මිනිසුන් සඳහා නීති ඇති කර ගන්න පුළුවන්. ව්‍යවස්ථා අපි සකස් කරන්නට ඕනෑ නැහැ. ආඥාපනත් ආණ්ඩුව සකස් කරන්නට ඕනෑ නැහැ. මහජනයාට ඒ සමුපකාරය භාර දෙන්න ඕනෑ. එහෙම භාර නොදී නැමදුම සමුපකාරය ගැන, ඒ පිළිබඳව රජයේ ප්‍රතිපත්ති ගැන මේ ගරු සභාව ඇතුළේ කථා කරනවා නම් සමුපකාරයට අපි කරන ලොකුම නින්දාව ඒකයි කියන එක මම කියන්නට කැමතියි. සමුපකාරය නමින් නොයෙක් සංවිධාන රටේ තිබෙනවා. සමුපකාර තොග වෙළඳ සංවිධානය කියායි. ඒ විධියට නොයෙක් දේවල් මේ නම පාවිච්චි කරනවා. ලෝකයේ වෙන කිසිම රටක එහෙම කරන බවක් මම දන්නේ නැහැ.

ලංකාවේ අපි මේ සමුපකාරයට වැරදි අර්ථකථනයක් දී තිබෙනවා. ඒ නිසා අපි ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුවක් හැටියට, ප්‍රජාතන්ත්‍රවාදය ජීවත් කිරීමේ වගකීම තිබෙන පිරිසක් හැටියට, ප්‍රජාතන්ත්‍රවාදී පසුබිමේ දායාදයක් හැටියට සමුපකාරය අපේ අනාගත පරපුරට දෙන්න කැමති නම් අපි සමුපකාරය රජයෙන් නිදහස් කරන්න ඕනෑ. ඉස්සර සිටි මිනිස්සු නුගත් නිසා ඩොනමෝර් කොමිසම, සෝල්බරි කොමිසම ආදී නොයෙක් කොමිෂන් දලා පාලනයට සහභාගී වෙන්න මිනිස්සු බුද්ධිමත්ද කියා සොයා බලා තමයි, අවසාන වශයෙන් සම්පූර්ණ නිදහස අපේ රටට දුන්නේ. දැන් මිනිස්සු බුද්ධිමත්ද කියා සොයා බලන්න අලුත් කොමිෂන් ඕනෑ නැහැ. අද කොම්පියුටර් යුගයට අපි ඇවිල්ලා. අද ග්‍රහලෝක තරණය කරන යුගයකට අපි ඇවිල්ලා. තාක්ෂණික වශයෙන් ලෝකයේ දියුණු සමාජ ක්‍රමයකට අපි ඇවිල්ලා. එහෙම නම් මිනිසුන්ට සමුපකාරය පාලනය කරගන්න, මිනිසුන්ට සමුපකාරය නිදහසේ භුක්ති විඳින්න අප අවසරය ලබා දෙන්න ඕනෑ. සමුපකාර සේවකයන් කියා පිරිසක්, සමුපකාර පාලකයන් කියා පිරිසක් ලෝකයේ ඇති වෙන්න හේතුවක් නැහැ. ඒ සම්පත් සියලු දෙනාටම ඒකාකාරව භුක්ති විඳින්න දිය යුතුයි කියන එකයි, සමුපකාර පිළිබඳව මා කියන්න අදහස් කළේ.

ඒ වාගේම රජයේ දෙපාර්තමේන්තු යටතේ තිබෙන තාක් කල් සමුපකාරයට හොඳක් වෙන්නේ නැහැ කියන එක මම ඔප්පු කර පෙන්වන්නම්. මේ පාලන වාර්තාවේ සමුපකාර සමිති නවයක් අතරින් අංක එකට හුඟක් දියුණු සමුපකාර සමිතියක් හැටියට හිරියාල සමුපකාර සමිතිය දක්වා තිබෙනවා. නියෝජ්‍ය සභාපතිතුමනි, මම මතක් කරන්න ඕනෑ 1983නේ හිරියාල සමුපකාර සමිතියේ සභාපති හැටියට පත් කළේ එම්. අයි. ජී. පෙරේරා කියන සමුපකාර පරීක්ෂක වරයෙක්. මේ එම්. අයි. ජී. පෙරේරා මහත්මයා මේ සමුපකාර සමිතියේ සභාපති හැටියටත්, මුතිදස කියන සමුපකාර පරීක්ෂකවරයා සාමාන්‍යාධිකාරී හැටියටත් කටයුතු කර තිබෙනවා. මේ අසු තුනේ අවුරුද්දේ ගණන් වාර්තාව හංගාගෙන ඉන්නේ ඇයි කියා අපි දැනගන්න කැමතියි. දැන් මේ එම්. අයි. ජී. පෙරේරා මහත්මයා, කුරුණෑගල මූලස්ථාන විගණන උප කොමසාරිස්. මුතිදස, කුරුණෑගල විගණන මූලස්ථාන පරීක්ෂක. මා ළඟ ගණන් වාර්තාවේ පිටපතකුත් තිබෙනවා. තරක්විම් සහ මිළ වෙනස් කිරීම් සටහන්වල ඡායාරූප පිටපතකුත් මා ළඟ තිබෙනවා. මේ ගණන් වාර්තාව පිට කරන තෙක් මුලු හිරියාල සමුපකාර සමිතියම බලාගෙන ඉන්නවා. මේ සමුපකාර නිලධාරියා යටතේ විශාල දූෂණ ගොඩාක් සිදුවී තිබෙනවා කියා ගණන් පරීක්ෂා කළ නිලධාරීන් සියලුදෙනාම ප්‍රකාශ කර තිබෙනවා. විගණන උප කොමසාරිස්ගෙන්—හිටපු සභාපතිගෙන්—හා මූලස්ථානයේ විගණන පරීක්ෂකගෙන්—හිටපු සාමාන්‍යාධිකාරීගෙන්—දැන් මේ ගැන ඇසීම හොරාගේ අම්මාගෙන් පේන අහනවා වාගේ වැඩක්. වාර්තාවට මොනවද වෙන්නේ කියා අපිට පැහැදිලිව කියන්න පුළුවන්. එය විනාශ වෙනවා. මේ උප කොමසාරිස්වරයාට දැන් සේවා දීර්ඝ කිරීමක් කර තිබෙනවා. දැන් තවත් සේවා දීර්ඝ කිරීමක් ඉල්ලා තිබෙනවා. මෙයාට ලබා දෙන්න ඕනෑ සේවා දීර්ඝ කිරීමක් නොවෙයි. මෙයා සිටින්න ඕනෑ රිමාන්ඩ් එකක් ඇතුලේ බව මම ගරු ඇමතිතුමාට කියනවා. එමනිසා මේ වාගේ නිලධාරීන්ගේ සේවා දීර්ඝ කිරීම් වහාම නවත්වා, ජනතාව අතරට මේ වාර්තාව එන්න ඉඩ දෙන්න කියා මම මතක් කරනවා.

ඒවාගේම ආහාර ගැන නම් දිගින් දිගටම කථා කරන්න ඕනෑ නැහැ. ආහාර දෙපාර්තමේන්තුවේ හිටපු කොමසාරිස්වරු හුඟ දෙනෙක් ලංකාවේ නැහැ. සමහර අය කැනඩාවේ. සමහර අය ඕස්ට්‍රේලියාවේ. සමහර අය සිංගප්පූරුවේ. ඒ කියන්නේ ලෝක වෙළඳ පොළත් සමහ සම්බන්ධ වී හුඟක් සල්ලි හම්බ කළ කථාවක් මෙහි පිටුපස තිබෙන්නේ. මේවායේ ඉතිහාසය හොඳට සොයා බලා අනාගතයට සූදානම් වෙන්න කියා මතක් කරමින් මගේ කථාව අවසාන කරනවා.

අ. භා. 2

**වෛද්‍යාචාර්ය එස්. වයි. එස්. බී. හේරත් මහතා (හිරියාල)**
**(வைத்திய கலாநிதி எஸ். வை. எஸ். பி. ஹேரத் — ஹிரியால)**
**(Dr. S. Y. S. B. Herat – Hiriyala)**

ගරු සභාපතිතුමනි, වචන ස්වල්පයක් කථා කරන්න මට ඉඩ දෙන්න කියා ඉල්ලා සිටිනවා. අපේ ගරු ධීවර නියෝජ්‍ය ඇමතිතුමා කිව්ව හැටියට මෙහෙම වාර්තාවක් ඉදිරිපත් වී තිබෙනවා. ඒ සම්බන්ධව අපේ ගරු ආහාර හා සමුපකාර ඇමතිතුමා විශේෂ පරීක්ෂණයක් කර සුදුස්සාට සුදුසු තැන දී, අයුතු වැඩ කළ අයට නිසි දඬුවම් දෙන මෙන් මා ඉල්ලා සිටින්න සතුටුයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ජී. එම්. ප්‍රේමචන්ද්‍ර මහතා**
**(திரு. ஜீ. எம். பிரேமசந்திர)**
**(Mr. G. M. Premachandra)**
ඒ සුදුස්සා කියන්නේ කවුද ?

**වෛද්‍යාචාර්ය එස්. වයි. එස්. බී. හේරත් මහතා**
**(வைத்திய கலாநிதி எஸ். வை. எஸ். பி. ஹேரத்)**
**(Dr. S. Y. S. B. Herat)**
ඒ වාර්තාවෙන් පසුව කියයි.

**සරත්චන්ද්‍ර රාජකරුණා මහතා**
**(திரு. சரத்சந்திர ராஜகருணா)**
**(Mr. Sarathchandra Rajakaruna)**
ගරු සභාපතිතුමනි, ආහාර හා සමුපකාර අමාත්‍යාංශය යටතේ පැවැත්වෙන මේ විවාදයේදී වචන ස්වල්පයක් කථා කරන්නට අවස්ථාව සලසාදීම ගැන මම ස්තුතිවන්ත වෙනවා.

මට කථා කරන්න අවස්ථාව ලැබුණේ මගේ කල්‍යාණ මිත්‍ර මාවතගම ගරු මන්ත්‍රීතුමාගේ කථාවෙන් පසුවයි. එතුමා, එතුමාට අතීතය සහ අනාගතය පැටලී අතීතය වෙනුවෙන් කිවයුතු දේ අනාගතය වෙනුවෙන් ආවිච්චි කළේ වැරදීමකින් වෙන්න ඇති කියා මට හිතෙනවා. සමුපකාර ව්‍යාපාරයේ අතීතයේදී එවැනි තත්ත්වයක් තිබුණ බව අප හැමෝම දන්නවා. විශේෂයෙන් එවැනි තත්ත්වයක් තිබුණ විත්තිය හෘදය සාක්ෂියට එකඟව කල්පනා කර බැලුවොත් අප හැම කෙනෙකුටම වැටහේවි. සමුපකාර ව්‍යාපාරය ඊට අනුකූලව කටයුතු නොකළ අවස්ථා ඇති වුණේ කොයි කාලයේදීද කියන එකත් එවිට පැහැදිලි වේවි.

මෙම සමුපකාර ව්‍යාපාරය ඉතාමත් පුළුල් ව්‍යාපාරයක්. ඒ වාගේම ආහාර හා සමුපකාර අමාත්‍යාංශය අපේ රටේ තිබෙන අමාත්‍යාංශවලින් ඉතාමත් වැදගත් ඉතාමත් වගකීමක් ඇති ඒ වාගේම සාමාන්‍ය ජනතාවට කිට්ටු සම්බන්ධකම් තිබෙන අමාත්‍යාංශයක්. මේ අමාත්‍යාංශයේ කටයුතු කොයි තරම් හොඳට කළත් කථා කරන්න ඕනෑ කෙනෙකුට කථා කරන්න පුළුවන්. කබරගොයා තල ගොයා හැටියට හඳුන්වා කතන්න ඕනෑ කෙනෙකුට එහෙම කරන්නත් ඒවාගේම තලගොයා කබරගොයා කරන්න පුළුවන්. ඒ නිසා මේ ගරු සභාවේ මන්ත්‍රීවරුන් වශයෙන් කථා කරන විට සෑම අවස්ථාවකදීම කල්පනාවකින් කථා කරන්න ඕනෑ. ඉදිරියේදී අපටත් සමහර විට මේ විධියේ වැදගත් කථාවක් කරන්න අවස්ථාවක් එළඹේවි. ඒ නිසා අපි වගකීමක් ඇතිව කථා කරන්න ඕනෑය කියා හැම කෙනෙක්ම වග බලාගැනීම වැදගත්ය කියන එක මම ප්‍රකාශ කරන්න ඕනෑ.

විශේෂයෙන්ම විරුද්ධ පක්ෂයේ ගරු මන්ත්‍රීවරුන්. ඒ වාගේම ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් ඉතාම වැදගත් අදහස් ප්‍රකාශ කළා. ඒ විවේචනාත්මක අදහස්වල හොඳ නරක දෙකම ගැන මගේ ගරු ඇමතිතුමාත් මමත් කල්පනා කර ඒ කටයුතු ඉදිරියට ගෙන යාමට අප බලාපොරොත්තු වන විත්තිය මේ අවස්ථාවේදී මම ප්‍රකාශ කරන්න ඕනෑ.

අද විශේෂයෙන් මතක් කළ යුත්තක් නම් මෙම වැය ශීර්ෂ සම්බන්ධයෙන් කථා කරන ලද මන්ත්‍රීවරුන්ගේ කථාවල වෙනදාට වඩා විවේචනාත්මක ස්වරූපය අඩු වූ විත්තිය අප හැම කෙනෙක්ම කල්පනා කරන්නට ඕනෑ. ඊකට හේතුව මම හිතන්නෙ මෙම දෙපාර්තමේන්තු අංශ දෙකේම යම්කිසි දියුණුවක් ඇති වී තිබෙනවාය කියා ගරු මන්ත්‍රීවරුන් තුළ විශ්වාසයක් ඇති වී තිබෙනවාය කියන එකයි.

මම විශේෂයෙන් විස්තර කරගෙන ආවේ මහජනයාට කිට්ටු සම්බන්ධකමක් තිබෙන්නේ අපේ අමාත්‍යාංශයේ සමුපකාර ව්‍යාපාරයේ බවයි. මගේ ගරු ඇමතිතුමා මගේ අමාත්‍යාංශයට පත් වුණේ 1983 දීයි. එතුමා පත් වූ අවස්ථාවේදී මෙම ව්‍යාපාරය සියයට 34ක ලාභයක් ලබමිනුයි, පවත්වාගෙන ගියේ. එනම් සමිති 295 කින් 116ක් ලාබ ඇතිව ගෙන ගියා. 1984 වන විට සියට 48 දක්වා එහි දියුණු තත්ත්වයක් ඇති වුණා. එනම් සමිති 139 ක් ලාභ ඇතිව දියුණු තත්ත්වයකින් ඉදිරියට යන අවස්ථාවට පත් වුණා.

තමුන්නාන්සේලාට මම මේ කරන කථාව දේශපාලන කථාවක් නොවෙයි විගණකාධිපති වාර්තාව අනුව කරන කථාවක්. එමනිසා හැම කෙනෙක්ම පිළිගන්න ඕනෑ, මේ කථාව, සත්‍ය ගණන් පරීක්ෂණ වාර්තාවක් අනුව කරන කථාවක් බව. 1985 වන විට, ඒ කියන්නේ මේ අවුරුද්දේ සියයට 55කට වැඩි සමිති ප්‍රමාණයක් ශුද්ධ ලාභයක් ඇතිව ගෙන යන්නට හැකි වන විත්තිය මේ අවස්ථාවේදී මේ ගරු සභාවට මතක් කරන්න ඕනෑ.

තමුන්නාන්සේලා දන්නවා, තමුන්නාන්සේලාගේ කථාවලින්ම කියවුණා, 1977ට පෙර මේ ව්‍යාපාරය, සමුපකාර සමිති වශයෙන් නොවෙයි, සමුපකාර දෙපාර්තමේන්තුවක් හැටියටයි පාලනය වුණේ කියා. එහෙම නම් ඒ කාල සීමාවේදී තිබුණු අඩුපාඩුකම්, දුර්වලකම්, පැය 24න් සිංහල භාෂාව රජයේ භාෂාව කළා වාගේ සම්පූර්ණ කරන්න බැරි බව මේ ගරු මන්ත්‍රීවරු පිළිගන්නවා ඇති. මේ ව්‍යාපාරය යම්කිසි තත්ත්වයකට ගෙන එන්න සෑහෙන කාලයක් යනවා. මෙහි අඩුපාඩුකම් රාශියක් තිබුණා. තමුන්නාන්සේලා දන්නවා, මේ යුගයේදී, නිදහස් ආර්ථිකය තුළ මේ ව්‍යාපාරය ඉතාමත්ම අමාරුවෙන් තමයි ඉදිරියට ගෙන යන්නට තිබෙන්නේ. ඒ නිදහස් ආර්ථිකය තුළ මේ ව්‍යාපාරය දියත් කරන්නට අපේ සමුපකාර සමිතිවල සේවක මහත්වරු, නිලධාරී මහත්වරු සූදානමින් සිටියේ නැහැ.

අපේ දෙපාර්තමේන්තුවට මේ සමුපකාර සමිතිවල තත්ත්වය දියුණු කරන්නට පසුගිය අවුරුදු කිහිපය තුළ සෑහෙන වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරන්න සිදු වුණා. ඒ අනුව අපට සිදු වුණා, අපේ සමුපකාර සමිතිවල සිටින සේවක මහත්වරුන්ට, නිලධාරී මහත්වරුන්ට යම්කිසි පුහුණුවක් ලබා දෙන්නට. එම දියුණුව අපි ඉස්සෙල්ල ලබා දුන්නේ පොල්ගොල්ලෙ සමුපකාර අභ්‍යාස විද්‍යාලයෙන් පමණයි. දැන් එම පුහුණුව ජාතික සමුපකාර මණ්ඩලය මඟිනුත් දෙනවා. මේ මණ්ඩලය තුළ තිබෙන කුරුණෑගල ශාඛාවෙන් හා ගාල්ල ශාඛාවෙනුත් ඒ අවශ්‍ය පුහුණුව අපි ලබා දෙනවා. ඒ අනුව අපි සෑම කෙනෙකුටම පුහුණුවක් ලබා දෙනවා. එද පොල්ගොල්ල සමුපකාර අභ්‍යාස විද්‍යාලයෙන් පුහුණුවක් ලබා දුන්නේ බොහොම කලාතුරකින්. නමුත් දැන් පොල්ගොල්ල සමුපකාර අභ්‍යාස විද්‍යාලයේ සෑම දිනකම පුහුණු පාඨමාලා පැවැත්වෙන බව මා සංතෝෂයෙන් ප්‍රකාශ කරන්න කැමතියි. දවස් 365ම පොල්ගොල්ල සමුපකාර අභ්‍යාස විද්‍යාලයේ පුහුණු පාඨමාලා පවත්වනවා. කොටින්ම කියනවා නම්, පොල්ගොල්ල අභ්‍යාස විද්‍යාලයේ කුස්සියේ ලිප හැමදම මෙලවෙන බව මා සංතෝෂයෙන් ප්‍රකාශ කරන්න කැමතියි. මේ විධියට අපට සිදු වුණා පුහුණු පාඨමාලා ලබා දී, මේ නිදහස් ආර්ථික සටන සමග ඉදිරියට යන්නට.

මා හිතන්නේ මේ ස්ථානයේ දැන් අපේ කළුතර දිසා ඇමතිතුමාත් ඇති. අපි ඒ ලබා දුන් පුහුණුව නිසා අපට දැන් සෑහෙන ප්‍රතිඵල ලැබී තිබෙනවා. උදාහරණයක් වශයෙන් හොරණ සමුපකාර සමිතිය ගනිමු. 1984 වනවිට ඒ සමුපකාර සමිතියේ තිබුණු වෙළඳාම රුපියල් ලක්ෂ 15යි. රුපියල් ලක්ෂ 15ක වෙළඳාමක් තිබෙනවට ඒ සමිතියේ මාසයකට ශුද්ධ පාඩුව රුපියල් 20,000යි. රුපියල් ලක්ෂ 15ක වෙළඳාමක් කරනවිට රුපියල් 20,000ක ශුද්ධ පාඩුවක් මාසයකට තිබුණා. නමුත් මේ අළුත් වැඩපිළිවෙළ ක්‍රියාත්මක කළායින් පසුව 1985 වනවිට ඒ සමිතියේ වෙළඳාම රුපියල් ලක්ෂ 32ක් දක්වා වැඩි වුණා ගරු සභාපතිතුමනි. වෙළඳාම රුපියල් ලක්ෂ 32 දක්වා වැඩි වූ අතර, ශුද්ධ ලාභය මාසයකට රුපියල් 40,000 දක්වා වැඩි වුණා. ගරු සභාපතිතුමනි, අපට නොයෙක් විධියට කථා කරන්න පුළුවන්. නමුත් යමක් ක්‍රියාත්මක කරන විට අපට එය ක්‍රියාත්මක කරන්න සිදුවන්නේ ක්‍රමානුකූලවයි. මම මේ කිව්වෙ එක සමිතියක් ගැන පමණක් ඇති වූ වෙනසයි. ඒ විධියට දියුණු කළ තව එක සමිතියක් ගැන කියන්නම්.

වීරගොඩ සමුකාර සමිතියක් මේ විධියට දියුණු කළා. ඒ සමිතියේ මාසයකට වෙළඳාම තිබුණේ රුපියල් ලක්ෂ 4 යි. රුපියල් ලක්ෂ 4ක් වෙළඳම් කරනවිට රුපියල් 40,000ක් මාසයකට පාඩු වුණා. අපේ අලුත් වැඩ පිළිවෙළ අනුව 1985 වනවිට වෙළෙඳාම වැඩි කළා, රුපියල් දසලක්සයකින්. ඒ අනුව මාසයකට ශුද්ධ ලාභය ආවා, රු. 80,000ක්. මම හිතන්නේ ගරු සභාපතිතුමාට මේවා එකින් – එක විස්තර කරන්න අවශ්‍ය නැහැ. එතුමා දන්නවා. එතුමාගේ මැතිවරණ කොට්ඨාශයේ සමිතිය එද තිබුණු තත්ත්වයත්, අද ඒ සමිතිය කොයි තත්ත්වයෙන් පවතිනවාද කියාත්. ඒ වාගේම දෙයක් තමයි, කලවාන මැතිවරණ කොට්ඨාශය ගත්තත්,අක්මීමන මැතිවරණ කොට්ඨාශය ගත්තත්, අපට කියන්න පුළුවන්කම තිබෙන්නේ. ඒ ගරු මන්ත්‍රීතුමන්ලා දෙදෙනාම ප්‍රකාශ කළා. එතුමන්ලාගේ සමිතිවල අද තත්ත්වය මොකක්ද කියා. ඒ නිසා අපි තේරුම් ගන්න ඕනෑ. මේ වාගේ වැඩ පිළිවෙළක් දියත් කොට යම් – යම් ප්‍රශ්නවලට මුහුණ දී සටන් කොට එයින් ජයග්‍රහණය ලබන්න සෑහෙන කාලයක් යන බව.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සමුපකාර ව්‍යාපාරය දියුණු කිරීමේදී ඒ ප්‍රශ්නයට පමණක් නොවෙයි, අපට මුහුණ පාන්න තිබෙන්නේ. තමුන්නාන්සේලා දන්නවා ඇති, බී. ටී. ටී. ගෙවන්නත් සමුපකාර සමිතිවලට සිදු වී තිබෙන බව. සමුපකාර සමිති මිල දී ගන්නා සෑම බඩුවක් සම්බන්ධයෙන්මත්, විකුණන සෑම බඩුවක් සම්බන්ධයෙන්මත් බිල් පත් භාවිතා කරනවා. නමුත් සමුපකාරයට අල්ලපු කඩේ පෞද්ගලික මුදලාලි වැඩිපුර බඩු ගන්නේත්, විකුණන්නේත් බිල් පත් නැතිවයි. ඒ තත්ත්වය අනුව සිදු වී තිබෙන්නේ මොකක්ද ? සමුපකාරය බී. ටී. ටී. ගෙවන අතර අල්ලපු කඩේ බී. ටී. ටී. නොගෙවන තත්ත්වයක් තමයි, අද ඇති වී තිබෙන්නේ. එහෙම නම් අපට — සමුපකාර සමිතිවලට — මෙහිදී ලොකු සටනක් කරන්න සිදු වී තිබෙන බව කාටත් පැහැදිලි වෙනවා. ඇති. බී. ටී. ටී. ගෙවන්නේ නැති නිසා පෞද්ගලික කඩේ මුදලාලිට පුළුවන්කම තිබෙනවා අඩු මිලට බඩු විකුණන්න. නමුත් බී. ටී. ටී. ගෙවන්න සිදු වී තිබෙන නිසා සමහර අවස්ථාවලදී සමුපකාරයට සිද්ධ වෙනවා, පෞද්ගලික කඩේට වඩා වැඩි මිලකට බඩු විකුණන්න.

අ. භා. 2.15

නමුත් මේ අවස්ථාවේදී මම තවත් දෙයක් සන්තෝෂයෙන් ප්‍රකාශ කරන්න ඕනෑ. අපේ අලුත් වැඩ පිළිවෙළ අනුව සමුපකාර ව්‍යාපාරය අද කොයි තරම් දියුණු වී තිබෙනවාද කීවොත් අද පෞද්ගලික අංශයට වඩා සෑහෙන අඩු මිලකට බඩු විකුණන්න සමුපකාර සමිති උත්සාහ කර තිබෙනවා. මම අද උදෑසන මේ ගරු සභාවට ආ අවස්ථාවේදී නියෝජ්‍ය කම්කරු ඇමතිතුමා කීවා, " අපේ සමුපකාරය ලංකාවේ අනෙක් තැන්වලට වඩා සත 50 ක් අඩුවෙන් සීනි විකුණනවා ; අපි ඒ මුදල තොග වෙළෙඳාමෙන් අල්ලා ගන්නවා " කියා. ඒ විධියට අපේ සමුපකාර ව්‍යාපාරය දැන් පෞද්ගලික අංශයත් සමඟ මොන තරම් තරග වැදී තිබෙනවාද කීවොත්, පෞද්ගලික අංශය වගේම ප්‍රචාරක " පෝස්ටර් " පවා ගහලා තිබෙනවා. සමුපකාරයෙනුත් දැන් නොයෙකුත් තරග ඇති කර තිබෙනවා. වැඩියෙන් බඩු ගන්නා මිනිහාට තෑගි, නොයෙකුත් සහන රැසක්. අනෙක් අතින් පෞද්ගලික අංශයට වඩා සත පහක් — දහයක්වත් අඩුවෙන් බඩු විකුණනවා. අර " අවුරුදු සේල් " වගේ අපේ සමුපකාර අංශයත් දැන් නොයෙකුත් ප්‍රචාරක කටයුතු කරනවා.

මම උදාහරණයක් වශයෙන් යටියන්තොට මැතිවරණ කොට්ඨාශයේ බුලත්කොහුපිටිය සමුපකාර සමිතිය ගෙන හැර දක්වන්න කැමැතියි. ඒ අය ලාබෙට බඩු දෙන බවට දැන්වීමක් ප්‍රසිද්ධ කර තිබෙනවා. අද වෙනත් සෑම තැනකම පිටරට කැකුළු හාල් විකුණන්නේ රු. 7.40 ටයි. ඒක තමයි නියම මිල. නමුත් ඒ සමිතිය දැන්වීමක් ප්‍රසිද්ධ කර තිබෙනවා. තමන් පිටරට කැකුළු හාල් 7.20 — සත 20 ක් අඩුවෙන් — දෙනවාය කියා. අනෙක් හැම තැනම මෙරට කැකුළු හාල් විකුණන්නේ රු. 6.75 ටයි. ඒක තමයි, නියම මිල. නමුත් ඒ සමුපකාර සමිතිය ඒවා විකුණන්නේ රු.6.70 ටයි. රු. 14ට විකුණන්න තිබෙන සීනි ඒ අය විකුණනවා, රු. 13.70 ට. මේ විධියට සමුපකාර ව්‍යාපාරය තුළ විශාල වෙනසක් මේ කාල සීමාව තුළදී ඇති වී තිබෙන බව සන්තෝෂයෙන් ප්‍රකාශ කරන්න ඕනෑ.

එපමණක් නොවෙයි. මගේ ගරු ඇමතිතුමාගේ ඉල්ලීම පරිදි ගරු මුදල් ඇමතිතුමා අවුරුදු 3ක් ඇතුලතදී ආධාර මුදලක් වශයෙන් අපට රුපියල් කෝටි 100ක් දුන්නා, මේ සමුපකාර ව්‍යාපාරය දියුණු කර ගන්න.

අපේ සමාජ සේවා නියෝජ්‍ය ඇමතිතුමා ඇහුවා : සමුපකාර කොමසාරිස්තුමාගේ වාර්තාව අනුව 1984 වර්ෂයේ සමිති 11කට පමණක් ආධාර දී තිබෙන්නේ ඇයි, 1985 වර්ෂයේ සමිති 54 කට පමණක් ආධාර දී තිබෙන්නේ ඇයි, මේ තරම් සමිති තිබියදී අනික් සමිතිවලට ආධාර නොදෙන්නේ ඇයි කියා. අපේ ගරු නියෝජ්‍ය ඇමතිතුමාට මම මේ අවස්ථාවේදී කියන්නට කැමතියි, අපි මේ මුදල් දෙන විට ටිකක් කල්පනාකාරීව දෙන්නට ඕනෑය කියා. තුවාලයකට බෙහෙත් දමන විට තුවාලය හොඳට ශුද්ධ කරලයි බෙහෙත් දමන්නට ඕනෑ. එසේ නැතිව තුවාලයේ උඩට බෙහෙත් දැම්මොත් ඒ බෙහෙත් තුවාලයට අල්ලන්නේ නැහැ. සමහරවිට පල්මානික්කම් පොඩ්ඩකින් කපා ශුද්ධ කරන්නටත් වෙනවා.

**සභාපතිතුමා**
**(தவிசாளர்)**
**(The Chairman)**

නියෝජ්‍ය ඇමතිතුමා තව කොපමණ වේලාවක් ගන්නට බලාපොරොත්තු වෙනවාද ?

**සරත්චන්ද්‍ර රාජකරුණා මහතා**
**(திரு. சரத்சந்திர ராஜகருணா)**
**(Mr. Sarathchandra Rajakaruna)**

තවත් පැය 1/2 ක් පමණ.

**සභාපතිතුමා**
**(தவிசாளர்)**
**(The Chairman)**

තව දෙතුන් දෙනෙක් කථා කරන්නට සිටිනවා.

**සරත්චන්ද්‍ර රාජකරුණා මහතා**
**(திரு. சரத்சந்திர ராஜகருணா)**
**(Mr. Sarathchandra Rajakaruna)**

හොඳයි මම තව මිනිත්තු 10 කින් ඉවර කරන්නම්.

ගරු සභාපතිතුමනි, මම කිව්වා තුවාලයකට බෙහෙත් දමන විට තුවාලය ටිකක් පිරිසිදු කරලයි, බෙහෙත් දමන්නට ඕනෑ කියා. ශුද්ධ නොකර නිකම් දැම්මොත් වැඩක් වෙන්නේ නැහැ. බෙහෙත් ටික අපතේ යනවා. සමහරවිට පල්මානික්කම් කැල්ලකින් කපා තුවාලය ශුද්ධ කරලයි, බෙහෙත් දමන්නට වෙන්නේ. ඒ වගේ මේවායේ සිටින හොරු පන්නා දමා සමිතිවල තිබෙන අඩුපාඩු හා දූෂණ නැති නොකර රජයෙන් ලැබෙන මුදලක්ය කියා මෙය දෙන්නට ගියොත් වැඩක් වෙන්නේ නැහැ.

**ජේ. එල්. සිරිසේන මහතා**
**(திரு. ஜே. எல். சிறிசேன)**
**(Mr. J. L. Sirisena)**

මම ඇසුවේ එය දෙන පදනම මොකක්ද කියන එකයි.

**සරත්චන්ද්‍ර රාජකරුණා මහතා**
**(திரு. சரத்சந்திர ராஜகருணா)**
**(Mr. Sarathchandra Rajakaruna)**

පදනම තමයි, එය ශුද්ධ පවිත්‍ර කර දීම. හැම කෙනකුටම දෙනවා. මෙහි ගරු ඇමතිතුමාටවත් මටවත් කියා විශේෂ බලපෑමක් නැහැ. මගේ මැතිවරණ කොට්ඨාශයේ සමිති දෙකක් තිබෙනවා. අදත් ඒ සමිති දෙකට ඒ ආධාර මුදල් ලැබී නැහැ. ඒ සමිතිවල තිබෙන අඩුපාඩු හදාගන්නා තුරු ඒ මුදල් දීම අපි නවත්වා තිබෙනවා. ඒ නිසා එය සාධාරණව ඉටු වන බව මම විශේෂයෙන් මේ අවස්ථාවේදී මතක් කරන්ට ඕනෑ. මේ මුදල දීම ගැන මම ගරු මුදල් ඇමතිතුමාටත් මේ අවස්ථාවේදී ස්තුතිවන්ත වෙනවා.

සේවක මහත්වරු උනන්දු කිරීමට අපි නොයෙක් වැඩ පිළිවෙළවල් ඇතිකර තිබෙනවා. සේවකයින් උනන්දු නොකර අපට මේ ව්‍යාපාරය දියුණු කරන්න බැරි බව තමුන්නාන්සේ දන්නවා. අපේ කලවානේ ගරු මන්ත්‍රීතුමා (සරත් මුත්තෙට්ටුවේගම මහතා) බොහොම කණගාටුවෙන් සේවක මහත්වරුන් වෙනුවෙන් හා සමුපකාර සමිති ව්‍යාපාරය වෙනුවෙන් කථා කළා. මේ සභාවේදී කඳුළු හෙලුවේ නැති එක පමණයි. පුදුම ආදරයක් ඇතිවයි සමිති ගැන කථා කළේ. මට මතක් වෙනවා, අපි ඉස්කෝලෙ යන පොඩි කාලයේ තත්ත්වය ගැන. අපේ ඉස්කෝලවල සිටි සමහර පොඩි නංගිලා මල්ලිලාත් ඔය වගේ බොරු පොරොන්දු දෙනවා. ඒ අය තරුණ කාලයේ සමහර ගැහැණු ළමයින් හමුවූ විට බොරු ආදරයක් දක්වන බව මම නොකීවාට තමුන්නාන්සේලා දන්නවා. නොයෙකුත් බොරු පොරොන්දු දෙනවා, " හරි සුදෝ කොහොමද " ආදී වශයෙන් නොයෙක් දේවල් කිය කියා. ඒ කාලයේ කළ දේවල් මතක ඇති නෙ. ඒ විධියටයි, කලවානේ ගරු මන්ත්‍රීතුමාත් මේ අවස්ථාවේ කථා කළේ. ඒ දැක්වූයේ බොරු ආදරයක්. නමුත් මම කලවානේ ගරු මන්ත්‍රීතුමාට කියන්න කැමතියි, ආදරය කරන හැටි අපි හොඳට දන්නවාය කියා. අපි ඒ විධියට ආදරය කරලත් තිබෙනවා. ඒ නිසා කලවානේ ගරු මන්ත්‍රීතුමාට කියන්න කැමතියි, ආදරය කරන හැටි ඕනෑ නම් ඇවිත් අපෙන් අසා ගන්නය කියා. බොරුවට කිඹුල් කඳුළු හෙලනවා.

**දිනේෂ් ගුණවර්ධන මහතා**
**(திரு. தினேஷ் குணவர்த்தன)**
**(Mr. Dinesh Gunawardene)**

දොම්පෙ ආයට ආදරය කරනවා වගේ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සමූපකාර අතරින් බණ්ඩාරවෙල සමූපකාර සමිතිය ප්‍රතිසංවිධානය කිරීමෙන් පසුව අද ඉතාමත්ම මහත්සියෙන් ඒ සේවක මහත්වරු, අධ්‍යක්ෂ මහත්වරු බදුලු දිස්ත්‍රික්කයේ උප කොමසාරිස් මහත්වරු, මහා කොමසාරිස්තුමා අදින් අපට සහයෝගය දෙන බව. පසුගිය කාලයේ ඉතාමත්ම සුළුවෙන් තිබුණු සමූපකාර ව්‍යාපාරය අද උසස් අන්දමින් පවත්වාගෙන යන්නට අපට අවස්ථාව ලැබී තිබෙනවා.

පසුගිය කාලයේ ඒ සමූපකාර සමිතිවලට විශේෂයෙන් තේරුණු අධ්‍යක්ෂ මණ්ඩල අතුරෙන් ඒ මහ සභාවේ අනුමැතිය ඇතිව සභාපතිවරයෙක් තෝරා ගන්නට අපට අවස්ථාව ලැබුණා. එතුමා අවුරුදු ගණනාවක් ඒ කටයුතු කර ගෙන ගියා. ඒ කාලය තුළදී සමූපකාරය දියුණු කිරීමට ඒ සභාපතිතුමාත්, අධ්‍යක්ෂ මණ්ඩලයත් සියලුම නිලධාරීන් හා සේවක මහතුනුත් සැහෙන්න උනන්දුවක් දක්වා කටයුතු කළා. එනිසා අපට පුළුවන්කම ලැබුණා 1977 වන විට අපේ සමූපකාරයේ සිටි සේවකයින් සංඛ්‍යාව 225 සිට 412 දක්වා වැඩි කරගන්න. දැන් අවුරුද්දකට රුපියල් දොළොස් කෝටියක පමණ වෙළඳාමක් කිරීමටත්, ඒ වාගේම 1981 වර්ෂය තුළ රුපියල් තුන් ලක්ෂයකට වැඩි ශුද්ධ ලාභයක් ලබාගන්නටත් අපට පුළුවන් වුණා. ඒ වාගේම සේවකයින් අතර, 1980/81 කාලය වෙනුවෙන් රුපියල් 57,000ක බෝනස් මුදලක් බෙද දෙන්නත් අපට පුළුවන්කම ලැබුණා. පසුගිය කාලය තුළ ඒ තරම් උනන්දුවෙන් වැඩ කටයුතු කළ අපේ සාමාජිකයින්ට බෝනස් ලබා දීමට අපි බලාපොරොත්තු වෙනවා.

1981–82 කාලයට රු. 45,000කුත්, 1982–83 කාලයට රු. 95,000කුත් බෝනස් වශයෙන් දෙන්නට අපි බලාපොරොත්තු වෙනවා. ඒ සඳහා අපි දෙපාර්තමේන්තුවෙන් අවසර ඉල්ලා තිබෙනවා. ඇත්තවශයෙන්ම ඒ වගේ උනන්දුවෙන් සමූපකාර සමිතිවල යහපතට කටයුතු කරන අයගේ දියුණුවට අපි කටයුතු කරන්න ඕනෑ. පසුගිය කාලයේදී අධ්‍යක්ෂ මණ්ඩලය වෙනස් කළාට පසුව මහ කොමසාරිස්තුමාගේත් උප කොමසාරිස්තුමාගේත් අනුදැනුම ඇතිව දැන් අලුත් අධ්‍යක්ෂ මණ්ඩලයක් පත් කර තිබෙනවා. අපේ උප දිසාපතිතුමාත්, සමූපකාර දෙපාර්තමේන්තුවේ නිලධාරී මහත්මයෙකුත් ඒ වගේම වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ගණකාධිකාරී මහත්මයෙකුත් ඒ අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කර තිබෙනවා. පසුගිය කාලය තුළදී කරගෙන ආවා වගේම ඉදිරි කාලය තුළදීත් අපේ සමූපකාර ව්‍යාපාරය දියුණු කිරීමට විශාල වෙහෙස මහත්සියක් දරමින් කටයුතු කරාවිය කියා අපි බලාපොරොත්තු වෙනවා.

අවසාන වශයෙන් සමූපකාර ව්‍යාපාරය දියුණු කිරීමට කටයුතු කළ අපේ සමූපකාර සමිතියේ සියලුම නිලධාරී මහත්වරුන්ටත්, ගරු ඇමතිතුමාටත්, නියෝජ්‍ය ඇමතිතුමාටත්, විශේෂයෙන්ම සමූපකාර දෙපාර්තමේන්තුවේ කොමසාරිස්තුමා ඇතුළු සියලුම දෙනාටත්, බදුල්ලේ උප කොමසාරිස්තුමාටත්, විශේෂයෙන්ම අපේ දිසාපතිතුමාටත්, බැංකුවලින් ණය ලබා දෙන්නට කටයුතු කළ සියලුම දෙනාටත්, බණ්ඩාරවෙල සමූපකාර සමිතිය දියුණු කිරීමට අවස්ථාව ලබා දුන්න සියලු දෙනාටත් ස්තුතිවන්ත වෙමින්, අපේ රටේ සමූපකාර ව්‍යාපාරය තව තවත් දියුණු වේවා කියා ප්‍රාර්ථනා කරමින් මගේ කථාව අවසන් කරනවා.

**ගාමිනී ජයසූරිය මහතා**
**(திரு. காமினி ஜயசூரிய)**
**(Mr. Gamini Jayasuriya)**

I must thank my Deputy Minister not only for the co-operation he has extended to me during the past year but also for the very clever manner in which he has dealt with most of the questions raised by the hon. Members this morning and this afternoon. He has covered a very large extent of the co-operative movement. Therefore, I am left with just a matters that need clarification or further explanation.

The hon. Member for Bingiriya mentioned about Markfed which he found was not doing a satisfactory job of work. I would like to tell the hon. Member and the Deputy Minister that last year I re-constituted the Markfed Board because I myself found a lot of weaknesses in the earlier Board. The accounts had not been finalized even up to 1979. And I am happy to say that within a period of one year the accounts for 1979 have been finalized and passed by the General Body. The General Body has not met for a long time and they met recently and even passed the accounts for 1979. The accounts for 1980 to 1982 have been audited and sent to the Commissioner of Co-operative Development. The 1983 accounts will be finalized by the end of this month. The 1984 and 1985 accounts will be completed before the end of next year. The 1984 profits are expected to be around Rs. 2 million. The 1985 profits will be a little less due to the break down of activities due to the situation in the North and the East. I have appointed Members with considerable experience in management, accounts and marketing to the Board and I have felt that before long they will do a satisfactory job in the marketing of vegetables and so forth. That would also benefit our farmers.

I must the hon. Members for they have spoken with sincerity and I am grateful to them for the encouraging words that they have expressed towards me and the co-operative movement.

Now, Sir, I would like to say something about our rice requirements for 1986 because there was a lot of talk today about the prising of rice, flour and sugar and so on.

The National paddy production in Sri Lanka is estimated to be about 136 million bushels in 1986, as compared with 126.1 million bushels in 1985. Unforeseen weather conditions and disturbed internal security situation in several paddy producing districts may have adverse effects on the realization of the estimates. That is possible. However, based on the achievement of 1985, domestic paddy production would hopefully be in the range of 126 million bushels in 1986, yielding approximately 1.62 million tonnes of milled rice after making an allowances for seed and waste etc. The waste goes up to about 10 to 12 per cent. The National production during the last 10 years reveals an impressive growth of 129 per cent from 56 million bushels in 1975 to 126 million bushels in 1985.

The per-capita consumption of rice reveals an increase of 17 kilogrammes per annum i.e., 86.4 kg. per capita per annum in 1973 to 103 kg. per capita per annum in 1985 (estimates). The wheat flour consumption however reveals a drop of 7 kgs. per capita per annum i.e., from 17.6 kg. in 1973 to 10.6 kg. in 1982. The source is the Central Bank Statistics Department. The National consumption of rice in 1986 on the above basis is estimated to be 1.6 million tonnes. Mathematically therefore, the country has already reached the state of self-sufficiency. However, one has to make a reasonable allowance for the distribution, conversion and stock-holding factors involved in the

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගාමිණී ජයසූරිය මහතා]

paddy/rice trade, which will result in a substantial quantity, getting distributed in the marketing system at any one time. It is usual in the rice sector to hold a strategic buffer in storage to meet any unforeseen situations that may arise. Therefore, taking all factors into consideration, the country needs to bridge the gap between the domestic production and the absolute and safe comsumption needs. The present disturbed state of internal security makes the need for the building up of a safe buffer even more obvious.

Under the present free trade policies state marketing channels the Food Commsioner's Department and the PMB, cater to the supply of only 13 per cent of the total rice requirements of the nation. The balance is made up of farmer consumption from their own produce and distribution through open-market channels. A very dynamic and vibrant free trade in rice has evolved as a consequence. With the result the intake of paddy by the Paddy Marketing Board has been reduced. The PMB's role at present is one of administering the Guranteed Price Scheme. Although the share in the market enjoyed by the private sector has increased rapidly, there is a need for a Government agency to monitor the price and to facilitate farmers to market their produce at an equitable price. Therefore the PMB's present role is ensuring the farmers the guaranteed price fixed by the Government and operating as a purchaser of the last resort. The reason for the low intake of paddy by the Paddy Marketing Board is the comparatively higher price offered by the private sector during a greater part of the year. At the height of the paddy harvesting season however the paddy prices drop and farmers take refuge in the Paddy Marketing Board. Although during the past few years, open-market price trends revealed comparatively higher levels than the guaranteed price, with the expansion of production, a plateau will be reached at some time or other. At that stage the farmer welfare needs to be ensured by facilitating them with a reasonable price and dependable marketing opportunities. Therefore, the Paddy Marketing Board has to continue this role in the market and be in readiness to operate in the market to bring about a price equilibrium.

As a result of the rapid expansion of paddy production in the country, the quantity goal in rice has been achieved. Economic development during the last few years has also resulted in significant changes in the consumption habits of the country. More and more people now demand better quality rice. Therefore, the need for improvement of the rice processing industry is felt now more than ever before.

This is a very important matter, Sir, because the majority of rice in the country today is local rice. Quite different to what it was long years ago. It was imported rice long years ago. Of course, I do not contest that the rice we get from outside is still better than our local rice. But today, we have a bigger consumption of local rice. Therefore it is not that our milling has gone down. The milling, as a matter of fact, has improved, but it is not up to international standards. We are now trying to improve our own local milling. But it is not up to international standard. We are now trying to improve our own local milling. Consequently the PMB will embark on a scheme to improve the rice processing industry in the country with facilities and incentives to millers to improve their industry. More credit facilities, introduction of new machinery and imparting expertise will be required for this purpose. An island-wide survey is being conducted for the purpose of ascertaining the current capacity and quality of the milling industry. This survey will give data to design the type of assistance that will be required. In the meanwhile the Rice Processing Research and Development Centre of the Paddy Marketing Board is continuing research and extension work in the direction of improving the milling industry.

ප. ව. 2.45

Now, Sir, I want to make a few comment about co-operatives.

During 1985 an attempt was made to deal with some of the serious problems of Multi-purpose Co-operative Societies, not on a piece-meal but on a global basis.

A feature of Multi-purpose Co-operative Society performance which has been a major factor in frustrating the attempts of managements to operate at a profit has been the occurrence of leakages. These leakages, in most cases, go undetected till they attain large proportions, and, when detected, the kind of evidence required to convict the offenders is generally not available. This year a system of speedy checking of stocks, which is sufficiently accurate to detect even small shortages, has been introduced. General Managers of Co-operative Societies, Co-operative Inspectors and Assistant Commissioners of Co-operative Development have been trained in this system and they are required to carry out spot checks of stocks in randomly selected branches. It is expected that such a system would be a deterrent to misappropriating stocks in the future and reduce substantially losses from this unfortunate practice.

A system of pooling significant performance data of all Multi-purpose Co-operative Societies and processing such data so as to generate indicators of performance has been instituted. This management information system will alert departmental officers to adverse trends when ever they are manifested and make possible timely intervention. In short, the Department of Co-operative Development will have better control over the performance of Consumer Co-operative Societies. If we succeed we will be able to step in in time and reduce most of these misappropriations of large sums of money that take place in the co-operatives.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Another problem faced by Multi-purpose Co-operative Societies arises from the large debts that have been incurred to the Food Commissioner, the People's Bank and the Co-operative Wholesale Establishment as a result of indifferent management in the past. A substantial proportion of the earnings of many co-operative societies is dissipated in the repayment of these debts and the interest due on them. A moratorium of a year for debt repayment has been agreed upon with the big creditors. This will enable such societies as are innately viable to build up a reserve. They are further supported in this effort by the grant of loans from a fund created by the Minister of Finance. At the end of the moratorium, the performance of each society will be studied and conditions created, such as by the rescheduling of debts, in which it could operate as a viable institution.

These measures have already resulted in dramatic changes for the better in the case of several societies. For instance, the Horana MPCS, which with a sale of Rs. 15 lakhs in September 1984 incurred a loss of Rs. 20,000, doubled its sales to Rs. 32 lakhs in September 1985, making a profit of Rs. 40,000, where they incurred a loss of Rs. 20,000. I am glad to say that in 1985 they made a profit of Rs. 40,000. Shravastipura, with a sale of Rs. 3.5 lakhs in October 1984, incurred a loss of Rs. 50,000. Sales were increased to Rs. 5 lakhs in October 1985 with a profit of Rs. 5,000. Maradankadawala had sales of Rs. 6.4 lakhs in September 1984 and incurred a loss. Its sales increased to Rs. 10 lakhs in September 1985 and a profit of Rs. 20,000 was realized.

An innovative development in the co-operative distribution system which bids fair to bring about revolutionary changes in sales volume is the self-service shop. Already seven such shops have been opened, one in Colombo, two in Dehiwela-Galkissa, two in Ratnapura, one in Kahawatte and one in Matale. Multi-purpose Co-operative Societies often have to operate branch outlets in rural areas where purchasing power is low and distribution is undertaken at a loss. The setting up of self-service shops in urban areas with large sales volume and attendant high profits enables the MPCS to carry such loss-making rural branches and yet run the society as a whole at a profit.

Now, Sir, we are making attempts like this to resurrect the Multi-purpose Co-operative Societies which have been a big drain on the finances of this country. At the same time they have been performing a very useful task, as all hon. Members would agree and accept. We have got to look after this system of co-operatives in Sri Lanka. It has proved its usefulness when necessary and where no one else could have stepped in. At the same time we must appreciate the problems that one has to face when trying to look after the co-operative societies.

When I took over the co-operative societies one and a half years ago, Sir, I was wondering what I had come in for, whether I would ever be able to hear a good word from anyone. They were in such a dire state. It was a terrible task. It was a very difficult task. But I must thank all Members of Parliament, for they have given their full co-operation to me to see that some improvement could be effected in the co-operative societies. As we know, Sir, two years back, when I took over and when I was present here for the Budget Debate, most Members were talking of political interference and so on. I mentioned at that time that as far as I was concerned there would be no politicaly interference. I am happy to say, Sir, that all Members of Parliament, Government as well as Opposition, have given me their full assistance, and today there is hardly anything that we could call political interference in the co-operative movement. We must think of our people and try to develop these societies.

My Commissioner of Co-operative Development is sometimes critized – I think, most unfairly. That is being done because people do not know the amount of work he has got to do. I may have done the same if I was not in that Ministry. I see the amount of work they have to do, the amount of calls they are made to attend to and the terrific problems they are faced with. I must say that he has faced these problems bravely. Sometimes it must have been very frustrating to him because Members of Parliament crticized him unfairly. The Member himself has no real solution, but to get over his problem he puts it on the Commissioner of Co-operative Development. So it is a very, very difficult task to be the Commissioner of Co-operative Development, and I must thank the Commissioner for the effort he is making. Someone might say I am thanking him too much now ! No, Sir. I am saying this because I sincerely feel so, having seen for myself the terrific and huge task that he has to face and how he is tackling it.

Similarly, my Secretary and my Additional Secretary have been of immense help to me. My Secretary has guided me in most of my work, and my duties as Minister of Food and Co-operatives have been made very much lighter because I have a Secretary of the calibre of Mr. Dharmasiri Peiris. Similarly, the Food Commissioner is a very honourable person. He has been in this job only for a short period – not even a year – but he has carried out his duties and I feel he has been a very honourable person.

Sir, you know about storekeepers. Whether it is a Food Department storekeper, a Paddy Marketing Board storekeeper or a Co-operative Department storekeeper, they are a different set altogether. They are very clever people, in a way very clever people. The Food Commissioner has had to interdict 30 odd Co-operative Department storekeepers, and his life is

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගාමිණී ජයසූරිය මහතා]

now being threatened. They are very powerful people, and his life has been threatened. He has been working in that atmosphere. I feel he is doing a very hounourable and good job.

Similarly, organizations like MARKFED, the National Co-operative Council and the Sri Lanka Co-operative Management Services are doing a very good job in a very difficult atmosphere, in very difficult circumstances and they have all succeeded.

According to the hon. Member for Akmeemana, last year we had only a certain number of co-operatives that were making a profit. Now we have increased that number. We have pulled out a number of co-operatives which were in the red and improved their position. Within a period of one year it is not easy to bring up to standard 42 Co-operatives that were in the red. Thay were unable to carry on, unable to pay wages and get their goods. We have been able to resserrect 42 Co-operative societies in this short period of time, and most of them are now making profits. Therefore you will see that some improvement has been made. I am not saying that everything is perfect. There are tremendous problems, but we are facing them honestly, truly and squarely and I hope that in another couple of years I will be able to reduce to a very great extent the losses that co-operative societies are facing today.

Finally, let me again thank my Deputy Minister, Secretary, Deputy Secretary, Additional Secretaries, Commissioners and Directors. All of them have given me their fullest co-operation, and if there has been any success in the Co-operative Movement it is not because of me but because they have guided me correctly and given me their full co-operation.

ආර්. ජේ. ජී. ද මැල් මහතා
(திரு. ஆர். ஜே. ஜீ. த மெல்)
(Mr. R. J. G. de Mel)

Sir, I want to mke a clarification with regard to a statement made by the hon. Member for Attanagalla when I was not in this House. He had obviously read out a letter, which he states has been written by the Food Commissioner to the Acting Minister of Food and Co-operative Undertakings, on the subject of rice, flour and sugar prices, dated 22nd November. How he got this letter written by the Food Commissioner to the Acting Minister of Food and Co-operative Undertakings on the subject of rice, flour and sugar I do not know, but considering the amount of leakages and shortages in food stores which my Hon. Colleague just referred to, it may be in the natural state of things for letters addressed to Hon. Ministers to leak out to Members of the Opposition.

Anyway, that is beside the point. What I wish to clarify is only this, Sir. Food prices are determined by a number of factors–world food prices, local food prices, Government action and also sometimes the machinations of the trade. As you know very well, Sir, a combination of these factors also can determine food prices. One of these factors, or two or three of these factors, can also determine food prices–world food prices, local food prices, Government action or Government policy and machinations of the trade.

ප. ව. 3

In the case of food prices, Sir, this Government took a very clear-cut decision, even before the present Hon. Minister of Food and Co-operative became the Minister and when the distinguished Speaker of the House was Minister of Agriculture, that food prices should be operated by the Food Commissioner on a no-profit no-loss basis. That is the Government policy from the time when the previous Hon. Minister of Agriculture was in office. There was no necessity for anybody either to come to the Cabinet or to get any changes in food prices reflected in the Budget. The Budget in not the thing to reflect food prices. A clear decision had been taken that on a no-profit no-loss basis food prices should be operated by the Government.

That was a Government decision, and from time to time food prices increased. The local price of rice increased from time to time due to various factors - may be due to non-collection or inability to collect by the Paddy Marketing Board, may be due to the difficulties in the North and in the East. And this year in particular Rs. 700 million worth of rice was imported from China to supplement the stock of rice in this country to keep the people in this country from starvation despite the difficulties in the North and in the East. So we had to take into account foreign food prices plus local food prices, which had also escalated due to various causes at various times. Sometimes in between harvesting the food prices go up.

Anyway, it is the duty of the Food Commissioner to maintain food prices on a no-profit-loss basis. That was the decision of the Government even before my good Friend became the Minister of Agriculture and food. Due to various reasons the food prices did increase in the course of this year. The rice price increased due to a variety of factors, which I just mentioned. Troubles in the North and the East caused the import of rice from China. That is the other factor. All these occurred long before the Budget, months and months before the Budget.

In the same way the price of dhal increased in the world due to the fact that some of the dhal-producing countries had a severe drought and dhal could only be obtained from one place. Thus the CWE had to import dhal at a very high price, and they were suffering a big loss. The CWE, for example, was suffering a loss of about Rs. 20 million on dhal prices.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

So, on the basis of a clear-cut decision of the Government, all food prices, whether by the Food Commissioner or by the CWE, should be operated on a no-profit no-loss basis, and the prices had to be adjusted. It had nothing to do with the Budget. That is why I said in this House that the Budget had nothing to do with the changes in food prices. The Budget does not even mention rice, flour, sugar or dhal, and the Budget is not responsible for any of these price rises.

So, when the hon. Member for Attanagalla comes here and says that I should withdraw my statement, I think he is talking through his hat. That is all I have got to say.

" 170 වන ශීර්ෂයෙහි 1 වන වැඩ සටහන, පුනරාවර්තන වියදම් සඳහා රු. 50,14,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය " යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

170 වන ශීර්ෂයෙහි 1 වන වැඩ සටහන, පුනරාවර්තන වියදම් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"தலைப்பு 170 நிகழ்ச்சித் திட்டம் 1, மீண்டுவருஞ் செலவுக்கான ரூபா 50,14,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 170, நிகழ்ச்சித் திட்டம் 1, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

Question, "That the sum of Rs. 5,014,000, for Head 170, Programme 1, Recurrent Expenditure be inserted in the Schedule", put and agreed to.

Head 170, Programme 1, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

1 වන වැඩ සටහන.—සාමාන්‍ය පරිපාලනය හා කාර්ය මණ්ඩල සේවා—මූලධන වියදම, රු. 10,25,000

நிகழ்ச்சித் திட்டம் 1.— பொது நிருவாகமும் பதவியினர் சேவைகளும் — ஆக்கப் பொருட் செலவு, ரூபா 10,25,000

Programme 1 – General Administration and Staff Services – Capital Expenditure Rs. 1,025,000

" 170 වන ශීර්ෂයෙහි 1 වන වැඩ සටහන, මූලධන වියදම් සඳහා රු. 10,25,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය " යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

170 වන ශීර්ෂයෙහි 1 වන වැඩ සටහන, මූලධන වියදම් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"தலைப்பு 170, நிகழ்ச்சித் திட்டம் 1, ஆக்கப்பொருட் செலவுக்கான ரூபா 10,25,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக் கொள்ளப்பட்டது.

தலைப்பு 170, நிகழ்ச்சித் திட்டம் 1, ஆக்கப்பொருட் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

Question, "That the sum of Rs. 1,025,000, for Head 170, Programme 1, Capital Expenditure be inserted in the Schedule", put and agreed to.

Head 170, Programme 1, Capital Expenditure, ordered to stand part of the Schedule.

### 171 වන ශීර්ෂය—ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව

1 වන වැඩ සටහන.—ආහාර ද්‍රව්‍ය මිලයට ගැනීම හා බෙදහැරීම—පුනරාවර්තන වියදම, රු. 30,00,000

### தலைப்பு 171.—உணவு ஆணையாளர் திணைக்களம்

நிகழ்ச்சித் திட்டம் 1. — உணவுப் பொருட்களின் கொள்வனவும் விநியோகமும் — மீண்டுவருஞ் செலவு, ரூபா 30,00,000

### HEAD 171.–DEPARTMENT OF THE FOOD COMMISSIONER

Programme 1.– Purchase and Distribution of Foodstuffs – Recurrent Expenditure, Rs. 3,000,000

" 171 වන ශීර්ෂයෙහි 1 වන වැඩ සටහන, පුනරාවර්තන වියදම් සඳහා රු. 30,00,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය " යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

171 වන ශීර්ෂයෙහි 1 වන වැඩ සටහන, පුනරාවර්තන වියදම් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"தலைப்பு 171, நிகழ்ச்சித் திட்டம் 1, மீண்டுவருஞ் செலவுக்கான ரூபா 30,00,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 171, நிகழ்ச்சித் திட்டம் 1, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

Question, "That the sum of Rs. 3,000,000, for Head 171, Programme 1, Recurrent Expenditure be inserted in the Schedule", put and agreed to.

Head 171, Programme 1, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

1 වන වැඩ සටහන.—ආහාර ද්‍රව්‍ය මිලයට ගැනීම හා බෙදහැරීම—මූලධන වියදම, රු. 37,50,000

நிகழ்ச்சித் திட்டம் 1.— உணவுப் பொருட்களின் கொள்வனவும் விநியோகமும் — ஆக்கப்பொருட் செலவு, ரூபா 37,50,000

Programme 1.– Purchase and Distribution of Foodstuffs – Capital Expenditure, Rs. 3,750,000

" 171 වන ශීර්ෂයෙහි 1 වන වැඩ සටහන, මූලධන වියදම් සඳහා රු. 37,50,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය " යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

171 වන ශීර්ෂයෙහි 1 වන වැඩ සටහන, මූලධන වියදම් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"தலைப்பு 171, நிகழ்ச்சித் திட்டம் 1, ஆக்கப்பொருட் செலவுக்கான ரூபா 37,50,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 171, நிகழ்ச்சித் திட்டம் 1, ஆக்கப்பொருட் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

Question, "That the sum of Rs. 3,750,000, for Head 171, Programme 1, Capital Expenditure be inserted in the Schedule", put and agreed to.

Head 171, Programme 1, Capital Expenditure, ordered to stand part of the Schedule.

### 172 වන ශීර්ෂය—සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව

1 වන වැඩ සටහන.—සමුපකාර සමිති සංවර්ධනය, පරිපාලනය හා ගණන් පරීක්ෂණය—පුනරාවර්තන වියදම, රු. 15,11,05,000

### தலைப்பு 172.— கூட்டுறவு அபிவிருத்தித் திணைக்களம்

நிகழ்ச்சித் திட்டம் 1. — கூட்டுறவுச் சங்கங்களின் கணக்காய்வு, மேற்பார்வை, அபி விருத்தி — மீண்டுவருஞ் செலவு, ரூபா 15,11,05,000

### HEAD 172.–DEPARTMENT OF CO-OPERATIVE DEVELOPMENT

Programme 1.– Development, Supervision and Audit of Co-operative Societies – Recurrent Expenditure, Rs. 151,105,000

" 172 වන ශීර්ෂයෙහි 1 වන වැඩ සටහන, පුනරාවර්තන වියදම් සඳහා රු. 15,11,05,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය " යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

172 වන ශීර්ෂයෙහි 1 වන වැඩ සටහන, පුනරාවර්තන වියදම් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"தலைப்பு 172, நிகழ்ச்சித் திட்டம் 1, மீண்டுவருஞ் செலவுக்கான ரூபா 15,11,05,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 172, நிகழ்ச்சித் திட்டம் 1, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

Question, "That the sum of Rs. 151,105,000, for Head 172, Programme 1, Recurrent Expenditure be inserted in the Schedule", put and agreed to.

Head 172, Programme 1, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දිනේෂ් ගුණවර්ධන මහතා
(திரு. தினேஷ் குணவர்த்தன)
(Mr. Dinesh Gunawardene)

කාටත් ලෙහෙසියි කියන්න ඒක අරයාගේ මෙයාගේ පෞද්ගලික අදහසක් කියලා. මේ රටේ වතු කම්කරුවන්ට පැය ගණනාවක් වැඩ කරන්න එපාය, අසවල් දේ සඳහා සටන් කරන්නය කියා කැබිනට් ඇමතිවරයෙක් කියනවා නම් ඒක පෞද්ගලික අදහසක් කියා බේරෙන්නට පුළුවන් නම් හුඟක් දේවල් එහෙම නම් පුද්ගලික අදහස්ය කියා බේරිලා විනාශයක් සිද්ධ වෙනතුරු බලා සිටිමයි සිද්ධ වෙන්නේ. මම තමුන්නාන්සේලාට කීන්නේ පුරාවස්තුකම පිළිබඳ ප්‍රශ්නය නොවෙයි.

ඩබ්ලිව්. එම්. ජී. ටී. බණ්ඩා මහතා (නියෝජ්‍ය සංස්කෘතික කටයුතු ඇමතිතුමා)
(திரு. டபிள்யு. எம். ஜீ. ரீ. பண்டா — கலாசார அலுவல்கள் பிரதி அமைச்சர்)
(Mr. W. M. G. T. Banda – Deputy Minister of Cultural Affairs)

පළාත් නවයකට බෙදනවා නම්, ඒ බෙදන්න ඉස්සෙල්ලා සංස්කෘතික දයාද ගැන අපි සාකච්ඡාවක් කරන විට අපි තමුන්නාන්සේටත් ඒකට සහභාගි වෙන්නට ඉඩ දෙන්නම්. අපි තවම එවැනි තීරණයක් අරගෙන නැහැ.

දිනේෂ් ගුණවර්ධන මහතා
(திரு. தினேஷ் குணவர்த்தன)
(Mr. Dinesh Gunawardene)

තමුන්නාන්සේ කියන්නේ එහෙම තීරණයක් අරගෙන නැහැ කියලද ? එතකොට ගරු ජනාධිපතිතුමා බහමාස් සමුළුවේදී කර තිබෙන්නේ වැරදි ප්‍රකාශයක්ද ?

ඊ. එල්. බී. හුරුල්ලේ මහතා (සංස්කෘතික කටයුතු ඇමතිතුමා)
(திரு. ஈ. எல். பி. ஹுருள்ளே — கலாசார அலுவல்கள் அமைச்சர்)
(Mr. E. L. B. Hurulle – Minister of Cultural Affairs)

පුරාවිද්‍යාව සම්පූර්ණයෙන්ම අද තිබෙන තත්ත්වයටයි ඉදිරියටත් පවත් වන්නට යන්නේ.

දිනේෂ් ගුණවර්ධන මහතා
(திரு. தினேஷ் குணவர்த்தன)
(Mr. Dinesh Gunawardene)

පුරාවිද්‍යාව පවත්වාගෙන යන්නට පුළුවන් දෙපාර්තමේන්තුවෙන්. පුරාවිද්‍යාව පිළිබඳ ඒකීය බවක් දෙපාර්තමේන්තුව වශයෙන් තිබෙන්නට පුළුවන්. පුරාවිද්‍යාත්මක වස්තූන් රක්ෂණය වන ක්‍රම තිබෙනවා.

ඊ. එල්. බී. හුරුල්ලේ මහතා
(திரு. ஈ. எல். பி. ஹுருள்ளே)
(Mr. E. L. B. Hurulle)

ඒවා ඒ ප්‍රාන්තවලට භාර දෙන්නේ නැහැ.

දිනේෂ් ගුණවර්ධන මහතා
(திரு. தினேஷ் குணவர்த்தன)
(Mr. Dinesh Gunawardene)

ප්‍රාන්තවලට භාර දෙන්නේ නැහැ කියනවා. ඒ කියන්නේ ප්‍රාන්තවලට එකඟ වෙලා තිබෙනවාද ?

ඊ. එල්. බී. හුරුල්ලේ මහතා
(திரு. ஈ. எல். பி. ஹுருள்ளே)
(Mr. E. L. B. Hurulle)

නැහැ.

දිනේෂ් ගුණවර්ධන මහතා
(திரு. தினேஷ் குணவர்த்தன)
(Mr. Dinesh Gunawardene)

මොකක්ද මේ කථාව ? එක නියෝජ්‍ය ඇමතිවරයෙක් කියනවා ප්‍රාන්තවලට එකඟතාවයක් නැහැ කියල. ඔබතුමා කියනවා ප්‍රාන්තවලට භාර දෙන්නේ නැහැ කියල. ප්‍රාන්තවලට එකඟවෙලා නැත්නම් ප්‍රාන්තවලට භාර දෙන කථාවක් මොකද කියන්නේ ?

ඩබ්ලිව්. එම්. ජී. ටී. බණ්ඩා මහතා
(திரு. டபிள்யு. எம். ஜீ. ரீ. பண்டா)
(Mr. W. M. G. T. Banda)

ප්‍රාන්ත ගැන තීරණයක් අපි තවම අරගෙන නැහැ.

දිනේෂ් ගුණවර්ධන මහතා
(திரு. தினேஷ் குணவர்த்தன)
(Mr. Dinesh Gunawardene)

තමුන්නාන්සේලා කොපමණ නැහැ කිව්වත් ජනාධිපතිතුමා බහමාස් සමුළුවේදී කියා තිබෙනවා. ප්‍රාන්ත 9කට රට විමධ්‍යගත කිරීමේ පරිපාලන රටාවක් පිළිබඳ තීරණයකට ආණ්ඩුව ඇවිත් තිබෙනවාය කියා. මේ රජය නිරන්තර ප්‍රකාශයන් කර තිබෙනවා, උතුරු සහ නැගෙනහිර පළාත් ඒකාබද්ධවීමකට පමණයි මේ රජය විරුද්ධ කියා. ඒ නිසා කොළය වහන්නට ඕනෑ නැහැ. කොපමණ නැහැයි කිව්වත්, තමුන්නාන්සේලා එකඟවෙලා තිබෙනවා මේ රට පළාත් 9කට කඩන්නට. තමුන්නාන්සේලා අද නැහැ කියයි. නමුත් සත්‍යය ඒකයි. තමුන්නාන්සේලා ප්‍රතිඥා දී තිබෙනවා, උතුරු නැගෙනහිර වෙනම රාජ්‍යයක් ඉල්ලූ ද්‍රවිඩ ජනතාවගේ සමහර නායකයන්ට, මේ රට පළාත් 9කට කඩලා, උතුරු සහ උතුරුමැද පළාත් වෙනමත්, නැගෙනහිර පළාත වෙනමත් ඔවුන්ගේ ප්‍රාන්ත ඇමතිවරුන් යටතේ පාලනය කරන්න.

මහින්ද යාපා අබේවර්ධන මහතා (හක්මන)
(திரு. மஹிந்த யாப்பா அபேவர்த்தன — ஹக்மன)
(Mr. Mahinda Yapa Abeywardana – Hakmana)

එහෙම අදහසක් කවුරුවත් තවම පිළිගෙන නැහැ.

දිනේෂ් ගුණවර්ධන මහතා
(திரு. தினேஷ் குணவர்த்தன)
(Mr. Dinesh Gunawardene)

තමුන්නාන්සේ පිළිගන්න ඕනෑ නැහැ. තමුන්නාන්සේට තිබෙන අයිතිය බොහොම සීමාසහිතයි. ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයෙක් හැටියට. ඒක අපි දන්නවා. මම මේ කියන්නට එන්නේ—

ඊ. එල්. බී. හුරුල්ලේ මහතා
(திரு. ஈ. எல். பி. ஹுருள்ளே)
(Mr. E. L. B. Hurulle)

පොඩ්ඩක් පැහැදිලි කර දෙන්නම්. එහෙම අදහසක් අප තුළ නම් නැහැ. නමුත් මම මතක් කර දෙන්න කැමතියි—

සභාපතිතුමා
(தலைவர்)
(The Chairman)

Order, Please ! The Hon. Speaker will now take the Chair.

*අනතුරුව නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, කථානායකතුමා [ඊ. එල්. සේනානායක මහතා] මූලාසනාරූඪ විය.*

*அதன் பிறகு, பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, சபாநாயகர் அவர்கள் [திரு. ஈ. எல். சேனநாயக்க] தலைமை வகித்தார்கள்.*

*Whereupon* MR. DEPUTUY SPEAKER *left the Chair, and* MR. SPEAKER [MR. E. L. SENANAYAKE] *took the Chair.*

ඊ. එල්. බී. හුරුල්ලේ මහතා
(திரு. ஈ. எல். பி. ஹுருள்ளே)
(Mr. E. L. B. Hurulle)

එහෙම අදහසක් අපේ නැහැ. නමුත් මම ගරු මන්ත්‍රීතුමාට මතක් කර දෙන්න කැමතියි, ඔබතුමාගේ පියාණන්, 1956 පැවති ආණ්ඩුවේ ඉන්න කාලයේදී බණ්ඩාරනායක – චෙල්වනායගම් ගිවිසුම අත්සන් කළ බව. ඒ පක්ෂය රජ කරවන්නට උදව් කළ ස්වාමීන් වහන්සේලා උපවාසේ යෙදිලයි බණ්ඩාරනායක – චෙල්වනායගම් ගිවිසුම ඉරා දැම්මේ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දිනේෂ් ගුණවර්ධන මහතා
(திரு. தினேஷ் குணவர்த்தன)
(Mr. Dinesh Gunawardene)

ඒක සත්‍යයක්. ඒ මොකද, ඒ ආණ්ඩුව මහජන මතයට හිස නැමුවා. බණ්ඩාරනායක අගමැතිතුමාට මහජනතාව උත්තරීතර නිසා මහජන මතයට හිස නමා ගිවිසුම ඉරා දැම්මා. ඩඩ්ලි සේනානායක මැතිතුමාත් මහජන මතයට හිස නමා ගිවිසුම ඉල්ලා අස්කර ගත්තා. තමුන්නාන්සේලාගේ වෙනස තිබෙන්නේ එසේ නොවෙන නිසයි. අන්න ඒකයි තිබෙන ප්‍රධාන වෙනස.

ඩබ්ලිව්. එම්. ජී. ටී. බණ්ඩා මහතා
(திரு. டபிள்யு. எம். ஜீ. ரீ. பண்டா)
(Mr. W. M. G. T. Banda)

එහෙම එකක් තවම කෙරිලා නැහැ.

දිනේෂ් ගුණවර්ධන මහතා
(திரு. தினேஷ் குணவர்த்தன)
(Mr. Dinesh Gunawardene)

අන්න ඒකයි මෙතන තිබෙන ප්‍රශ්නය. [බාධා කිරීමක්] ඕවා පිළිබඳව තර්ක කරන්නට වුවමනා නැහැ. පුවත්පත්වලට කළ ප්‍රකාශයක් ගැන අපි මේ ගරු සභාවේ කීපවතාවක් කියා තිබෙනවා. "මගේ නොයෙක් දේවල් පාර්ලිමේන්තුව අනුමත කරන්නේ නැත්නම් මම පාර්ලිමේන්තුව විසුරුවා හැරලා හරි මේක ක්‍රියාත්මක කරනවාය" කියා කළ ප්‍රකාශයත් පවා තිබෙනවා. තමුන්නාන්සේලාට අනිවාර්යයෙන්ම ඕනෑකමක් තිබෙනවා එහෙම නොවෙයි කියා අන්තිම දක්වාම කියන්නට. ඒ ප්‍රශ්නය නොවෙයි මම අහන්නට ආවේ. මම අහන්නට ආවේ ප්‍රාන්ත නවයකට රට කැඩුණාට පසුව මේ පුරාවිද්‍යා සිද්ධස්ථාන පිළිබඳව තමුන්නාන්සේලා අනුගමනය කරන්න යන ප්‍රතිපත්තිය කුමක්ද කියන එකයි.

ඩබ්ලිව්. එම්. ජී. ටී. බණ්ඩා මහතා
(திரு. டபிள்யு. எம். ஜீ. ரீ. பண்டா)
(Mr. W. M. G. T. Banda)

ගිවිසුම් දෙකකුත් ඉරා දැම්මා නම් කවින් කියපු දෙයක් තමුන්නාන්සේ ගිවිසුමකටත් වැඩිය ඉහළින් පිළිගෙන තිබෙන බවයි අපට පෙනෙන්නේ. අපි එහෙම ගිවිසුමක් ලියලා නැහැ.

දිනේෂ් ගුණවර්ධන මහතා
(திரு. தினேஷ் குணவர்த்தன)
(Mr. Dinesh Gunawardene)

තමුන්නාන්සේ පිළිගෙන නැද්ද ?

ඩබ්ලිව්. එම්. ජී. ටී. බණ්ඩා මහතා
(திரு. டபிள்யு. எம். ஜீ. ரீ. பண்டா)
(Mr. W. M. G. T. Banda)

නැහැ.

දිනේෂ් ගුණවර්ධන මහතා
(திரு. தினேஷ் குணவர்த்தன)
(Mr. Dinesh Gunawardene)

පිළිගත්තෙත් නැද්ද ?

ඩබ්ලිව්. එම්. ජී. ටී. බණ්ඩා මහතා
(திரு. டபிள்யு. எம். ஜீ. ரீ. பண்டா)
(Mr. W. M. G. T. Banda)

එහෙම දෙයක්, එහෙම යෝජනාවක් ඇවිත් නැහැ. ලංකාව තුළින්.

දිනේෂ් ගුණවර්ධන මහතා
(திரு. தினேஷ் குணவர்த்தன)
(Mr. Dinesh Gunawardene)

එහෙම යෝජනාවක් ඇවිත් නැහැයි කියා රජයේ වගකිව යුතු නියෝජ්‍ය ඇමතිවරයෙක්හ ැටියට තමුන්නාන්සේ ප්‍රකාශ කරනවාද ?

ඩබ්ලිව්. එම්. ජී. ටී. බණ්ඩා මහතා
(திரு. டபிள்யு. எம். ஜீ. ரீ. பண்டா)
(Mr. W. M. G. T. Banda)

ඔව් !

දිනේෂ් ගුණවර්ධන මහතා
(திரு. தினேஷ் குணவர்த்தன)
(Mr. Dinesh Gunawardene)

ඒ කියන්නේ මේ රටේ ප්‍රාන්ත නවයක පාලනයක් ඇති කරන්න කිසිම යෝජනාවක් ඇවිදිනුත් නැහැ. අනුමත කිරීමට සාකච්ඡා කරලත් නැහැ. එවැනි දෙයක් කවුරු හරි කියනවා නම් ඒක අසත්‍යයක් බොරුවක් කියන එකයි තමුන්නාන්සේ කියන්නේ.

ඩබ්ලිව්. එම්. ජී. ටී. බණ්ඩා මහතා
(திரு. டபிள்யு. எம். ஜீ. ரீ. பண்டா)
(Mr. W. M. G. T. Banda)

මම දන්නා තරමින් ලංකාව තුළදී එවැනි දෙයක් සිදු වෙලා නැහැ. මම එය තරයේම කියනවා. මම දන්නා තරමින් ලංකාව තුළ එවැනි දෙයක් සිදු වෙලා නැහැ.

සභාපතිතුමා
(தவிசாளர்)
(The Chairman)

මොකක් ගැනද අපි දැන් මේ කථා කරන්නේ ? සංස්කෘතික අමාත්‍යාංශය ගැන. මහරගම ගරු මන්ත්‍රීතුමා මොනවා ගැනද මේ කථා කරන්නේ ?

දිනේෂ් ගුණවර්ධන මහතා
(திரு. தினேஷ் குணவர்த்தன)
(Mr. Dinesh Gunawardene)

ගරු සභාපතිතුමනි, සංස්කෘතික අමාත්‍යාංශය ගැනයි මම මේ කථා කරන්නේ. මම කථා කරන්නේ සංස්කෘතික අමාත්‍යාංශයේ දායාදයක් පිළිබඳවයි ; උතුරු හා නැගෙනහිර පළාත්වල සංස්කෘතික දායාදයක් පිළිබඳව ඉදිරි කාලයේදී අමාත්‍යාංශය දරන වගකීම පිළිබඳවයි. ඒ සඳහා යම් යම් යෝජනා ක්‍රියාත්මක වුණොත් ඒ දායාදයන් සහ නටබුන් පිළිබඳව වගකියන්නේ කවුද කියන ප්‍රශ්නය පිළිබඳවයි මම කථා කරන්නේ. මෙය සංස්කෘතික අමාත්‍යාංශයට සම්බන්ධ ප්‍රශ්නයක්. එය නැහැයි කියන්නට බැහැ.

ඊ. එල්. බී. හුරුල්ලේ මහතා
(திரு. ஈ. எல். பி. ஹுருள்ளே)
(Mr. E. L. B. Hurulle)

ගරු සභාපතිතුමනි, පුරාවිද්‍යාව භාර දෙන්නේ නැහැයි කියා මම පිළිතුරු දුන්නා. එය පිළිගන්න ඕනෑ. භාර දෙන්නේ නැහැ. එතුමා අදහස් කරන්නේ, එතුමාට මේ හීන පෙනෙන්නේ ප්‍රාන්ත ගැනයි. ප්‍රාන්තවලට අපි භාර දෙන්නේ නැහැයි කියා මම කිව්වා.

දිනේෂ් ගුණවර්ධන මහතා
(திரு. தினேஷ் குணவர்த்தன)
(Mr. Dinesh Gunawardene)

හරි ! ඉතින් ඒක තමයි මම මේ කියන්නට ආවේ. තමුන්නාන්සේලා ප්‍රාන්තවලට භාර දෙන්නේ නැහැ. තමුන් ප්‍රාන්ත පිළිගෙන ඉවරයි. ඒ ගැන ඉතින් වෙනත් තර්කයක් අවශ්‍ය නැහැ. ප්‍රාන්තවලට දෙන්නේ නැහැයි කියා කැබිනට් මණ්ඩලයේ ඇමතිවරයෙක් කියනවා. ප්‍රාන්ත පිළිඅරගෙන නැත්නම් ප්‍රාන්තවලට දෙන්න අවශ්‍ය නැහැනේ. ප්‍රාන්ත පිළිඅරගෙන තිබෙනවා. ඒ සඳහා පුරා විද්‍යාව භාර දෙන්නේ නැහැයි කියන එකයි දැන් ප්‍රකාශ කළේ.

ඊ. එල්. බී. හුරුල්ලේ මහතා
(திரு. ஈ. எல். பி. ஹுருள்ளே)
(Mr. E. L. B. Hurulle)

මහරගම ගරු මන්ත්‍රීතුමාට හීන පෙනෙනවාය කියා මම කිව්වේ ඒක තමයි.

දිනේෂ් ගුණවර්ධන මහතා
(திரு. தினேஷ் குணவர்த்தன)
(Mr. Dinesh Gunawardene)

හීන පෙනෙනවා නොවෙයි, මේ රට ප්‍රාන්ත නවයක ආණ්ඩුවලට කැඩීමට එකඟත්වය තිබෙනවාය කියන එක තමුන්නාන්සේ පැහැදිලිව පිළිගන්නවා. එය නැහැයි කියන්නට බැහැ. එහෙම නැත්නම් කොහොම ප්‍රාන්තවලට දෙන්නේ නැහැයි කියන්නේ ?



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**සභාපතිතුමා**
**(தவிசாளர்)**
**(The Chairman)**

එහෙම කිසිම තීන්දුවක් මේ රජයෙන් අරගෙන නැහැ. තවම ඒ ගැන තීන්දුවක් අරගෙන හෝ ඒ ගැන කථා කර හෝ නැහැ.

**ඊ. එල්. බී. හුරුල්ලේ මහතා**
**(திரு. ஈ. எல். பி. ஹுருள்ளே)**
**(Mr. E. L. B. Hurulle)**

ඒ කොයි තරම් නැහැයි කිව්වත් මහරගම ගරු මන්ත්‍රීතුමා එය පිළිගන්නේ නැහැ.

**දිනේෂ් ගුණවර්ධන මහතා**
**(திரு. தினேஷ் குணவர்த்தன)**
**(Mr. Dinesh Gunawardene)**

තීරණයක් ගැනීම ගැන නොවෙයි මම කිව්වේ. එවැනි ප්‍රකාශයක් කර තිබෙනවා බහමාස් සම්මේලනයේදී. නිරන්තරයෙන්ම රජය ඒ ප්‍රකාශය කර තිබෙනවා.

**ඩබ්ලිව්. එම්. ජී. ටී. බණ්ඩා මහතා**
**(திரு. டபிள்யு. எம். ஜீ. ரீ. பண்டா)**
**(Mr. W. M. G. T. Banda)**

ලංකාවේදී එහෙම දෙයක් සිදු වී නැහැයි කියා මම තමුන්නාන්සේට කිව්වා.

**දිනේෂ් ගුණවර්ධන මහතා**
**(திரு. தினேஷ் குணவர்த்தன)**
**(Mr. Dinesh Gunawardene)**

ලංකාවේදී සිදු වී නැතිලු.

**ඩබ්ලිව්. එම්. ජී. ටී. බණ්ඩා මහතා**
**(திரு. டபிள்யு. எம். ஜீ. ரீ. பண்டா)**
**(Mr. W. M. G. T. Banda)**

ඔව් !

**දිනේෂ් ගුණවර්ධන මහතා**
**(திரு. தினேஷ் குணவர்த்தன)**
**(Mr. Dinesh Gunawardene)**

බොහොම හොඳයි. මම ඒ ගැන තවත් තර්ක කරන්නේ නැහැ. මොකද ? නිකම් කථා කිරීමෙන් සිදු වෙන්නේ මේ ප්‍රශ්නය වසා දමන්නට දරන උත්සාහය තව තව එළිදරව් වීම පමණයි. ඊට වඩා දෙයක් කථා කිරීම අවශ්‍ය නැහැ. පනතක් ඉදිරිත් වූ දවසකට තමුන්නාන්සේලා අද කිව්ව දේවල් පිළිබඳ සත්‍යය දැන ගන්නට අපට පුළුවන්.

ඊළඟට තිබෙන්නේ මේ අනුරාධපුරයේ බෞද්ධාවාසය පිළිබඳ ප්‍රශ්නයයි. ඒ බෞද්ධාවාසයේදී ඒ ප්‍රදේශයේ සිදු වූ අලාභ හානි පිළිබඳවත්, ඊට පසුව ඒ ප්‍රදේශයෙන් නැගෙනහිර ප්‍රදේශයෙන් ස්වාමීන් වහන්සේලා ඝාතනය කිරීමෙන් සහ නොයෙකුත් ආකාරයෙන් සිදු කරන ලද විනාශයනුත්, ඒවාගේම ඒ ආගමික මධ්‍යස්ථාන පිළිබඳවත් විස්තරයක් සපයන්න පුළුවන්ද කියන එක මම ගරු ඇමතිතුමාගෙන් දැන ගන්නට කැමතියි. ඒ සිදු වූ විනාශයන් සම්බන්ධයෙන් බෞද්ධ කටයුතු පිළිබඳ කොමසාරිස් දෙපාර්තමේන්තුව ගත් පියවරවල් මොනවාද ? මොනවා හෝ සහනයක් සැපයුවාද ඒ සහනයන් සපයන්නට අපොහොසත් වුණාද ? එසේ කළා නම් කළ කාර්යයන් මොනවාද කියන එකත් අපි දැන ගන්නට කැමතියි. අපි දන්නා ආකාරයට බෞද්ධ කටයුතු පිළිබඳ කොමසාරිස් දෙපාර්තමේන්තුවට ඒ පිළිබඳව සම්පූර්ණයෙන් මැදිහත් වෙන්නට හැකියාවක් ඇති වී නැහැ. ඒ තත්ත්වය තුළ නැගෙනහිර පළාතේ විශේෂයෙන් ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ ස්වාමීන් වහන්සේලා විශාල ප්‍රමාණයක් ජීවත් වන්නට බැරි තත්ත්වයකට පත් වී තිබෙනවා. මොකද අවට ගම්වාසීන් ඒ ගම්වලින් ඉවත් වී ගොස් තිබෙනවා. [බාධා කිරීමක්] ඒක තමයි මම මේ අහන්නේ.

**ඩබ්ලිව්. එම්. ජී. ටී. බණ්ඩා මහතා**
**(திரு. டபிள்யு. எம். ஜீ. ரீ. பண்டா)**
**(Mr. W. M. G. T. Banda)**

අපි මේවාට ආධාර කරනවා. අපි වියදම් කළ මුදල් පිළිබඳවත් ආධාර ලබාදුන් ස්ථාන ගැනත් අපේ පිළිතුරු කථාවේදී කියන්නම්.

**දිනේෂ් ගුණවර්ධන මහතා**
**(திரு. தினேஷ் குணவர்த்தன)**
**(Mr. Dinesh Gunawardene)**

පැහැදිලි කරන ලෙස තමයි මා ඉල්ලා සිටින්නේ. මොකද මේ ගම්මානවල සිටින බෞද්ධ සහ සිංහල ජනතාව ඒ ප්‍රදේශවලින් ඉවත් කිරීමක් සිදු වුණොත් අද කොපමණ ආධාර කළත්, යළිත් ඒ තත්ත්වය පවත්වාගෙන යාමට හම්බවෙන්නේ නැහැ ඒ ප්‍රදේශවල ජනතාව තමයි එම වටපිටාව ආරක්ෂා කළේ. ඒ බෞද්ධ සිද්ධස්ථාන සහ පුරාවස්තු ආරක්ෂා කිරීමේ ප්‍රතිපත්තිය ස්ථාවර තත්ත්වයකට ගෙන යන්න නම් මම හිතන්නේ ඉතාම වැදගත් වෙන්නේ ඒ ප්‍රදේශවල ජනතාව නැවත ඒ තැන්වලටම ගෙන යාමේ ක්‍රියාමාර්ගයයි. සංස්කෘතික දෙපාර්තමේන්තුව, විශේෂයෙන්ම බෞද්ධ කටයුතු පිළිබඳ කොමසාරිස් දෙපාර්තමේන්තුව ඒ සඳහා මීට වඩා ක්‍රියා කරන්න පියවර ගන්නා ලෙස ඉතා ඕනෑ කමින් මා ඉල්ලා සිටිනවා. මා නැගූ මේ ප්‍රශ්න කිහිපය පිළිබඳව ගරු සංස්කෘතික ඇමතිතුමා පැහැදිලි කිරීමක් කරනවා නම් මා අගය කරනවා.

**ඩී. වින්සන්ට් ඩයස් මහතා**
**(திரு. டீ. வின்சன்ற் டயஸ்)**
**(Mr. D. Vincent Dias)**

ගරු සභාපතිතුමනි, සංස්කෘතික අමාත්‍යාංශයේ වැය ශීර්ෂ සාකච්ඡාවට භාජනය වන මේ අවස්ථාවේ මහරගම ගරු මන්ත්‍රීතුමාගේ (දිනේෂ් ගුණවර්ධන මහතා) කථාවෙන් පසුව මට කථා කරන්න ලැබීම ගැන මා සන්තෝෂ වෙනවා. මේ රටේ මේ ද්‍රවිඩ ප්‍රශ්න විසඳීමට රජය ගන්නා ක්‍රියාමාර්ග පිළිබඳව එතුමා අනිසි බියක් ඇති කර ගත තිබෙනවා. නොයෙක් විට ගරු ජනාධිපතිතුමාත් ගරු ඇමතිවරුත් ඇතැම්විට ගරු මන්ත්‍රීවරුත් මේ ගැන තමන් දරන අදහස් දක්වනවා. මා ඊයේ පත්‍රයේ දුක්කා, අපේ ගාල්ලේ ගරු මන්ත්‍රීතුමා කළ ප්‍රකාශයකුත්, මඩකලපුවට ආණ්ඩුවකුත්, යාපනයට ආණ්ඩුවකුත් වශයෙන් ආණ්ඩු දෙකක් පිහිටුවගන්න කියා එතුමා ප්‍රකාශයක් කර තිබුණා.

**මන්ත්‍රීවරයෙක්**
**(அங்கத்தவர் ஒருவர்)**
**(A Member)**

පාර්ලිමේන්තු දෙකක්.

**ඩී. වින්සන්ට් ඩයස් මහතා**
**(திரு. டீ. வின்சன்ற் டயஸ்)**
**(Mr. D. Vincent Dias)**

පාර්ලිමේන්තු දෙකක්. නොයෙකුත් ප්‍රකාශයන් කරනවා. අන්තිමට ඒවා සම්බන්ධව සාකච්ජා කර තීරණ ගන්නේ මේ පාර්ලිමේන්තුවේදීයි. පාර්ලිමේන්තුවෙන් පිටස්තර රැස්වීම්වල, අරහේ මෙහේ කවුරු මොනවා ප්‍රකාශ කළත්, මන්ත්‍රීවරු හැටියට අපි සියලුදෙනාටම මේ රට වෙනුවෙන් වගකීමක් ඉෂ්ට කරන්න තිබෙනවා. තමුන් මන්ත්‍රීවරු හැටියට අපි 168 දෙනාට මහජනතාව වෙනුවෙන් මේ ප්‍රශ්නය විසඳීමට තිබෙන වගකීම ගැන මහරගම ගරු මන්ත්‍රීතුමා බයක් ඇති කරගන්න වුවමනාවක් නැහැ. පාර්ලිමේන්තුවේ මේ සභා ගර්භය තුළින් අපේ අවසාන තීරණය අරගෙන ජනතාව අතරට යනවාය කියන එක තමුන්නාන්සේ දැනගන්න ඕනෑ. ඒ නිසා අනිසි බියක් ඇති කරගන්න වුවමනාවක් නැහැ. ගිනිදැල් නැග නැග බුර බුරා තිබෙන මේ ප්‍රශ්නයට තව තවත් ඉන්ධන දමා වැඩි කරන්නට නොවෙයි අපට වුවමනා කරන්නේ. ජාතියට ආදරය තිබෙනවා නම්, ආගමක් ගැන හැක්කුමක් තිබෙනවා නම් ලොකුවට කෑ ගසා, පත්‍රවලට ලොකු ප්‍රකාශ දී, මහජනතාව කුලප්පු කර මේ ප්‍රශ්නය විසඳන්න පුළුවන්කමක් නැහැ. ඒ ප්‍රශ්නයට විසඳුම තිබෙන්නේ අපි අතරේ, අපේ හැසිරීම තුළ, අපේ අදහස්—සංකල්ප—තුළ බව ප්‍රකාශ කරන්න ඕනෑ. අපේ අදහස්—අපේ සංකල්ප—මේ රටේ ජීවත්වන සුළු ජනතාව පිළිගන්නා තරමට අප පොහොසත් වුණොත් අන්න එතැනයි මේ ප්‍රශ්නයට විසඳුම තිබෙන්නේ කියා මම මහරගම ගරු මන්ත්‍රීතුමාට පෙන්වා දෙන්න කැමතියි. ඒ නිසා අනිසි බියක් ඇති කරගන්න වුවමනාවක් නැහැ.

ගරු සභාපතිතුමනි, මගේ ආසනය ගැන කල්පනා කර බලන විට දහම් පාසල් 30ක් බදුල්ල ආසනයේ තිබෙනවා. තමුන්නාන්සේගේ අමාත්‍යාංශය යටතේ බදුලු දිස්ත්‍රික්කයේම දහම් පාසල් 500ක් තිබෙනවා. මේ දහම් පාසල්වල අඩුපාඩු ගැන අපි විටින්විට සාකච්ජා කරනවා. තමුන්නාන්සේගේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අමාත්‍යාංශයෙන් දෙන්න පුළුවන් හැම සහයෝගයක්ම මේවාට ලබාදෙනවා. විශේෂයෙන්ම මගේ ආසනයේ දහම් පාසල් තිබෙන්නේ ඉතාමත් දුප්පත් පන්සල්වල පොල් අතු මඩුවලයි. එහෙම නැත්නම් අවුරුදු ගණනක් දිරා ගිය ශාලාවල්වලයි. මේ විධියේ තත්ත්වයකුයි තිබෙන්නේ. මේ දහම් පාසල්වල අඩුපාඩු ගැන කල්පනා කලාම, පුටු බංකු ආදී දේවල්වල විශාල අඩුවක් තිබෙනවා. දහම් පාසල් ගුරුවරු එන්නේ හැතැප්ම හතර පහ, හත අට මග ගෙවා ගෙනයි. උදේ අටේ සිට දහවල් දොළහ නැත්නම් පස්වරු එක දක්වා මේ දහම් පාසල් පවත්වනවා. මේ ගුරුවරුන්ට ගෙවීමක් නැහැ. තේ කෝප්පයක් බොන්න තරම්වත් ගාස්තුවක් හෝ විශේෂ දීමනාවක් ලැබෙන්නේ නැහැ.

අ. භා. 3.30

අපේ සංස්කෘතිය ආරක්ෂා කර ගන්න ඕනැය කියා අපි අපේ ශිරිය පුප්පාගෙන කෑ ගහනවා. අපේ සංස්කෘතිය ආරක්ෂා කරන්න ඕනැ නම් අපි ආගම රකින්න ඕනැ. මොකක්ද අපේ සංස්කෘතිය කියන්නේ ? අපට ආවේණිකව තිබෙන අපේ ශිෂ්ටාචාරය, අපේ ආගම, අපි දායාදය කොට තිබෙන අපේ පුරාවස්තු ආදිය තමයි අපේ සංස්කෘතිය කියන්නේ. ඒ සංස්කෘතිය ආරක්ෂා වන්නේ කා අතින්ද ? අපේ අනාගත පරපුර අතින් තමයි අපේ සංස්කෘතිය ආරක්ෂා වන්නෙ. එහෙම නම් අපේ අනාගත පරපුර ආරක්ෂා කිරීමේ වැඩපිළිවෙළේ පදනම සකස් වෙන්න ඕනැ මේ දහම් පාසල්වලින්. ඒ සම්බන්ධව අපි කොපමණ කරුණු ඉදිරිපත් කළත් ක්‍රමානුකූලව ඒවා කෙරෙන්න නැති බව මම මතක් කරනවා.

තමුන්නාන්සේට පුළුවන් ආධාර තමුන්නාන්සේ දෙනවා. නමුත් අපට බැහැ අපේ විමධ්‍යගත අයවැයෙන් මුදල් දෙන්න. ඒ මොකද ? මෙම දහම් පාසල් පන්සල්වල පෞද්ගලික ගොඩනැගිලිවල පවත්වාගෙන යන ඒවා නිසා. ඒ නිසා අපට නීතියෙන් ඉඩක් ලබා දෙන්න ඒවාට ආධාර කරන්න. අපේ දිස්ත්‍රික් සංවර්ධන සභා මගින්වත් මුදලක් වෙන් කරන්න පුළුවන්ද කියා මම ඇමතිතුමාගෙන් දැන ගන්න කැමතියි. පළාත් පාලන ඇමතිතුමා සමග සාකච්ඡා කර, සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශයත් එක්ක සාකච්ඡා කර—

**ඊ. එල්. බී. හුරුල්ලේ මහතා**
(திரு. ஈ. எல். பி. ஹுருள்ளே)
**(Mr. E. L. B. Hurulle)**
ආධාර මුදලක් දෙන්න පුළුවන්.

**ඩබ්ලිව්. එම්. ජී. ටී. බණ්ඩා මහතා**
(திரு. டபிள்யு. எம். ஜீ. ரீ. பண்டா)
**(Mr. W. M. G. T. Banda)**
විමධ්‍යගත අයවැයෙන් දෙන්න පුළුවන්.

**ජී. වී. එස්. ද සිල්වා මහතා (හබරාදූව)**
(திரு. ஜீ. வீ. எஸ். த சில்வா — ஹபருதுவ)
(Mr. G. V. S. de Silva – Habaraduwa)
මම රුපියල් 10,000ක් දී තිබෙනවා.

**ඩී. වින්සන්ට් ඩයස් මහතා**
(திரு. டீ. வின்சன்ற் டயஸ்)
**(Mr. D. Vincent Dias)**
බදුල්ල දිස්ත්‍රික්කයේ අපි තවම දන්නෙ නැහැ. අපේ ඌව පළාතට දනුම් දෙන්න ඕනැ.

**ඩබ්ලිව්. එම්. ජී. ටී. බණ්ඩා මහතා**
(திரு. டபிள்யு. எம். ஜீ. ரீ. பண்டா)
**(Mr. W. M. G. T. Banda)**
දැන් අවුරුද්දක් පමණ වෙනවා.

**ඩී. වින්සන්ට් ඩයස් මහතා**
(திரு. டீ. வின்சன்ற் டயஸ்)
**(Mr. D. Vincent Dias)**
අවුරුද්දක් වුණත් දෙකක් වුණත් නියෝජ්‍ය ඇමතිතුමනි. බදුල්ලේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා හැටියට මම මේ ගැන දන්නෙ නැති බවයි මම කියන්නෙ. තමුන්නාන්සේ ඒක පිළිගන්න ඕනැ. විමධ්‍යගත අයවැයෙන් දහම් පාසල් දියුණුවට මෙන්න මේ විධියේ ආධාර ප්‍රමාණයක් දෙන්න පුළුවන් කියා චක්‍රලේඛයක් යවන්න තමුන්නාන්සේ පියවර ගන්න ඕනැ.

**ඩබ්ලිව්. එම්. ජී. ටී. බණ්ඩා මහතා**
(திரு. டபிள்யு. எம். ஜீ. ரீ. பண்டா)
**(Mr. W. M. G. T. Banda)**
මෙය කැබිනට් මණ්ඩලයේ තීරණයක්.

**ඩී. වින්සන්ට් ඩයස් මහතා**
(திரு. டீ. வின்சன்ற் டயஸ்)
**(Mr. D. Vincent Dias)**
කැබිනට් මණ්ඩලය දැනගන්නට අපි දන්නෙ නැහැ නේ ? ඒකයි නියෝජ්‍ය ඇමතිතුමනි, මම කියන්නේ.

ඊළඟට නිදහස් ගමන් බලපත්‍ර දීම. මේ බලපත්‍ර මාස හයෙන් හයට අලුත් කරන පිළිවෙළක් තිබෙන්නෙ. හය මාසය අවසානයේදී එය නැවත අලුත් කරගන්න ගිය විට ඒ සඳහා තවත් තුන් මාසයක් පමණ ගත වෙනවා. අඩු ගණනේ ඒ නිදහසේ ගමන් කරන්න තිබෙන අවස්ථාවෙන්වත් ඔවුන්ට ප්‍රයෝජනයක් ගන්නට ඉඩක් නොලැබ යනවා. එමනිසා හය මාසය ඉකුත් වීමට ප්‍රථම, එහෙම නැත්නම් ඊළඟ හය මාස කාලය ආරම්භ වනවාත් සමගම නොකඩවා ගමන් කිරීමට අවස්ථා සැලසෙන පරිදි ගමන් බලපත්‍රය අලුත් කර දීමේ වැඩපිළිවෙළක් සකස් විය යුතු බව මම ගරු ඇමතිතුමාගේ අවධානයට යොමු කරනවා.

අපේ දිස්ත්‍රික්කයේ දහම් පාසල් ගුරුවරුන් 500ක් ඉන්නවා. ලක්ෂ ගණනක් විශාල ශිෂ්‍ය සංඛ්‍යාවක් ඉන්නවා. මේ අවස්ථාවේදී මම ගරු ඇමතිතුමාගේ සැලකිල්ලට යොමු කරන්න කැමතියි, අපේ සංස්කෘතිය පිළිබඳ අධ්‍යයනයක් කිරීමට, ඒ වාගේම වෙනත් වෙනත් පාඨමාලා ක්‍රමයකින් දේශනවලට සවන් දීමට ඉඩ ලැබෙන සංස්කෘතික මධ්‍යස්ථානයක් බදුල්ල දිස්ත්‍රික්කයේ නැති බව. විශේෂයෙන් ඌව පළාතේ කේන්ද්‍රස්ථානය වන බදුල්ල නගරයේ සංස්කෘතික මධ්‍යස්ථානයක් පිහිටුවීම ගැන ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරන්නය කියා මම ඉල්ලනවා. ඒ සඳහා අවශ්‍ය ඉඩකඩ දෙන්න මම ලෑහැස්තියි.

1984 තමුන්නාන්සේලා දහම් පාසල් පොත් බෙද හැරියා. නමුත් ශ්‍රේණි කීපයකට පොත් ලැබුණේ නැහැ. ඒ නිසා බෞද්ධ කොමසාරිස්තුමා මගින් මේ ගැන පරීක්ෂා කර බලා 1985 වර්ෂයේ නියම විධියට ඒ ඒ ශ්‍රේණිවලට දහම් පාසල් පොත් ලබා දෙන්නය කියලා මම ඉල්ලනවා. ඒ මොකද ? මෙම පොත් ඔවුන්ට ලැබුණේ නැත්නම් දහම් පාසල් විභාගයට නියමිත කරුණු අධ්‍යයනය කර ගැනීමට නොහැකි වීම නිසා ඔවුන් මහත් අසීරු තත්ත්වයකට පත් වෙනවා.

අපේ සංස්කෘතික ඇමතිතුමා අපේ සංස්කෘතික දායාදයන් ගැන කථා කරනවා. නමුත් සංස්කෘතික දායාදයන් ආරක්ෂා කරන්න ඉන්න තරුණ පරපුරට, විශේෂයෙන් පාසල් යන දරුවන්ට අපේ සංස්කෘතිය පිළිබඳව අධ්‍යයනය කරන්න ඇතිකර තිබෙන මාර්ග මොනවාද කියලා අපි දැන ගන්න කැමතියි. මට නම් පේන්නෙ නැහැ එවැනි මාර්ග තිබෙනවාය කියා. නමුත් ඉන්දියාව වැනි රටවල් ගැන බලන විට ඉන්දියාවේ බෞද්ධ සිද්ධස්ථාන හා පුරාවස්තු පිළිබඳ විස්තර, ඒ රටේ සිටි රජදරුවන් පිළිබඳ විස්තර, නොයෙක් ඓතිහාසික සිද්ධීන් පිළිබඳ විස්තර වීඩියෝ ගත කිරීමෙන්, චිත්‍රපට ගත කිරීමෙන් ඒවා සංචාරකයන්ටත්, අධ්‍යයනය කරන්නන්ටත් බලාගන්නට පුළුවන් වැඩපිළිවෙළවල් සකස් කර තිබෙනවා. නමුත් ලංකාවේ තවම එවැනි දෙයක් නැහැ. තමුන්නාන්සේ සීගිරියේ එවැනි වැඩපිළිවෙළක් ආරම්භ කළා. මා දන්නෙ නැහැ දැන් එය පවත්වාගෙන යනවද කියල. නමුත් මේ වැඩපිළිවෙළ ප්‍රමාණවත් මදි. මේ වැඩපිළිවෙළ තවත් පුළුල් වෙන්න ඕනැ. අපේ සංස්කෘතික අධ්‍යාපන ක්ෂේත්‍රයේ අනිවාර්යෙන්ම ක්‍රියාත්මක විය යුතු වැඩපිළිවෙළක් මෙය.

අපේ රටට, අපේ ජාතියට තර්ජන එල්ල වී තිබෙන මේ අවස්ථාවේදී අපේ සංස්කෘතිය, අපේ සංස්කෘතියේ ඉතිහාසය වැළලෙන්නට ඉඩ දෙන්න බැහැ. අපේ සංස්කෘතියේ ඉතිහාසය වැළලෙන්නට නොදී, බාල පරම්පරාව තුළ අපේ සංස්කෘතියේ ඉතිහාසය පිළිබඳව හැඟීම් උපද්දවන්න පුළුවන් වන්නේ ඔවුන්ට ලබාදෙන අධ්‍යයනය තුළින් පමණයි. නමුත් අධ්‍යයනය ක්‍රමානුකූලව කරන්නේ නැති බව කණගාටුවෙන් වුවත් මම මතක් කළ යුතුයි. සංස්කෘතික දෙපාර්තමේන්තුව මේ පිළිබඳව සකස් කරන වැඩපිළිවෙළ මොකක්ද ? සංස්කෘතික දෙපාර්තමේන්තුව මේ පිළිබඳව ඇතිකර තිබෙන පුළුල් සැලැස්ම මොකක්ද ? අපි එය දැන ගැනීමට සතුටුයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩී. වින්සන්ට් ඩයස් මහතා]

මේ විෂයය ඉතා වැදගත් විෂයයක්. අද අපේ රටට එල්ල වී තිබෙන තර්ජන ගැන කල්පනා කර බලනවිට, මේ ක්ෂේත්‍රයට, මේ වැඩපිළිවෙළට ප්‍රමුඛත්වය දිය යුතුව තිබෙනවා. මොකද, අනාගතයේදී වගකීම් භාරගන්න ඉන්න පරපුරට මේ පිළිබඳව අධ්‍යයනයක් ලබාදීම ඉතාමත් වැදගත් වෙනවා. එමනිසා ඒ සඳහා වැඩපිළිවෙළක් සකස් විය යුතු බව මා මේ අවස්ථාවේදී මතක් කර දෙන්න කැමතියි.

රූපවාහිනී වැඩසටහන් පිළිබඳවත් යමක් කිවයුතුයි. මම දන්නේ නැහැ අනෙක් අයගේ අදහස් කොහොමද කියලා. මගේ පෞද්ගලික අදහසයි මම ඉදිරිපත් කරන්නේ. රූපවාහිනියෙන් භික්ෂූන් වහන්සේලාගේ චරිත නිරූපනය කරමින් රඟපාන අය, එම චරිත රූපවාහිනී චිත්‍රපට ජනප්‍රිය කර ගැනීමට මාධ්‍යයක් කරගෙන තිබෙනවා.

**ඩබ්ලිව්. පී. බී. දිසානායක මහතා (මහනුවර දිසා ඇමතිතුමා)**
**(திரு. டபிள்யு. பீ. பி. திஸாநாயக்க — கண்டி மாவட்ட அமைச்சர்)**
**(Mr. W. P. B. Dissanayake - District Minister, Kandy)**

ඒ රඟපාන්නේ, සංඝයා වහන්සේගෙන්, නායක හාමුදුරු කෙනෙකුගෙන් සිවුරු ලබාගත් උදවිය නොවෙයි. තිකම් මිනිස්සු කොණ්ඩේ බූ ගාගෙන සිවුරු දමාගෙන රඟපාන්නෙ. මේක මහ නිග්‍රහයක්.

**ඩී. වින්සන්ට් ඩයස් මහතා**
**(திரு. டீ. வின்சன்ற் டயஸ்)**
**(Mr. D. Vincent Dias)**

තිකම් නළුවෝ කොණ්ඩ බූ ගාගෙන, සිවුරු පොරවාගෙන භික්ෂූන් වහන්සේලාගේ චරිත රඟපානවා රූපවාහිනියෙන්. රූපවාහිනියෙන් පෙන්වන ඒ නාට්‍යවල භික්ෂූන් වහන්සේගේ චරිතය රඟපාන මනුෂ්‍යයාගේ කථා විලාශය, ඒ මනුෂ්‍යයාගේ හැසිරීම, ඒ මනුෂ්‍යයාගේ අනිකුත් කටයුතු භික්ෂූන් වහන්සේ කෙනෙකුට වඩා සම්පූර්ණයෙන් වෙනස්. [බාධා කිරීමක්]

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
(Mr. Lakshman Jayakody)

එහෙම නම්, සිරිසඟබෝ නාට්‍ය රඟපාන්න බැහැ. අර තෙරුන් වහන්සේ එතන ඉන්න ඕනැමයි.

**ඩබ්ලිව්. පී. බී. දිසානායක මහතා**
**(திரு. டபிள்யு. பீ. பி. திஸாநாயக்க)**
**(Mr. W. P. B. Dissanayake)**

නාට්‍යයකට වඩා අපට අපේ ආගම වටිනවා.

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
(Mr. Lakshman Jayakody)

ඒක ඇත්ත වෙන්න පුළුවන්. එවිට භික්ෂු චරිත එකක්වත් නාට්‍යවල දමන්න බැහැ.

**ඩී. වින්සන්ට් ඩයස් මහතා**
**(திரு. டீ. வின்சன்ற் டயஸ்)**
**(Mr. D. Vincent Dias)**

අත්තනගල්ලේ ගරු මන්ත්‍රීතුමාට මම කියලා දෙන්නම්, ඒ චරිත නාට්‍යවලට දමන හැටි. මම නැරඹුවා ඉන්දියාවේ තෙළඟු නාට්‍යයක්. එහි මම දැක්කා, ඒ ප්‍රධාන නිළිය අපේ සම්මා සම්බුද්ධරජාණන් වහන්සේට වන්දනා කරන්න ඒ පන්සලට පිවිසෙනවා. නමුත් මොන විධියකින්වත් බුදුරජාණන් වහන්සේගේ ප්‍රතිරූපය ඒ තිරයේ මවා පෑවේ නැහැ. තිරයේ පෙන්නුවේ නැති වුණත් එය අපේ හදවතට පෙන්නුවා. කිසිම විටක භික්ෂූන් වහන්සේ නමකගේ චරිතයක් චිත්‍රපටයක පෙන්වන්නේ නැහැ.

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
(Mr. Lakshman Jayakody)

බුදු හාමුදුරුවන්ගේ චරිතය හැර භික්ෂූන් වහන්සේ නමකගේ චරිතයක් පෙන්නුවාට වරදක් නැහැ. ඒ චරිත පෙන්වන හැම අවස්ථාවකදීම අපි මහානායක ස්වාමීන් වහන්සේලාගෙන් අවසර අරගෙන තිබෙනවා. හැබැයි, බුදුරජාණන් වහන්සේගේ චරිතය පෙන්වන්න බැහැ. [බාධා කිරීමක්]

**ඩී. වින්සන්ට් ඩයස් මහතා**
**(திரு. டீ. வின்சன்ற் டயஸ்)**
**(Mr. D. Vincent Dias)**

අත්තනගල්ලේ ගරු මන්ත්‍රීතුමා, ඔය කියන කථාවෙන් අර 1956 දී සිවුරු පෙරවූ කථාව තමයි. රූපවාහිනියෙන් රඟපානවා වාගේ සිවුරු දමාගෙන අනිත් වැඩත් පටන් ගනියි.

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
(Mr. Lakshman Jayakody)

මේ ගරු සභාවේ ඉන්න හොඳම නළුවා තමයි මේ දිසා ඇමතිතුමා. තමුන්නාන්සේලා දන්නේ නැහැ එතුමාගේ ඉතිහාසය.

**මන්ත්‍රීවරයෙක්**
**(அங்கத்தவர் ஒருவர்)**
**(A Member)**

අයි, අම්බලන්ගොඩ මන්ත්‍රීතුමා ?

**ඩී. වින්සන්ට් ඩයස් මහතා**
**(திரு. டீ. வின்சன்ற் டயஸ்)**
**(Mr. D. Vincent Dias)**

ගරු සභාපතිතුමනි, භික්ෂූන් වහන්සේගේ චරිතයත්, මොන තරම් පවිත්‍ර, මොන තරම් පිරිසිදු, සංවරයක් තිබෙන චරිතයක්ද ? අපි ගිහිත් අත් දෙක එක් කොට භික්ෂූන් වහන්සේ නමකට වඳින්නේ බුදු හාමුදුරුවන් වහන්සේ සිහිපත් කරලයි. ඒ නිසා අපි මෙහිදී මතක තබා ගන්න ඕනෑ, භික්ෂූන් වහන්සේ නමක්ය කියන්නේ මොන තරම් පිරිසිදු, නොකැලැල්, නොකිළිටි චරිතයකටද කියා. එහෙම තත්ත්වයක් තිබෙද්දී උපසම්පදාව නොලැබූ කෙනෙක්, ගිහියෙක් භික්ෂූන් වහන්සේ නමක් විධියට සිවුරු පොරවා ගෙන රූපවාහිනියේ රඟපානවා නම්, ඒ සඳහා අවසර තිබෙනවා නම් අර උතුම් භික්ෂු චරිතයේ තිබෙන වටිනාකම මොකක්ද කියා මම අහන්න කැමතියි. සිරිසඟබෝ නාට්‍යය මෙතැනට අදාළ වන්නේ නැහැ. ඒ නිසා මේ කාරණය ගැන සංස්කෘතික අමාත්‍යාංශය රාජ්‍ය අමාත්‍යාංශයත් සමඟ සාකච්ඡා කොට, මින් ඉදිරියට එවැනි දේකට අවස්ථාව නොලැබෙන විධියට කටයුතු කළ යුතු බව පෙන්වා දෙන්න කැමතියි.

ඒ අතර මම දැක තිබෙනවා, ඇතැම් චිත්‍රපටවල මල් පූජා කරන දර්ශන, බොහොම භක්තිවන්තව ආගම අදහන දර්ශන පෙන්වන විට බුදු හාමුදුරුවන් වහන්සේගේ තබා කිසිම භික්ෂූන් වහන්සේ නමකගේවත් ප්‍රතිරූපය ඒ චිත්‍රපටයේ මවා පාන්නේ නැතිව, ඒ වෙනුවට වෙනත් ආකාරයකින් ප්‍රේක්ෂකයාගේ හදවත තුළ භක්තියක් ඇති වන විධියට ඒ දර්ශන පෙන්වන හැටි. ඒ තුළින් ප්‍රේක්ෂකයාගේ හදවත තුළ, භික්ෂු චරිතය පිළිබඳව කොයි තරම් ගරුත්වයක් ඇති කරනවාද ? ඇයි, ඒ විධියට රූපවාහිනියටත් ඒ දර්ශන පෙන්වන්න බැරි ? අපේ රූපවාහිනිය බොහොම බාල විධියට, අපේ භික්ෂූන් වහන්සේලාට ඉතාමත් අගෞරව වන විධියට භික්ෂු චරිතය කිළිටි කර දමා තිබෙනවා. අන්න ඒ ගැනයි, අපේ විරුද්ධත්වය ප්‍රකාශ කරන්නේ. රූපවාහිනියේ ඇතැම් භික්ෂු චරිත පෙන්වන විට ඒ චරිත රඟපාන ගිහියන් නොයෙකුත් විධියේ දෙබස් උච්චාරණය කරනවා. ඒ ඇතැම් දෙබස් අපේ සංස්කෘතිය අනුව කිසිසේත් භික්ෂු චරිතයකට ගැලපෙන්නේ නැහැ. ඒ නිසයි අපි ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටින්නේ මේ සම්බන්ධයෙන් රාජ්‍ය අමාත්‍යාංශයත් සමඟ සාකච්ඡා කොට, රූපවාහිනී වැඩ සටහන් තුළින් එවැනි චරිත පෙන්වන විට සුපරීක්ෂාකාරීව වන විධියට වැඩ පිළිවෙළක් සකස් කරන්නය කියා.

ගරු ඇමතිතුමා අපේ විහාර ප්‍රතිසංස්කරණය කිරීම පිණිස බොහොම සුළු මුදලක්—රුපියල් 2,000ක් වගේ මුදලක්—අපට ලබා දෙනවා. දහම් පාසල් කටයුතු ආදිය සඳහා විමධ්‍යගත අයවැයෙන් මුදල් වෙන් කිරීමට අවසර දෙමින් චක්‍රලේඛයක් යවනවායයි නියෝජ්‍ය ඇමතිතුමා කලින් ප්‍රකාශ කළා. සංවර්ධන සභා අරමුදල්වලින් අපේ විහාරස්ථාන ප්‍රතිසංස්කරණය කර ගන්න අවසර ලැබෙන චක්‍රලේඛයක් හැම දිස්ත්‍රික් සංවර්ධන සභාවකටම ලැබුණා. ඒ අනුව අපි සංවර්ධන සභාවේදී විශේෂයෙන් මහියංගන පූජා නගර වැඩපිළිවෙළ ගැන සාකච්ඡා කළා. ඒ සඳහා සංවර්ධන සභා අරමුදල් පාවිච්චි කරන්න අපි අගමැතිතුමාගෙන් විශේෂ අවසරයක් ලබා ගත්තා. ඒ විධියට අපේ විමධ්‍යගත අයවැයේ මුදලුත් අපේ විහාර දේවාල ප්‍රතිසංස්කරණය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සඳහා පාවිච්චි කරන්න අනුමැතිය තිබෙනවාද කියා ගරු ඇමතිතුමාගෙන් දැන ගන්න කාමතියි. අපේ දිස්ත්‍රික්කයේ තිබෙන සාංස්කෘතික දායාදයන් විනාශ වන්න ඉඩ නොදී අපේ සම්පත් පාවිච්චි කොට අපේ අනාගත පරම්පරාව සඳහා ඒවා ආරක්ෂා කර දීම අපේ යුතුකමක්. ඒ නිසා අපේ විමධ්‍යගත අයවැය මුදල් පාවිච්චි කොට අපේ විහාර දේපොළ ප්‍රතිසංස්කරණය කිරීමේ වැඩ පිළිවෙළක් සකස් කරන්න පුළුවන්ද කියා මම දැන ගන්න කැමතියි. ඒ සඳහා නීතිමය අවසරය ලබා දෙන හැටියට ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටින අතර මට මේ අවස්ථාව ලබා දීම ගැන ගරු සභාපතිතුමාට ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා.

**කළුබණ්ඩා රත්නායක මහතා** (පඩුවස්නුවර)
(திரு. கலுபண்டா ரத்நாயக்க — பண்டுவஸ்நுவர)
**(Mr. Kalubanda Ratnayake – Panduvasnuwara)**

ගරු සභාපතිතුමනි, සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ වැය ශීර්ෂය යටතේ වචන ස්වල්පයක් කථා කිරීමට අවස්ථාව ලැබීම ගැන මම බොහොම සන්තෝෂ වෙනවා. මම මේ අමාත්‍යාංශයේ උපදේශක කාරක සභාවේ ඉන්න නිසා දන්නවා, අපේ ගරු ඇමතිතුමාත්, නියෝජ්‍ය ඇමතිතුමාත්, අමාත්‍යාංශයේ ලේකම්තුමා සහ ඒ ඒ දෙපාර්තමේන්තු ප්‍රධානීන් ප්‍රමුඛ කාර්ය මණ්ඩලයත් අපේ සංස්කෘතික දායාදයන් ආරක්ෂා කර ගැනීමට, දියුණු කිරීමට කොයි තරම් වෙහෙස - මහන්සියක් දරනවාද කියා අත්තනගල්ලේ ගරු මන්ත්‍රීතුමාත් (ලක්ෂ්මන් ජයකොඩි මහතා) ඒ උපදේශක කාරක සභාවේ සාමාජිකයෙක්. එතුමාත් බොහොම වටිනා අදහස් ඉදිරිපත් කරනවා.

ඇත්ත වශයෙන්ම කියනවා නම් මීට ඉහත තිබුණු කිසිම රජයකට වඩා අපේ වර්තමාන රජයෙන් අපේ සංස්කෘතික දායාදයන් ආරක්ෂා කිරීමට, අපේ සංස්කෘතිය දියුණු කිරීමට විශාල ධනස්කන්ධයක් වියදම් කරන බව පෙන්වා දෙන්න කැමතියි. අපේ අතිගරු ජනාධිපතිතුමාණෝ මේ රටේ මුදල් පමණක් නොවෙයි, පිටරට මුදල්ද ලබාගෙන මේ පුරාවස්තු ආරක්ෂා කිරීම හා සංස්කෘතිය දියුණු කිරීම පිළිබඳව විශාල ව්‍යාපාරයක් ආරම්භ කළා කියන එක කවුරුත් දන්නවා. ඇත්ත වශයෙන්ම අද අනුරාධපුරයේ, ජේතවනාරාමය, මිරිසවැටිය, සීගිරිය හා පොළොන්නරුවේ ආලාහන පිරිවෙන ආදී විශාල නටඹුන් පදගෙන ඒවා දියුණු කර තිබෙන්නේ මා කලින් කී ක්‍රමයට මුදල් ලබාගෙනයි. එමෙන්ම මේ රජයේ සංස්කෘතික කටයුතු ඇමති ඊ. එල්. බී. හුරුල්ලේ මැතිතුමා මේ කටයුත්තට ඉතා දක්ෂ කෙනෙක් බවත් මම කියන්නට කැමතියි. බුද්දහම දියුණු කිරීමට, සංස්කෘතිය දියුණු කිරීමට හා පුරාවස්තු සොයා ගැනීමට මහන්සි ගැනීම එතුමා බොහොම ආදරයෙන් කරන කාර්යයක්. අද එතුමා කෙරෙහි මහා සංඝරත්නය විශාල පැහැදීමකින් සිටිනවා කියන එකත් අපි දන්නවා.

බොහොම කාලයක් තිස්සේ පැවැති මෙම් රටේ දහම් පාසල්වලට රජයෙන් කිසිම ආධාරයක් ලැබුණේ නැහැ. එහෙත් මෙතුමාගේ හා මේ රජයේ අනුග්‍රහයෙන් අද මේ රටේ තිබෙන සියළුම දහම් පාසල්වලට නොමිලේ පොත්පත් සපයනවා. එමෙන්ම ඒවා පිළිසකර කිරීමටත් සෑහෙන මුදලක් ලබා දෙනවා. කලින් කථා කළ අපේ ගරු දිසා ඇමතිතුමා කිව්වා වගේ අඩුපාඩුවකට තිබෙනවා නම් තිබෙන්නේ ඒවායේ ගුරුවරුන් හැටියට සේවය කරන අයට වේතනයක් නොලැබීම පමණයි. ඉදිරි . අනාගතයේදී ඒ කාරණයත් ඉටු කරන්නට අපි බලාපොරොත්තු වෙනවා. එතුමා කටයුතු කරන්නේ බෞද්ධාගම දියුණු කිරීමට පමණක් නොවෙයි. අන්‍ය ආගම්වල සංස්කෘතික කටයුතු දියුණු කිරීමටත් විශාල වශයෙන් වියපැහැදම් කරන බවත්, උත්සාහ ගන්නා බවත් මම මේ සභාවේදී මතක් කරන්නට ඕනෑ.

මගේ ආසනය පඩුවස්නුවර රාජධානියයි. එය පළමුවන රාජධානිය බව මම මතක් කරනවා. [බාධා කිරීමක්] ඒ ගැන හිනා වෙනවා නම් එසේ හිනාවන මන්ත්‍රීවරු ඒ ගැන නොදන්නවා යයි මම හිතනවා. රජවරු 4 දෙනෙක් පඩවස්නුවර රාජ්‍යය කළා. විජය රජතුමා, පඩුවස් දෙව් රජතුමා, පරාක්‍රමබාහු රජතුමා හා නිශ්ශංකමල්ල රජතුමා ඒ රජවරුන් 4 දෙනායි. ඒ හිනාවූ මන්ත්‍රීවරු දන්නේ නැත්තම් දැන ගන්න. එය රාජධානියක් යයි මම කීවේ ඒ නිසයි. තමුන්නාසේලා ඇවිත් බලන්න. පරාක්‍රමබාහු රජතුමගේ මාළිගය අක්කර 22 ක් මැදයි තිබෙන්නේ. එවැනි ඉතාම ලස්සන මාළිගා ලංකාවේ තිබෙන්නේ ටිකයි. එය ලංකාවේ තිබෙන අංගසම්පූර්ණ රජ මාළිගයක් බව මට කියන්ට පුළුවන්. ඇත්තෙන්ම මේ රජය ඇති වුණාට පසුවයි, පඩුවස්නුවර කියා එකක් මේ රටේ ප්‍රසිද්ධ වුණේ.

අපේ අතිගරු ජනාධිපතිතුමාගේ මූලිකත්වයෙන් පළමු වන වරට වප් මඟුල ආරම්භ වුණේ පඩුවස්නුවර ආසනයේයි. ලංකාවේ සෑම ප්‍රදේශයකින්ම ලක්ෂ ගණන් ජනතාව ඒ වප් මඟුල බලන්නට ගියා. ඒ අවස්ථාවේ එහි විහාරස්ථානයටත් ගියා. [බාධා කිරීමක්] ඒක අපේ ගරු කථානායකතුමා ආරම්භ කළ එකක්. මම එය බොහොම සන්තෝෂයෙන් මතක් කරනවා. එතනින් තමයි, පඩුවස්නුවර ගැන සෑහෙන ප්‍රචාරයක් මේරටේ ඇති වුණේ. ඒ පිළිබඳව මම මේ අවස්ථාවේ අපේ ගරු කථානායකතුමාට ස්තුතිවන්ත වෙනවා. එතුමා බොහොම මහන්සි ගත්තා, ඒ වප් මඟුල ප්‍රථම වරට දියත් කරන්නට.

**සභාපතිතුමා**
(தலைவர்)
(The Chairman)

අනුරාධපුරයටත් වඩා පැරණි ඉතිහාසයක් තමයි, පඩුවස්නුවරට තිබෙන්නේ.

**කළුබණ්ඩා රත්නායක මහතා**
(திரு. கலுபண்டா ரத்நாயக்க)
**(Mr. Kalubanda Ratnayake)**

තමුන්නාන්සේ කරුණාකර හිනාවෙන අයට ඕක කියන්න. එහෙනම් බොහොම වැදගත්. විහිළු තහළු කරන්නේ ඒ අයයි. ඒ නිසා කරුණාකර ඒ අයට කියන්න. (බාධා කිරීමක්] ඕනෑනම් ඉතිහාසය කියන්න පුළුවන්. එයට කාලය නැහැ.

එච්. බී. අබේරත්න මහතා (නියෝජ්‍ය ගමනාගමන මණ්ඩල ඇමතිතුමා)
(திரு. எச். பி. அபேரத்ன — போக்குவரத்துச் சபைகள் பிரதி அமைச்சர்)
(Mr. H. B. Abeyratne – Deputy Minister for Transport Boards)

මේ අය රාජධානි ගැන දන්නේ නැහැ. ඒකයි ප්‍රශ්නය. යාපහුවත් රාජධානියක් ; පඩුවස්නුවරත් රාජධානියක්.

**කළුබණ්ඩා රත්නායක මහතා**
(திரு. கலுபண்டா ரத்நாயக்க)
**(Mr. Kalubanda Ratnayake)**

කරුණාකර එය ගරු කථානායකතුමාට කියන්න.

**ආර්. එම්. අබේකෝන් මහතා (මොණරාගල දිසා ඇමතිතුමා)**
(திரு. ஆர். எம். அபேகோன் — மொனறாகல மாவட்ட அமைச்சர்)
**(Mr. R. M. Abeykoon – District Minister, Moneragala)**

පඩුවස්නුවර කියන්නේ විජය රජු ඉන්දියාවේ සිට පැමිණ අල්ලාගත් ස්ථානයයි. ඒකයි කියන්නේ ඒක එච්චර—

**කළුබණ්ඩා රත්නායක මහතා**
(திரு. கலுபண்டா ரத்நாயக்க)
**(Mr. Kalubanda Ratnayake)**

ගරු සභාපතිතුමනි, ඊට පසුව මේ ස්ථානය තවත් දියුණු වූයේ, තමුන්නාන්සේගේ මූලිකත්වයෙන් ආරම්භ කළ දළද පෙරහැර නිසයි. පඩුවස්නුවර ජනතාව වෙනුවෙන් මම තමුන්නාන්සේටත්, සංස්කෘතික කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමාටත් මේ අවස්ථාවේදී ස්තුතිවන්ත වෙනවා.

මේ ස්ථානය ඉතාම නොදියුණු තත්ත්වයකයි, තිබුණේ. ගරු සභාපතිතුමනි, 1977 ඡන්ද ව්‍යාපාරය කාලයේදී ගරු මුදල් ඇමතිතුමා මගේ ආසනයේ සංචාරය සඳහා යන අවස්ථාවේදී එතුමා ඇමතිවරයෙක් නොවෙයි. එනකොට එක්සත් ජාතික පක්ෂය මහ මැතිවරණයට තරග කරන වෙලාව. මේ අවස්ථාවේදී එතුමා මට කිව්වා, මේ මාළිගාව බලන්න යන්න ඕනෑය කියා. ඒ අනුව මම එතුමා සමඟ ඒ මාළිගාවට ගියා. එද මම එතුමාට කිව්වා "එක්සත් ජාතික පක්ෂය මෙවර දිනනවා. තමුන්නාන්සේ ඇමතිවරයෙක් වෙනවා. ඒක ගැන කිසි සැකයක් නැහැ." කියා. මම කිව්වේ නැහැ, එතුමා මුදල් ඇමති වෙනවා කියා. මම ඒ අවස්ථාවේදී ඉල්ලා සිටියා, මේ රටේ තිබෙන පළමු වැනි රාජධානිය වන මේ ප්‍රදේශය දියුණු කිරීමට හා පූජා නගරයක් කිරීමට ආධාර දෙන ලෙසට.

දැන් මේක කියා අවුරුදු හත අටක් වෙනවා. නමුත් මට ඒ ගැන තවම සතුටුදයක පිළිතුරක් ලැබුනේ නැහැ. මේ ප්‍රදේශය පූජා නගරයක් කිරීම සඳහා අතිගරු ජනාධිපතිතුමා මුල් ගල් තබා දැනට අවුරුදු හතරකටත් වැඩි



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ කළුබණ්ඩා රත්නායක මහතා ]

කාලයක් වෙනවා. මේ සම්බන්ධයෙන් මම ගරු ඇමතිතුමාට මතක් කලා. මම බලාපොරොත්තු වෙනවා නුදුරු අනාගතයේදී ඒ කාරණයත් ඉෂ්ට වේවිය කියා.

අද ඒ ප්‍රදේශයේ සිය දෙනෙක් පමණ කැණීම් පිළිබඳ වැඩ කරනවා. දවසකට විශාල වැඩ කොටසක් ඔවුන් අතින් කෙරෙනවා. වෙහෙර විහාර, චෛත්‍යය, පවුරු ආදී සැම දෙයක් ගැනම කැණීම් කරනවා. අද ඒවා මතු කර තිබෙනවා. නමුත් ඒවා සංරක්ෂණය කර නැහැ. ඒක ලොකු පාඩුවක්. මහ පොළොව යට තිබුණු මේ වස්තුව කවද, හෝ නැති වෙන්න පුලුවන්, තව පිරිසක් ඇති වෙලා. අපේ ගරු ඇමතිතුමාගේ, පුරා විද්‍යා කොමසාරිස්තුමාගේ හා ලේකම්තුමාගේ උද්යෝගය නිසා, ඒ අයගෙන් ලැබුණු සහයෝගය නිසා. මහජනයාට බලා ගැනීමට හැකි වන පරිදි මේ හැම දෙයක්ම දැන් පොළොව මතු පිටට ගෙනැවිත් තිබෙනවා. නමුත් ඒවා සංරක්ෂණය කර නොතිබීම විශාල පාඩුවක්. මම කියන්නේ නැහැ, මෙවැනි පුරා වස්තු පඩුවස්නුවර පමණක් තිබෙනවාය කියා. අනුරාධපුරය, පොළොන්නරුව, සීගිරිය වැනි ස්ථානවලත් මෙවැනි දේ තිබෙන බව අපට කියන්න පුළුවන්.

මේ කටයුතු කිරීම සඳහා අවශ්‍ය මුදල් ප්‍රමාණය සංස්කෘතික ඇමතිතුමාට ලැබෙන්නේ නැහැ. සීමිත මුදල් ප්‍රමාණයක් එතුමාට ලැබෙන්නේ. එමනිසා මේවා දියුණු කිරීමට බැරිවෙයි කියන තත්ත්වයක් පේනවා. මේවා, අපට ඉතාම වටිනා දායාද. මේවා, අපේ සංස්කෘතික වස්තු. මේවා ආරක්ෂා කර ගැනීම සඳහා කටයුතු කිරීමට විශේෂ මුදලක් සංස්කෘතික ඇමතිතුමාට ලබා දෙන ලෙස මම ඉල්ලා සිටිනවා.

ඉතාමත්ම කණගාටුදායක සිද්ධියක් මට මෙහිදී කීමට සිදුවී තිබෙනවා. ගරු සභාපතිතුමනි, දැන් සති දෙක තුනක සිට 900ක් පමණ පිරිසකට රක්ෂාව නැතිවී තිබෙනවා. මේ පිරිස් මේ ක්ෂේත්‍රයේ අවුරුදු හත, අට, දහය, දොළහ සහ දාහතර අනියම් කම්කරුවන් වශයෙන් වැඩ කල අයයි.

**ඩබ්ලිව්. එම්. ජී. ටී. බණ්ඩා මහතා**
**(திரு. டபிள்யு. எம். ஜீ. ரீ. பண்டா)**
**(Mr. W. M. G. T. Banda)**

සේවකයින් 1150 දෙනෙක්.

**කළුබණ්ඩා රත්නායක මහතා**
**(திரு. கலுபண்டர் ரத்நாயக்க)**
**(Mr. Kalubanda Ratnayake)**

අපේ නියෝජ්‍ය ඇමතිතුමා කියනවා, සේවකයින් 1150 දෙනෙක්ය කියා. දැන් සති දෙක තුනකට කලින් ටෙලිග්‍රෑම්වලින් මේ සේවකයින්ගේ වැඩ නතර කලේ. මේ අන්දමේ සේවකයින් ලංකාව පුරාම ඉන්න පුළුවන්. මම දන්නේ නැහැ, ද්‍රවිඩ පළාත්වල තත්ත්වය මොකක්ද කියා. ඒ අයට අද යන එන මං නැතිව ඉතාම අසරණ තත්ත්වයක ඉන්නවා.

ගරු සභාපතිතුමනි, මේ අයට අඩු වශයෙන් ආහාර මුද්දරවත් නැහැ. කලින් වැඩ කල නිසා ඒ ආදායම ගණන් අරගෙන ආහාර මුද්දර දී තිබුණේ නැහැ. අද රැකියාවක් නැහැ. පඩියත් නැහැ. ආහාර මුද්දරත් නැහැ. මෙක භයානක තත්ත්වයක්.

මෙයට සති දෙක තුනකට කලින් අපි අතිගරු ජනාධිපතිතුමාට මේ පිළිබඳව කරුණු පැහැදිලි කර දුන්නා, මෙහෙම දෙයක් වී තිබෙනවාය කියා. මහාමාර්ග දෙපාර්තමේන්තුවේ විශාල පිරිසක් අස්කලා. ඒ අයට දීමනාවක් දුන්නා රුපියල් විසි දහස් තිස් දහස් හතලිස් දහස් ගණනින්. නමුත් මේ අංශයේ වැඩ කල දුප්පත් අහිංසක අයට තවම මුදලක් ලැබී නැහැ, කියන එක අපි කණගාටුවෙන් මතක් කරනවා. මම දන්නවා අද දුප්පත් පවුල් ඉතාමත්ම අහිංසක තත්ත්වයේ සිටිනවා. මේ නිසා අපේ ගරු ඇමතිතුමාට මම මතක් කරනවා, නැවත වරක් මගේ ආසනයේ පමණක් නොවෙයි හැම ආසනයකම පුරා විද්‍යා ස්ථානවල සිටින ඒ දුප්පත් අහිංසකයින්ට සහනයක් ලබා දෙන්න කටයුතු කරන්න කියා.

මම මීට වඩා කතා කරන්න යන්නෙ නැහැ. නමුත්තාන්සේට අද විරුද්ධ පක්ෂයෙ මන්ත්‍රීවරුන්ගෙන්, ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ගෙන්, මහ ජනතාවගෙන්, මහා සංඝ රත්නයෙන් හැම අතින්ම උදව් ලැබෙනවා. ඒ සැමදෙනාම ඔබතුමා ප්‍රිය කරනවා. අපේ ලේකම් තුමාත්, කොමසාරිස්තුමාත් අනිකුත් නිලධාරී මහත්වරුත් නමුත්නාන්සේට තන් අයුරින් උදව් දෙනවා. සම්පූර්ණ සහයෝගය දෙනවා. ඒ වාගේම ඉතාමත්ම දක්ෂ ලෙස කටයුතු කරන අපේ නියෝජ්‍ය ඇමතිතුමාගේ සහයෝගයත් නමුත්නාන්සේට ලැබෙනවා. එම නිසා තව දුරටත් ඒ අයගේ ප්‍රියතාවය රැක ගැනීමට කටයුතු කරන ලෙස මතක් කරන අතරම ඒ හැම දෙනාගේම සහයෝගය ලබා ගෙන මේ අපගේ වැදගත් දායාදය ආරක්ෂා කරන්නට කටයුතු කරන්න ලැබේවා කියා ප්‍රාර්ථනය කරමින් මගේ කථාව අවසන් කරනවා.

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
(Mr. Lakshman Jayakody)

Mr. Chairman, I did not want to speak because of the fact that I am a member of the Consultative Committee of the Ministry of Cultural Affairs and I know everything that is happening there. However, I am reluctantly compelled to say that I have to make certain observations to the Hon. Minister which I think I should do before I allow the matter to go before the country.

There is one areas we should concentrate on, and that is the area of visual and performing arts. Just now there was a comment made by the hon. Deputy Minister about artistes portraing the role of Bhikkus. We know that it is a sacred and symbolic gesture on the part of the person who dons the robe and acts the part. It is symbolic, yet it is sacred. But when you delve into it, how are you going to portray anything Buddhistic when a layman gets into a robe? It is difficult enough to do so on the stage and even on the screen. I gave you an example about Siri Sangabo which was staged at the Tower Hall. They had to have a person to portray the role of the Maila Maha Therun Vahanse, as he is known, in the Elu Attanagalu *charithaya*. You have to have him because he is the key figure in that entire esisode of Siri Sangabo. A person can be competent enough, but he has not become an *upasampada*. Even I can wear a robes but I need not become an *upasampada*. I can say the *dasasil* and for that little period I can act that part. But it is symbolic and therefore one must accept it in that manner.

There is one thing, however, that should not be done, and that is to allow the sacred and the symbolic to descend to vulgarism and commercialized spectacle. You have to avoid such things. That is why I made a proposal to the Hon. Minister to take up with the Hon. Minister of State to have a Public Performance Board for Rupavahini. Once you have that board, we can ask the priests concerned how we can proceed in this matter.

අ. භා. 4

There is one other matter I would like to raise with the Hon. Minister. This is not yet out but I think I should raise it here. I am happy that two hon. Members concerned are here, one of whom is the Deputy Minister of Platations. We have a real problem but the problem is not here. (*Interruption*). Let us not hide the facts. This is about the Bo-tree at Kalutara. What has happened there is that unfortunately there are no

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

priests there. The Bo-tree at Kalutara is a very sacred place. People offer money there, and various people have utilized that money. I am not going to find out whether the money has been properly utilized. That is not my business. That is the business of the trustee. When you have a sacred place, the sacredness of the place must be preserved. How does a place become sacred? It is through some symbolic Buddhistic gesture. What they did there was to put up a nice *chaithiya*. I think it is one of the most exquisite forms ot art one sees going down south. We must pay a tribute to the late Sir Cyril de Zoysa for the great work he did. At the same time we must see that money lenders do not take over the temple.

මන්ත්‍රීවරයෙක්
(அங்கத்தவர் ஒருவர்)
(A Member)

Money lenders?

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

Money users or money lenders. Let us even say "money changers." They should not take over the temple. It is rather a difficult thing. It is difficult for everyone. I am sure the affairs at the Bo-tree are being run perfectly well. There are no two words about it. But there must be some sort of control. It is up to the directors and the trustees to ensure that the money is being used properly and that it is being used pr the betterment of the *Sasana* and for nothing beyond that. That is very important.

Thirdly, Sir, I have noticed that tourism is undoubtedly plundering local arts. There are no two words about it but how are you going to stop it? I have brought this question up on many occasions. There are various "වෙද පොත්" right along. I will mention one. Some very important documents that have been preserved on this country are for sale on the road to Sigiriya and Anuradhapura! Valuable images are being sold! (*Interruption*) It may be that there are fakes, as the hon. Member for Habaraduwa mentioned. Then there are distorted versions of literature on history. Even with the regard to the little problem that you mentioned just now on Pandukabhaya and Panduwasnuwara, there is a grave doubt as to whether that was the abode of Pandukabhaya or Panduwas. (*Interruption*) I know. I agree with you, because according to some chronicles it is the same. But if you ask a historian - listened to Chadra Wickrema Gamage on the other day over the radio. He said ther were no facts yet to establish that it was the place where Panduwas lived. I wish, I hope and I pray that it is the place, but we should have facts.

සභාපතිතුමා
(தலைவர்)
(The Chairman)

The ruins of the "එක් ටැම් ගේ" are still there in Panduswasnuwara.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

Yes, Sir. But there is a certain doubt about the "එක් ටැම් ගේ" It is said that the site of the palace is in one place and the "එක් ටැම් ගේ" is about a mile away. Why should that "එක් ටැම් ගේ" be a mile away when the King wanted to see whether Unmada Chitra was there or not?

සභාපතිතුමා
(தலைவர்)
(The Chairman)

Hon. Member is making a mistalke. The present palace of Panduwasnuwara was built by Parakramabhahu 1,500 years after Panduwas.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

Precisely. I am very happy that you have corrected the situation. Sir, we have to get more facts. But I hope and I pray that it is the place. And there must be something in it.

I was on the question of tourism plundering of our local arts. I am very happy that the Hon. Minister has taken a decision to see that valuable pieces of art do not get out of this country. He has framed laws and he is going to frame more stringent laws. He has shown some of those laws to me also and I am very happy that he has done that.

Then the desecration of religious sites this is taking place in a big way. I think in such instances you have to take a very strong and strict attitute. I think the worst thing that happened was during the time of Mr. Iriyagolla when some vandals went and desecrated that beautiful piece of art in Sigiriya. Our hearts sank when we heard about it but thank heavens there was enough technology in the world to clean the whole thing out and we have managed to save that. But there are so many that we have not yet identified or looked into. I think the best thing would be for us, who as Members of Parliament control certain areas, to go out to those areas and channel whatever information is available pertaining to this type of desecration to the Hon. Minister so that he will be able to take action. The Hon. Minister must take some decision to stop it.

What are you going to do in the North and the East? Only the God knows that! It is a vey touchy problem. I do not want to go into that actually. With regard to

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ලක්ෂ්මන් ජයකොඩි මහතා]

certain areas in the north and the east a very good contribution was made in this House some time ago by the hon. Member for Hanguranketa, where he proved that the east was at one stage a Buddhist domain. And we all know from Kandaroddai and all those place in the north also had been a Buddhist domain. There are no two words about that. But yet, the fact remains, today all that area has been desecrated. So something must be done in order to stop that.

Then I would like to say something about the *Sanghadhikarana Panatha.* I do not know what the Hon. Minister is doing with it because he has to get permission from the bhikkus and then finalize it. It has been pending for the last so many years.

Then we saw a national policy on culture. We got an interim report. That is not enough. To decide something on culture, you cannot have an interim report. You must get an official report on the national policy on culture. I hope the Hon. Minister will take note of it and let us have a national policy.

Then, I read in the papers what a colleague of mine, Mr. K. B. Ratnayake, had stated about the leaves of the sacred Bo-tree. I am very happy about it. I think the Hon. Minister did inform us that the leaves of the *Sri Maha Bodeen Wahanse* will be used to help and save the cultural monuments of this country. He asked whether he could collect some money by selling them. We decided that the leaves of the *Sri Maha Bodeen Wahanse* should not be used but the leaves of the other Parivara Bodhis that are right round could be used. The Hon. Minister was very keen but I have my own reservations about that matter. That is a different thing. I can understand as long as he does not use the leaves of the sacred bo-tree. But the problem arose subsequently as to how we should put it in the format. So, we have corrected that. I do not think it is a good thing to use them without the permission of the *Mahanyakas* because we know that it is not the leaves of the *Sri Maha Bodeen Wahanse* but it is the leaves of the Sri Maha Bodhi area or let us say the temple. I think these leaves are being sent to Korea or some country to collect some money.

That is the problem, Sir. It is a very touchy thing. You can have different views on the subjuct but I think in these religious affairs one should ask the Bhikkus, get their advice and then take whatever action you wish to take.

Then, Sir, we have a lot of seats of learning in this country where there are pirivenas and we have the pirivena libraries. Out of the pirivenas four of them have now been made Pali and Buddhist Universities. Sir, a pirivena library is a small library but when it becomes a university you must have a university library. Therefore, at a time when books are so costly, I would urge the Cultural Department to kindly work out, with the assistance of a foreign agency organization or country, to help these Pali and buddhist universities especially to develop their libraries. If you are going to have a good university library you need at least photostat machines, audio-visual aids, desks and chairs. Then we have the Pali text society books. I do not think we can ever buy those books now. I do not know where you can get them! Then there is the famous Hevavitharana Atuwawa. That is the Atuwawa books of Hevavitharana grouping. All those are not available today! Then you must have an encyclopaedia. These are the things that the Cultural Department must provide the Bhikkus to help in their learning.

Sir, very soon Sri Lanka will be the centre of Theravada learning. All these temples where you find the universities will be the main area of Buddhist education in the world. I can remember, Sir, the London Univesity had a course in buddhist studies in Pali. That is not existing any more! In the Commonwealth I do not think there are any other universities where they teach Buddhism and Pali together. I can remember there was one in Shantiniketana but it is now waning. I do not think it is developing there. So it is high time that Sri Lanka takes up this challenge to preserve *Theravada* Buddhism in the world. All the *Theravada* Buddhist countries are now going through a very serious transformation politically, economicaly etc. You know what has happened to Laos, Cambodia and Vietnam. You know what is happening in Thailand and Burma. Sri Lanka is the only place where we can impart *Theravada* Buddhism to the whole world. So it is going to be a massive attraction. There are certain areas where you can break ground technologically as well as socially. If you can prove to the world that Sri Lanka is the only place where there is *Theravada* Buddhism, people who are attracted in the *Theravada* tradition and ways of life and those who want to study *Theravada* Buddhism will all flock here. That is the attraction that we have to make.

For instance, Trincomalee is not only a base to look after the Indian Ocean Peace Zone. Why are we making it a nuclear free zone ? It is because we know that Trincomalee is the last outpost of the land mass in the North exending right up to Antarctica. This entire place is going to be an area of clean water, marine, minerals and all other benefits, including solar energy. One day when solar energy develops, Trincomalee may be the key place. That is why we started the Indian Ocean Peace Zone proposals.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**සභාපතිතුමා**
**(தலைவர்)**
**(The Chairman)**

Order, please ! The Deputy Chairman of Committees will now take the Chair.

*අනතුරුව කථානායකතුමා මූලාසනයෙන් ඉවත්වූයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා [එඩ්මන්ඩ් සමරවික්‍රම මහතා] මූලාසනාරූඪ විය.*

*அதன் பிறகு, சபாநாயகர் அவர்கள் அக்கிராசனத்திலிருந்து அகலவே, குழுப் பிரதித் தலைவர் அவர்கள் [திரு. எட்மண் சமரவிக்ரம] தலைமை வகித்தார்கள்.*

*Whereupon* MR. SPEAKER *left the Chair, and* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES [MR. EDMUND SAMARAWICKREMA] *took the Chair.*

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
**(Mr. Lakshman Jayakody)**

Sir, I was speaing on the subject of *Thervada* Buddhism in Sri Lanka. I hope the Hon. Minister will be able to help these four Buddhist universities in that manner. If he can help them in the way of buildings, it is so much the better. They must also start various other sectors in that place. Within the framework of the old traditions they must start new concepts. There must be new thinking on *Theravada* Buddhism. I think we are quietly going to a Mahayanistic tradition. I do not know whether it is the inter-reaction between the Chinese, Japanese and South-East Asian Culture that is coming here. That is a different matter. But I feel that we should keep to the old traditions. We must also become a member of the Commonwealth University Organization, where these temples are concerned.

Therefore, I would like te Hon. Minister to help us in this manner so that it will be useful to us.

As the hon. Member for Panduwasnwara said,

අ. භා. 4.15

ජේතවනාරාම ව්‍යාපෘතියට සම්බන්ධව, එහි සේවයේ යෙදී සිටින උදවිය ගැන එහි රැකියා සුරැකීමේ කමිටුවේ ජේ. එස්. ඔබේසේකර මහතා ගරු අග්‍රාමාත්‍යතුමා වෙත යැවූ ලිපියක පිටපතක් අපටත් එවා තිබෙනවා, ඒ අයගේ අත්සන් සහිතව. මේ උදවිය ගැන වැඩිපුර සැලකිල්ලක් දක්වන්නට ඕනෑ. කැනීම් කරන උදවිය රැක බලා ගන්නටයය23 මා ඉල්ලා සිටින්නේ ඒ අය බොහොම වටිනා පුද්ගලයන් පිරිසක් නිසයි. පුරාවිද්‍යා කැනීම් කියන කාර්යය විශේෂඥ කාර්යයක්. හැම දෙනෙකුටම ඒ කර්තව්‍යය ඉෂ්ට කරන්නට බැහැ. ඒ වාගේම සොයා ගන්නා දේවල් සුරක්ෂිතව භාවයෙන් තබා ගැනීමත් එක්තරා වැදගත් කර්තව්‍යයක්. එම නිසා ඒ කම්කරුවන්ගේ රැකියා සුරක්ෂිත භාවය ගැන සැලකිල්ලක් දක්වන්නට ඕනෑ. එම කම්කරුවන්ට මෙම සේවයෙන් ඉවත්ව යන්නට ඉඩ දෙන්නට එපා. මොකද ? කිසියම් ව්‍යාපෘතියක වැඩ පටන් ගත්තාම, එන්ට එන්ටම එම වැඩ කටයුතු ගැන පුහුණුවක් ලැබෙනවා. පුහුණුව අවසානයේදී කැනීම් සම්බන්ධයෙන් විශේෂඥ භාවයක් ඇති වෙනවා. අන්න එවැනි පිරිසක් ආරක්ෂා කිරීමට කිසියම් වැඩ පිළිවෙළක් සකස් කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

නිදහස් සමරු දිනයේ දීප ව්‍යාප්ත වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කිරීම සඳහා වැඩ පිළිවෙළක් දියත් කර ඇති බව පෙනෙන්නට තිබෙනවා. ඒ සම්බන්ධයෙන් අතිරේක ලේකම්තුමා යවා ඇති ලිපිය මෙයට වඩා සැලකිල්ලෙන් සැකසුම් කර තිබුණා නම් හොඳය කියා මා කල්පනා කරනවා. මන්ද ? එම ලියවිල්ලේ අපේ රටේ ජාතික වීරවරයන්ගේ නාම ලේඛනය සටහන් කර ඇති ආකාරය බැලුවාම, ඒ ගැන ඊට වඩා සැලකිල්ලක් දක්විය යුතු බව කියන්නට ඕනෑ. මා හිතන්නේ නැහැ, එතුමා ඒ අය ගැන නොදන්නා කෙනෙක්ය කියා. මොකද ? එතුමා මම ගරු කරන ආචාර්ය කෙනෙක්. නමුත් මේ වාගේ ලිපියක් ලියන විට මෙයට වඩා සැලකිලිමත් වෙන්න ඕනෑ. මම එහි සඳහන් කර ඇති නම් කීපයක් කියවන්නම් : " ගොන්ගාලේගොඩ බණ්ඩා, මහතා පුරන් අප්පු මහතා." නිකම්ම පුරන් අප්පු කිව්වා නම් කමක් නැහැ. " සුමංගල හිමි, ගුණානන්ද හිමි, ධර්මාරාම හිමි, සුබෝධි හිමි, සෝල්බරි සාමි " මෙහි සඳහන් අන්දමට සෝල්බරි සාමිත් අපේ ජාතික වීරවරයෙක්. මම මේ නම් ලැයිස්තුවේ සියල්ලක්ම කියවන්නට යන්නේ නැහැ. මොකද ? එහෙම කියා ගෙන ගියොත් අපේ වීරවරයන්ටත් අගෞරවයක් වෙනවා. මේ අය අපේ රටේ ඉතිහාසයේ ඉතාමත්ම වැදගත් උදවිය. " ඩිංගිරි රාළ මහත්මයා " ඩිංගිරි රාළ කිව්වාම, පන් දහසක් නොවෙයි, පණස් දහසක් වුණත් අපේ රටෙන් සොයා ගන්නට පුළුවනි.

**ඊ. එල්. බී. හුරුල්ලේ මහතා**
**(திரு. ஈ. எல். பி. ஹுருள்ளே)**
**(Mr. E. L. B. Hurulle)**

කරුණු පැහැදිලි කිරීමකට මට ටිකක් ඉඩ දෙන්න. දැන් ඔය චක්‍රලේඛය අප අවලංගු කර තිබෙනවා. මෙම ලැයිස්තුව ස්වදේශ කටයුතු භාර අමාත්‍යාංශයෙන් ලබා ගත් ලැයිස්තුවක්. එම ලැයිස්තුව කැබිනට් සන්දේශයකට ඇතුළත් කර ඉදිරිපත් කර තිබෙනවා, මෙයින් මොන මොන පුද්ගලයන් ජාතික වීරවරයන් වශයෙන් සමරනවාද කියා තීරණයක් ගන්නට.

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
**(Mr. Lakshman Jayakody)**

මගේ කථාව අවසන් කරන්නට පෙර එතුමා කරුණු පැහැදිලි කිරීමක් කළා. මේ ගැන මම අබේවර්ධන මහතාට චෝදනා කරන්නේ නැහැ. මන්ද ? ස්වදේශ කටයුතු භාර අමාත්‍යාංශයෙන් කෙරෙන්නේ මේ වාගේ කටයුතු තමයි. " මඩුගල්ලේ මහතා, පිළිමතලාවේ මහතා " සමහර විට මේ අය අපේ ඇමතිතුමාගේ ඥාතීන් වෙන්නටත් පුළුවනි. ඔන්න ඔය විධියටයි අපේ ජාතික වීරයන් හඳුන්වා දී තිබෙන්නේ. එම නිසා මේ වරද නිවැරදි කරන හැටියට නැවත වරක් ඉල්ලා සිටිනවා.

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා වශයෙන් වැඩ බලන, රෝලන්ඩ් සිල්වා මහතා, දැන් අවුරුදු ගණනාවක් තිස්සේම වැඩ බලන තත්ත්වයේමයි කටයුතු කරන්නේ. නමුත් පුරාවිද්‍යා අධිකාරිය කිව්වාම එය වැදගත් ආයතනයක්. එම ආයතනයේ ප්‍රධානියා වශයෙන් සිටින්නට ඕනෑ, බඳවා ගැනීමේ පරිපාටියට සරිලන කෙනෙක්. එතුමා නරකයි කියනවා නොවෙයි. එතුමා නරක පුද්ගලයෙක් නොවෙයි. නමුත් අවශ්‍ය කරුණු ටික තිබෙන්නට ඕනෑ. අධ්‍යාපනය නැහැ කිව්වත් වැරදියි. ඒකත් තිබෙනවා එක්කෝ බඳවා ගැනීමේ පටිපාටිය වෙනස් කරන්නට ඕනෑ, එහෙම නැත්නම් පුද්ගලයා වෙනස් කරන්නට ඕනෑ. ඔය දෙකෙන් එකක් කරන්නට ඕනෑ.

**ඊ. එල්. බී. හුරුල්ලේ මහතා**
**(திரு. ஈ. எல். பி. ஹுருள்ளே)**
**(Mr. E. L. B. Hurulle)**

දැන් මීට පෙර තිබුණු බඳවා ගැනීමේ පටිපාටි 6 ක් සංශෝධනය වෙලා තමයි අද පවතින එක තිබෙන්නෙ. මීට පෙර තිබුණු 6 අනුවම රෝලන්ඩ් සිල්වා මහතා සුදුසුකම් ලබා තිබෙනවා. නමුත් මොන හේතුවක් මතද මම දන්නෙ නැහැ. ඒක වෙනස්වෙලා මෙයාට අහිමිවෙන අන්දමට සකස් කර තිබුණා. එමනිසා මම ඇමති මණ්ඩලයට සන්දේශයක් ඉදිරිපත් කර එතුමාව දැන් ස්ථිර කර තිබෙනවා, පුරාවිද්‍යා කොමසාරිස් වශයෙන්.

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
**(Mr. Lakshman Jayakody)**

නීත්‍යානුකූලව වැඩේ කර තිබෙනවා නම් අපේ විරුද්ධත්වයක් නැහැ. මොකද, කලින් ශ්‍රේෂ්ඨ නම් තිබුණා. එච්. සී. පී. බෙල්, පරණවිතාන ගුරින්. මහාචාර්ය ගොඩකුඹුරේ ආදී ශ්‍රේෂ්ඨ පුද්ගලයින් සිටියා. අන්න ඒ වාගේ. ඒ මට්ටමේ සිටින පුද්ගලයෙක් වෙන්න ඕනෑ. එනිසයි මම මේ යෝජනාව කළේ. මම දන්නෙ නැහැ ඔබතුමා කැබිනට් සන්දේශයක් ඉදිරිපත් කර තිබෙන බව.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ලක්ෂ්මන් ජයකොඩි මහතා]

නමුත් එහෙම කර තිබෙනවා නම් ඒක වෙනම දෙයක්. නමුත් අපි අනාගතයේවත් හොඳ දක්ෂ උදවිය පුහුණු කරවන්න ඕනෑ මේ අංශයට. විශේෂයෙන්ම පුරාවිද්‍යාව සම්බන්ධව පුහුණු කර ඒකට ප්‍රධානියෙක් පත් කරන්න ඕනෑ.

මම මේ අවස්ථාවේදී කලාවට සම්බන්ධ අනෙක් අංශ ගැන කථා කරන්න යන්නෙ නැහැ. නමුත් මට වඩා දක්ෂ කෙනෙක් ඊයේ පෙරේදා අපි සොයා ගත්තා, මේ ගරු සභාවෙන්ම. හැංගිලයි සිටියේ මෙපමණ කාලයක්. මේ ගරු සභාවේ සිටිනවා ඉතාමත්ම දක්ෂ, මම හිතන්නෙ ලංකාවේ සුප්‍රසිද්ධම බැලේ නාට්‍ය සම්බන්ධව දන්නා කෙනෙක්. අපි වාගේ නිකම්ම කථා කිරීම පමණක් කරන කෙනෙක් නොවෙයි, ඒක ක්‍රියාවෙන්ම ඔප්පු කර තිබෙන කෙනෙක්. එතුමාත් අපේ වැඩ කටයුතුවලට ලැබේවා කියා ප්‍රර්ථනා කරමින් මම නිහඬ වෙනවා.

**වී. එල්. විජේමාන්න මහතා (නියෝජ්‍ය රාජ්‍ය වැවිලි ඇමතිතුමා)**
**(திரு. வீ. எல். விஜேமான்ன — அரச பெருந்தோட்டப் பிரதி அமைச்சர்)**
**(Mr. V. L. Wijemanne – Deputy Minister of State Plantations)**

Sir, may I ask your indulgence just to make a clarification. In the courts of the speech of the hon. Member for Attanagalla reference was made to the Kalutara Bodhi and its management. As I happen to be the Trustee Secretary of the Bodhi Trust, I wish to mention that the Kalutara Bodhi is managed by a Board of Trustees constituted under the Trust Ordinance. The management is strictly done according to the terms of the Trust Ordinance.

**ඩබ්ලිව්. පී. බී. දිසානායක මහතා**
**(திரு. டபிள்யு. பீ. பி. திஸாநாயக்க)**
**(Mr. W. P. B. Dissanayake)**

ගරු සභාපතිතුමනි, මේ මොහොත ලබාදීම ගැන මම නමුත්නාත්සේට අනේක වාරයක් ස්තුතිවන්ත වෙනවා. මේ සංස්කෘතික අමාත්‍යාංශයේ වැය ශීර්ෂය යටතේ මාතෘකා දෙකක් ගැන පමණයි මම කතා කරන්නට බලාපොරොත්තු වෙන්නෙ. එකක් තමයි බෞද්ධ කටයුතු කොමසාරිස්තුමාගේ දෙපාර්තමේන්තුව. අනික් එක පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවයි. බෞද්ධ කටයුතු පිළිබඳව කොමසාරිස්තුමෙකු ඇතුළු දෙපාර්තමේන්තුවක් ඇතිකිරීම ගැන අතිගරු ජනාධිපතිතුමාටත් මේ රජයටත් මම අනේක වාරයක් ස්තුතිවන්ත වෙනවා. ඒ දෙපාර්තමේන්තුව දැන් ඉතාම සාර්ථක අන්දමින් කටයුතු කරගෙන යනවා. නමුත් මේ පසුගිය දවසකදී පාර්ලිමේන්තු උපදේශක කාරක සභාවේදීත් මට කියන්නට සිදුවුණා, කණගාටුවෙන් වුණත් මම මතක් කරන්න ඕනෑ, බෞද්ධ කටයුතු පිළිබඳ කොමසාරිස්තුමාට එතුමාගේ කටයුතු කරගෙන යාම සඳහා නීතිමය බලය ඉතාම සීමිතවයි ලැබිලා තිබෙන්නෙ කියා. ඒ නිසා නීති සංශෝධනයක් තුළින් හෝ බෞද්ධ කටයුතු පිළිබඳ කොමසාරිස්තුමාට බෞද්ධ කටයුතු පිළිබඳව ක්‍රියාකිරීම සඳහා මීට වඩා පුළුල් බලතල ලබාදීමට උනන්දුවන ලෙස ගරු නියෝජ්‍ය ඇමතිතුමාගෙන් මා ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිනවා. බෞද්ධ කටයුතු පිළිබඳ කොමසාරිස්තුමාගේ බලතල මීට වඩා පුළුල් නොකොළොත් එතුමාගෙන් අපි බලාපොරොත්තුවන රාජකාරිය, සේවය, අපට ලබාගන්න බැරිව යනවා. ජනරජ ව්‍යවස්ථාව අනුව බැලුවොත්, ජනරජ ව්‍යවස්ථාවේ බෞද්ධාගම පිළිබඳව වෙනමම ඡේදයක් තිබෙනවා. එය මේ රජය විසින් බෞද්ධාගමට නිසි තැන ලබාදීම සඳහා ඇතිකර තිබෙන ඡේදයක් බව මම ගෞරවයෙන් සඳහන් කරන්න කැමතියි. බෞද්ධ කටයුතු පිළිබඳ කොමසාරිස්තුමාගේ දෙපාර්තමේන්තුවට අද ක්‍රියාත්මක කරන්නට බලය ලැබී තිබෙන්නේ විහාර දේවාලගම් පනත පමණයි. විහාර දේවාලගම් පනත ක්‍රියාත්මක කිරීම හැර වෙනත් බලතල ඒ දෙපාර්තමේන්තුවට නැහැ කියන එකයි මගේ හැඟීම. එහෙම වෙනත් බලතල තිබෙනවා නම් මම ඒ අදහස වෙනස් කරගන්න කැමතියි.

මේ රටේ ඉන්නේ සියයට 73ක් පමණ බෞද්ධ ජනයා නිසා ඒ බෞද්ධාගාමික පරිසරය ආරක්ෂා කිරීමට බෞද්ධ කටයුතු පිළිබඳ කොමසාරිස්තුමාට මීට වඩා බලය තිබිය යුතුය කියන එකයි මගේ විශ්වාසය.

මේ දෙපාර්තමේන්තුව පටන් ගන්නා අවස්ථාවේදීම කොමසාරිස්වරයෙකු සිටියා. ආරම්භයේදීම විශාල ප්‍රශ්න ඇතිවෙන්න තිබුණත් ඒවා එතුමාගේ බුද්ධිමත් කල්පනාව නිසා නැතිකර ගත්තා. එතුමා වෙනුවට ඒ වගේම දක්ෂ නිලධාරියෙක් දැනුත් පත්ව සිටිනවා. එතුමා කෙරෙහි අපගේ බලවත් විශ්වාසය මම ප්‍රකාශ කරන්න කැමතියි.

මේ විහාර දේවාලගම් පනත ක්‍රියත්මක කිරීම ගැන මම වචන කීපයක් කථා කරන්න ඕනෑ. විහාර සන්තක දේපොළ සහ දේවාල සන්තක දේපොළ– අද මේ පනතින් ආරක්ෂා වන දේපොළ – බොහෝදුරට මේ ආයතන දෙකටම නැතිවී ගොස් තිබෙනවා. මේ දේපොළවල කොටස් දෙකක් තිබෙනවා. රාජකාරී ඉඩම් සහ බණ්ඩාර ඉඩම් කියන කොටස් දෙකයි. රාජකාරී කියන කොටස දැන් ඇත්තේම නැහැ. එක එක්කෙනා භුක්ති විඳිනවා. නැත්නම් සියයක් දෙසියයක් අතර දැන් මාරුවී ඉවරයි. ඒවා විකුණලා තිබෙන නිසා, බදු දී තිබෙන නිසා ඒ රාජකාරී එකක්වත් ඉෂ්ට වෙන්නෙ නැහැ. යම්කිසි තැනක ඉෂ්ට වෙනවා නම් ඒ බොහොම කලාතුරකින් තමයි.

බණ්ඩාර ඉඩම් කියන ඒවා බොහොමයක්ම දැන් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයිති වී තිබෙනවා. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂමෙන් ඒ පිළිබඳව තවම එම ආයතනවලට හෝ මේ දෙපාර්තමේන්තුවට වන්දි මුදලක් ගෙවීමක්වත් කෙරිලා නැහැ. ඒ නිසා දේපොළ තිබෙන ආයතන වුණත් – ආගමික ආයතන වුණත් – අද අසරණ තත්ත්වයට පත්ව තිබෙනවා.

මෙය කොතෙක් දුරට බලපෑවාද කියතොත් මහනුවර ඇසළ පෙරහැර කිරීම සඳහා ජනාධිපති අරමුදලෙන් මුදල් සපයන්න ජනාධිපතිතුමාට සිදුවුණා. ඇසළ පෙරහැර සඳහා ජනාධිපතිතුමාගේ අරමුදලෙන් ලබාදුන් ඒ ආධාර මුදල නොවන්නට අපේ ජාතික උරුමයක් හැටියට අපේ ජාතික උත්සවයක් හැටියට අප පවත්වන, මේ රටේ සංස්කෘතිය ගැන කතා කිරීමේදී ආඩම්බරයෙන් සඳහන් කරන්න පුළුවන් මේ ආගමික සංස්කෘතික සංදර්ශනය පවත්වන්නට බැරි තත්ත්වයක් ඇතිවෙන්න ඉඩ තිබුණා. මේ නින්දගම්, අපේ පැරණි ශ්‍රේෂ්ට රජවරුන් විසින් ප්‍රදානය කරන ලද ඒ ගම්වර මහා කළමනාකාරත්වයක් යටතේ පාලනය කිරීමේ පිළිවෙළක් ඇති කරන්න පුළුවන් නම් ඒ විධියේ තත්ත්වයක් ඇති වන්නේ නැහැ. ඒ නිසා මා ගරු ඇමතිතුමාගෙන් – නියෝජ්‍ය ඇමතිතුමා ඉන්නවා මෙතැන – ඉල්ලීමක් කරන්න කැමතියි. විහාරගම් ගැන කතා කරන්න මම කැමති නැහැ. එය අපේ ගෞරවනීය මහා සංඝරත්නයට තිබෙන අයිතිවාසිකමක්. දේවාලවලට අයිති ඒවා ඔක්කෝම එක්කෝ රජයට පවරාගෙන ඒවාට වන්දි මුදලක් දෙන්න. නැත්නම් සංස්ථාවක් ඇතිකර මේ දේපළ පාලනය ඒ සංස්ථාවට බාරගන්න කියන්න.

මේ ආයතනවලට අවුරුදු පහකට වරක් භාරකාරයෙක් පත්වෙනවා. මේවාට තඩු කියන්න ගියාම අවුරුදු දහසයක් පහළොවක් විස්සක් පමණ යනවා. තඩු කීමේ වියහියදම් වැඩි නිසාත් තඩු කියන්න කාලයක් නැති නිසාත් දැනුත් ඒවා ක්‍රමයෙන් නැති වෙගෙන යනවා. මෙහෙම වුණොත් මේ ආයතනවල භාරකරුවන්ට ඒවා ගෙනයාමේ අපහසුකම් ඇතිවන නිසා මේ ගැන අවධානය යොමු කරවන්න මම කැමතියි. ඊළඟට බෞද්ධ අධ්‍යාපන–

**ඩබ්ලිව්. එම්. ජී. ටී. බණ්ඩා මහතා**
**(திரு. டபிள்யு. எம். ஜீ. ரீ. பண்டா)**
**(Mr. W. M. G. T. Banda)**

දේවාල ඉඩම්, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සන්තක වුණාට පසු සමහර අය පෞද්ගලිකව බලහත්කාරයෙන් මේ ඉඩම්වලට ඇතුළු වී ගෙවල් හදාගෙන පදිංචි වී සිටිනවා. දැන් වැඩි හරියක් ඒ විධියට වෙලා තිබෙනවා.

**ඩබ්ලිව්. පී. බී. දිසානායක මහතා**
**(திரு. டபிள்யு. பீ. பி. திஸாநாயக்க)**
**(Mr. W. P. B. Dissanayake)**

මම නමුත්නාත්සේලාට ස්තුතිවන්ත වෙනවා මේ පිළිබඳව සොයා බැලුවොත්. ඉතාම සුදුසු කණ්ඩායමක් නමුත්නාත්සේලා පත්කර තිබෙනවා. මාපා ගුණරත්න මහතා තමයි මහාභාරකාරතුමා. විමලවන්ද්‍ර මහතා මේ රටේ දක්ෂ නීතිඥ මහත්මයෙක්. දැනට නීති විද්‍යාලයේ විද්‍යාලයාධිපති. හිටපු මහාභාරකාර නැන්පත් රඹුක්වැල්ලේ මහත්මයාත් ඉන්නවා. ඒ අනුව ඉතාම සුදුසු කණ්ඩායමක් පත්කර තිබෙනවා. ඒ මහත්වරුත් ඒ ගැන සුදුසු වාර්තාවක් පිළියෙළ කරයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අදහසක් වශයෙන් මම මේ කරුණ කියන්න කැමතියි. සිංහල රජවරුන් මේ විශාල ගම්වර පූජා කරන කාලයේ අද වාගේ මේ රටේ ඉඩම් හිඟයක් තිබුණේ නැහැ. ඒ නිසා ඒ ගම්වර එහෙම පිටින්ම බාරහාර වශයෙන් ඔප්පු කරන්න නැත්නම් පූජාකරන්න රජවරුනට පුළුවන්වුණා. මම කතා කරන්නේ දේවාල ඉඩම් පිළිබඳව විතරයි. මගේ අවංක හැඟීම නම් අප මහා සංඝරත්නයේ අදහස් දැන ගන්නේ නැතිව ගිහියකු හැටියට මට විහාර ඉඩම් පිළිබඳව කතා කරන්න බැහැ. මා කතා කරන්නේ දේවාල ඉඩම් ගැන පමණයි. මා නියෝජනය කරන දේවස්ථානයටත් අක්කර අසූඑක් දහක නින්දගමක් තිබෙනවා. සිංහල රජවරුන්ට පුළුවන්වුණා ඒවා බාරකාර වශයෙන් පූජා කරන්න.

අ. භා. 4. 30

අද එද වාගේ නොවෙයි. විශාල ඉඩම් හිඟයක් මේ රටේ තිබෙනවා. ඉඩම් සඳහා විශාල ඉල්ලුමක් තිබෙනවා. මා නියෝජනය කරන ආයතනයට අක්කර අසූඑක් දහක නින්දගමක් අවශ්‍ය නැහැයි කියන එකයි මගේ හැඟීම. ඒ නිසා වර්තමාන සමාජයේ තිබෙන ප්‍රශ්න දිහා බලා ඒ දේපල රජයට අත්පත් කරගෙන සීමිත ප්‍රමාණයක් ඒ ආයතනවලට දී ඉතිරි හරිය රජයට අත්පත් කරගෙන ඒවාට වන්දි මුදල් දෙන්න. මිනිස්සු දැන් ඒවායේ පදිංචි වී ඉන්නවා නම් ඒ ඔවුන්ට ඉන්න වෙන තැනක් නැති නිසායි. අපි ඒ මිනිස්සුන් එළියට දැම්මොත් එය අපේ ආගමට ගැළපෙන්නේ නැහැ. මගේ කොට්ඨාශයේ නම් මම එය කොහොමටවත් කරන්නේ නැහැ. ඒ නිසා මේ වැඩපිළිවෙළ මහනුවර මහා විෂ්ණු දේවාලයේ ඉඩකඩම්වලින්ම ආරම්භ කරන ලෙස මා ගරු ඇමතිතුමාට යෝජනා කරන්න කැමතියි. මේ සඳහා මගේ කැමැත්ත මේ සභාවේදී මම ප්‍රසිද්ධියේ ප්‍රකාශ කරනවා. දේවාලවල බස්නායක නිලමේතුමන්ලාට පුළුවන්කමක් නැහැ ඉඩම් පාලනය කරන්න. ඒ නිසා ඒවා රජයට බාරගෙන වන්දි මුදල් දෙන්න. රජය ඊට අසතුටු නම් සංස්ථාවක් ඇතිකර ඒකට මේවා ඔක්කෝම පවරන්න. යම්කිසි කෙනෙක් ඒවා භුක්ති විඳිනොත් එය එහෙමම භුක්ති විඳපුදෙන්. ගාස්තුවක් අයකර තමුන්නාන්සේලා සල්ලි ටිකක් අරගෙන ඒ මුදල් අපි ඉතා ඕනෑකමින් කතා කරන මේ බෞද්ධ සිද්ධස්ථාන සංරක්ෂණය කිරීම සඳහා යොදවන්න. බෞද්ධ අධ්‍යාපනය සඳහා ඒ මුදල් යොදවන්න. භික්ෂූන් වහන්සේලාගේ තත්ත්වය නගා සිටුවීම සඳහා පන්සල්වල වැඩිදියුණුවට ඒ මුදල් වියදම් කරන්න. මේ ආයතනත් පවත්වාගෙන යන්න පුළුවන් වෙන්න එයින් ආධාර මුදල් දෙන්නටය කියා පමණයි මම යෝජනා කරන්නේ.

ඒ වාගේම බෞද්ධ කටයුතු පිළිබඳ කොමසාරිස්තුමාට තිබෙන බලය කුමක්ද කියා මම දැනගන්නට කැමතියි. බෞද්ධ කටයුතු පිළිබඳ කොමසාරිස්තුමාට බෞද්ධ අධ්‍යාපනය පිළිබඳව කිසිම බලයක් නැහැ කියන එකයි මගේ අදහස. එමනිසා බෞද්ධ අධ්‍යාපනය පිළිබඳ බලපෑමක් ඇති කිරීමට බෞද්ධ කටයුතු පිළිබඳ කොමසාරිස්තුමාගේ දෙපාර්තමේන්තුවට බලය දිය යුතුය කියන එකයි මගේ ඉල්ලීම.

අද බෞද්ධ අධ්‍යාපනය පිළිබඳ පාඨමාලා තිබෙනවා. පොත් පත් මුද්‍රණය කරනවා. විභාග පවත්වනවා. නමුත් බෞද්ධ කටයුතු පිළිබඳ කොමසාරිස්තුමාට ඒ ගැන බලයක් නැහැ. අපි දන්නේ නැහැ ඒවා කොහොමද වෙන්නේ කියා. එමනිසා එවැනි බලතල එතුමාට ලබා දෙන්නට ඕනෑ. බෞද්ධ අධ්‍යාපනය ගැන කථා කරන විට මම තවත් දෙයක් ගැන කියන්න ඕනෑ. දහම් පාසල් අවසාන විභාගය පාස් වෙන්න ළමයෙකු අවුරුදු ගණනාවක් ඉගෙන ගන්නට ඕනෑ. ඒ දහම් පාසල් සහතිකයට කිසිම පිළිගැනීමක් නැහැ. එම නිසා මේ දහම් පාසල් අවසාන සහතිකයටත් අපොස සාමාන්‍ය පෙළ හා සමාන පිළිගැනීමක් තිබෙන්නට ඕනෑ. ආගම ඉගැන්වීමට එය ඉතාමත් අවශ්‍යයි. අපි මේ රටේ සංවර්ධන කටයුතු කොපමණ කළත්, හැදිච්ච පිරිසක් මේ රටේ ඇතිකර ගන්නට බැරි වුණොත් ඒ කරන සංවර්ධනයෙන් ප්‍රයෝජනයක් ගන්නට බැරි වෙනවා. ඒවා කඩාකප්පල් වෙනවා. අද බස් එකක යන විට තමුන්නාන්සේලා දන්නවා ඒ බස් එකේ සීට් කපා තිබෙන බව. විදුලි ලාම්පුවක් පාරේ සවි කරලා තිබුණාම ඒකට ගලක් ගහලා කඩලා දමනවා. පාලමක ලස්සනට තීන්ත ගාලා තිබුණොත් පෝස්ටර් ගෙනවිත් ඒකේ අලවනවා. එසේ නම් අප මහවැලිය හැදුවත්, කොපමණ කුඹුරු අස්වැද්දුවත්, නොයෙක් සංවර්ධන වැඩ කළත් මතු පරම්පරාවට ප්‍රයෝජනයක් ලබා ගන්නට ඒවා ඉතිරි වන්නේ නැහැ, අපි එක්තරා ප්‍රමාණයකටවත් හැදිච්ච පිරිසක් මේ රටේ බිහි කලේ නැත්නම්. එවැනි පිරිසක් බිහි කරන්නට පුළුවන් වෙන්නේ, ආගමික අධ්‍යාපනයක් ලබා දීමෙන් පමණයි. එසේ නම් ආගමික අධ්‍යාපනයට දැනට වඩා වැඩි වැදගත් කමක් එකතු කරන්නට ඕනෑ. ඒ සඳහා උනන්දුවක් ඇති කරවන්නටත් ඕනෑ.

මම ගිය අවුරුද්දේ මතක් කලා තමුන්නාන්සේට මතක ඇති, බෞද්ධ ළමයින් ඉගෙන ගන්නා හැම පාසලකටම ආගම ඉගැන්වීම සඳහා ගුරුවරුන් පත් කරන්නට ඕනෑ බව. අද ආගම ඉගැන්වීම සඳහා සාමාන්‍ය ගුරුවරුන් එසේ නැත්නම්, සහතික නොලත් ගුරුවරුන් යොදවා තිබෙනවා. ඒ උදවියගේ ආගම දැනීම සීමාසහිතයි. එමනිසා දහම් පාසල් අවසාන සහතිකය තිබෙන ළමයින්ට පාසල්වල දහම් ඉගැන්වීම සඳහා ගුරු පත්වීම් දෙන්න පුළුවන්. ඒ අය පාසල්වල ගණිත උගන්වන්නට අවශ්‍ය වෙන්නේ නැහැ. ඒ අය විද්‍යාව උගන් වන්න අවශ්‍ය වෙන්නේ නැහැ. ඒ අයට දහම් ඉගැන්වීම සඳහා දහම් පාසල් අවසාන සහතිකය ලබා තිබීම ප්‍රමාණවත් කියන එකයි මගේ හැඟීම. මේ දහම් පාසල් සහතිකය තිබෙන අය විද්‍යාලවල ගුරුවරුන් හැටියට පත් කරන්න ඕනෑ. අද හැම පාසලකට බෞද්ධාගම විෂයයක් හැටියට උගන්වනවා. අනිවාර්ය විෂයයක් හැටියට විභාගවලට නියම කර තිබෙනවා. එසේ නම් ඒ සඳහා විශේෂයෙන් සුදුසු ගුරුවරු පැලැන්තියක් පත් කරන්නට ඕනෑ. ගුරුවරුන් පත් කරන අවස්ථාවලදී දහම් ගුරු පත්වීම් දෙන්නේ දහම් පාසල් අවසාන සහතිකය තිබෙන අයට බව කිව්වොත් මේ රටේ හැම ළමයෙක්ම දහම් පාසල්වලට ගොස් ධර්මය ඉගෙන ගනීවි. ඒ විධියට ධර්මය ඉගෙන ගත්තොත් දහම් පාසල්වල ගුරුවරුන් වන්නට බැරි වුණත් මේ රටේ ධර්මය ඉගෙන ගත් පිරිසක් ඇති වෙනවා. එයින් මේ රටට යහපතක් වෙනවාය කියන එකයි මගේ අවංක හැඟීම.

ඊළඟට මම මතක් කරන්නට කැමතියි, මෙන්න මේ කාරණය. ඔබතුමාගේ අමාත්‍යාංශය තමයි මේ රටේ අමාත්‍යාංශ අතුරින් ඉතාමත්ම වැදගත් අමාත්‍යාංශය. ඒ අමාත්‍යාංශයෙන් තමයි මේ රටට වැදගත් සේවයක් කරන්නට පුළුවන්. තමුන්නාන්සේ දන්නවා මේ රට අවුරුදු 450 ක් යටත් විජිතයක් වෙලා තිබුණා. ඒ අවුරුදු 450 කාලය තුළදී විදේශිකයන් මේ රට පාලනය කරන අවස්ථාවේදී ඒ උදවියට ඕනෑ කලේ නැහැ අපේ රටේ සංස්කෘතිය ආරක්ෂා කරන්න. ඒ උදවියට ඕනෑ කලේ නැහැ අපේ රටේ සභ්‍යත්වය ආරක්ෂා කරන්න. ඒ උදවියට ඕනෑ කලේ නැහැ අපේ ආගම ආරක්ෂා කරන්න. මේ අවුරුදු 450 තිස්සේම විදේශිකයන් මේ රට පාලනය කරමින් කලේ මොකක්ද ? අපේ සංස්කෘතිය වළලා දැමීමට ඉතාමත්ම සියුම් උපක්‍රමශීලී ක්‍රියාවල යෙදීමයි. අපේ පූජනීය ස්ථාන ගරා වැටෙන්නට ඇරියා. ඒවා එහෙමම පස්වලට යට වුණා. ඉතිරි වුණේ පූජනීය ස්ථාන දෙකක් තුනක් පමණයි. අනුරාධපුර යුගයේ පොළොන්නරු යුගයේ, දඹදෙණි යුගයේ මේ රටේ සංස්කෘතිය කොයිතරම් දියුණුවෙලා තිබුණාද කියන එක ගැන මම අසා තිබෙනවා. නමුත් ඒවා සියල්ලක්ම අද නෂ්ටාවශේෂ බවට පත්වෙලා. ඒ නෂ්ටාවශේෂත් අද නැති වන තත්ත්වයට—

**නියෝජ්‍ය සභාපතිතුමා**
**(பிரதித் தவிசாளர் அவர்கள்)**
(The Deputy Chairman)

තමුන්නාන්සේට කොපමණ වේලා කථා කරන්න ඕනෑද ?

**ඩබ්ලිව්. පී. බී. දිසානායක මහතා**
**(திரு. டபிள்யு. பீ. பி. திஸாநாயக்க)**
**(Mr. W. P. B. Dissanayake)**

මම තව විනාඩි 5 කින් මගේ කථාව අවසන් කරනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම දැන් මේ මගේ කථාවේ වැදගත්ම හරියට එන්නේ.

අවුරුදු 450 ක් තිස්සේ වළලා දැමූ මේ සංස්කෘතිය අපි ගොඩ ගන්නවාද නැද්ද කියන එක අද මේ ගරු සභාවේදී අපි තීරණය කළ යුතුව තිබෙනවා. අපි නිදහස ලබා 1948 සිට මේ වනවිට අවුරුදු තිස් ගණනක් ගත වුණා. පෘතුගීසීන්ට, ඕලන්දකාරයන්ට, ඉංග්‍රීසීන්ට අපි අවුරුදු 450 ක් යටත්ව සිටිය බව හැබැව. අපේ වෙහෙර විහාර, පූජනීය ස්ථාන ආරක්ෂා කරන්න ඒ උදවියට කිසිම රුදවක් තිබුණේ නැහැ. නිදහස් ආණ්ඩුවක් වශයෙන් අද මේ රටේ බහුතර මහජනතාවගෙන් වැඩි කොටසක් අදහන ආගම වන බුද්ධාගමට අයිති සිද්ධස්ථාන පුනරුත්ථාපනය කරන්න ඒ මිනිසුන්ට ඕනෑ නැති වුණ එක හැබැව. නමුත් අද අපට එය ඕනෑ වී තිබෙනවා. නිදහස් ආණ්ඩු තිබිලත් ඒවා මේ පිළිබඳව කිසිම පියවරක් නොගත් නිසා, මේ රටේ බලය ලබාගෙන සිටි ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආණ්ඩුවක් හෝ වේවා, එක්සත් ජාතික පක්ෂයේ ආණ්ඩුවක් හෝ වේවා, එහෙම නැතිනම් සමගි පෙරමුණු ආණ්ඩුවක් හෝ වේවා ඔවුන් විසින් කළයුතු ක්‍රියාව හරියාකාර කලේ නැති නිසා ඒ හැම ආණ්ඩුවකටම දෝෂාරෝපණය කරන්නට අද අපට සිදු වී තිබෙනවා. මේවා පිරිහෙන්නට පටන්ගෙන දැන් අවුරුදු 480ක් විතර වෙනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ ඩබ්ලිව්. පී. බී. දිසානායක මහතා ]

ඒ පිරිහීම නවත්වා, අවුරුදු 450ක්, 460ක්, 470ක් තිස්සේ වළලා දමූ අපේ ඒ පූජණීය ස්ථාන, විනාශ වෙන්න ඉඩ හැර තිබූ අපේ ඒ පූජණීය ස්ථාන සංරක්ෂණය කිරීම සඳහා සංස්කෘතික ත්‍රිකෝණ වැඩපිළිවෙළ මඟින් යම්කිසි පියවරක් ගෙන තිබීම ගැන සංස්කෘතික ඇමතිතුමාටත්, ගරු ජනාධිපතිතුමාටත්, ගරු අගමැතිතුමාටත් අනේක වාරයක් මම ස්තුතිවන්ත වෙනවා.

මේ සංස්කෘතික ත්‍රිකෝණ වැඩපිළිවෙළින් මොකක්ද කර තිබෙන්නේ? අනුරාධපුරයේ දිසා ඇමතිතුමා මේ ගරු සභාවේ සිටිනවා. මම මහනුවර නියෝජනය කරනවා. අද පූජණීය ස්ථාන රාශියක් පුනරුත්ථාපනය කර යථා තත්ත්වයට පත් කිරීමට කටයුතු කරගෙන යනවා. නමුත් ගරු ඇමතිතුමාට තවදුරටත් ඒ කටයුත්ත කරන්නට පුළුවන්ද ? බැහැයි කියා මම කියනවා. තමුන්නාන්සේ යටතේ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ සිටි සේවකයන් පිළිබඳ සංඛ්‍යාලේඛන මා ළඟ තිබෙනවා. මම ඒ සංඛ්‍යාලේඛන කියවන්නම්.

1979 දී තමුන්නාන්සේ ළඟ සේවකයන් 1,050 ක් සිටියා. 1980 දී ඒ සංඛ්‍යාව 1,768 දක්වා නැංගා. 1981 දී 1,932 යි. 1982 දී 1,718 යි. 1983 දී 1,300 යි. 1984 දී 1,300 යි. 1985 දී 1,300 යි. 1986 දී තමුන්නාන්සේ කී දෙනෙක් මේ කටයුතු සඳහා යොදවන්නට බලාපොරොත්තු වෙනවාද ? කියා මම මේ අවස්ථාවේ දී අසන්නට කැමතියි. තමුන්නාන්සේ යොදවන්නට බලාපොරොත්තු වෙන්නේ 400 යි.

**ඩබ්ලිව්. එම්. ජී. ටී. බණ්ඩා මහතා**
**(திரு. டபிள்யு. எம். ஜீ. ரீ. பண்டா)**
**(Mr. W. M. G. T. Banda)**

150 යි.

**ඩබ්ලිව්. පී. බී. දිසානායක මහතා**
**(திரு. டபிள்யு. பீ. பி. திஸாநாயக்க)**
**(Mr. W. P. B. Dissanayake)**

150 යි. අවුරුදු 480 ක් තිස්සේත් අවුරුදු 450 ක් විදේශිකයන්ගේ යටතේත්, ඊට පසුව තිදහස් ආණ්ඩු ගණනක් යටතේත් වළලෙන්ට හැර තිබුණු, අපේ ඒ ආඩම්බර වෙන්න පුළුවන්, මුළු ලෝකයටම හඬගා හයියෙන් කියන්නට පුළුවන්, කාට වුණත් සාක්ෂි ඇතිව පෙන්නන්නට පුළුවන්, අපේ සංස්කෘතිය, අපේ ආගම ගොඩනගන්න තිබෙන මේ අවස්ථාවේ, අපේ ගරු ජනාධිපතිතුමා, අපේ ගරු අගමැතිතුමා, මේ රටේ නායකයෝ ඊට සම්පූර්ණ සහයෝගය දෙද්දී, අගමැතිතුමා සංස්කෘතික ත්‍රිකෝණයේ ගරු සභාපතිතුමා හැටියට කටයුතු කරද්දී, ලබන අවුරුද්දේ ඒ සඳහා පත් කරන්න බලාපොරොත්තුවන්නේ 150 යි. 150 කින් මොනවාද කරන්න යන්නේ. කියන්නටත් කණගාටුයි. තමුන්නාන්සේලා උතුරේත්, නැගෙනහිරේත් සංරක්ෂණ කටයුතු සම්පූර්ණයෙන්ම අත්හරින්නට බලාපොරොත්තු වෙනවය කියා මට ආරංචියි. මම ඒ ගැන ඊට වැඩිය කියන්නේ නැහැ. නමුත් ඒගැන මම කණගාටුව ප්‍රකාශ කරනවා. ඒ ප්‍රදේශවල සිටින උදවිය ඒ අයගේ ආගම අදහපුවාවේ. අපි කවුරුවත් බුද්ධාගමට හරවන්න කියන්නේ නැහැ. නමුත් උතුරු පළාතේත් නැගෙනහිර පළාතේත් තිබෙන අපේ ඒ පෞරාණික පූජණීය ස්ථාන සංරක්ෂණය කිරීමට යම්කිසි පියවරක් ගන්න තිබෙනවා නම් තිරගයව ඒ පියවර ගන්නය කියා. මම තමුන්නාන්සේට කියනවා. සමහරවිට මේවා කඩාකප්පල් කරන්න කුමන්ත්‍රණකාරී නිලධාරීන් ඉන්න පුළුවන්. ඔව් ! මේවා කඩාකප්පල කරන්න කුමණන්ත්‍රණගාරී නිලධාරීන් ඉන්න පුළුවන්. එවැනි නිලධාරීන්ට ඔලුව උස්සන්න දෙන්න එපා. අපේ සංස්කෘතිය වළලා දමන්න අපට තවදුරටත් ඉඩ දෙන්න බැහැ. ගරු නියෝජ්‍ය සභාපතිතුමා මා දිහා බලන කොට ඒ මට වාඩි වෙන්නයි කියන්න බව මම දන්නවා.

**නියෝජ්‍ය සභාපතිතුමා**
**(பிரதித் தவிசாளர் அவர்கள்)**
(The Deputy Chairman)

Order, please ! This is a difficult task for me. There are other speakers. Please co-operate with me.

**ඩබ්ලිව්. පී. බී. දිසානායක මහතා**
**(திரு. டபிள்யு. பீ. பி. திஸாநாயக்க)**
**(Mr. W. P. B. Dissanayake)**

Yes, Sir, there is one last point.

බදුල්ලේ ගරු මන්ත්‍රීතුමා — නියෝජ්‍ය ප්‍රාදේශීය සංවර්ධන ඇමතිතුමා — සංඝ ගෞරවය ගැන කථා කළා. ගරු ඇමතිතුමනි, ඒ පිළිබඳව ක්‍රියා කිරීමේ බලතලත් අපි බෞද්ධ කටයුතු කොමසාරිස්තුමාට ලබාදෙන්න ඕනෑ කියා මම ප්‍රකාශ කරනවා. අද මා ගැන අත්තනගල්ලේ ගරු මන්ත්‍රීතුමා (ලක්ෂ්මන් ජයකොඩි මහතා) කිව්වා. මට තළුවෙක්ය කිව්වා ; මම නාඩගම් කරුවෙක්ය කියා කිව්වා ; මම සංගීතඥයෙක්ය කියා කිව්වා. මම ඒවා ගැන කථා කරන්නේ නැහැ. ඒවා ඉස්සර කාලේ සිදුවුණු දේවල්. මම දැන් ඒවා කිසි දෙයක් කරන්නේ නැහැ. මම දැන් මහලුවියට පැමිණිලා.

**මන්ත්‍රීවරයෙක්**
**(அங்கத்தவர் ஒருவர்)**
(A Member)

බැරිය වෙණ ගායනා පෙරදේ.

**ඩබ්ලිව්. පී. බී. දිසානායක මහතා**
**(திரு. டபிள்யு. பீ. பி. திஸாநாயக்க)**
**(Mr. W. P. B. Dissanayake)**

දැන් මම විශ්‍රාම ලබා ඉන්නේ. වෙනත් ආගම්වලත් පූජකවරු චිත්‍රපටවල පෙනී සිටිනවාය කියා මම කියනවා. රූපවාහිනියේ නාට්‍ය අංශය ඉතාමත්ම දියුණු අංශයක්. ලෝකයේ ඕනෑම රටක් එක්ක තරඟ කරන්න පුළුවන් තත්ත්වයට රූපවාහිනියේ නාට්‍ය අංශය—ඒ කියන්නේ ටෙලි නාට්‍ය අංශය—අද සමත් වී තිබෙනවා. මම ඒ සම්බන්ධයෙන් ප්‍රශ්නයක් නොවෙයි කියන්නේ. කතෝලික පූජකතුමන්ලා, එක එක පින්තූරවල පෙනී සිටිනවා මම දක්කා. ඒ තියම කතෝලික පූජකතුමන්ලා, කිසිම කෙනෙකුට හිතුවක්කාර අන්දමට භික්ෂුත්වය ලබන්න බැහැ. කම්සයක්, සරමක්, කලිසමක් අඳින්නා වාගේ හිස මුඩු ගා සිවුරක් කරේ දමාගන්න බැහැ. අපේ භික්ෂූන් වහන්සේලාගේ ගෞරවය අපි ආරක්ෂා කරන්න ඕනෑ. මේ සම්බන්ධව මොකද කරන්නේ කියා අපේ මහනායක හාමුදුරුවන් වහන්සේලාගෙන් අහන්නය කියා මම ගරු ඇමතිතුමාගෙන් ඉතාමත්ම යටහත් පහත්ව කාරුණිකව ඉල්ලීමක් කරනවා. කලාව වළලා දමන්න එපා. කලාවත් අපේ සංස්කෘතියේ කොටසක්. කලාවත් අපිට අවශ්‍යයි. නමුත් මෙයට අවසර තිබෙනවාද—ඉඩ තිබෙනවාද—කියා භික්ෂූන් වහන්සේලාගෙන් අහන්න. එහෙම නැත්නම් ඒ වෙනුවට ආදේශකයක් යොද ගන්න බලන්න. සංඝයා වහන්සේලාගේ ගෞරවය අපි ආරක්ෂා කරන්න ඕනෑ. අපේ හාමුදුරුවන්ගේ ගෞරවය නැති වුණොත්, එහෙම නම් අපේ සංස්කෘතියත් එදාට ඉවරයි ; අපේ ආගමත් ඉවරයි ; අපේ හැදිච්චකමත් ඉවරයි. ඉතාමත්ම අභාග්‍ය සම්පන්න කාලවලදී මේ රටේ සෞභාග්‍ය ඇති කර ගැනීමට පසුබිම වුණේ අපේ මහා සංඝරත්නයයි. ඒ නිසා මහා සංඝරත්නයේ ගෞරවය අපි ආරක්ෂා කළ යුතුයි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, තමුන්නාන්සේ මට වාඩිවෙන්න කියන නිසා මම ඉක්මණින් වාඩි වෙනවා. නමුත් අමාරුකම් මධ්‍යයේ සැහෙන වැඩ කොටසක්—මහනුවරටත් විශේෂ වරප්‍රසාද, ප්‍රයෝජන ලබා දී තිබෙනවා—කර තිබීම ගැන මේ අමාත්‍යාංශයට මගේ ප්‍රසාදය පළ කරනවා. ඒ එක්කම මීට වැඩිය ප්‍රතිපාදන මේ අමාත්‍යාංශයට ලබාදිය යුතුය කියා මේ ගරු සභාවෙන් ඉල්ලීමකුත් මම කරනවා. දැන් මේ මිනිස්සු අස් කළොත් එකම සංරක්ෂණයක්වත් කරන්න බැහැ. එද තිබුණාටත් වැඩිය තරක තත්ත්වයකට කඩා වැටෙයි. දැන් හාරා තිබෙන ඒවා සංරක්ෂණය කළේ නැත්නම්, එහෙම නම් මේ කැණීම් නිසා අපි විනාශයක් කළා වෙනවා. එමනිසා මේ අමාත්‍යාංශයට මුදල් වැඩියෙන් ලබා දෙන්නය කියා ඉල්ලමින් මේ අවස්ථාව ලබාදීම ගැන තමුන්නාන්සේට ස්තුතිවන්ත වෙමින් මගේ කථාව නතර කරනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**නියෝජ්‍ය සභාපතිතුමා**
**(பிரதித் தலைவர் அவர்கள்)**
**(The Deputy Chairman)**

වාඩිවෙන එක හොඳයි, හුඟක් වේලා කථා කළා.

අ. භා. 4.45

**ආර්. එම්. අබේකෝන් මහතා**
**(திரு. ஆர். எம். அபேகோன்)**
**(Mr. R. M. Abeykoon)**

ජාතියේ ජීවය රඳා පවතින ඉතාම වැදගත් අමාත්‍යාංශයක වැය ශීර්ෂය සාකච්ඡා කරන මේ අවස්ථාවේ මටත් කථා කරන්න අවස්ථාව ලබාදීම ගැන නියෝජ්‍ය සභාපතිතුමාට අනේක වාරයක් ස්තුතිවන්ත වන බව ප්‍රකාශ කරන්න කැමතියි. අපේ ජාතියට එක්තරා සංස්කෘතික රටාවක් තිබුණු බව අපි දන්නවා. මේ සංස්කෘතික රටාව විදේශීන්ගේ ආක්‍රමණය නිසා පූර්ණ වශයෙන් වැළලී ගියා. අවසානයේදී මේ 1977 න් පසු අපේ සංස්කෘතික හැඳියාවන් ඒ රටාවන් පුනර්ජීවයට පත් කරන්න වැදගත් අරමුණු රාශියක් ඉටු වී තිබෙන බව මේ අවස්ථාවේදී මම මතක් කරන්න කැමතියි. ඒ පිළිබඳව කියන කොට අපේ ගරු සංස්කෘතික ඇමතිතුමාට මගේ ඉමහත් ගෞරවය මේ අවස්ථාවේදී පුද කරන්න ඕනෑ. එතුමාගේ පරිශ්‍රමය තුළින් විශාල සංස්කෘතික දායාදයන් රාශියක් අපට ආරක්ෂා කරදෙන වැඩ පිළිවෙලවල් සකස් වී තිබෙන බව විශේෂයෙන් මතක් කළ යුතුයි. මේ සම්බන්ධව ගරු මන්ත්‍රීවරුන් කරුණු රාශියක් ඉදිරිපත් කළා. ඒ කෙසේ වෙතත්, මේ සංස්කෘතික ත්‍රිකෝණ කටයුතු පිළිබඳව සඳහන් කරන විට ඌව පළාත පිළිබඳවත් මතක් කරන්න ඕනෑ. සංස්කෘතික ත්‍රිකෝණ කටයුතුවලට යොමු වී තිබෙන්නේ මහනුවරත්, පොළොන්නරුවත්, අනුරාධපුරයත් කියන ත්‍රිකෝණය අතර තිබෙන අපේ නෂ්ටාවශේෂයි. නමුත් ඌව පළාතේ තිබෙන නෂ්ටාවශේෂ දෙස බලනවිට ඇත්ත වශයෙන්ම ඒවා බොහෝ ඉපැරණි නෂ්ටාවශේෂ බව ඒත්තු යනවා ඇති. සංස්කෘතික ගුණධර්ම සංස්කෘතික රටාවන් ඒ රටේ තිබෙනවා. අර සොළී පාඩි ආදීන් පැමිණ උතුර, මධ්‍යම ප්‍රදේශ ආක්‍රමණය කරන විට, අපේ බෞද්ධ ශිෂ්ඨාචාරය, අපේ හැඳියාවන් සියල්ල ආරක්ෂා වුණේ, ඊට අවශ්‍ය පදනම වැටුණේ ඌව රුහුණු ප්‍රදේශයෙන් කියන එක මම විශේෂයෙන් සඳහන් කරන්න ඕනෑ.

ඌවේ සෑම කන්දක් පාසාම තිබෙන ගල්ගුහාවල බෞද්ධ පිළිම වහන්සේලා දකින්න ලැබෙනවා. නිධන් හොරුන් විසින් විනාශයට පත්කළ ඒවා කොපමණ දකින්න ලැබෙනවාද ? ත්‍රිකෝණ සංරක්ෂණ කටයුතු වගේම ඌව පළාතේ තිබෙන මෙම බෞද්ධ ශිෂ්ඨාචාරය නගා සිටුවාලීමට මේ රජය යටතේ ගරු සංස්කෘතික ඇමතිතුමාගේ අවධානය යොමු කරනවා ඇතැයි මම බලාපොරොත්තු වෙන්නේ එය කළ යුතුම වැඩක් නිසයි.

ගරු ඇමතිතුමාට මේ අවස්ථාවේදී මම ස්තුතිවන්ත වෙනවා යුදගනාව චෛත්‍ය සංරක්ෂණය සඳහා අපට සෑහෙන ආධාරයක් ලබාදීම ගැන. මේ රටේ විශාලම සංවර්ධනයක් ඇති වූ, ජාතික නිදහස පිළිබඳව රටේ ඒකීය භාවයක් ඇති වූ ශිෂ්ටාචාරයක් සහ සංස්කෘතියක් බිහිවූ දුටුගැමුණු යුගයේ ආරම්භය ඌව පළාතේ පිහිටි මේ යුදගනා භූමියයි කියා අපට කියන්න පුළුවන්.

ඒ වාගේම මොනරාගල දිස්ත්‍රික්කයේ පිහිටි ගල්ටැම් මණ්ඩිය, දෙමටවල් විහාරය ආදී වෙහෙර විහාර රාශියක් පිළිබඳව ගරු ඇමතිතුමාගේ අවධානයට යොමු කරන්නේ ඒවායේ තිබෙන සංස්කෘතික වටිනාකම රැකගැනීමට අමාත්‍යාංශයේ පූර්ණ සහයෝගය ලබා දෙන ලෙස ඉල්ලා සිටීම සඳහායි.

මහනුවර ගරු දිසා ඇමතිතුමාගෙන් කියවුණා, විදේශිකයන්ගේ ආක්‍රමණයෙන් පස්සෙ අපේ සංස්කෘතියට ඇති වුණ බාධාවන් සහ බලපෑම් පිළිබඳව. එම තත්ත්වයන් නැවත නගා සිටුවීම සඳහා ගරු ඇමතිතුමාත්, ගරු නියෝජ්‍ය ඇමතිතුමාත් මේ දිනවල දරණ උත්සාහයක් ගැන එතුමන්ලා දෙපළට අපේ පූර්ණ ස්තුතිය ජාතිය වෙනුවෙන් පිරිනමන්න කැමතියි. සභාපතිතුමාට ස්තුතියි.

**අමරසිරි දොඩන්ගොඩ මහතා (බද්දේගම)**
**(திரு. அமரசிறி தொடங்கொட — பத்தேகம)**
**(Mr. Amarasiri Dodangoda – Baddegama)**

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම වැඩි වෙලාවක් කාලය ගන්න බලාපොරොත්තු වන්නෙත් නැහැ. ඒවාගේම මෙම අමාත්‍යාංශ යටතේ ඇති ආයතන ගැන කථා කරන්නට බලාපොරොත්තු වන්නෙත් නැහැ. අපේ ගරු ඇමතිතුමාත් ගරු නියෝජ්‍ය ඇමතිතුමාත් හොඳ අදහස් දරණ අය වෙන්න පුළුවන්. නමුත් මෙන්න මේ ලේඛනයේ ඇති විස්තර ගැන මම එතුමන්ලාගේ විශේෂ අවධානය යොමු කරනවා. මේ ගැන පොඩ්ඩක් කන් දුන්නොත් හොඳයි :

" හෙරොයින් ග්‍රෑම් 2 ක් ළඟ තබාගෙන අසුවන්නෙක් සිය දිවි හානි වනතුරු ගෙල සිර වන සේ එල්ලා තැබිය හැකි නීතිය දැන් ක්‍රියාත්මකය. 1981 මුළු ලංකාවෙන්ම අසු වූයේ හෙරොයින් ග්‍රෑම් 77 ක් වුවත් 1984 මුල් මාස තුනේ කොළඹින් පමණක් හෙරොයින් ග්‍රෑම් 1,200 ක් අල්ලාගෙන තිබේ. හෙරොයින් වෙළන්දන්ගෙන් හතරෙන් එකක්ම වෙළඳාම් කරන්නේ පාසල්වල බව පොලිස් මත් ද්‍රව්‍ය අංශය කියයි. 1981 දී මත් ද්‍රව්‍ය ප්‍රවාහනය කර විදේශයන්හිද අසු වූ ශ්‍රී ලාංකිකයන්ගේ ගණන 82 කි."

**නියෝජ්‍ය සභාපතිතුමා**
**(பிரதித் தலைவர் அவர்கள்)**
**(The Deputy Chairman)**

ගරු මන්ත්‍රීතුමාට මිනිත්තු 10යි කථා කරන්න පුළුවන්.

**අමරසිරි දොඩන්ගොඩ මහතා**
**(திரு. அமரசிறி தொடங்கொட)**
**(Mr. Amarasiri Dodangoda)**

" 1982 දී 117ක් වූ මේ සංඛ්‍යාව 1983 දී 147ක් බවට පත් විය. වෙල්වෙටිතුරෙහිදී හෙරොයින් ග්‍රෑම් එකක මිල රුපියල් 80කි. ගාල්ලේදී රුපියල් 250කි. කොළඹදී රුපියල් 350කි. හෙරොයින් අලෙවි කරන කොළඹ ව්‍යාපාරිකයින් 200ක් සිටින බව පොලීසිය කියයි. "

මේ අනුව බලන විට තමුන්නාන්සේගේ කටයුත්ත අමාරු වී තිබෙන්නේ තමුන්නාන්සේගේ අඩුපාඩුව උඩ නොවෙයි. අපේ සංස්කෘතිය පිළිබඳ තත්ත්වය කොයි අතට ගමන් කරනවාද කියන එක ගැන මුළු කැබිනට් මණ්ඩලයේම මුළු රජයේම අවධානය යොමු කරන්න වෙනවා. ගල්කිස්ස උසාවියේ නඩු කටයුතු අපි අරගෙන බැලුවොත් දවසකට විකුණන දරුවන් සංඛ්‍යාව බලන්න. සල්ලි නැතිකමට, හදාගන්න බැරුව, තමන් වදපු දරුවො විකුණලා අම්මලා අඩ අඩ යනවා. මේවා අපේ රටේ ආරම්භ වුණු දේවල් නොවෙයි. අපි ආශ්‍රය කරන රටවලින් පුරුදු වුණ දේවල්. දකුණු කොරියාවේ වර්තමාන පාලකයාගේ ආණ්ඩු කාලයේදී පළමු අවුරුදු තුන තුළ 4,30,000ක් ඇමරිකාවට විකුණලා තිබෙනවා. එයින් 7,150ක් දරුවො, වකුගඩු සඳහා විකුණා තිබෙනවා. මිනිසුන් විකිණීම පිළිබඳව කටයුතුවල යෙදී සිටින දකුණු කොරියාව මේ රජයේ වර්තමාන වැඩපිළිවෙළ අනුව අපේ මිත්‍ර රටක්. දකුණු කොරියාවේ මිනිසුන්ගේ ජීවිත ගැන සංස්කෘතියට බලපාන කරුණු ගැන විශේෂයෙන් කියන්න වුවමනා නැහැ. අපේ රජයේ හොඳ මිත්‍ර රටවල් තමයි, ලෝකයේ හෙරොයින් ව්‍යාපාරයේ ලොක්කො. පාකිස්ථානයේ හා ඉරානයේ තමයි වැඩි වශයෙන්ම හෙරොයින් භාවිතය සිදු වන්නේ. ඒ වාගේම මලයාසියාව, තායිලන්තය, පිලිපීනය, හොංකොං ආදී රටවල් තමයි, හෙරොයින් රජරුන්ගේ රටවල්. මේ රටවල් එක්ක තමයි, අපේ රටේ හෙරොයින් ව්‍යාපාරය බැඳී තිබෙන්නේ. දොස්තර තාලක මෙන්ඩිස් මහතා මත් ද්‍රව්‍ය රෝගීන් 10 දෙනෙකුට ප්‍රතිකාර කරන බවත්, එයින් කොටසක් ගැහැණු ළමයින් බවත් ප්‍රකාශ කර තිබෙනවා. මෙයට විසඳුමක් සෙව්වේ නැත්නම් සංස්කෘතික ඇමතිවරයාට සංස්කෘතික ත්‍රිකෝණය ගැන හෝ වෙන යම් කටයුතු පිළිබඳව හෝ අපි කිවයුතු නැහැ. ඉතිහාසය දෙස බලනවිට, ලංකාව වාගේ, ආසියාකරයේ ජනතාව වාගේ, සංස්කෘතික මට්ටමෙන් ඉදිරියෙන් සිටියේ නැහැ යුරෝපීයයන්. ලංකාවේ හය වැනි පරාක්‍රමබාහු රජ්ජුරුවො " කව්සිළුමිණ " ලියනවිට, එංගලන්තයේ ජෝජ් රජ්ජුරුවො 1215 දී මහජන සර්වාධිපත්‍යය පිළිබඳ පළමු ගිවිසුම පාර්ලිමේන්තුවට අත්සන් කර දුන්නේ කොහොමද ? එතුමාට අත්සන් කරන්න බැරිව සීල් එක තියලයි දුන්නේ. ඒ අවස්ථාවේදී අපේ හය වැනි පරාක්‍රමබාහු රජ්ජුරුවො ලියූ පොත අදවත් අපට තෝරා ගන්න බැහැ. නමුත් ශත වර්ෂ ගණනක් තුළදී විජිතවාදය සහ යුරෝපයේ ඇතිවූ කාර්මීකරණය හේතුවෙන් අපි පස්සට ගියා. ජාතියක් හැටියට අපේ තිබුණු ප්‍රෞඪත්වය, අපේ රජවරුන්ගේ තිබුණු සංස්කෘතිය, ශාස්ත්‍රීය මට්ටම පහළ වැටුණා. අද අපි ඔවුන්ගේ වාණිජ ක්‍රමයට කොයි තරම් දුරට ඇතුළු වෙලාද කිව්වොත්, තව ටික කාලයක් යනවිට මේ ලී ඉවරවූවිට දුව කොන්ත්‍රාත් කරුවන්ගෙන් එක බෝගහක් බේරා ගන්න පුළුවන් වුණොත් පුදුමයි. ගොඩනැගිලි කොන්ත්‍රාත්කරුවන්ගෙන් ලෝවාමහාපායේ ගල් කණු බේරා ගන්න පුළුවන් වුණොත් පුදුමයි.

මේ රට යන තත්ත්වය කොයිතරම් වාණිජත්වයට යොමු වෙලාද කිව්වොත් මම දැක්කා එක් පත්‍රයක ශ්‍රී මහා බෝධීන්වහන්සේගේ බෝ පත් පිටරට යැවීම සම්බන්ධයෙන් සඳහන් වී තිබෙනවා. එය සම්පූර්ණයෙන්ම



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[අමරසිරි දොඩන්ගොඩ මහතා]

තතර කරත්තටය කියා මා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. අධ්‍යාත්මික ගුණ ධර්ම සහ අපේ ජාතියේ උරුමයන් මේ විධියට වාණිජ මට්ටමට ගෙනාවොත් ඇත්තවශයෙන්ම අපට අපේ සංස්කෘතියක් ගැන කථා කරන්න දෙයක් ඉතුරු වෙන එකක් නැහැ. මෙය ඇමතිතුමාගේ හෝ නියෝජ්‍ය ඇමතිතුමාගේ හෝ දෙපාර්තමේන්තුවේ හෝ කර්තව්‍යයක් නොවෙයි. මෙය සාමාන්‍යයෙන් සිදුවන දෙයක්. රටක වානිජත්වය ඉස්මතු වන විට, සල්ලි වැදගත් වන විට, ඒ රට ඇසුරු කරන රටවල භාවිතා වන ක්‍රමලවලට ඒ රට ඇබ්බැහි වෙනවා. ඒ තත්ත්වය අපේ රටටත් සිදු වෙන්න පුළුවන්. ජාතික සමගිය පිළිබඳ ප්‍රශ්නයටත් මෙය බලපාන්න පුළුවන්. සර් පොන්නම්බලම් අරුනාචලම්, පොන්නම්බලම් රාමනාදන්, ඩී. එස්. සේනානායක, එෆ්. ආර්. සේනානායක සහ එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක ආදී අය අපේ රටේ නිදහස සඳහා සටන් කළේ, අපේ ජාතිය වෙනුවෙන් සටන් කළේ ඒ සියළු දෙනාම එකට වාඩිවෙලයි. නමුත් අද අපේ සංස්කෘතික වශයෙන් තිබෙන හැඟීම් කොයිතරම් දුරට වෙනස් වෙලාද කියා කිව්වොත්, ගිය සුමානෙ එක සහෝදරයෙක් මට ඇවිත් කිව්වා, පොල්ලෙලි තලමින් හිටිය එක්කෙනෙක්, පොල්ලෙලි තලන පොල්ල තවත්වලා කිව්වාලු " අන්න රෝයි ඩයස් පරාදයි " කියලා. මෙහෙම කියන්නේ ගම්වල ඉන්න අම්මලා. මේ අයගේ මනස විකෘති කරවලා, රටේ තිබුණු තත්ත්වයන් අමතක කරවලා, මොන විදියට ආකල්ප වෙනස් කර තිබෙනවාද යන්න පිළිබඳව මුළු රජයම වගකිව යුතු වෙනවා. එය සංස්කෘතිය පිළිබඳ කටයුතු ඇමතිවරයාට හෝ නියෝජ්‍ය ඇමතිවරයාට එහෙම නැත්නම් ඒ දෙපාර්තමේන්තුවට පමණක් සීමා වූ දෙයක් නොවෙයි.

**වෛද්‍යාචාර්ය පී. එම්. බී. සිරිල් මහතා (හම්බන්තොට දිසා ඇමතිතුමා)**
**(வைத்திய கலாநிதி பீ. எம். பி. சிறில் — ஹம்பாந்தோட்டை மாவட்ட அமைச்சர்)**
**(Dr. P. M. B. Cyril – District Minister, Hambantota)**

ක්‍රිකට් ගහන්න එපා කියලද තමුන්නාන්සේ කියන්නේ ?

**අමරසිරි දොඩන්ගොඩ මහතා**
**(திரு அமரசிறி தொடங்கொட)**
**(Mr. Amarasiri Dodangoda)**

එපා කියලා නොවෙයි, මම කියන්නේ. මා පැහැදිලිව ප්‍රකාශ කරන්න කැමතියි ක්‍රිකට් ජාතික ක්‍රීඩාවක් නොවන බව. ඒක මේ රටේ ඉන්න ලක්ෂ 160න් 25,000ක් විතර කරන ක්‍රීඩාවක්. ඒ මිස මුළු රටේම ක්‍රීඩාවක් නොවෙයි. ඒ බව පිළිගත යුතුයි. ජාතික ක්‍රීඩාව කියන්නේ ගමේ හැම ළමයෙකුටම සහභාගි වන්න පුළුවන් ක්‍රීඩාවලටයි.

**ජී. වී. පුංචිනිලමේ මහතා (නියෝජ්‍ය වනිතා කටයුතු හා ශික්ෂණ රෝහල් ඇමතිතුමා)**
**(திரு. ஜி. வி. புஞ்சிநிலமே — மாதர் அலுவல்கள், போதனா வைத்தியசாலைகள் பிரதி அமைச்சர்)**
**(Mr. G. V. Punchinilame – Deputy Minister of Women's Affairs and Teaching Hospitals)**

එහෙම නම් ළිදේ ඉන්න ගෙම්බො වගේ ඉන්න ඕනෑ.

**අමරසිරි දොඩන්ගොඩ මහතා**
**(திரு. அமரசிறி தொடங்கொட)**
**(Mr. Amarasiri Dodangoda)**

ළිදේ ඉන්න ගෙම්බෝ නොවෙයි. ලෝකයේ දියුණුම රටවල් ජාත්‍යන්තර ක්‍රිකට් තරගවලට සහභාගි වන්නේ නැහැ. බොහොමයක් දියුණු රටවල ජාතික ක්‍රීඩාව ක්‍රිකට් නොවෙයි, වෙනත් ක්‍රීඩාවකුයි. තමුන්නාන්සේලා කියනවාද, රුසියාව, ඇමෙරිකාව ජාත්‍යන්තර ක්‍රිකට් තරගවලට සහභාගි වෙනවාය කියා ? [බාධා කිරීම්] ක්‍රිකට්, ජාතික ක්‍රීඩාවක් බවට පත් වී තිබෙන්නේ, බ්‍රිතාන්‍ය පාලන ක්‍රමය තිබුණු රටවල් කීපයක විතරයි.

**ජී. වී. පුංචිනිලමේ මහතා**
**(திரு. ஜி. வி. புஞ்சிநிலமே)**
**(Mr. G. V. Punchinilame)**

තමුන්නාන්සේ කියන්නේ තමුන්නාන්සේලාගේ යුගයේ මෙන් ළිදේ ඉන්න ගෙම්බෝ වගේ ඉන්නය, දියුණු වෙන්න එපා කියාද?

**අමරසිරි දොඩන්ගොඩ මහතා**
**(திரு. அமரசிறி தொடங்கொட)**
**(Mr. Amarasiri Dodangoda)**

මම මේ අවස්ථාවේදී ඒ ප්‍රකාශය කළේ මේ නිසයි : සාංස්කෘතික කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමාත්, නියෝජ්‍ය ඇමතිතුමාත්, අදාල ඒ ඒ දෙපාර්තමේන්තුවල නිලධාරි මහතුනුත් අවධානය යොමු කළ යුතු දෙයක් තිබෙනවා. අපේ සංස්කෘතියට හානි වන අන්දමින් සිදු වෙගෙන යන බලපෑම්වලට විරුද්ධව ක්‍රියාත්මක වී අපේ සංස්කෘතිය ආරක්ෂා කර ගන්න ඇති කරන වැඩ පිළිවෙල තමන්ගේම ක්‍රමයක් තුළ ගොඩ නඟා ගන්න බැරි නම්, අපේම රටට උරුම වූ ක්‍රමයක් තුළ ගොඩ නඟා ගන්න බැරි නම් ඒ කටයුත්ත සාර්ථකව කරන්න බැරි වෙනවා. අපේ සංස්කෘතියට හානිකර අන්දමින් විදේශවලින්, නොයෙකුත් මාධ්‍යයන් තුළින් කෙරෙන බලපෑම් සහ එමගින් අපේ තරුණ පිරිස් මානසික දූෂණයකට පත්වීමත් පිළිබඳව සොයා බැලිය යුතුයි. එය හුදෙක් සාංස්කෘතික අමාත්‍යාංශයේ නනි වගකීමක් නොව රජයේ පොදු වගකීමක් බවත් මෙහිදී පෙන්වා දෙන්න ඕනෑ. ඒ නිසා රජයේ පැහැදිලි ප්‍රතිපත්තියකුත්, විධිමත් වැඩ පිළිවෙලකුත් තුළින් අපේ සංස්කෘතිය ආරක්ෂා කර ගන්න වහාම ක්‍රියාත්මක විය යුතුව තිබෙනවා.

ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් කියනවාද, දරුවන් විකිණීම වැඩි වෙලා නැහැ, හෙරොයින් පාවිච්චිය වැඩි වෙලා නැහැ, නොයෙකුත් විධියේ දූෂණ වැඩි වෙලා නැහැ කියා ? තව ටික දවසක් යන විට මිනිස්සු වෙල්ලෝරයේ ඉස්පිරිතාලයට වකුගඩුත් විකුණයි. ඒ නිසා අපි කියනවා, මේ තත්ත්වයට තුඩු දුන් පසුබිම කෙරෙහි ප්‍රතිපත්තිමය වශයෙන් රජය වගකිව යුතුය කියා. ඇත්තවශයෙන්ම කියනවා නම් මේ ආණ්ඩුව බලයට ආවාට පස්සේ මේ රටේ සාංස්කෘතිකමය පසුබෑමක් ඇති වුණා. රජයේ ප්‍රතිපත්ති හේතුකොටගෙන මේ රටේ " වීඩියෝ " සාප්පු ඇති වුණාට, වැඩි වුණාට පහුගිය අවුරුදු 8 ක කාලය තුළ එක පොත් සාප්පුවක්වත් වැඩි වුණේ නැහැ.

**චන්ද්‍රකුමාර විජය ගුණවර්ධන මහතා (කඹුරුපිටිය)**
**(திரு. சந்திரகுமார விஜய குணவர்த்தன — கம்புறுப்பிட்டிய)**
**(Mr. Chandrakumara Wijeya Gunawardane – Kamburupitiya)**

පසුගියදත් සාංස්කෘතික දෙපාර්තමේන්තුවෙන් පොත් සාප්පුවක් විවෘත කෙරුණා—[බාධා කිරීම්]

**අමරසිරි දොඩන්ගොඩ මහතා**
**(திரு. அமரசிறி தொடங்கொட)**
**(Mr. Amarasiri Dodangoda)**

දැනට මාසයකට වගේ උඩදී—

**ජී. වී. පුංචිනිලමේ මහතා**
**(திரு. ஜி. வி. புஞ்சிநிலமே)**
**(Mr. G. V. Punchinilame)**

තමුන්නාන්සේ කියන්නේ—

**නියෝජ්‍ය සභාපතිතුමා**
**(பிரதித் தலைவர் அவர்கள்)**
**(The Deputy Chairman)**

Order please ! Hon. Deputy Minister if you want to make a speech, please get up and do so. You are the Deputy Minister of Women's Affaris and Teaching Hospitals – you must keep up your standard.

**අමරසිරි දොඩන්ගොඩ මහතා**
**(திரு. அமரசிறி தொடங்கொட)**
**(Mr. Amarasiri Dodangoda)**

අක්මීමන ගරු මන්ත්‍රීතුමා (රිචඩ් පතිරණ මහතා) මේ ගරු සභාවට ඉදිරිපත් කළා, කඩවල ප්‍රසිද්ධියේ එල්ලා විකුණන පත්‍ර කීපයක්. ඒ පත්‍රවල තිබෙන දේවල් දක්කාම වර්තමාන ලංකාවේ සංස්කෘතිය මොකක්ද කියා තේරෙනවා.

අන්න ඒ නිසා මම රජයේ දැඩි අවධානය යොමු කරවන්න කැමැතියි, අපේ වටිනා සංස්කෘතිය, දැනටමත් සිදු වෙමින් පවතින විනාශයෙන් බේරා ගැනීම, ආරක්ෂා කර ගැනීම සඳහා රජය වහාම ජාතික අවශ්‍යතාවන්ට අනුකූලව

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පැහැදිලි පියවරක් ගත යුතුය කියන කාරණය කෙරෙහි. ඒ ව්‍යසනයෙන් අපේ සංස්කෘතිය බේරා ගැනීම සඳහා රජය වහාම ප්‍රතිපත්තිමය තීරණයක් ගත යුතුව තිබෙනවා. එසේ ගන්නාවූ ප්‍රතිපත්තිමය තීරණය තුළින් ක්‍රියාත්මක වී කටයුතු කරන ලෙස ගරු ඇමතිතුමාගෙනුත්, නියෝජ්‍ය ඇමතිතුමාගෙනුත්, අදාළ වගකිව යුතු නිලධාරී මහතුන්ගෙනුත් ඉල්ලා සිටිමින් මම නිහඬ වෙනවා.

අ. භා. 5.00

**චන්ද්‍රකුමාර විජය ගුණවර්ධන මහතා**
**(திரு. சந்திரகுமார விஜய குணவர்த்தன)**
**(Mr. Chandrakumara Wijeya Gunawardane)**

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, සංස්කෘතික අමාත්‍යාංශයේ අලුත් වැඩ පිළිවෙළ යටතේ එක පොත් සාප්පුවක්වත් ආරම්භ කර නැතැයි බද්දේගම ගරු මන්ත්‍රීතුමා කීවා. සංස්කෘතික අමාත්‍යාංශයෙන් බිහි වන සියලුම ප්‍රකාශන අලෙවි කිරීමේ මධ්‍යස්ථානයක් පසුගිය ද මාතර නගරයේදී විවෘත කෙරුණු බව එතුමාට මතක් කරන්න කැමැතියි.

**අමරසිරි දොඩන්ගොඩ මහතා**
**(திரு. அமரசிறி தொடங்கொட)**
**(Mr. Amarasiri Dodangoda)**

මම කිව්වේ සංස්කෘතික අමාත්‍යාංශය ගැන නොවෙයි. කොළඹ නගරයේ, පෞද්ගලික අංශයේ එක පොත් සාප්පුවක්වත් වැඩි වී තිබෙනවා නම් කරුණාකර කියන්න.

**චන්ද්‍රකුමාර විජය ගුණවර්ධන මහතා**
**(திரு. சந்திரகுமார விஜய குணவர்த்தன)**
**(Mr. Chandrakumara Wijeya Gunawardane)**

මම කියන්නේ කොළඹ නගරය ගැන නොවෙයි, මාතර නගරය ගැනයි.

**අමරසිරි දොඩන්ගොඩ මහතා**
**(திரு. அமரசிறி தொடங்கொட)**
**(Mr. Amarasiri Dodangoda)**

මාතර නගරයේවත් වැඩි වී තිබෙනවා නම් පෙන්වන්න.

**චන්ද්‍රකුමාර විජය ගුණවර්ධන මහතා**
**(திரு. சந்திரகுமார விஜய குணவர்த்தன)**
**(Mr. Chandrakumara Wijeya Gunawardane)**

එන්න මාතරට, පෙන්වන්න. සංස්කෘතික අමාත්‍යාංශයේ අතිරේක ලේකම්තුමා පසුගිය ද මාතරට ගිහින් මාතර දිස්ත්‍රික්කයේ සියලුම මැති-ඇමතිවරුන්ගේත් සහභාගිත්වයෙන් පොත් සාප්පුවක් විවෘත කළා.

**අමරසිරි දොඩන්ගොඩ මහතා**
**(திரு. அமரசிறி தொடங்கொட)**
**(Mr. Amarasiri Dodangoda)**

රේස් කොළ නම් වැඩි වී තිබෙනවා.

**ඩබ්. ජේ. එම්. ලොකුබණ්ඩාර මහතා (ඇමතිතුමා)**
**(திரு. டபிள்யு. ஜே. எம். லொக்குபண்டார — அமைச்சர்)**
**(Mr. W. J. M. Lokubandara - Minister)**

නියෝජ්‍ය සභාපතිතුමනි, මේ මුළු ගරු සභාවම බරපතළ සංස්කෘතික අර්බුදයකට මුහුණ දී තිබෙන බව පෙනෙනවා. ඒ ඒ අයගේ හිතේ හැටියට තම තමන් මනාප දේවල් තමයි, වටිනාම දේවල් වන්නේ. මෙහිදී එක්තරා කථාවක් මගේ සිහියට එනවා. එක හංසයෙක් මානස විලට ගොස් මානස විලේ තිබෙන ලස්සන ගැන වර්ණනා කරන විට එය අසා සිටි එක් එක් කෙනා එක එක දේවල් ගැන ඇසුවාලු. ඒ අතර ඒ විලේම සිටි ගෙම්බෙක් ඇසුවාලු, මේ මානස විලේ ඒ ඇත්තන්ට සුදුසු ඒ ඇත්තන්ගේ ආහාරයට ගැලපෙන ජීවා එහෙම තිබෙනවාද කියා. සභාවක වුණත් එහෙමයි.

මා ළඟ තිබෙනවා ඊසොප්ගේ උපමා කථා කියා පොතක්. එහි උපමා කථාවකත් එවැනිම දෙයක් තිබෙනවා. ඒ කථාන්තරවලින් කියැවෙන්නේ අපි එක එක්කෙනා වටිනාකම හැටියට සලකන්නේ ඒ ඒ අයට ගැලපෙන දේවල්ය කියන එකයි. වෙළඳම ගැන කල්පනා කරන විට පොත් වෙළඳමත් එක්තරා විධියක ලාභදායක වෙළඳමක් බවට පත් වූ එක්තරා යුගයකුත් මේ රටේ තිබුණා. පොත් වෙළඳම ඉතාම සරු වටිනා වෙළඳම් ක්‍රමයක්. අපේ රටේ විශේෂ වෙනසක් වුණා, පසල් පොත් නොමිලේ ලබාදීම නිසා. මේක අපි හොඳට මතක තබා ගන්න ඕනෑ. පාසල් පොත් දඩමීමා කරගෙන යස ජාවාරම් කරගත් පිරිසකට ඒ තුළින් මුදල් ලබා ගැනීමේ වාසිය නැතිවීමට එක්තරා ආකාරයකින් මෙය හේතු වුණා. තර්කයක් වශයෙන් බොහෝවිට ඉදිරිපත් කරන දෙයක් තමයි, පොත් සාප්පු වැඩි වන්නේ නැත, අනික් ඒවායි වැඩි වන්නේ කියන එක. වෙළඳම කියන එක අපි තර්කයකට ගන්නවා නම් වෙළෙන්ද කවදාවත් ජනතාවට වාසි වන දේවල් බල බලා හෝ ජනතාවගේ රස වින්දනය දියුණු කිරීම බලාගෙන හෝ නොවෙයි, මේ වැඩේ කරන්නේ. ඒක ව්‍යාපාරයක්. ඒක මිණුම් දණ්ඩ කරගෙන අපේ රටේ සංස්කෘතික තත්ත්වය මනින්නට යන එක සාධාරණද කියා මම අපේ බද්දේගම ගරු මන්ත්‍රීතුමාගෙන් (අමරසිරි දොඩන්ගොඩ මහතා) අහනවා. එහෙම නම් අපි තක්සේරුවට ගන්නේම වෙළඳමේ සරුසාර බවයි. එහෙම නම් පොත් වෙළඳම හොඳයි නම්, හොඳ සංස්කෘතියක් තිබෙනවා. එහෙම බලනවා නම් සංස්කෘතිය අතින් ඉතා වටිනවාය කියන පොළොන්නරු යුගයේදී නැත්නම් අනුරාධපුර යුගයේදී කොපමණ පොත් සාප්පු තිබුණාද කියා මම අහනවා. එහෙම කල්පනා කරන එක හරි නැහැ. දහස් දෙනෙකුට වුවත් එක පොත හඬ නගා කියවන්න පුළුවන්. සමහරවිට රුවන්මැලි සෑය වැනි තැනකදී පෝදක ජාතක පොත අහන විට සියළු දෙනාම පොත් කියවන්නට දැනගන්නාටවත් වැඩි දෙනාට අකුරු කියවන්නට පුළුවන් වුනාමවත් වැඩි වැඩියෙන් පොත් අලෙවි වන නිසාවත් සංස්කෘතිය දියුණු වෙනවා කියන තර්කය ඉදිරියට ගෙන යන්න බැහැ. හැම විටකම ඒ තර්කය හරිත් නැහැ.

බද්දේගම ගරු මන්ත්‍රීතුමා ඉතාමත්ම සරු පදනමක් මත තුන්වන ලෝකයට බලපෑමට තිබෙන නොයෙකුත් අභියෝග පිළිබඳව හොඳ හැදෑරීමක් කරන කෙනෙක්. එහෙත් එක පැත්තකින් පමණයි එතුමා බලන්නේ කියන්නට ඕනෑ. මම කාලයක් තිස්සේම එතුමාගේ කථා රාශියක් කියෙව්වා. පාර්ලිමේන්තුවේදී අසා ගන්නට බැරි වුණොත් හැන්සාඩ් එකෙන්වත් කියවනවා. ඒවායින් පෙනෙන දෙයක් තිබෙනවා. එතුමා එක පැත්තකින් පමණක් බලනවා. ඒක හරි නැහැ. එයට මම නිදර්ශනයක් කියන්නම්.

එතුමා කිව්වා—එය ඉදිරිපත් කළ විලාසය ඉතාමත්ම රමණීයයි. කවිකත්වය අතිනුත් ඉතාම හොඳයි—හය වන පැරකුම්බා රජු කාලයේ මේ "කව් සිළුමිණ" ලියූ එක. මේ ගරු සභාවේ දත් එය වාර්තාගත වෙනවා. මේ සභාවේ මන්ත්‍රීවරයෙක් වශයෙන් එය නිවැරදි කළේ නැත්නම් ඒක හරි නැහැ. හයවන පැරකුම්බා රජ්ජුරුවෝ සිටියේ මේ කෝට්ටේ යුගයේයි.

**අමරසිරි දොඩන්ගොඩ මහතා**
**(திரு. அமரசிறி தொடங்கொட)**
**(Mr. Amarasiri Dodangoda)**

දෙවන පැරකුම්බා රජු.

**ඩබ්. ජේ. එම්. ලොකුබණ්ඩාර මහතා**
**(திரு. டபிள்யு. ஜே. எம். லொக்குபண்டார)**
**(Mr. W. J. M. Lokubandara)**

ඉතාම හොඳයි. එතුමා එය නිවැරදි කළා. එහෙම නැත්නම් අපට එය හොඳ නැහැ. එවැනි වැරදි හොඳ නැහැ. ඒ විධියට ඉතිහාසයට එය එක් වුණොත් හොඳ නැහැ. එතුමා හිතාමතා වරදක් කරන්නට ගියා නොවෙයි. එය ඉදිරිපත් කළ විලාසය ගැන මම එතුමාට නැවතත් ප්‍රශංසා කරනවා. කථාවක් සරුසාර වෙන්නට කියන විට එවැනි දේවල් සිදු වෙනවා.

ඒ කව්සිළුමිණෙහිම පළමු වන කවිය ගනිමු.

> "තමා වරදස නොදිස්නේ — මෙරමා දෙස් මැ දිස්නේ
> නුවන් තමා මුත් බැහැර. තනමත තො දක්නේ කිම් ?"

ඇහැට ඇහැ පෙනෙන්නේ නැහැ. අනුන්ගේ වරදමයි ඇහැට පෙනෙන්නේ. "තමා වරදස නොදිස්නේ". "මෙරමා" කියන්නේ අනුන්ගේ කියන එකයි. අනුන්ගේ දෙස් තමයි, පෙනෙන්නේ කියනවා. එය ස්වභාවයක්. ඒ කව්සිළුමිණකරු පොළොන්නරු යුගයේ මහා පැරකුම්බා හෝ වේවා එහෙම නැත්නම් දෙවන පැරකුම්බා හෝ වේවා කවුරු හෝ වේවා පැරකුම්බා කෙනෙක්. ඒ විධියට බලන විට කොයි පැරකුම්බා වුණත් අපේ මුත්තා කෙනෙක්. කවුරු ලිව්වත් ලියපු බණ හරි. බොහොම වටිනා දෙයක්. අපට බැලුවට පෙනෙන්නෙ නැහැ, අපේ දෝෂය. අපි කවුරුත් කල්පනාවට ගතයුතු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩබ්. ජ. මු. ලොකුබණ්ඩාර මහතා]

කාරණයක් එතුමාගේ කතාවෙන් මතු වෙනවා. ඒක අමතක කරන්න හොඳ නැහැ. ඒ කාරණය තමයි, සංස්කෘතික දෙපාර්තමේන්තුව මේ කාලය තුළදී ගෙන ගිය ලොකු අරගලයක ප්‍රතිඵලයක් වශයෙන්, කිසිම දවසක ඉතිහාසයේ සිදු නොවූ අන්දමේ සංස්කෘතික ප්‍රබෝධයක් ඇතිවී ගෙන ආවාය කියන කාරණය. ඒක බොරුවක්ය කියා කියන්න බැහැ.

නොයෙක් නොයෙක් වැව් හදපු රජවරු ගැන, දාගැබ් හැදූ රජවරු ගැන, නොයෙකුත් විධියට ඉතිහාසයේ සඳහන් වෙනවා. ඉතිහාසය අනුව කවර කවදාකවත්, වාපි සංස්කෘතිය, වාරි සංස්කෘතිය, වැව් කර්මාන්තය මේ තරම් දියුණු වූ යුගයක් ගැන කියන්න බැහැ. ඊට දෙවැනි නැහැ අපේ දාගැබ් කර්මාන්තය අතීත් බැලුවොත්. සංස්කෘතික ත්‍රිකෝණ ආධාර වලින්, මොන තරම් කල එළියක් ඇතිව, මේ යුගයේ හැර වෙන මොනම යුගයකවත් ඉෂ්ට කළේ නැහැ කියන්න පුළුවන් තරමේ දියුණුක් දාගැබ් අංශයෙනුත් ඇති කරගෙන ආවා. ඒත් මොන බලපෑම් නිසාද කියන්න දන්නේ නැහැ, මේ තත්ත්වය අඩාල වුණා. යම්කිසි කුමන්ත්‍රණකාරී බලවේගයක් තිබෙනවා. මේ ගැන අපේ අවධානය යොමු කළ යුතුයි. මේ සම්බන්ධයෙන් බද්දේගම ගරු මන්ත්‍රීතුමාගේ (අමරසිරි දොඩන්ගොඩ මහතා) සහයෝගය අපට ඕනෑ. මහනුවර දිසා ඇමතිතුමා කිව්වා වාගේ, අපේ ප්‍රදේශයේ සොරගුණේ දේවාලය වැනි තැන් පුදුමාකාර විධියෙන් ප්‍රතිසංස්කරණය කරන්නට, සංරක්ෂණය කරන්නට ගත් පියවරවල් ආඩාලවී ගිහිල්ලා, කම්කරුවන්ගේ පඩි දෙන්නවත් බැරි තරම් තත්ත්වයට අපේ භාණ්ඩාගාරය අසරණ වී තිබෙන නිසා. මිටි තැනින්නූ ජලය ගලා බසින්නේ. මේ සංස්කෘතික වස්තූන් අඩා වැලපී, කෑගසා අපට කියන්නේ නැහැ, "මම ආරක්ෂා කරගන්න" කියා. සීගිරි ගල අපට කෑගසා කියන්නේ නැහැ, ආරක්ෂා කරගන්නට. හෙට දවසේ මේ සභාව දකින්නට එන පාකිස්ථානු ජන නායකයා හෝ වේවා අප අගය කරනවා නම්, එහි තිබෙන ප්‍රධානත්වය, අපට තිබෙන විශේෂ සම්බන්ධතාවය, ගන්ධාර සංස්කෘතිය කියන එක අපි මතක තබා ගන්න ඕනෑ එතුමා ලංකාවට ඇවිල්ල, තරඹන්නට යන්නේ අනුරාධපුරය, මහනුවර වැනි ප්‍රදේශවල තිබෙන මල බැඳුණු පයිප්ප කටක් වැනි දෙයක් නොවෙයි.

එහෙනම් සාධාරණව, ස්වභාව ධර්මයා කුරිරුකම් නොකොට ආරක්ෂා කළ දේවල් ස්වභාවයෙන්ම ආරක්ෂා කළ දේවල් යම් සැලසුමක් ඇතිව සංරක්ෂණය කරන්නට අපි බලාපොරොත්තු වුනා. සිය දහස් වර්ෂ ගරා වැටී ස්වභාව ධර්මයාගේ කාරුණික හස්තය නිසාම වැස්සට තෙමුණු අව්වට වේළුණු අපේ පිළිම, දාගැබ්, නටඹුන්, ස්වභාව ධර්මයා ආදරයෙන් ආරක්ෂා කළා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, වැඩිය හොඳට ආරක්ෂා කරන්නටය කියා ඒවායේ කැණීම් කටයුතු ආරම්භ කළා. දැන් ඉතින් වැහි වතුරට යට වෙනවා. අව්වට වේලෙනවා. ඒ වැඩ කටයුතු කරගන්න බැරි තත්ත්වයකට පත්වී තිබෙනවා. මේ ගැන අපට විරුද්ධ පක්ෂයේ සහයෝගය ඕනෑ. අපි වාද කරන එක නොවෙයි තිබෙන්නේ.

වාණිජත්වයට හසුවී මුළු ලෝකපම එකම ගමනක යනවා. මේ තත්ත්වයේ භයානකකම, බියකරුබව ආනන්දකුමාරස්වාමි වැනි අය දුටුවේ අද ඊයේ නොවෙයි. මේ සියවස ඇරඹීමත් සමගයි. අපි අද අවාසනාවන්ත විධියට මේ තත්ත්වයට ගොදුරු වී ගෙන යනවා. අපට පෙනෙන මූලික දෙය නම්, අපි ඉතිහාසයට යුතුකමක් ඉටු කළේ නැතුවා වෙනවා, මේ කරුණු ගැන මතක් නොකළොත්. මෙබඳු විවාදයකදී තුන් වැනි වර කියවන විට, අපි වගන්තියෙන් වගන්තිය බලාගෙන යනවිට පුරා විද්‍යා දෙපාර්තමේන්තුවට මේ අරියාදුව කරන්නේ ඇයි කියා අපිට අහන්නට සිද්ධ වෙනවා. එහෙම නැත්නම් මේ සභාවේදී දෙවැනි වර කියවීමෙන් පසුව, තුන්වනවර කියවන එකේ වැඩක් නැහැ. මම ඉල්ලා සිටිනවා මේ පිළිබඳව මුදල් අමාත්‍යාංශයේ දැඩි අවධානය යොමු විය යුතුය කියා. අවුරුදු තුනක් තිස්සේ යම්කිසි ප්‍රමාණයක දීමනාවක් දුන්නා නම්, දැන් ඒ ප්‍රමාණයවත් නැහැ. මේ ව්‍යාපාරයට සම්බන්ධ කම්කරුවන්ගේ ගණන දහස් ගණනකින් විතර අඩු කර තිබෙනවා. ඇයි බැරි මේ පිළිබඳව සාධාරණයක් ඉෂ්ට කරන්න.

අපට පෙනෙනවා, සංස්කෘතික ඇමතිතුමාගේ වැය ශීර්ෂවල නොයෙක් නොයෙක් විධියට මුදල් වැඩි කර තිබෙන තැන්. ඒවායින් මුදල් කපා හෝ එහෙම නැත්නම් වෙන ඕනෑම වැය ශීර්ෂයක් කපා හෝ මුදල් ලබාගෙන, සංස්කෘතික ත්‍රිකෝණ වැඩ පිළිවෙල යටතේ කෙරෙන සංරක්ෂණ වැඩ අතපසු නොකර කරගෙන යන්න කියා මම ජාතියේ නාමයෙන් ගරු සංස්කෘතික ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

උපවාස කිරීමෙන් හෝ වෙනත් ඕනෑම අන්දමකින් මේ ගැන මෙයට වඩා දැඩි විධියට කියන්න පුළුවන් තත්ත්වයක් තිබෙනවා නම්, ඒ ඕනෑම විධියකින් කියන්න මේ ගරු සභාවේ ගරු මන්ත්‍රීවරුන්ට යුතුකමක් තිබෙනවා. මේවා අපට තිබෙන වටිනා උරුමයක්. අපි මේවා ආරක්ෂා කරගත යුතුයි. අපිට යම්කිසි විධියට කරුණාවක් එපා. අපට විශේෂ අනුග්‍රහයක් එපා. අපේ සාධාරණ යුක්ති සහගත ඉල්ලීම ඉෂ්ට කරන්න. මේ හාරා තිබෙන දේවල් මේ විදියටවත් රැක ගන්න අඩුගණනේ පොළොවට පස් දලා වහන්න ඕනෑ තරම් ශ්‍රමයක් දෙන්න යටත්පිරිසෙයින්. මේ අතීත් බැලුවාම යුනෙස්කෝව වැනි සම්පූර්ණයෙන්ම බෞද්ධය කියන්න බැරි එබඳු ආයතනවලින් අපට ලැබෙන සහයෝගයවත් මේ ධර්මිෂ්ට යුගයේ භාණ්ඩාගාරයෙන් නොලැබෙනවා නම් ඒ ගැන අපි අපේ බරපතල විරෝධය පළ කරන්න ඕනෑ. භාණ්ඩාගාරයේ යම් නිලධාරියකුට හෝ වෙනත් පුද්ගලයකුට හෝ මේ ගැන දොස් කියා හරියන්නෙ නැහැ. ඊට වඩා සමස්ත ආකාරයකින් බලන්නට ඕනෑ. එහෙම නොවුණොත් ජාතියේ ශාපය එල්ල වෙනවා. අපේ යුගයට. මේ කාරණය ගැන දැඩිම දැඩි අවධානය මම යොමු කරවනවා.

ඒ වාගේම මහනුවර දිසා ඇමතිතුමා එතුමාගේ කථාවේදී ප්‍රකාශ කළා බෞද්ධ කටයුතු කොමසාරිස් තුමාගේ බලතල ගැන. ගරු සංස්කෘතික ඇමතිතුමනි, අපේ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ තිබෙනවා 9 වැනි වගන්තියේ, බුද්ධාගමට ප්‍රමුඛත්වය දෙනවා කියන එක. මේ බුද්ධාගමට ප්‍රමුඛත්වය දෙනවා කියන වගන්තිය අපට ඉබේම ලැබුණු වරප්‍රසාදයක් නොවෙයි. මෙය මේ රටේ බහුතරය, එක්කෝටි දශ ලක්ෂයක් පමණ වන සිංහල බෞද්ධ ජනතාවගේ උරුමයයි. ඉබේම ආවා නෙවෙයි. මේ වගන්තිය මෙය ආවේ තවත් ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවකින්. ඒකත් ආවේ නිකම්ම නොවෙයි. 1851 මාර්තු 2 වැනිද එද අපේ රට ධවල අධිරාජ්‍යයට යටත් වුණු දවසේදී හිරු නොබසින අධිරාජ්‍යයේ ඒ කොඩිය ඔවුන්ට ඔසවන්ට දුන්නේ නැහැ. ඒ ගිවිසුම අත්සන් කරන තෙක් වාරියපොළ නායක හාමුදුරුවො. එද ඒ තරම් අභියෝගයකට මුහුණ දී අපි යම් ගිවිසුමකට අත්සන් කළා නම් ඒ ගිවිසුමෙන් පැවරුණ, සිංහල ජාතියට මේ බුද්ධාගම ආරක්ෂා කර ගැනීමට බුද්ධාගම ආරක්ෂා කිරීමේ ඒ වගන්තිය. ඒ වගන්තිය අද හුදෙක් ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 9 වැනි වගන්තිය වශයෙන් තිබී වැඩක් නැහැ. එහෙම නම්, බෞද්ධ කටයුතු කොමසාරිස් කියන ඒ ආයතනය ඒ පිළිබඳ වගකීම දැරිය යුතුයි. එක්කෝ ගැසට් පතකින් හෝ යම්කිසි නීතියකින් ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 9 වැනි වගන්තිය ක්‍රියාත්මක කිරීමේ බලධරයා වශයෙන් බෞද්ධ කටයුතු කොමසාරිස්තුමා පත්කිරීමට පියවර ගන්නය කියා මම උදක්ම මේ සභාවෙන් ඉල්ලා සිටිනවා. මේ සභාව ඒක කෙළින්ම අනුමත කළ යුත්තේ. බෞද්ධ කටයුතු කොමසාරිස්තුමා බුද්ධ ශාසනය පිළිබඳ හැම කටයුත්තකදීම ආණ්ඩුව වෙනුවෙන් ඉදිරිපත් විය යුතු තත්ත්වයක් තිබෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ රටේ ඒ ඒ ආගම් පිළිබඳව නොයෙකුත් දෙපාර්තමේන්තු තිබෙනවා. අමාත්‍යාශ තිබෙනවා. අපි සිංහල බෞද්ධයින්ට විශේෂ අයිතියක් ඉල්ලනවා නොවෙයි, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි.

මම තව එක කාරණයක් ඉදිරිපත් කරනවා. අපි බෞද්ධ සාහිත්‍ය ගැන කල්පනා කළාම, සිංහල සාහිත්‍ය ගැන කල්පනා කළාම මේ යුගයේදී අපි ස්තුති පූර්වකව කියන්ට ඕනෑ, සංස්කෘතික අමාත්‍යාංශය වෙන කවර කාරණයක් නොකළත් සිංහල ශබ්දකෝශය ඉදිරි ගමනක ගෙන ගියා. එය ආරම්භ කර ගතවූ ශතවර්ෂ භාගයක පමණ කාලයකටත් වැඩි කාලය තුළදී නොගිය ගමනක් ඒ අංශයෙන් සංස්කෘතික අමාත්‍යාංශය ගිහින් තිබෙනවා. ඒ පිළිබඳව අපි ස්තුතිවන්ත වෙනවා සංස්කෘතික අමාත්‍යාංශයට, ඒ දක්වන ලද උදාර උනන්දුව පිළිබඳව.

**නියෝජ්‍ය සභාපතිතුමා**
**(பிரதித் தலைவர் அவர்கள்)**
**(The Deputy Chairman)**

දැන් නියෝජ්‍ය ඇමතිතුමාටත් කතා කරන්න තිබෙන නිසා, ඇමතිතුමා කතාව ටිකක් අඩු කළොත් හොඳයි.

**ඩබ්. ජ. මු. ලොකුබණ්ඩාර මහතා**
**(திரு. டபிள்யு. ஜே. எம். லொக்குபண்டார)**
**(Mr. W. J. M. Lokubandara)**

ඒ වාගේමයි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පැලෑනේ ශ්‍රී වජිරඥාණ මාහිමිපාණන් වැනි උතුමන්ලා විශේෂයෙන් ඒ උදාර ත්‍රිපිටක වාගීශ්වරාචාර්යතුමා මගේ සිහියට නැගෙනවා. මේ ත්‍රිපිටකය සිංහලෙන් පළකිරීම පිළිබඳවත් ගත්ත ඒ උදාර වැයම—

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**නියෝජ්‍ය සභාපතිතුමා**
**( பிரதித் தலைவர் அவர்கள்)**
**(The Deputy Chairman)**

කතාව ටිකක් අඩු කලොත් හොඳයි.

**ඩී. ජ. මු. ලොකුබණ්ඩාර මහතා**
**(திரு. டபிள்யு. ஜே. எம். லொக்குபண்டார)**
**(Mr. W. J. M. Lokubandara)**

එහෙනම් ඔබතුමාට ජයවේවා, මම නිහඬ වෙනවා.

අ. භා. 5. 15

**ඩබ්ලිව්. එම්. ජී. ටී. බණ්ඩා මහතා**
**(திரு. டபிள்யு. எம். ஜீ. ரீ. பண்டா)**
**(Mr. W. M. G. T. Banda)**

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, සංස්කෘතික අමාත්‍යාංශයේ වැය ශීර්ෂය ගැන සාකච්ජා කරන මේ අවස්ථාවේදී විශේෂයෙන්ම මේ ගරු සභාවේ බහුතරය ගැන කල්පනා කරනවිට අපේ උරුමය ආරක්ෂා කරන්නට ඇප කැප වූ පිරිසක් ආණ්ඩු පක්ෂයේත්, විරුද්ධ පක්ෂයේත් සිටින බව පළමුවෙන්ම අපි කල්පනා කරන්නට ඕනෑ. අපි මේ ගරු සභාවටත් මේ සමාජයටත්, මේ රටටත් බිහිවෙලා ඉන්නෙ, අවුරුදු 2527ක ඉපැරණි ඉතිහාසයේ අපේ මුතුන්මිත්තන් විසින්, පාරම්පරිකව ගණන් කරනවා නම්, පරම්පරා 39ක්, යුගයෙන් යුගයට අපට උරුම කර දුන්, ඒ සංස්කෘතික දයාදය ඊළඟ පරම්පරාවට ආරක්ෂා කර දෙන්නට ඇප කැප වී සිටින පිරිසක් හැටියටයි. එහෙම නම් අපි මේ වාද විවාද කරද්දීත් කල්පනා කළයුතු කාරණයක් තිබෙනවා. මේ රටට නිදහස ලැබුණාට පසුව ඇතිවුණ ආණ්ඩුවලින් කෙරුන වැඩවලට වඩා වැඩි වැඩ කොටසක් පසුගිය අවුරුදු හත ඇතුලත සංස්කෘතික අමාත්‍යාංශයෙන් සිදුවී තිබෙනවාද, නැද්ද කියන එක පලමුවැනි තර්කය හැටියට ගන්න ඕනෑ. ඒ තර්කය අරගෙන ඒ තර්කය මත පමණක් අපි මේ විවාදය ආරම්භ කලා නම් ඉතාම වැදගත්ය කියා මා කල්පනා කරනවා. 1815 මාර්තු මස 2 වනද මහනුවර මහ මලුවේදි බුද්ධාගමට තිසි තැන දෙන බවට පොරොන්දු පත්‍රයක් – ගිවිසුමක් – අත්සන් කලා නම් එද සිට අද වන තෙක්ම මේ රටට නිදහස ලැබුණාට පසු පත්වුණු හැම ඇණ්ඩුවක්ම හැම වෙලාවේම කිව්වේ බුද්ධාගමට මේ රටේ නිසි තැන දෙන බවයි.

සංස්කෘතික අමාත්‍යාශයක් මේ රටේ ඇතිකර දුන් අවුරුදු 30ක් පමණ ගතවී තිබෙනවා. මෙම කාලසීමාව ඇතුලත මෙම අමාත්‍යාංශය යටතේ මේ රටට සිදුවී තිබෙන සේවාවන් මොනවාද කියා සාධාරණ මනුෂ්‍යයන් හැටියට වගකිවයුත්තන් හැටියට අපි කල්පනා කර බලන්න ඕනෑ.

මම විශේෂයෙන ඉදිරිපත් කරන්න බලාපොරොත්තුවුණ කරුණු, ඒ වාගේම අමාත්‍යාංශය වෙනුවෙන් කළ යුතු කථාව දේශීය වෛද්‍ය ඇමතිතුමාගෙන් කෙරුණු නිසා මේ අමාත්‍යාංශය මෙතෙක් කර තිබෙන වැඩ ගැන සුළු විස්තරයක් කරන්නට මම බලාපොරොත්තු වෙනවා. සිංහල ශබ්ද කෝෂය ගැන කියනවා නම්, දේශීය වෛද්‍ය ඇමතිතුමා සඳහන් කළ පරිදි අවුරුදු 25ක් ඇතුලත එහි කාණ්ඩ දෙකක් පමණයි නිකුත් කරන්න පුළුවන් වුණේ. අවුරුදු 25කට කාණ්ඩ දෙකක් පමණයි නිකුත් කර තිබෙන්නෙ. ඒ වාගේම පොත් ගැන, පොත් සාප්පු ගැන කථා කලා. පොත් සාප්පුවල විකුණන ඔය පොත්පත් ගැන කියනවිට මා මතක් කරන්න ඕනෑ නවීන ලෝකයේ යම් යම් මාර්ගවලට ඇබ්බැහිවුණ පුද්ගලයන් ඉන්නවා නම් ඉන් වැඩි කොටසක් ඒ තත්ත්වයට වැටුණේ ඔය පොත්පත් නිසා බව. නමුත් අපේ අමාත්‍යාංශය මගින් ඉදිරිපත් කල වැඩ ගැන කල්පනා කර බැලුවොත් සිංහලකම, බෞද්ධකම, සිංහල සංස්කෘතිය ආරක්ෂාවන වැඩ විශාල වශයෙන්, පුළුල් වශයෙන්, ඉතාමත් උනන්දුවෙන් එද කලාට වඩා සියක් ගුණයක් වැඩියෙන් කර ඇති බව පෙනීයනවා. මා එහෙම කියන්නෙ ඇයි ? සිංහල ශබ්ද කෝෂයේ කාණ්ඩ 11ක් මේ දක්වා නිකුත්කර තිබෙනවා. එයින් 9ක්ම නිකුත් කලේ මේ ආණ්ඩුව බලයට පත්වීමෙන් පසුවයි. මෙතෙක් මුද්‍රණය වූ පිටු ගණන 5,500යි. දැනට අවුරුද්දකට පිටු 1,000 බැගින් එය 1983 සිට නොකඩවා පළ කරගෙන එනවා. ඉදිරි අවුරුදු කීපය තුලදී නැත්නම් 1988 වන විට සිංහල ශබ්ද කෝෂය සම්පූර්ණයෙන්ම අවසන්කර මහජනයා අතට පත් කරන්නට මේ අමාත්‍යාංශය කටයුතුකර තිබෙනවා. මම හිතන විධියට එය සංස්කෘතික අමාත්‍යාංශයෙන් කල ඉතාමත් ශ්‍රේෂ්ඨ වැඩක් හැටියට සලකන්න පුළුවන්. ඒ බව අපි කවුරුත් අවිවාදයෙන් පිළිගන්න ඕනෑ.

ඊළඟට මම නමුත්නාන්සේලාට බෞද්ධ විශ්ව කෝෂය ගැන මතක් කරන්න ඕනෑ. මෙහි හතරවැනි කාණ්ඩයේ දෙවනභාගය මේ වර්ෂයේදී නිකුත් කර තිබෙනවා. එහි ඊළඟ භාගය ලියා අවසන් කර තිබෙනවා. මුද්‍රණාලයක් නැතිකම නිසා මුද්‍රණය කිරීම අතපසු වී තිබෙනවා.

ඒ වගේම බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව ගැන කථා කලා. මන්ත්‍රීවරුන් කීප දෙනෙක්ම ඒ ගැන කතා කලා. බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව ගැන කථා කරන විට ඒකට අයිති බලතල මොනවාද කියා මම ඉස්සරවෙලාම මතක් කරන්න කැමතියි. මහා භාරකාරතුමාට අයිති වැඩ බෞද්ධ කටයුතු පිළිබඳ කොමසාරිස්තුමාට පැවරෙනවා. බෞද්ධ විහාර දේවාලගම් පනත යටතේ එන වැඩ කටයුතු අයිති වෙනවා බෞද්ධ කටයුතු පිළිබඳ කොමසාරිස්තුමාට පැවරී ඇත්තේ ව්‍යවස්ථාවට අනුව කරන බෞද්ධ විහාර දේවාල ගම් පනත යටතේ එන කටයුතු පමණයි. රෙජිස්ට්‍රාර් ජනරාල්තුමාට භික්ෂූන් වහන්සේලා ලියාපදිංචි කිරීමේ කටයුතු පැවරී තිබෙනවා. ඊට අමතරව බෞද්ධ කටයුතු පරිපාලනය වශයෙන් දහම් පාසල් කටයුතු, භික්ෂූන් වහන්සේගේ සිව්පසයේ අඩුපාඩු ගැන කටයුතු කිරීම පැවරී තිබෙනවා. මේ කිව්වේ බලතල ගැනයි.

සිව්පසය ගැන කියන කොට මම කියන්න කැමතියි මේ රටේ බෞද්ධ සිද්ධස්ථාන 13කට පමණයි 1984 ට ඉස්සෙල්ලා අපි ආධාර කර තිබුණේ කියා. මේ අවුරුද්ද වන විට මෙය 63 දක්වා වැඩි වී තිබෙනවා. මුදලින් රුපියල් 96,000ක ආධාර කර තිබෙනවා. මම මේ කියන්න කල්පනා කලේ කලබලවලින් විපතට පත් වුණු හාමුදුරුවරුන්ට අපි කලේ මොනවාද කියල මහරගම මන්ත්‍රීතුමා (දිනේෂ් ගුණවර්ධන මහතා) ඇසූ නිසායි. විපතට පත් වෙන්න ඉස්සෙල්ලා පන්සල් 13 කට ආධාර කලා. අද 63කට ආධාර දෙනවා. රු.96,000ක් ගෙවා තිබෙනවා.

බෞද්ධ කොමසාරිස්තුමාට බෞද්ධාචාර්යවරුන් සඳහා ගමන් බලපත්‍ර දීමේ බලය පැවරිලා නැහැ. ඒ බලය පැවරී තිබෙන්නේ, ප්‍රවාහන අමාත්‍යාංශයටයි. ශාසනාරක්ෂක මණ්ඩලයේ ලේඛකාධිකාරී ස්වාමීන් වහන්සේ ඒ අමාත්‍යාංශයට ඒ ගැන දැනුම් දුන්නට පස්සේ ඒ අනුව කටයුතු කරනවා. බෞද්ධ කොමසාරිස්තුමාට මොනව හරි කිව්වත් එතුමාට ඒ බලය නැති බව මා දන්වන්න කැමතියි.

දහම් පාසල්වලට වුවමනා කරන පොත්පත්වල අඩුපාඩු ගැන කිව්වා. අපි දහම් පාසලේ අටවැනි ශ්‍රේණිය දක්වාම අවසාන විභාගය දක්වාම පොත් නිකුත් කර තිබෙනවා. යම්කිසි කොටසකට පොත් අඩු නම් ශාසනාරක්ෂක මණ්ඩලයේ ලේඛකාධිකාරී ස්වාමීන් වහන්සේ බෞද්ධ කොමසාරිස්තුමාට දැන්නුවාම ඒ කටයුතු ඒ වෙලාවට ඉෂ්ට වෙනවා. එය ලබා ගන්න තිබෙන මාර්ගය යම්කිසි කෙනකුට දැන ගන්න බැරි වුණා නම් ඒ බව අපට දැන්වීම යුතුකමක්. ඒ දැන්වීමෙන් පසුවත් නොලැබුණා නම් අමාත්‍යාංශයට දෙස් පවරනොත් අපි එය බාර ගන්න සූදානම්. නොදන්වා ඒ කරුණු ගැන පැහැදිලි අවබෝධයක් නැතිව පොත් නැති වුණාය කිව්වට බෞද්ධ කොමසාරිස්තුමාට හෝ අපට හෝ කියන්න දෙයක් නැහැ. නමුත් ඒ ආකාරයේ වැඩ පිළිවෙලක් සකස් කර තිබෙන බව මා කියන්න කැමතියි.

ඒ විතරක් නොවෙයි. දසසිල් මාතාවන් ගැන මේ රටේ කිසිම වැඩ පිළිවෙලක් තිබුණේ නැහැ. 1984 දී අපි දසසිල් මාතාවන් ලියාපදිංචි කිරීමේ වැඩපිළිවෙලක් සකස් කලා. රු. 5,000ක ආරම්භක අරමුදලක් ඇති කර ඊට අමතරව තවත් ආධාර ලබාගෙන කොඩි දිනයක් පවත්වා ඒ ආධාරත් සමග දැනට රු. 96,945ක තැන්පත් මුදලක් තිබෙනවා. ඉදිරියට දසසිල් මාතාවන් වෙනුවෙන් පන්ති ආරම්භ කර ඒ සම්බන්ධයෙන් කටයුතු කරන බව දන්වන්න කැමතියි.

පොත් මුද්‍රණය ගැන කියනොත් මේ අමාත්‍යාංශයට වෙන් වන මුළු මුදලම සිංහල ශබ්ද කෝෂය මුද්‍රණය කරන්නවත් මදි. හැම දෙනාම කියනවා අරක කලේ නැහැ, මේක කලේ නැහැ කියල. එහෙම කියන කොට කෙනෙක් මේ අමාත්‍යාංශයේ අමාත්‍යවරයා වුණාය කියමු. අමාත්‍යාංශයට දෙන මුදල්වලින් ශතයක්වත් අපතේ නොහැර යම් කටයුත්තක් අවසන් කරනවා නම් ඒ වාගේ වැඩ දහක් කලේ නැත කියා අමාත්‍යාංශයට කවුරු හෝ දෙස් පවරනොත් ඔහු ඒකට කැමති වෙයිද ? මේ තත්ත්වය ගැන ඇමතිවරයාවත් නියෝජ්‍ය ඇමතිවරයාවත් නිලධාරි මණ්ඩලයවත් මොනවා කරන්නද ? කරන්න දෙයක් නැහැ. ලැබෙන මුළු මුදලම සිංහල ශබ්ද කෝෂය මුද්‍රණය කරන්නවත් ප්‍රමාණවත් නොවෙනවා නම් එහි ප්‍රතිඵලය වන්නේ වෙනත් පොත් මුද්‍රණය කරන්න අමාත්‍යාංශයට නොහැකි වීමයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩබ්ලිව්. එම්. ජී. ටී. බණ්ඩා මහතා]

පාලි මහාවංශයේ සිංහල පරිවර්තනය හෝ ඉංග්‍රීසි පරිවර්තනය හෝ සොයා ගන්න නැහැ. එය නැවත මුද්‍රණය කරන්න මුදල් නැහැ. මහාවංශය හොයාගන්න නැති තත්ත්වයට ඇවිත් තිබෙනවා. මුද්‍රණය වුණු ඒවා අවසානයි. මේවා මුද්‍රණය කිරීමට මුදල් අවශ්‍යයි. අඩු වශයෙන් රුපියල් ලක්ෂයක්වත් තිබෙනවා නම් මේ පොත නැවත මුද්‍රණය කරන්නට පුළුවන් වෙනවා. එයයි මා මෙහිදී කියා සිටින්නේ.

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
(Mr. Lakshman Jayakody)
අපි මේ ලියන එකද ?

**ඩබ්ලිව්. එම්. ජී. ටී. බණ්ඩා මහතා**
**(திரு. டபிள்யு. எம். ஜீ. ரீ. பண்டா)**
**(Mr. W. M. G. T. Banda)**
අපි මේ ලියන එක.

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
(Mr. Lakshman Jayakody)
ඒකෙ තත්ත්වය මොකක්ද ?

**ඩබ්ලිව්. එම්. ජී. ටී. බණ්ඩා මහතා**
**(திரு. டபிள்யு. எம். ஜீ. ரீ. பண்டா)**
**(Mr. W. M. G. T. Banda)**
ඒක දැන් ලියාගෙන යනවා. මම කියන්නම්—

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
(Mr. Lakshman Jayakody)
35 දක්වා මුද්‍රණය කර තිබෙනවාද ?

**ඩබ්ලිව්. එම්. ජී. ටී. බණ්ඩා මහතා**
**(திரு. டபிள்யு. எம். ஜீ. ரீ. பண்டா)**
**(Mr. W. M. G. T. Banda)**
35 නොවෙයි. 56 දක්වා අවසාන වේගෙන යනවා.

බුද්ධ ජයන්ති ත්‍රිපිටකය—1955 වර්ෂයේදී එවකට ස්වදේශ කටයුතු භාර ඇමතිවරයා වශයෙන් සිටි ඒ රත්නායක මැතිතුමා විසින් ආරම්භ කළ එක බුද්ධ ජයන්ති පුස්තකය—1979 වන විට මුද්‍රණය වෙලා තිබුණේ කාණ්ඩ 3 යි. අද වන විට එහි කාණ්ඩ හතළිස් ගණනක් එළි දැක තිබෙනවා. මුද්‍රණය කළ බුද්ධ ජයන්ති ත්‍රිපිටක පොත්වලින් 20 ක් පමණ දැන් අවසාන වී තිබෙනවා. මේවා නැවත මුද්‍රණය කරන්නට වුවමනා වී තිබෙනවා. නමුත් අපහසුව මුදල් හිඟ කමයි. එයින් එකක් නැවත මුද්‍රණය කිරීමට ගාල්ලේ මහිමන් අමරසූරිය මහතා රුපියල් ලක්ෂයක් ප්‍රදානය කළා. ඒ පරිත්‍යාගය වෙනුවෙන් ඒ මහතාට ගෞරවයක් වශයෙන් ඒ පොත දැන් මුද්‍රණය වන බව මේ අවස්ථාවේදී මතක් කරන්න ඕනෑ. ඒ විධියට තවත් පරිත්‍යාගශීලීන් ඉදිරිපත් වෙනවා නම් ත්‍රිපිටකයේ ඉතිරිවී තිබෙන අනෙක් පොත්ද මුද්‍රණය කරන්නට පුළුවන් වෙනවා.

පුරා විද්‍යා දෙපාර්තමේන්තුවේ පැරණි ප්‍රකාශන සහ අමාත්‍යාංශයේ පැරණි ප්‍රකාශන නැවත මුද්‍රණය කළයුතුව තිබෙනවා. ශිලා ලිපි සංග්‍රහය එවැනි එකක්. මෑතදී එහි කාණ්ඩ දෙකක් විශාල වියදමක් දරා නැවත පළ කර තිබෙනවා.

මීට අමතරව, බෞද්ධයන් වශයෙන් අපි ජාත්‍යන්තර වශයෙන් ලෝකයේ පැරණි සිද්ධස්ථානවලට ආධාර කරනවා. ඉන්දියාවේ සිද්ධස්ථාන 15 කටත් තවත් රටවල බෞද්ධ සිද්ධස්ථාන 9 කටත් වශයෙන් ලෝකයේ බෞද්ධ සිද්ධස්ථාන 24 කට රුපියල් ලක්ෂ හතරක් අවුරුදුපතා ආධාර වශයෙන් දෙනවා. ඊට අමතරව මේ රට අභ්‍යන්තරයේ ආදායමක් නැතිව අමාරුවෙන් ජීවත්වන බෞද්ධ භික්ෂූන් වහන්සේලාට සිවුපසය සැපයීම සඳහා දීමනා වශයෙන් රුපියල් එක් ලක්ෂ අනූදහක ආධාර මුදලක් දෙනවා.

අ. භා. 5.30

සංස්කෘතික අමාත්‍යාංශයෙන් අප මේ විධියට කටයුතු කරගෙන යනවා. සංස්කෘතික අමාත්‍යාංශය ජාතියේ කොඳු ඇටය බව අපි කල්පනා කරන්නට ඕනෑ. ජාතියේ කොඳු ඇටය ආරක්ෂා කරන්නට, අපි සිංහලයන්ය කියා කථා කරන්නට, බෞද්ධයන්ය කියා කථා කරන්නට, අපේ ඉපැරණි ඉතිහාසය ආරක්ෂා කරන්නටය කියා කිව්වත්, ඊට අවශ්‍ය ආධාර උපකාර නැත්නම්, ඊට අවශ්‍ය මුදල් නැත්නම් තමුන්නාන්සේලා සියලුදෙනාම රැස්වෙලා ඒකට මාර්ගයක් සොයන්නට ඕනෑ. එහෙම මාර්ගයක් හොයන්නේ නැතිව අරක අඩුයි, මේක අඩුයි, මේක කළේ නැහැ, අරක කළේ නැහැ කියා අපි කාටත් කථා කරන්නට පුළුවන්. නමුත් මම තමුන්නාන්සේලාට පැහැදිලි කරන්නට යන්නේ මේකයි. මේ අමාත්‍යාංශයට වෙන් කරන මුදලින් ශත 5 ක් වත් අපි වැරදි මාර්ගයකින් හෝ එසේ නැත්නම් නොසැලකිලිමත්කමකින්, අතපසුවීමකින් හෝ වංචාසහගතව හෝ වියදම් කර තිබෙනවාය කියා කිසිම මන්ත්‍රීවරයෙකුට කියන්න පුළුවන් කමක් නැහැ. අපි ඒ තරම් කල්පනාකාරීව ඉතාම උනන්දුවෙන් ඕනෑකමින් මේක විශේෂ මෙහෙයයක් කොට සලකා, කටයුතු කරනවා. නමුත් මේ සඳහා වෙන් වන මුදල් ප්‍රමාණය මදි. අපිට ලැබෙන මුදල් ප්‍රමාණය අනුව, පුළුවන් තත්ත්වයෙන් මේ කටයුතු කර තිබෙන බව මා තමුන්නාන්සේලාට ප්‍රකාශ කරන්නට ඕනෑ. අපට ආවේණික වූ අපේ මේ සංස්කෘතික උරුමය අපේ මේ සංස්කෘතික දායාදයන් ඊළඟ පරම්පරාවට ලබා දෙන්නට ආරක්ෂා කරන්නට විරුද්ධ පක්ෂයේත් ආණ්ඩු පක්ෂයේත් අප සියලු දෙනාම එකතුවී මේ රටේ පුරවැසියන් හැටියට එකතුවී වගබලා ගතයුතු බව මා ඉතා කාරුණිකව මතක් කරන්නට ඕනෑ. ඒ වාගේම සංස්කෘතික අමාත්‍යාංශය දැනට ගෙන යන මේ වැඩ පිළිවෙළ නැතිනම් මෙම පියවර අපට සෑහීමකට පත් වන්නට තරම් ප්‍රමාණවත් යයි අප කාටවත් සිතන්නට බැහැ. එම නිසා අප සියලු දෙනාම මේ ගැන විශේෂ උනන්දුවකින් ඉදිරියටත් කටයුතු කරනවා ඇතැයි බලාපොරොත්තු වෙමින්, අද දින ඉදිරිපත් කරන ලද යෝජනා නැතිනම් කාරණා ගැන පිළිතුරු දීමට ගරු ඇමතිතුමාට අවස්ථාව ලබා දෙමින් මට මේ අවස්ථාව ලබා දීම ගැන තමුන්නාන්සේටද ස්තුති කරමින් මගේ කථාව අවසන් කරනවා.

ජී. වී. එස්. ද සිල්වා මහතා
(திரு. ஜீ. வீ. எஸ். த சில்வா)
(Mr. G. V. S. de Silva)
ත්‍රිපිටකය පරිවර්තනය කිරීමට වෙහෙස ගත් කෝදාගොඩ ඤාණාලෝක නාහිමියන් ඉතාමත්ම රෝගාතුරවී අහංගම විද්‍යාචන්ද්‍ර පිරිවෙනේ දැනට වැඩ සිටිනවා. උන්වහන්සේ බැහැදැකීමට ගරු ඇමතිතුමා යනවා නම් හොඳ බව කියන්නට කැමතියි.

**නියෝජ්‍ය සභාපතිතුමා**
**( பிரதித் தலைவர் அவர்கள்)**
(The Deputy Chairman)
ඒ ඇමතිතුමාගේ කාර්යාලයට ගිහින් පෞද්ගලිකව ඒ ඉල්ලීම කළා නම් හොඳයි.

**ඊ. එල්. බී. හුරුල්ලේ මහතා**
**(திரு. ஈ. எல். பி. ஹுருள்ளே)**
**(Mr. E. L. B. Hurulle)**
ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අද දින මෙම වැය ශීර්ෂය යටතේ ගරු මන්ත්‍රීවරු කීප දෙනෙක් සහ දිසා ඇමතිතුමන්ලා දෙදෙනෙක් වැදගත් අදහස් රාශියක් ඉදිරිපත් කළා. ප්‍රථමයෙන්ම මම කියන්නට කැමැතියි, මහරගම ගරු මන්ත්‍රීතුමා (දිනේෂ් ගුණවර්ධන මහතා) මේ ගරු සභාවට වැරදි අවබෝධයක් ඇති කරන්නට උත්සාහ කළ බව. එය හරියට මුහුද හත් ගව්වක් තිබෙද්දී කැහැපොට ගහගන්නාය කියන අපේ පැරණි කථාවට සමාන කරන්නට පුළුවනි.

**මන්ත්‍රීවරයෙක්**
**(அங்கத்தவர் ஒருவர்)**
(A Member)
අමුඩය ගහ ගන්නා වාගේ.

**ඊ. එල්. බී. හුරුල්ලේ මහතා**
**(திரு. ஈ. எல். பி. ஹுருள்ளே)**
**(Mr. E. L. B. Hurulle)**
මම ඒ වචනය පාවිච්චි කරන්නට අකමැති නිසයි ඒ විධියට කිව්වේ. එතුමාගේ කථාවෙන් උත්සාහ කළේ මේ රටේ නැවතත් කලබලකාරී තත්ත්වයක් ඇති කරන්නටයි. අන්න ඒ නිසයි, එතුමාගේ පියා ඇමතිවරයකු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වශයෙන් කටයුතු කරන අවදියේදී, 1958 දී ඇති කර ගන්නට ගිය බණ්ඩාරනායක–චෙල්වනායගම් ගිවිසුමේ විස්තර එතුමාට මම මතක් කර දුන්නේ.

කෞතුකාගාර සම්බන්ධයෙන් එතුමා අදහස් පළ කළා. පුරා විද්‍යා දෙපාර්තමේන්තුවට පමණක් සෑම තැනකම කෞතුකාගාර පිහිටුවන්නට ඉඩ නොදී වට්නා කෞතුකාගාර ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවට භාර දෙන්නටය කියන ඉල්ලීම කළා. අපි ඒ කාරණ ප්‍රතිපත්තියක් වශයෙන් පිළිගෙන ඇමති මණ්ඩලයේ අනුමැතිය ලබා ගෙන ඒ ආකරයෙන් කටයුතු කරන බව කියන්නට සතුටුයි. දැනට ත්‍රිකුණාමලයේ පුරා විද්‍යා කෞතුකාගාරය ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවට භාර දී තිබෙනවා. හෙට අනිද්දාම ගාල්ලේ කෞතුකාගාරයත් ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවට භාර දෙනවා. ඔය විධියට ක්‍රම ක්‍රමයෙන් මේ රටේ වැදගත් කෞතුකාගාර ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවට භාරදීමට ක්‍රියා කිරීම ප්‍රතිපත්තියක් වශයෙන් අප පිළිගෙන තිබෙනවා.

කැලණි මිටියාවතේ නවගමුව දේවාලයේ පවත්වා ගෙන ආ පෙරහැර ගැන එතුමා මතක් කළා. ඒ ගැන සාකච්ඡාවක් ඇති කර කිසියම් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්නට මා සූදානම් බව එතුමාට කියන්නට කැමතියි.

දුටුගැමුණු හෂ්මාවශේෂ තැන්පත් කිරීම ගැනත් එතුමා කරුණු ඉදිරිපත් කළා. එම හෂ්මාවශේෂ තැන්පත් කිරීම සඳහා දක්ෂිණ විහාරයට තුදුරුව ස්ථානයක් අප දැනටමත් තෝරා ගෙන තිබෙනවා. එහි සැලැස්ම දැනට අවසානයි. ඒ සඳහා අවශ්‍ය මුදල් ප්‍රමාණය අප ගණන් බලා තිබෙනවා. දැනට අවශ්‍ය මුදලින් සියයට විස්සක් පමණ එකතු වී තිබෙනවා. එය යථා කාලයේදී ඉදිකර එම හෂ්මාවශේෂ තැන්පත් කරන්නට අප බලාපොරොත්තු වෙනවා. තව සොයා ගන්නට ඇති සියයට අසූවක පමණ මුදල් ප්‍රමාණය අපට ලැබුණු විගසම එහි වැඩ කටයුතු ආරම්භ කිරීමට බලාපොරොත්තු වෙනවා. එම නිසා දැනට එහි ප්‍රමාදයක් පවතින්නේ යම්කිසි කෙනෙකුගේ හෝ කොටසකගේ බලපෑමක් නිසා නොවන බව එතුමාට මම තරයේම කියා සිටිනවා.

යුනෙස්කෝ වැඩ කටයුතු මගේ අමාත්‍යාංශයට පැවරිය යුතුයි කියා එතුමා තවත් අදහසක් ඉදිරිපත් කළා. එය වෙනත් ඇමතිවරයෙක් යටතේයි තිබෙන්නේ. නමුත් එය මගේ අමාත්‍යාංශයට පැවරිය යුතුයි කියා එතුමා යෝජනා කළා. අතිගරු ජනාධිපතිතුමාට යම්යම් බලතල තිබෙන බව මම කියන්නට කැමතියි. අතිගරු ජනාධිපතිතුමාගේ මනාපය අනුවයි යම්යම් වැඩ රාජකාරි ඇමතිවරුන්ට භාර දෙන්නේ. එතුමාටයි ඒ වගකීම භාරව තිබෙන්නේ. යම් රාජකාරියක් කොයි ඇමතිවරයාට භාර දෙන්න ඕනෑද කියා තීරණය කරන්නේ අපේ අතිගරු ජනාධිපතිතුමායි. එතුමාට තිබෙන බලතල අනුවයි එය කරන්නේ.

ඊළඟට මේ සෑම තැනකම පුරාවස්තු විකුණනවාය, ඒ සම්බන්ධයෙන් ගත් ක්‍රියා මාර්ගය මොකක්ද කියා ප්‍රශ්න කළා. ඒ සම්බන්ධයෙන් දැන් අපි පනතක් සූදානම් කරගෙන යන බව මම කියන්නට කැමතියි. ලංකාව තුළ යම් කෙනෙක් ළඟ පුරාවස්තු තිබෙනවා නම් ඒවා තවත් ලාංකිකයෙකුට විකුණන්න කිසිම තහනමක් නැහැ. නමුත් ඒවා පිටට ගෙනයන්න බැහැ. ලංකාවේ තිබෙන ඒ පුරාවස්තු පවා ලේඛන ගත කරන්න අපි බලාපොරොත්තු වෙනවා.

එහෙම ලේඛන ගත කරල ඊට පසුව ඒවා යම් කෙනෙකුට විකුණනවා නම්, හුවමරු වෙනවා නම් ඒ බව අපේ දෙපාර්තමේන්තුවට දන්වා අපේ ලේඛනවලත් සටහන් වෙන ආකාරයට වැඩ පිළිවෙළක් ආරම්භ කරන්න අපි බලාපොරොත්තු වෙනවා. නමුත් එවැනි පුරාවස්තු පිටරට ගෙන යාම අපි සම්පූර්ණයෙන්ම තහනම් කරලයි තිබෙන්නේ.

බදුල්ලේ ගරු මන්ත්‍රීතුමාගේ–නියෝජ්‍ය ප්‍රාදේශීය සංවර්ධන ඇමතිතුමාගේ– කථාව ගැන මම කණගාටු වෙනවා. එතුමා නියෝජ්‍ය ඇමතිවරයෙක් වශයෙන් සිටිද්දීත් රූපවාහිනිය ගැන යම් මතයක් ප්‍රකාශ කළා. නමුත් ඒ කාරණාව යොමු කරන්න තබුණේ රාජ්‍ය අමාත්‍යාංශයේ වැය ශීර්ෂය ගැන සාකච්ඡා කරන වෙලාවේදීයි. මම ඒ කාරණය ගැන විපරම් කළා. ඒ ඉදිරිපත් කළ සංදර්ශනය රැගුම් පාලක මණ්ඩලයත් දැක තිබෙනවා. නමුත් රූපවාහිනියෙන් පෙන්වන ඒ සංදර්ශන නවත්වන්න රැගුම් පාලක මණ්ඩලයට බලයක් නැහැ. ඒ සංදර්ශනය පෙන්නා තිබෙන්නේ ස්වාමීන් වහන්සේ නමකගේ අනුමැතිය උඩයි. නමුත් නැවත වරක් එය රූපවාහිනිය ඔස්සේ විකාශනය නොකිරීමට රූපවාහිනී සංස්ථාවේ සභාපතිතුමා දැන් තීරණය කර තිබෙනවා.

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
(Mr. Lakshman Jayakody)

මේවාගේ ප්‍රශ්නයක් ඇතිවුණාම ඒවා සම්බන්ධයෙන් මොකක් හෝ නිරාකරණය කිරීමක් තිබෙන්න ඕනෑ. ස්වාමීන් වහන්සේ නමක් ඒ දවස්වල මෙයට අනුමැතිය උන්නාය කියනවා නම් ඒක වෙන්න පුළුවන්. එහෙම ප්‍රශ්නයක් ඇති වී තිබෙනවා නම් මහානායක හාමුදුරුවරුන්ගෙන් අහලා ඒ පිළිබඳව තීරණයක් ගනිමු. එහෙම නැතිව දැන් එකපාරටම මෙහෙම තීරණ ගත්තොත් ඊළඟට ප්‍රශ්න රාශියකට මුහුණ පාන්නට සිදුවෙනවා. ඒ කියන්නේ නාට්‍ය නිෂ්පාදකයින්ට බලපෑමක් ඇතිවෙනවා. පළමුවෙන් රූපවාහිනියට එයි. ඊළඟට නාට්‍ය නිෂ්පාදකයන්ට එයි. ඊළඟට අච්චු ගහන පොත්පත්වලටත් එයි. දැන් පොත්පත්වල බුදුහාමුදුරුවන්ගේය කියා පින්තූර පළකර තිබෙනවා.

**ඊ. එල්. බී. හුරුල්ලේ මහතා**
**(திரு. ஈ. எல். பி. ஹூருள்ளே)**
**(Mr. E. L. B. Hurulle)**

ඒක හොඳ අදහසක්.

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
(Mr. Lakshman Jayakody)

බුදුහාමුදුරුවන්ය කියා පොත්වල පින්තූර තිබෙනවා. සමහරවිට විශේෂයෙන් ඉංග්‍රීසි පොත්වල " ශාක්‍යමුණි " කියා බුදුහාමුදුරුවන්ගේ පින්තූර පළකර තිබෙනවා. ඒවායේ නිකම් යක්ෂයන්ගේ වගේ දත් එළියට ඇවිදින් තිබෙනවා, එහෙම නැත්නම් තොරන් බැඳලා වගේ ඔලුව උඩින් මොනවා හෝ දමා තිබෙනවා. නමුත් පින්තූරය යටින් " ශාක්‍ය මුණි " කියා මුද්‍රණයකර තිබෙනවා. ඉතින් ඒවාත් නවත්වන්න ඕනෑ. මේක ලොකු ප්‍රශ්නයක් වෙනවා. ඒ නිසා මහානායක ස්වාමීන් වහන්සේලාගෙන් අහලා මේක දැන්ම ඉවරයක් කරන්න. එහෙම නැත්නම් සිරිසඟබෝ වගේ නාට්‍යවලට — තවත් සමාජයීය නාට්‍ය ගණනාවක් තිබෙනවානේ, ඒ නාට්‍යවලටත් — ලොකු ප්‍රශ්නයක් එනවා. එමනිසා ඒ ප්‍රශ්නය නිරාකරණය කර ගැනීම වැදගත්ය කියන එක මම ගරු ඇමතිතුමාට කියන්න කැමතියි.

**ඊ. එල්. බී. හුරුල්ලේ මහතා**
**(திரு. ஈ. எல். பி. ஹூருள்ளே)**
**(Mr. E. L. B. Hurulle)**

එය වැදගත් අදහසක් බව මම පිළිගන්නවා. ඒ කාරණා සියල්ලක්ම මම ගරු රාජ්‍ය ඇමතිතුමාගේ අවධානයට යොමු කරවනවා.

සංඝාධිකරණ පනත ගැනත් වචන ස්වල්පයක් මම කියන්න කැමතියි. මොකද, අත්තනගල්ලේ ගරු මන්ත්‍රීතුමා (ලක්ෂ්මන් ජයකොඩි මහතා) ඒක නිතරම අහන දෙයක්. ඒ සංඝාධිකරණ පනත අවුරුදු ගණනාවක් තිස්සේ සාකච්ඡාකර ඇමති මණ්ඩලයට ඉදිරිපත් කර, එය අනුමත වී නීතිපතිටත්, නීති සම්පාදක දෙපාර්තමේන්තුවටත් යවා තිබෙනවා. ඒ දෙකෙන්ම නීති කෙටුම්පත් ලැබී තිබෙනවා. නීතිපතිගේ නිරීක්ෂණයත් අපට ලැබී තිබෙනවා.

**මන්ත්‍රීවරයෙක්**
**(அங்கத்தவர் ஒருவர்)**
(A Member)

ඉංග්‍රීසියෙන් පමණක්.

**ඊ. එල්. බී. හුරුල්ලේ මහතා**
**(திரு. ஈ. எல். பி. ஹூருள்ளே)**
**(Mr. E. L. B. Hurulle)**

ඉංග්‍රීසි භාෂාවෙන් කලින් ලැබුණා. ඊට පසුව දැන් අපට සිංහල පරිවර්තනයක් ලැබී තිබෙනවා. එහි තිබෙන යම් යම් ඡේද, වගන්ති පිළිබඳව අපේ මහා නායක ස්වාමීන් වහන්සේලාගේ අදහස් දැනගන්නේ නැතුව ඇමති මණ්ඩලයට ඉදිරිපත් කරන්න අපහසු නිසා දැන් අපි අතිගරු මහානායක ස්වාමීන් වහන්සේලාගේන් ඒ සම්බන්ධව උන්වහන්සේලාගේ අදහස් ඉල්ලා තිබෙනවා. ඒ අදහස් ලැබුණාට පසුව ඇමති මණ්ඩලයට ඉදිරිපත් කර සම්මත කර ගැනීමටත්, අනතුරුව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර ගරු මන්ත්‍රීතුමන්ලාගේද සහයෝගය ඇතුව සම්මත කරගෙන එය නීතිගත

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඊ. එල්. බී. හුරුල්ලේ මහතා]

කරන්නත් මා බලාපොරොත්තු වෙනවා. ඒ සංඝාධිකරණ පනත සම්මත වුණාට පසුව අර මුලින් අදහස් කළ විත්‍රපට යනාදියේ භික්ෂු චරිත රඟපාන උදවිය සම්බන්ධවත් අපට ක්‍රියාකරන්න පුළුවන් වෙයි කියා මම කල්පනා කරනවා.

බෞද්ධ විශ්ව විද්‍යාලයට අවශ්‍ය පොත් ලබා දෙන්නය කියා අත්තනගල්ලේ ගරු මන්ත්‍රීතුමා තවත් අදහසක් ඉදිරිපත් කළා. ඒ ගැන ක්‍රියා කිරීමට මා අදහස් කරන බව මතක් කරන්න කාමතියි. ථෙරවාද බෞද්ධ මධ්‍යස්ථානයක් ඇති කළ යුතුය කියාත් අදහසක් ප්‍රකාශ වුණා. එයත් මම පිළිගන්නවා. දැන් තමුන්නාන්සේ දන්නවා අපේ අතිගරු ජනාධිපතිතුමාත්, එම ආර්යාවත් ඉතා වටිනා ඉඩමක් වන මාතෙල්වත්ත පරිත්‍යාග කළා. ඒ මාතෙල් වත්තේ ජාත්‍යන්තර ථෙරවාද බෞද්ධ මධ්‍යස්ථානයක් පිහිටුවන්න අපි දැන් බලාපොරොත්තු වෙනවා. දැනටමත් එහි චෛත්‍යයක් ඉදිකර අවසාන වේගෙන එනවා. සැලැස්මකුත් හද තිබෙනවා. ථෙරවාද රටවලට පමණක් එහි ඉඩදී ථෙරවාද බෞද්ධාගම හදරන්නට වුවමනා ඕනෑම කෙනෙකුට එතැනට ඇවිදින් ථෙරවාද බෞද්ධාගම ගැන කාරණා දැන ඉගෙන ගන්න අවස්ථාවක් සලස්වන්නයි අපේ බලාපොරොත්තුව.

අ. භා. 5.45

අත්තනගල්ලේ ගරු මන්ත්‍රීතුමා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ වැඩ කරන කම්කරුවන් ගැන තවත් වැදගත් කාරණයක් ඉදිරිපත් කළා. ඒ උදවිය ඉතා ඕනෑකමින් මේ කැණීම් කටයුතු, සංරක්ෂණ කටයුතු කරන බව අපි කවුරුත් පිළිගන්නවා. හැම එක්කෙනාටම කැණීම් කරන්න බැහැ. ඒ ගැන දැනීමක් තිබෙන්න ඕනෑ. මේ අමාත්‍යාංශයට ලැබුණු මුදල් ප්‍රමාණවත් නොවීම නිසා සැමතැනම පුරාවිද්‍යා ස්ථානවල වැඩපොළවල් වසා දමන්න සිදුවුණාය කියන එක කණගාටුවෙන් වුණත් කියන්න ඕනෑ. මා හිතන විධියට කම්කරුවන් 1,200ක් පමණ අද සේවයෙන් තාවකාලිකව අස් කර තිබෙනවා. අඩු වශයෙන් මේ ස්ථානවල කැණීම් කර සංරක්ෂණය කරන්න තිබෙන ඉතුරු ප්‍රමාණයවත් සංරක්ෂණය කරන්න අපට මුදල් දෙන්නය කියා මම ඉල්ලා සිටිනවා. ලබන බදද වෙන කොට ගරු මුදල් ඇමතිතුමාගෙන් සතුටුදායක පිළිතුරක් මම බලාපොරොත්තු වෙන්න පුළුවන්ය කියා මා කල්පනා කරනවා. එවිට අර තාවකාලික වැඩ නැවැත්වූ උදවිය කැඳවා ඒ වැඩ බිම්වල වැඩ ක්‍රියාත්මක කිරීමටයි අපි බලාපොරොත්තු වන්නේ.

මහරගම ගරු මන්ත්‍රීතුමා (දිනේෂ් ගුණවර්ධන මහතා) ප්‍රශ්නයක් ඇසුවා උතුරු නැගෙනහිර ප්‍රදේශවල බෞද්ධ සිද්ධස්ථානවල වැඩ කටයුතු කෙරෙනවාද කියා. මම කියන්න කැමතියි මේ කරදර මධ්‍යයේ වුවත් ස්ථාන කීපයක වැඩ අප විසින්ම නවත්වන තුරු අපේ සේවකයන් වැඩ කළ බව. මට ඒ ප්‍රදේශවලින් නිතරම ඉල්ලුම් පත්‍ර ලැබෙනවා ඒ ඒ වැඩ බිම්වල කම්කරුවන් වශයෙන් රක්ෂාව දෙන්නය කියා. එතකොට ඒකෙන්ම ඔප්පු වෙනවා ඒවායේ වැඩ කරගෙන යන නිසාය ඇබෑර්තු සඳහා මෙසේ ඉල්ලුම් පත්‍ර එවන්නේ කියා. අපි වැඩ නැවැත්තුවෙ නැහැ. නමුත් මුදල් මදිකම නිසා වැඩ නතවත්වන්න අපට සිද්ධ වුණා. ඒ නිසා මුදල් ලැබුණු හැටියෙ අපි නැවත වරක් ඒවායේ වැඩ ආරම්භ කරනවා.

ගරු මහනුවර දිසා ඇමතිතුමා යම් අදහසක් ඉදිරිපත් කළා. එනම් පසුගිය රජය කාලයේදී ඉඩම් ප්‍රතිසංස්කරණ නීතිය යටතේ රජයට අත්පත් කරගත් විහාර දේවාලර සන්තක ඉඩම් සඳහා අඩු වශයෙන් ඒවාට වන්දි මුදල්වත් ගෙවන්නය කියා. මම මතක් කර දෙන්න කැමතියි මේ සම්බන්ධයෙන් අතගරු ජනාධිපතිතුමාගේත් මගේ කල්පනාව යොමු වී තිබෙන බව. එසේ කල්පනාව යොමු වීමට ප්‍රධාන හේතුවක් වූයේ මේ වර්ෂයේ වාර්ෂික ඇසල පෙරහැරෙන් පසුව දියවඩන නිලමෙතුමාත් බස්නායක නිලමෙවරුන් අතිගරු ජනාධිපතිතුමාට ඉදිරිපත් කළ සංදේශයකින් කරන ලද යම් යම් ඉල්ලීම් බව මම මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්න කැමතියි. ඒ සම්බන්ධව මගේ නිර්දේශත් මම අතිගරු ජනාධිපතිතුමාට යවා තිබෙනවා. මා කල්පනා කරවා, වැඩි කල් නොගොස් ඒවා ක්‍රියාත්මක කිරීමට එතුමා තීරණයක් ගනීවි කියා.

අපේ මොනරාගල ගරු දිසා ඇමතිතුමා කිව්වා සංස්කෘතික ත්‍රිකෝණයේ වැඩ කටයුතු කෙරෙන අතරම ඊටත් වඩා පැරණි පෞරාණික වස්තු මොනරාගල තිබෙනවානය එම නිසා එහාටත් ආධාර කරන්නය කියා. මා ඊට පිළිතුරු වශයෙන් කියන්න කැමතියි. පුරා විද්‍යා දෙපාර්තමේන්තුවට ලැබෙන මුදල්වලින් අපි මොනරාගල දිස්ත්‍රික්කයටත් හැකි පමණ වැඩ කර තිබෙන බව. එතැනත් අපට සිද්ධ වුණා මුදල් මදිකම නිසා වැඩ නවත්වන්න. ත්‍රිකෝණයේ වුණත් මට කණගාටුයි කියන්න දැනට මාසයකට පමණ පෙර 1,200ක් පමණ සේවකයන්ගේ වැඩ නවත්වන්න සිද්ධ වූ බව. ඒත් මුදල් මදිකම නිසයි. මෙහිදී මට කණගාටුවෙන් සඳහන් කරන්න සිද්ධ වෙනවා 1977න් පස්සෙ ලංකාවෙ බොහෝ උදවිය ධනපතියො, කෝටිපතියො වුණත් එක්කෙනකුගෙන් පමණක් බව රුපියල් 25,000ක මුදලක් ලැබුණේ. නමුත් ද්‍රවිඩ මහත්වරුන් දෙදෙනකු අපට සැහෙන පරිත්‍යාග කර තිබෙනවා. එක මහත්මයෙක් රුපියල් 25,000ක් එවා තිබෙනවා. තවත් ද්‍රවිඩ මහත්මයෙක් රුපියල් 45,000ක් එවා තිබෙනවා. ඒ වාගේම අපේ ත්‍රිකෝණ අරමුදලට මුස්ලිම් සමාගමක් රුපියල් 2,50,000ක ආධාරයක් එවා තිබෙනවා. අපේ සිංහල බෞද්ධයන් වශයෙන් බැලුවොත් එක්කෙනෙක්, පමණයි රුපියල් 25,000ක පරිත්‍යාගයක් කෙළේ.

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
(Mr. Lakshman Jayakody)

මොකක්ද ඒකට හේතුව ? පරීක්ෂා කර බැලුවොත් හොඳයි.

**ඊ. එල්. බී. හුරුල්ලේ මහතා**
**(திரு. ஈ. எல். பி. ஹுருள்ளே)**
**(Mr. E. L. B. Hurulle)**

හේතුව මට ප්‍රසිද්ධියේ කියන්න බැහැ. තමුන්නාන්සේ පෞද්ගලිකව හමුවුණාම කියන්නම්.

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
(Mr. Lakshman Jayakody)

Is it free of income tax, Sir ?

**ඊ. එල්. බී. හුරුල්ලේ මහතා**
**(திரு. ஈ. எல். பி. ஹுருள்ளே)**
**(Mr. E. L. B. Hurulle)**

බදු සහන සියයට සියයක්ම තිබෙනවා.

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
(Mr. Lakshman Jayakody)

ඒක තමයි මමත් කියන්නේ. මම තමුන්නාන්සේට යෝජනාවක් ඉදිරිපත් කළා. ජනතාවගේ තිබෙන සංස්කෘතිය, පෞරාණික ප්‍රතිපත්ති ආරක්ෂා කිරීම සඳහා කටයුතු කරන්න ඕනෑය කියලා.

අපි යම්කිසි ආදායමක් උපද්දනවා. අපි ගිය වතාවේදී ගෙවල් පිච්චුවාය කියල සියයට 2 ක බද්දක් ගෙව්වා. ඒ වාගේම මා හිතන්නේ හෙට අනිද්ද ආරක්ෂක කටයුතු සඳහා සියයට 1 ක නැත්නම් 2 ක බද්දක ගෙවන්න සිදුවෙයි. සංස්කෘතිය ආරක්ෂා කර ගැනීම සඳහා, අඩුම වශයෙන් බෙර පදයවත් ආරක්ෂා කර ගැනීම සඳහා, අපි ඒකරාශී වී මොකක් හරි වැඩපිළිවෙලක් යොදමු. අපි සංස්කෘතික අරමුදල කියලවත් එකක් පටන් ගනිමු. ලංකාවේ සිටින සැම බෞද්ධයෙක්ම, සැම සිංහලයෙක්ම තමන්ගේ පෞරාණික දේපල ආරක්ෂා කර ගැනීම සඳහා, තමන්ගේ පෞරාණික උරුමයන් ආරක්ෂා කර ගැනීම සඳහා සියයට 1 ක් හරි සියයට 1/2 ක් හරි කැටයකට දමමු. එහෙම එකතු කරලා ඒ සල්ලි මේ කටයුතු සඳහා යොදවමු. නැත්නම් කිසි දිනක මේ කටයුතු කරන්න ලැබෙන්නේ නැහැ. සැම දෙයක්ම විනාශ වෙන්න ඉඩ තිබෙනවා මේ විධියේ වැඩපිළිවෙලක්වත් නොයෙදුවොත්.

**නියෝජ්‍ය සභාපතිතුමා**
**(பிரதித் தலைவர் அவர்கள்)**
(The Deputy Chairman)

Hon. Member, you must meet the Hon. Minister and discuss the matter.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ඊ. එල්. බී. හුරුල්ලේ මහතා**
**(திரு. ஈ. எல். பி. ஹுருள்ளே)**
**(Mr. E. L. B. Hurulle)**

ඔබතුමා කියන්නේ බෞද්ධ සිංහලයන් ගැන. මා කියන්න කැමතියි, සංස්කෘතික ත්‍රිකෝණය මගින් පොලොන්නරුවේ හින්දු කෝවිල් 14 ක් සංරක්ෂණය කරන්න භාරගෙන තිබෙන බව. දැනටමත් එයින් එක කෝවිලක සංරක්ෂණ කටයුතු කරනවා. ඒ නිසා බෞද්ධයන්, සිංහලයන් කියල වෙනසක් නැහැ. පෞරාණික දෙයක් නම්, වටිනා දෙයක් නම් ඒවා අපි සංස්කෘතික ත්‍රිකෝණය මගින් සංරක්ෂණය කරනවා. සංස්කෘතික ත්‍රිකෝණයෙන් පිට එවැනි වස්තූන් තිබෙනවා නම් ඒවාත් සංරක්ෂණය කියම අපේ ප්‍රතිපත්තියයි.

සංස්කෘතික ප්‍රතිපත්තිය ගැනත් ගරු මන්ත්‍රීතුමා දන්නවා. ඒ ප්‍රතිපත්ති සකස් කරන්නය කියා අපි කමිටුවෙක් පත් කර තිබෙනවා. ඒ කමිටුවේ අතුරු වාර්තාව ලැබී තිබෙනවා. අවසාන වාර්තාවේ නිර්දේශ ලබන මාසෙ අවසන් විමට පෙර ලැබෙයි කියා අපි බලාපොරොත්තු වෙනවා. ඉන්පසුව, අපි ඒ පිළිබඳ සාකච්ඡා කර, යම් වැඩපිළිවෙලක්, ප්‍රතිපත්ති මාලාවක් සකස් කරන්න බලාපොරොත්තු වෙනවා.

මම මීට වඩා පිළිතුරු දිය යුතු නැහැ කියා කල්පනා කරනවා. ඊට හේතුව, මගේ අමාත්‍යාංශයට කිසිම විවේචනයක් ඉදිරිපත් කළේ නැහැ. සෑම මන්ත්‍රීවරයෙක්ම පිළිගත්තා, අපේ අමාත්‍යාංශයේ මේ වැඩපිළිවෙලට වැඩිපුර මුදලක් දිය යුතුයි කියා. ආණ්ඩු පක්ෂයෙනුත්, විරුද්ධ පාර්ශ්වයෙනුත් ඒ අදහසමයි ප්‍රකාශ වුණේ. ඒ නිසා මා ඒ හැම දෙනාටම ස්තුතිවන්ත වෙනවා.

මේ අවුරුද්ද තුළ මේ වැඩපිළිවෙලවල් ක්‍රියාත්මක කරන්න පුළුවන් වුණේ මගේ හපන්කමවත්, නියෝජ්‍ය ඇමතිතුමාගේ හපන්කමවත් නිසාම නොවෙයි. මගේ ලේකම්තුමාගේ සිට අන්තිම සේවකයා දක්වා ඉතා උනන්දුවෙන් සහයෝගය දුන් නිසයි, අපේ දායාදයන් ආරක්ෂා කර ගන්න ඕනෑය කියා කල්පනා කළ නිසයි, සීමිත මුදල් ප්‍රමාණයකින් මෙවැනි වැඩ කොටසක් ක්‍රියාත්මක කරන්න පුළුවන්කම ලැබුණේ. ඒ නිසා ඒ හැම දෙනාටම මා ස්තුතිවන්ත වෙනවා.

විශේෂයෙන්ම අත්තනගල්ල ගරු මන්ත්‍රීතුමාට (ලක්ෂ්මන් ජයකොඩි මහතා) මා ප්‍රශංසා නොකරම බැහැ. එතුමා සංස්කෘතික කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවෙත් සාමාජිකයෙක්. එතුමා ඉතාම උනන්දුවෙන් මේ අමාත්‍යාංශයේ කටයුතුවලට සහයෝගය දෙනවා. එතුමා වැදගත් යෝජනා ඉදිරිපත් කරනවා. මගේ අමාත්‍යාංශයේ වැඩ කටයුතු සඳහා ආණ්ඩු පක්ෂයේ පමණක් නොව විරුද්ධ පාර්ශ්වයෙනුත් සම්පූර්ණ සහයෝගය ලැබුණා. ඒ හැම දෙනාටම ස්තුතිවන්ත වෙමින්, මගේ අමාත්‍යාංශය යටතේ තිබෙන වැය ශීර්ෂ සියල්ලම සම්මත කර ගන්නා ලෙස ඉල්ලමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

"162 වන ශීර්ෂයෙහි 1 වන වැඩ සටහන, පුනරාවර්තන වියදම් සඳහා රු. 1,25,79,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

162 වන ශීර්ෂයෙහි 1 වන වැඩ සටහන, පුනරාවර්තන වියදම් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"தலைப்பு 162, நிகழ்ச்சித் திட்டம் 1, மீண்டுவரும் செலவுக்கான ரூபா 1,25,79,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 162, நிகழ்ச்சித் திட்டம் 1, மீண்டுவரும் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

Question, "That the sum of Rs. 12,579,000, for Head 162, Programme 1, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 162, Programme 1, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

1 වන වැඩ සටහන.– සාමාන්‍ය පරිපාලනය හා කාර්ය මණ්ඩල සේවා – මූලධන වියදම්, රු. 1,70,00,000

நிகழ்ச்சித் திட்டம் 1.— பொது நிருவாகமும் பதவியினர் சேவைகளும் — ஆக்கப் பொருட் செலவு, ரூபா 1,70,00,000

Programme 1.– General Administration and Staff Services – Capital Expenditure Rs. 17,000,000.

"162 වන ශීර්ෂයෙහි 1 වන වැඩ සටහන, මූලධන වියදම් සඳහා රු. 1,70,00,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

162 වන ශීර්ෂයෙහි 1 වන වැඩ සටහන, මූලධන වියදම් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"தலைப்பு 162, நிகழ்ச்சித் திட்டம் 1, ஆக்கப்பொருட் செலவுக்கான ரூபா 1,70,00,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக் கொள்ளப்பட்டது.

தலைப்பு 162, நிகழ்ச்சித் திட்டம் 1, ஆக்கப்பொருட் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

Question, "That the sum of Rs. 17,000,000, for Head 162, Programme 1, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 162, Programme 1, Capital Expenditure, ordered to stand part of the Schedule.

## 163 වන ශීර්ෂය.– ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව

1 වන වැඩ සටහන.– කෞතුකාගාර සේවා පරිපාලනය – පුනරාවර්තන වියදම්, රු. 46,64,000

## தலைப்பு 163.— தேசிய நூதனசாலைகள் திணைக்களம்

நிகழ்ச்சித் திட்டம் 1.— நூதனசாலைச் சேவைகளின் நிருவாகம் — மீண்டுவரும் செலவு, ரூபா 46,64,000

## HEAD 163.– DEPARTMENT OF NATIONAL MUSEUMS

Programme 1.– Administration of Museum Services – Recurrent Expenditure, Rs. 4,664,000

"163 වන ශීර්ෂයෙහි 1 වන වැඩ සටහන, පුනරාවර්තන වියදම් සඳහා රු. 46,64,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

163 වන ශීර්ෂයෙහි 1 වන වැඩ සටහන, පුනරාවර්තන වියදම් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"தலைப்பு 163, நிகழ்ச்சித் திட்டம் 1, மீண்டுவரும் செலவுக்கான ரூபா 46,64,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 163, நிகழ்ச்சித் திட்டம் 1, மீண்டுவரும் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

Question, "That the sum of Rs. 4,664,000, for Head 163, Programme 1, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 163, Programme 1, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

1 වන වැඩ සටහන.– කෞතුකාගාර සේවා පරිපාලනය – මූලධන වියදම්, රු. 30,00,000

நிகழ்ச்சித் திட்டம் 1.— நூதனசாலைச் சேவைகளின் நிருவாகம் — ஆக்கப்பொருட் செலவு, ரூபா 30,00,000

Programme 1.– Administration of Museum Services – Capital Expenditure, Rs. 3,000,000.

"163 වන ශීර්ෂයෙහි 1 වන වැඩ සටහන, මූලධන වියදම් සඳහා රු. 30,00,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

163 වන ශීර්ෂයෙහි 1 වන වැඩ සටහන, මූලධන වියදම් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"தலைப்பு 163, நிகழ்ச்சித் திட்டம் 1, ஆக்கப்பொருட் செலவுக்கான ரூபா 30,00,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 163, நிகழ்ச்சித் திட்டம் 1, ஆக்கப்பொருட் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

Question, "That the sum of Rs. 3,000,000, for Head 163, Programme 1, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 163, Programme 1, Capital Expenditure, ordered to stand part of the Schedule.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

## 164 වන ශීර්ෂය.– පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව

1 වන වැඩ සටහන.– පුරාවිද්‍යා සේවා – පුනරාවර්තන වියදම, රු. 1,52,68,000

### தலைப்பு 164.— தொல்பொருள் திணைக்களம்

நிகழ்ச்சித் திட்டம் 1.— தொல்பொருளியற் சேவைகள் — மீண்டுவருஞ் செலவு, ரூபா 1,52,68,000

## HEAD 164.– DEPARTMENT OF ARCHAEOLOGY

Programme 1.– Archaeological Services – Recurrent Expenditure, Rs. 15,268,000

" 164 වන ශීර්ෂයෙහි 1 වන වැඩ සටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 1,52,68,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය " යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

164 වන ශීර්ෂයෙහි 1 වන වැඩ සටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"தலைப்பு 164, நிகழ்ச்சித் திட்டம் 1, மீண்டுவருஞ் செலவுக்கான ரூபா 1,52,68,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 164, நிகழ்ச்சித் திட்டம் 1, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

Question, "That the sum of Rs. 15,268,000, for Head 164, Programme 1, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 164, Programme 1, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

1 වන වැඩ සටහන.– පුරාවිද්‍යා සේවා – මූලධන වියදම, රු. 1,70,00,000

நிகழ்ச்சித் திட்டம் 1.— தொல்பொருளியற் சேவைகள் — ஆக்கப்பொருட் செலவு, ரூபா 1,70,00,000

Programme 1.– Archaeological Services – Capital Expenditure Rs. 17,000,000

" 164 වන ශීර්ෂයෙහි 1 වන වැඩ සටහන, මූලධන වියදම සඳහා රු. 1,70,00,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය " යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

164 වන ශීර්ෂයෙහි 1 වන වැඩ සටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"தலைப்பு 164, நிகழ்ச்சித் திட்டம் 1, ஆக்கப்பொருட் செலவுக்கான ரூபா 1,70,00,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 164, நிகழ்ச்சித் திட்டம் 1, ஆக்கப்பொருட் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

Question, "That the sum of Rs. 17,000,000, for Head 164, Programme 1, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 164, Programme 1, Capital Expenditure, ordered to stand part of the Schedule.

## 165 වන ශීර්ෂය.– ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව

1 වන වැඩ සටහන.– ලේඛනාරක්ෂක සේවා – පුනරාවර්තන වියදම, රු. 35,41,000

### தலைப்பு 165.— தேசிய சுவடிகள் திணைக்களம்

நிகழ்ச்சித் திட்டம் 1.— சுவடிச் சேவைகள் — மீண்டுவருஞ் செலவு, ரூபா 35,41,000

## HEAD 165.– DEPARTMENT OF NATIONAL ARCHIVES

Programme 1.– Archive Services – Recurrent Expenditure, Rs. 3,541,000

" 165 වන ශීර්ෂයෙහි 1 වන වැඩ සටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 35,41,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය " යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

165 වන ශීර්ෂයෙහි 1 වන වැඩ සටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"தலைப்பு 165, நிகழ்ச்சித் திட்டம் 1, மீண்டுவருஞ் செலவுக்கான ரூபா 35,41,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 165, நிகழ்ச்சித் திட்டம் 1, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

Question, "That the sum of Rs. 3,541,000, for Head 165, Programme 1, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 165, Programme 1, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

1 වන වැඩ සටහන.– ලේඛනාරක්ෂක සේවා – මූලධන වියදම, රු. 24,25,000

நிகழ்ச்சித் திட்டம் 1.— சுவடிச் சேவைகள் — ஆக்கப்பொருட் செலவு, ரூபா 24,25,000

Programme 1.– Archive Services – Capital Expenditure Rs. 2,425,000

" 165 වන ශීර්ෂයෙහි 1 වන වැඩ සටහන, මූලධන වියදම සඳහා රු. 24,25,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය " යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

165 වන ශීර්ෂයෙහි 1 වන වැඩ සටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"தலைப்பு 165, நிகழ்ச்சித் திட்டம் 1, ஆக்கப்பொருட் செலவுக்கான ரூபா 24,25,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 165, நிகழ்ச்சித் திட்டம் 1, ஆக்கப்பொருட் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

Question, "That the sum of Rs. 2,425,000, for Head 165, Programme 1, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 165, Programme 1, Capital Expenditure, ordered to stand part of the Schedule.

## 166 වන ශීර්ෂය.– බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව

1 වන වැඩ සටහන.– බෞද්ධාගමික කටයුතු වර්ධනය – පුනරාවර්තන වියදම, රු. 85,64,000

### தலைப்பு 166.— பௌத்த அலுவல்கள் திணைக்களம்

நிகழ்ச்சித் திட்டம் 1.— பௌத்த சமய முயற்சிகளின் மேம்பாடு — மீண்டுவருஞ் செலவு, ரூபா 85,64,000

## HEAD 166.– DEPARTMENT OF BUDDHIST AFFAIRS

Programme 1.– Promotion of Buddhist Religious Activities – Recurrent Expenditure, Rs. 8,564,000

" 166 වන ශීර්ෂයෙහි 1 වන වැඩ සටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 85,64,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය " යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

166 වන ශීර්ෂයෙහි 1 වන වැඩ සටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"தலைப்பு 166, நிகழ்ச்சித் திட்டம் 1, மீண்டுவருஞ் செலவுக்கான ரூபா 85,64,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 166, நிகழ்ச்சித் திட்டம் 1, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

Question, "That the sum of Rs. 8,564,000, for Head 166, Programme 1, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 166, Programme 1, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

1 වන වැඩ සටහන.– බෞද්ධාගමික කටයුතු වර්ධනය – මූලධන වියදම, රු. 5,22,000

நிகழ்ச்சித் திட்டம் 1.— பௌத்த சமய முயற்சிகளின் மேம்பாடு — ஆக்கப்பொருட் செலவு, ரூபா 5,22,000

Programme 1.– Promotion of Buddhist Religious Activities – Capital Expenditure, Rs. 522,000

" 166 වන ශීර්ෂයෙහි 1 වන වැඩ සටහන, මූලධන වියදම සඳහා රු. 5,22,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය " යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

166 වන ශීර්ෂයෙහි 1 වන වැඩ සටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"தலைப்பு 166, நிகழ்ச்சித் திட்டம் 1, ஆக்கப்பொருட் செலவுக்கான ரூபா 5,22,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 166, நிகழ்ச்சித் திட்டம் 1, ஆக்கப்பொருட் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Question, "That the sum of Rs. 522,000, for Head 166, Programme 1, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 166, Programme 1, Capital Expenditure, ordered to stand part of the Schedule.

*එකල්හි වේලාව ප. භා. 6 වුයෙන්, පාර්ලිමේන්තුවට ප්‍රගතිය වාර්තා කරනු පිණිස නියෝජ්‍ය සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් විය.*

*කාරක සභාව ප්‍රගතිය වාර්තා කරයි ; නැවත රැස්වීම දෙසැම්බර් 13 වන සිකුරාද.*

*நேரம் பி. ப. 6 மணியாகிவிடவே, குழுவின் பரிசீலனை பற்றி அறிவிக்கும் பொருட்டு பிரதித் தலைவர் அக்கிராசனத்திலிருந்து நீங்கினார்.*

*குழுவினது பரிசீலனை அறிவிக்கப்பட்டது ; மீண்டும் கூடுவது வெள்ளிக்கிழமை, 13 டிசெம்பர் 1985.*

*It being 6 p.m. the Deputy Chairman left the Chair to report Progress.*

*Committee report Progress ; to sit again on Friday, 13th December 1985.*

## පරිපූරක මුදල : ආහාර මුද්දර යෝජනා ක්‍රමය — පාඩු අත්හැර දැමීම

## குறைநிரப்புத் தொகை : உணவு முத்திரைத் திட்டம் — நட்டத்தைத் தள்ளிவிடல்

## SUPPLEMENTARY SUPPLY : FOOD STAMPS SCHEME – WRITE-OFF OF LOSSES

**එම්. වින්සන්ට් පෙරේරා මහතා**
**(திரு. எம். வின்சன்ற் பெரேரா)**
**(Mr. M. Vincent Perera)**

On behalf of the Minister of Agricultural Development & Research and Minister of Food & Co-operatives, I move,

"That a supplementary sum not exceeding Rupees one billion seven hundred and twenty seven million seven hundred and forty five thousand (Rs. 1,727,745,000)be payable out of the Consolidated Fund of the Government of the Democratic Socialist Republic of Sri Lanka, or any other fund or moneys of, or at the disposal of the Government of the Democratic Socialist Republic of Sri Lanka, or from the proceeds of any loans obtained by the Government of the Democratic Socialist Republic of Sri Lanka, for the service of the Financial Year beginning on 1st January 1985 and ending on 31st December 1985 and that the said sum may be expended as specified in the Schedule hereto : –

Schedule

| | Rs. |
|---|---|
| Head :171 – Department of the Food Commissioner<br>Programme :1 – Implementation of the Food and Kerosene Stamps Scheme Recurrent Expenditure | 1,727,745,000" |

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பெற்று ஏற்றுக்கொள்ளப்பட்டது.*
***Question put, and agreed to.***

## පරිපූරක මුදල : ආහාර මුද්දර යෝජනා ක්‍රමය භාණ්ඩාගාරයට අයවිය යුතු පොලී

## குறைநிரப்புத் தொகை : உணவு முத்திரைத் திட்டம் — திறைசேரிக்குரிய வட்டி

## SUPPLEMENTARY SUPPLY : FOOD STAMPS SCHEME – INTEREST DUE TO TREASURY

**එම්. වින්සන්ට් පෙරේරා මහතා**
**(திரு. எம். வின்சன்ற் பெரேரா)**
**(Mr. M. Vincent Perera)**

On behalf of the Minister of Agricultural Development & Research and Minister of Food & Co-operatives, I move,

"That a supplementary sum not exceeding Rupees one hundred and ninety million two hundred and forty five thousand (Rs. 190,245,000) be payable out of the Consolidated Fund of the Government of the Democratic Socialist Republic of Sri Lanka, or any other fund or moneys of, or at the disposal of the Government of the Democratic Socialist Republic of Sri Lanka, or from the proceeds of any loans obtained by the Government of the Democratic Socialist Republic of Sri Lanka, for the service of the Financial Year beginning on 1st January 1985 and ending on 31st December 1985 and that the said sum may be expended as specified in the Schedule hereto : –

Schedule

| | Rs. |
|---|---|
| Head :171 – Department of the Food Commissioner<br>Programme :1 – Implementation of the Food and Kerosine Stamps Scheme Recurrent Expenditure | 1,90,245,000" |

*ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put and agreed to.*

## පරිපූරක මුදල : සීනි සංයුක්ත මණ්ඩලයට ලැබෙන මූල්‍ය ආධාර

## குறைநிரப்புத் தொகை : சீனிக் கூட்டுத்தாபனத்துக்கு நிதியுதவி

## SUPPLEMENTARY SUPPLY : FINANCIAL ASSISTANCE TO SUGAR CORPORATION

**එම්. වින්සන්ට් පෙරේරා මහතා**
**(திரு. எம். வின்சன்ற் பெரேரா)**
**(Mr. M. Vincent Perera)**

On behalf of the Minister of Agricultural Development & Research and Minister of Food & Co-operatives, I move,

"That a supplementary sum not exceeding Rupees one hundred and twelve million (Rs. 112,000,000) be payable out of the Consolidated Fund of the Government of the Democratic Socialist Republic of Sri Lanka, or any other fund or moneys of, or at the disposal of the Government of the Democratic Socialist Republic of Sri Lanka, or from the proceeds of any loans obtained by the Government of the Democratic Socialist Republic of Sri Lanka, for the service of the Financial Year beginning on 1st January 1985 and ending on 31st December 1985 and that the said sum may be expended as specified in the Schedule hereto : –

Schedule

| | Rs. |
|---|---|
| Head :131 – Minister of Agricultural Development and Research<br>Programme :1 – Planning, Programming and Progress Control of Agricultural Development | 112,000,000" |

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பெற்று ஏற்றுக்கொள்ளப்பட்டது.*
***Question put, and agreed to.***

**එම්. වින්සන්ට් පෙරේරා මහතා**
**(திரு. எம். வின்சன்ற் பெரேரா)**
**(Mr. M. Vincent Perera)**

I move Item 5.

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
**(Mr. Lakshman Jayakody)**

No. Sir.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**එම්. වින්සන්ට් පෙරේරා මහතා**
**(திரு. எம். வின்சன்ற் பெரேரா)**
**(Mr. M. Vincent Perera)**

I thought you agreed. You said that you can debate it today.

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
(Mr. Lakshman Jayakody)

No. How can I take a decision on Defence matters ?

**එම්. වින්සන්ට් පෙරේරා මහතා**
**(திரு. எம். வின்சன்ற் பெரேரா)**
**(Mr. M. Vincent Perera)**

It is very urgent.

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
(Mr. Lakshman Jayakody)

We cannot discuss it now. We will take it up at the Party Leaders' Meeting and come to a decision. let my Leader come back, please.

**එම්. වින්සන්ට් පෙරේරා මහතා**
**(திரு. எம். வின்சன்ற் பெரேரா)**
(Mr. M. Vincent Perera)

But I thought you agreed in the morning ?

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
(Mr. Lakshman Jayakody)

Let the leader of the Opposition come back.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
**(குழுப் பிரதித் தலைவர் அவர்கள்)**
(The Deputy Chairman of Committees)

Anyway, this has been the custom earlier, to agree –

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
(Mr. Lakshman Jayakody)

No, sir, not defence matters, not Item 5. All the items that come under the Ministry of Agricultural Development & Research and Minister of Food & Co-operatives we are prepared to allow.

**එම්. වින්සන්ට් පෙරේරා මහතා**
**(திரு. எம். வின்சன்ற் பெரேரா)**
(Mr. M. Vincent Perera)

I thought you agreed in the morning.

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
(Mr. Lakshman Jayakody)

No, not defence, please. If my Leader was here I would have agreed. I would have spoken to him and asked him whether he has any comments to make. But he is not here. Let it be there. It is not going to be a problem.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
**(குழுப் பிரதித் தலைவர் அவர்கள்)**
(The Deputy Chairman of Committees)

The Local Government Votes have been passed and it has been agreed–

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
(Mr. Lakshman Jayakody)

No, Sir, this is not Local Government. This is the Minister of Defence. This is about defence matters.

**එම්. වින්සන්ට් පෙරේරා මහතා**
**(திரு. எம். வின்சன்ற் பெரேரா)**
**(Mr. M. Vincent Perera)**

This is very urgent.

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
(Mr. Lakshman Jayakody)

The Minister of Defence is not here. So it comes in the name of the Hon. Prime Minister. If the Hon. Minister of National Security was here I would have been able to discuss this matter and finish it. Let him come. We will do it tomorrow. Let us know what it is all about.

**එම්. වින්සන්ට් පෙරේරා මහතා**
**(திரு. எம். வின்சன்ற் பெரேரா)**
**(Mr. M. Vincent Perera)**

If necessary I can explain to you.

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
(Mr. Lakshman Jayakody)

No, please. It is also after 6 p.m. now. We will have it tomorrow, Sir.

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**එම්. වින්සන්ට් පෙරේරා මහතා**
**(திரு. எம். வின்சன்ற் பெரேரா)**
**(Mr. M. Vincent Perera)**

I move,

**"That the Parliament do now adjourn".**

*ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.*
*வினா எடுத்தியம்பப்பெற்றது.*
***Question proposed.***

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
(Mr. Lakshman Jayakody)

Sir, I have an Adjournment question to which, I think the Hon. Minister of Parliamentary Affairs and Sports is having the answer also. I am very grateful to him because he is acting for so many Ministers.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Sir, it is really a Question of which notice had been given by the Leader of the Opposition pertaining to the leasing out of the National Milk Board to a company called MILCO. Sir, what has happened is that the Milk Board, by a Circular No. 900, has already informed its employees that the Government has decided to transfer all of its operational activities to a company called Milk Industries Limited (MILCO) at the end of this year. That is in another couple of days' time or perhaps somewhere in the beginning of the next year. There is a lot of unrest among the employees because there are certain problems and questions that they would like to get clarified. Namely, whether the employees presently employed by the MILK Board will be found employment in the said company with the privileges that they enjoyed today. Secondly, Sir, as to how much compensation will be paid to those who are not willing to join the company and to those who are not re-employed by the company. I ask the Question on behalf of Hon. Anura Bandaranaike, Leader of the Opposition, as he is not here.

There is also very important letter written by Mr. R. P. Somapala of Visira Viyalana Kiri Kamhala, Ambewela, where he details out the request. I would like the Hon. Minister to kindly let us know what the situation is about these two matters.

**එම්. වින්සන්ට් පෙරේරා මහතා**
**(திரு. எம். வின்சன்ற் பெரேரா)**
**(Mr. M. Vincent Perera)**

I can forward your Question to the Minister.

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
(Mr. Lakshman Jayakody)

This Question has been given to you, Sir, two days ago. This is the type of thing, Sir. This is an Adjournment Question given to you two days ago.

**එම්. වින්සන්ට් පෙරේරා මහතා**
**(திரு. எம். வின்சன்ற் பெரேரா)**
**(Mr. M. Vincent Perera)**

I do not know. But if you had given it to me I would have got the reply.

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
(Mr. Lakshman Jayakody)

This is why I say there should be some system, Sir. Now the Hon. Minister says that we have to give it to him. But there is a procedure laid down.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
**(குழுப் பிரதித் தலைவர் அவர்கள்)**
(The Deputy Chairman of Committees)

The Hon. Minister say that he will refer it to the Minister concerned. He does not have the answer now. The procedure is that you have to accept it.

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
(Mr. Lakshman Jayakody)

It is a peculiar situation.

Sir, I do not start these procedures because governments may come and governments may go, but the procedures go on for ever! But, when you start changing procedures, when new governments come they will also start changing procedures and there will be a stage where the Parliaments will be stifled for good! This is what I fear.

**එම්. වින්සන්ට් පෙරේරා මහතා**
**(திரு. எம். வின்சன்ற் பெரேரா)**
**(Mr. M. Vincent Perera)**

There is no reason for us to fight about this matter. I will get answer tomorrow

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
(Mr. Lakshman Jayakody)

This Parliament will have no voice at all. There would not be anyone speaking but will be just *signal kanu.*

මේවාට පිළිතුරු දෙන්නේ නැත්නම් මන්ත්‍රීවරු සිග්නල් කණු බවට පත් වෙනවා. අදාළ අමාත්‍යාංශ හයක ඇමතිවරු මෙහි නැහැ. [බාධා කිරීම්]

**එම්. වින්සන්ට් පෙරේරා මහතා**
**(திரு. எம். வின்சன்ற் பெரேரா)**
**(Mr. M. Vincent Perera)**

I will get you the reply.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
**(குழுப் பிரதித் தலைவர் அவர்கள்)**
(The Deputy Chairman of Committees)

ඇමතිතුමා කියනවා, හෙට පිළිතුරු දෙන්නම් කියා. ඒ නිසා ඒක පිළිගන්න එකයි තිබෙන්නේ. [බාධා කිරීම්]

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
(Mr. Lakshman Jayakody)

මම ඒක පිළිගන්න ලෑස්තියි. නමුත් එහෙම නොවෙයි, කටයුතු කළ යුතුව තිබුණේ. එහෙම ක්‍රියා කරන්න හොඳ නැහැ. අන්තිමේදී, මෙතැන ඉදිමෙනුත් වැඩක් නැහැ නේ ? මේ විධියට ගියොත් මේ පාර්ලිමේන්තුව නිකම් විහිළුවක් වෙනවා. කණගාටුවෙන් නමුත් කියන්න මට සිදු වී තිබෙනවා, 1977 න් පස්සේ පාර්ලිමේන්තුව විහිළුවක් බවට පරිවර්තනය වුණාය කියා. පාර්ලිමේන්තු කටයුතු හා ක්‍රීඩා ඇමතිතුමා 1977 ට කලිනුත් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක්ව හිටියා. [බාධා කිරීම්]

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பெற்று ஏற்றுக்கொள்ளப்பட்டது.*
***Question put, and agreed to.***

*පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ. භා. 6.05ට 1985 නොවැම්බර් 28 වන දින සභාසම්මතිය අනුව 1985 දෙසැම්බර් 13 වන සිකුරාද පූ. භා. 9.00 වන තෙක් කල් ගියේය.*

*அதன்படி, பி. ப. 6.5 மணிக்கு பாராளுமன்றம், அதனது, 1985 நொவம்பர் 28 ஆம் தேதிய தீர்மானத்திற்கிணங்க, 1985 டிசெம்பர் 13, வெள்ளிக்கிழமை மு. ப. 9 மணிவரை ஒத்திவைக்கப் பட்டது.*

*Adjourned accordingly at 6.05 p.m. untill 9.00 am on Friday 13th December 1985, pursuant to the Resolution of the Parliament of 28th November 1985.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Sir, it is really a Question of which notice had been given by the Leader of the Opposition pertaining to the leasing out of the National Milk Board to a company called MILCO. Sir, what has happened is that the Milk Board, by a Circular No. 900, has already informed its employees that the Government has decided to transfer all of its operational activities to a company called Milk Industries Limited (MILCO) at the end of this year. That is in another couple of days' time or perhaps somewhere in the beginning of the next year. There is a lot of unrest among the employees because there are certain problems and questions that they would like to get clarified. Namely, whether the employees presently employed by the MILK Board will be found employment in the said company with the privileges that they enjoyed today. Secondly, Sir, as to how much compensation will be paid to those who are not willing to join the company and to those who are not re-employed by the company. I ask the Question on behalf of Hon. Anura Bandaranaike, Leader of the Opposition, as he is not here.

There is also very important letter written by Mr. K. P. Somapala of Visita Viyslana Kiri Kumbala, Ambewela, where he details out the request. I would like the Hon. Minister to kindly let us know what the situation is about these two matters.

(Mr. M. Vincent Perera)

I can forward your Question to the Minister.

(Mr. Lakshman Jayakody)

This Question has been given to you, Sir, two days ago. This is the type of thing, Sir. This is an Adjournment Question given to you two days ago.

(Mr. M. Vincent Perera)

I do not know. But if you had given it to me I would have got the reply.

(Mr. Lakshman Jayakody)

This is why I say there should be some system, Sir. Now the Hon. Minister says that we have to give it to him. But there is a procedure laid down.

(The Deputy Chairman of Committees)

The Hon. Minister says that he will refer it to the Minister concerned. He does not have the answer now. The procedure is that you have to accept it.

(Mr. Lakshman Jayakody)

It is a peculiar situation.

Sir, I do not start these procedures because governments may come and governments may go, but the procedures go on for ever! But, when you start changing procedures, when new governments come they will also start changing procedures and there will be a stage where the Parliaments will be stifled for good. This is what I fear.

(Mr. M. Vincent Perera)

There is no reason for us to fight about this matter. I will get answer tomorrow.

(Mr. Lakshman Jayakody)

This Parliament will have no voice at all. There would not be anyone speaking but will be just signed kanu.

(Mr. M. Vincent Perera)

I will get you the reply.

(The Deputy Chairman of Committees)

(Mr. Lakshman Jayakody)

Question put, and agreed to.

Adjourned accordingly at 6.03 p.m. until 9.00 a.m. on Friday 13th December 1985, pursuant to the Resolution of the Parliament of 28th November 1985.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සැ. යු.

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය කථාවල නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන එහි ඒවා පැහැදිලිව දක්වා එම පිටපත හැන්සාඩ් සංස්කාරක වෙත

**1985 දෙසැම්බර් 27 වන සිකුරාද**

**නොඉක්මවා ලැබෙනසේ එවිය යුතුයි.**

குறிப்பு

**அங்கத்தவர்கள் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களை அறிக்கையிற்றெளிவாகக் குறித்து பிழை திருத்தங்களைக் கொண்ட பிரதியை ஹன்சாட் பதிப்பாசிரியருக்கு**

**1985 டிசெம்பர் 27, வெள்ளிக்கிழமைக்குப் பிந்தாமற்**

**கிடைக்கக்கூடியதாக அனுப்புதல் வேண்டும்.**

**NOTE**

Corrections which Members suggest for the Final Print should be clearly marked in this Report and the *copy containing the corrections must reach* the Editor of HANSARD

**not later than**

**Friday, 27th December 1985**

---

| | | |
|---|---|---|
| **Contents of Proceedings** | : | **From 9.00 a.m. to 6.05 p.m. on 12.12.1985** |
| **Final set of manuscripts received from Parliament** | : | **7.20 p.m. on 13.12.1985** |
| **Printed copies despatched** | : | **14.12.1985 morning** |

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**දායක මුදල් :** පාර්ලිමේන්තු විවාද වාර්තාවල වාර්ෂික දායක මිල රු. 200/- කි. (අශෝධිත පිටපත් සඳහා නම් රු. 175/- කි). පිටපතක් ගෙන්වා ගැනීම අවශ්‍ය නම් ගාස්තුව රු. 2.50 කි. තැපැල් ගාස්තුව ශත 90 කි. කොළඹ 1, තැ. පෙ. 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම නොවැම්බර් 30 දට ප්‍රථම දායක මුදල් ගෙවා ඉදිරි වර්ෂයේ දායකත්වය ලබාගෙන විවාද වාර්තා ලබාගත හැකිය. නියමිත දිනෙන් පසුව එවනු ලබන දායක ඉල්ලුම්පත් භාරගනු නොලැබේ.

*சந்தா:* ஹன்சாட் அதிகார அறிக்கையின் வருடாந்த சந்தா ரூபா 200/- (திருத்தப்படாத பிரதிகள் ரூபா 175/-) ஹன்சாட் தனிப்பிரதி ரூபா 2·50. தபாற் செலவு 90 சதம். வருடாந்த சந்தா முற்பணமாக அத்தியட்சர், அரசாங்க வெளியீட்டலுவலகம், த. பெ. இல. 500, கொழும்பு 1 என்ற விலாசத்திற்கு அனுப்பி பிரதிகளைப் பெற்றுக்கொள்ளலாம். ஒவ்வோராண்டும் நவெம்பர் 30 ந் தேதிக்குமுன் சந்தாப் பணம் அனுப்பப்படவேண்டும். பிந்திக் கிடைக்கும் சந்தா விண்ணப்பங்கள் ஏற்றுக்கொள்ளப்படமாட்டா.

**Subscriptions :** The annual subscription for Official Report of Hansard is Rs. 200/- (For uncorrected copies Rs. 175/-). A single copy of Hansard is available for Rs. 2.50. (Postage 90 cts.) Copies can be obtained by remitting in advance an annual subscription fee to the SUPERINTENDENT, GOVERNMENT PUBLICATIONS BUREAU, P. O. Box, 500 Colombo 1. The fee should reach him on or before November 30 each year. Late applications for subscription will not be accepted.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org